SriLankan Airlines

oneworld




# ශක්තිමත්ව ධනාත්මකව අරමුණු පෙරදැරිව

ශ්‍රීලංකන් එයාර්ලයින්ස්
වාර්ෂික වාර්තාව 2022-2023

# පටුන

**දළ විශ්ලේෂණය**
- අපගේ දැක්ම සහ මෙහෙවර 2
- වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම 5
- මූල්‍ය තොරතුරු 6

**නායකත්වය**
- සභාපතිතුමාගේ පණිවුඩය 7
- ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ පණිවුඩය 10
- අධ්‍යක්ෂ මණ්ඩලය 13
- ජ්‍යේෂ්ඨ කළමනාකරණ කණ්ඩායම 17

**කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය**
- මෙහෙයුම් පරිසරය 22
- අපගේ මෙහෙයුම් 22
- අපගේ මානව සම්පත 25
- මගී අත්දැකීම් 28
- ප්‍රජා සවි බල ගැන්වීම 31
- තිරසාරත්ව කාර්යසාධනය 33
- නියාමන අනුකූලතාවය 34
- මූල්‍ය සමාලෝචනය 35
- ව්‍යාපාර ඒකකයන්හි කාර්යසාධනය 37

**ආයතනික භාරකාරත්වය**
- ආයතනික පාලන වාර්තාව 43
- ආයතනික අවදානම් කළමනාකරණය 45

**මූල්‍ය ප්‍රකාශ**
- අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 48
- අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව 52
- අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය 53
- ස්වාධීන විගණකගේ වාර්තාව 54
- මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 58
- ලාභ හෝ අලාභ ප්‍රකාශය 59
- විස්තීර්ණ ආදායම් ප්‍රකාශය 60
- ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය 61
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය 62
- මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 63

**අතිරේක තොරතුරු**
- පාරිභාෂික ශබ්ද මාලාව 113
- දස අවුරුදු සමාලෝචනය 114
- ගුවන් මාර්ග සිතියම 116
- විශේෂ කඩඉම් 118
- සාංගමික තොරතුරු 120
- මහා සභා රැස්වීම් නිවේදනය 121
- සටහන් 122
- පෙරකලාසි පත්‍රය 124

# ශක්තිමත්ව ධනාත්මකව අරමුණු පෙරදැරිව

වර්ධනය යනු ආකල්පයක් වන අතර, වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි අපි සමාගමෙහි ක්‍රමික වර්ධනයක් ඇති කිරීම සඳහා අත්‍යවශ්‍ය වන්නා වූ ධනාත්මක ආකල්ප වර්ධනය කිරීමෙහිලා කටයුතු කරමින් සිටිමු. පශ්චාත් වසංගත යුගයක් සහ මූල්‍ය අර්බුදයේ ප්‍රතිවිපාක පෙන්නුම් කළ අඳුරු කාලවකවානුවක් සාර්ථකව පසු කර ඒමේදී, අප සතු ව පැවතියාවූ නොපසුබට වීර්යය අපගේ අභිලාෂයන් කරා ළඟා වීමට අපට උපකාරී විය. අලුත් වූ විශ්වාසයෙන් සහ සූක්ෂ්ම අවධානයෙන් යුතුව සෑම අභියෝගයකටම ධනාත්මකව මුහුණ දෙමින්, රටක් වශයෙන් ශ්‍රී ලාංකික අපිට පිරිනැමිය හැකි හොඳම ආකාරයේ ආගන්තුක සත්කාරයක් සමඟින් අපගේ ගනුදෙනුකරුවන්ට සේවය කිරීමට අපි ඉතා ඕනෑකමින් යුතුව බලා සිටිමු.

ශක්තිමත්ව, ධනාත්මකව, අරමුණු පෙරදැරිව; අපි අනාගතය වෙත පියනගන්නෙමු...

# අපගේ දැක්ම

උණුසුම් ආගන්තුක සත්කාර සපිරි සැබෑ ශ්‍රී ලාංකේය අත්දැකීමක් විඳගැනීමට බලාපොරොත්තු වන සංචාරකයින්ගේ පළමු තේරීම බවට පත්වීමට අපි අපේක්ෂා කරමු.

# අපගේ මෙහෙවර

සංචාරක ව්‍යාපාරයට මෙන්ම විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ට සහ ජාතික ආර්ථිකයට ද සහය වෙමින්, ඉන්දියන් සාගර කලාපය තුළ පිහිටීමේ වාසිය උපායමාර්ගික ලෙස යොදාගනිමින්, ශ්‍රී ලංකාව ගුවන් ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම මඟින් අප රට ලෝකය වෙත ගෙන යන තිරසාර, ලාභ උපයන ගුවන් සේවයක් බවට පත්වීම.

ගුවන් සේවය සඳහා මෙන්ම ගුවන් සේවා ක්ෂේත්‍රය සඳහා වෘත්තිකයන් බිහිකිරීමේ ප්‍රමුඛත්වය ගන්නා මධ්‍යස්ථානයක් බවට පත්වීම.

තවද රටට සහ අප සේවය කරන ප්‍රජාවන්ට දිගුකාලීන තිරසාර ප්‍රතිලාභ අත්කර දෙමින් සදාචාර සම්පන්නව සේවය කිරීමට අපි කැපවී සිටිමු.



SriLankan
www.srilankan.com
A330-300



# වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම

මෙය 2022/23 මූල්‍ය වර්ෂය සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි 45 වැනි වාර්ෂික වාර්තාවයි. මෙමඟින් 2022 අප්‍රේල් 1 සිට 2023 මාර්තු 31 දක්වා කාර්යසාධනය ආවරණය කෙරේ.

ශ්‍රී ලංකාවේ ජාතික ගුවන් සේවය වන ශ්‍රීලංකන් එයාර්ලයින්ස් 1979 වසරේ සිට ක්‍රියාත්මක වේ. සම්මානලාභී ගුවන් සේවයක් ලෙස ශ්‍රීලංකන් එයාර්ලයින්ස් වසර ගණනාවක් පුරා එහි උසස් තත්ත්වයේ සේවාව, සුව පහසුව, ආරක්ෂාව සහ විශ්වසනීයත්වය වෙනුවෙන් ප්‍රබල කීර්තියක් අත්කර ගෙන ඇත. ගුවන් සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් අතරට මගී සහ භාණ්ඩ ප්‍රවාහන මෙහෙයුම් සහ ගොඩබිම් හැසිරවීමේ සේවා ඇතුළත් වේ. මීට අමතරව, පරිපාලිත ව්‍යාපාර ඒකක හරහා සේවා සැපයීම සහ අනුබද්ධ සේවා ලබා දෙනු ලැබේ.

ගුවන් සමාගම එහි ප්‍රධාන මධ්‍යස්ථානය වන කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ සිට ක්‍රියාත්මක වන අතර සලකා බලන ලද මූල්‍ය වර්ෂය තුළ රටවල් 58 ක ගමනාන්ත 112 ක ගෝලීය ජාලයක සම්බන්ධතා පවත්වාගෙන ගියේය.

## විෂය පථය සහ සීමාව

මෙම වාර්ෂික වාර්තාවෙහි සමාලෝචිත කාල සීමාව තුළ සමූහයේ මූල්‍ය සහ මූල්‍ය නොවන සංවර්ධනයන්ට අදාළ තොරතුරු අන්තර්ගත වේ. අපගේ මෙහෙයුම් ප්‍රතිඵලයන්, මූල්‍ය කාර්යසාධනය, අවදානම් කළමනාකරණය, ආයතනික පාලනය සහ පරිචයන් පිළිබඳ දළ විශ්ලේෂණයක්ද මෙහි ඇතුළත් වේ. සලකා බලනු ලබන කාල සීමාව තුළ සමූහයේ සහ එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ සවිස්තරාත්මක අවබෝධයක් ලබා ගැනීමට මේ හරහා අපගේ පාර්ශ්වකරුවන්ට හැකි වනු ඇත.

## වාර්තාව පිළියෙල කිරීමේ ප්‍රමිති සහ මූලිකාංග

මෙම වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කොට ඇති මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ 2007 අංක 7 දරන සමාගම් පනතෙහි අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කර ඇත. ආයතනික පාලනය පිළිබඳ අනුකූලතාවයන් රාජ්‍ය ව්‍යවසාය චක්‍ර ලේඛන අංක 01/2021 යටතේ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සහ රජය සතු ව්‍යවසායන් සඳහා මෙහෙයුම් අත්පොත අනුව සකස් කර ඇත.

## ඉදිරි දැක්ම පිළිබඳ ප්‍රකාශය

මෙම වාර්තාවට අවදානම් සහ අනපේක්ෂිතතාවයන් පිළිබඳ සඳහන් "ඉදිරි දැක්ම පිළිබඳ ප්‍රකාශය" ඇතුළත් වේ. ඉදිරි දැක්ම පිළිබඳ ප්‍රකාශයෙන් අපේක්ෂා කරනු ලබන දෑට සාපේක්ෂව සැබෑ ප්‍රතිඵල සහ එකී කාලවලදී ඇති වන සමූහයේ කාර්යසාධනය වෙනස් විය හැකිය. එබැවින් "ඉදිරි දැක්ම පිළිබඳ ප්‍රකාශය" මත අනවශ්‍ය විශ්වාසයක් තබා නොගන්නා ලෙස පාඨකයන් වෙත දැනුම් දෙනු ලැබේ.

**සටහන:**

**මෙම සිංහල වාර්තාව ඉංග්‍රීසි වාර්තාවේ පරිවර්තනයක් වන අතර,**
**පරිවර්තන ගැටළු පවතින සෑමවිටම ඉංග්‍රීසි වාර්තාව පරිශීලනය කරන්න.**

# මූල්‍ය විශේෂ තොරතුරු

| | | සමූහය 2023 | සමූහය 2022 | සමාගම 2023 | සමාගම 2022 |
|---|---|---|---|---|---|
| **මූල්‍යමය** | | | | | |
| ආදායම | රු. මිලියන | 369,470.04 | 134,301.35 | 365,171.77 | 132,936.23 |
| මෙහෙයුම් වියදම | රු. මිලියන | 329,856.52 | 133,222.10 | 330,568.53 | 132,397.86 |
| විනිමය අලාභයට පෙර මෙහෙයුම් ලාභය/(අලාභය) | රු. මිලියන | 43,371.56 | 1,692.66 | 40,743.58 | 1,237.33 |
| වසර සඳහා අලාභය | රු. මිලියන | (71,306.66) | (163,583.08) | (73,621.53) | (166,369.68) |
| මුළු වත්කම් | රු. මිලියන | 211,176.41 | 182,263.33 | 199,454.76 | 178,144.17 |
| කොටස් හිමිකරුවන්ගේ අරමුදල් | රු. මිලියන | (494,429.99) | (426,423.83) | (509,174.88) | (437,036.92) |
| **ගමනාගමනය** | | | | | |
| මගී ධාරිතාව | ASK මිලි. | | | 15,188.00 | 10,144.12 |
| ප්‍රවාහනය කරන ලද මගීන් | RPK මිලි. | | | 11,793.72 | 4968.59 |
| මගී පැටවුම් සාධකය | % | | | 77.65 | 48.98 |
| සමස්ත ධාරිතාව | ATK මිලි. | | | 2,044.45 | 1531.28 |
| සමස්ත පැටවුම | RTK මිලි. | | | 1355.99 | 847.33 |
| මගී පැටවුම් සාධකය | % | | | 66.33 | 55.33 |
| **කාර්ය මණ්ඩල ඵලදායීතාවය** | | | | | |
| පිරිස් බලයේ සාමාන්‍යය | සංඛ්‍යාව | 6,203 | 6,849 | 5,440 | 5,833 |
| එක් සේවකයෙකුගේ ආදායම | රු. මිලියන | 59.56 | 19.61 | 67.13 | 22.79 |
| **ගුවන් යානා** | | | | | |
| පටු බඳ සහිත | සංඛ්‍යාව | | | 12 | 12 |
| පුළුල් බඳ සහිත | සංඛ්‍යාව | | | 11 | 12 |
| වසර අවසානය වන විට සේවයේ නියුතු ගුවන් යානා | සංඛ්‍යාව | | | 23 | 24 |

**මූල්‍ය කාර්ය සාධනය**




**මෙහෙයුම් කාර්ය සාධනය**



# සභාපතිතුමාගේ වාර්තාව

**"සමූහය පසුගිය මූල්‍ය වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය වූ රුපියල් බිලියන 1.7 ට සාපේක්ෂව සැලකිය යුතු වර්ධනයක් සනිටුහන් කරමින් රුපියල් බිලියන 43.4 ක මෙහෙයුම් ලාභයක් (විනිමය අලාභවලට අදාළව ගිණුම්ගත කිරීමට පෙර) අත්කර ගෙන ඇත.**

**පෙර නොවූ විරූ අභියෝග මධ්‍යයේ වුවද සියලු ප්‍රයත්නයන් දැරීමෙන් මූල්‍ය ස්ථාවරත්වය සාක්ෂාත් කර ගැනීම කැපී පෙනෙන ජයග්‍රහණයක් විය."**

2022දී ගෝලීය ආර්ථිකය දුර්වල කාර්යසාධනයක් පෙන්නුම් කළ අතර එමගින් ලොව පුරා කර්මාන්ත රැසකට බලපෑම් එල්ල විය. ගුවන් ගමන් සඳහා වැඩිවන ඉල්ලුමට ප්‍රතිචාර දක්වමින් ගුවන් සේවා කර්මාන්තය මෙම අභියෝගවලට මුහුණ දුන්නේය. මෙවන් දුෂ්කර කාලවලදී සමාගමේ තත්ත්වය වැඩි දියුණු කර ගනිමින්ද නැගී එන වෙළඳපොළ අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමට හැකි වන පරිදි ගුවන් සමාගමේ ක්‍රමෝපායන් සකස් කර ගනිමින්ද ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ශුභවාදීව මෙන්ම ශක්තිමත්ව සිටියේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පෙර වසරට සාපේක්ෂව වසරේ අග භාගයේදී, ගුවන් සේවයෙහි යම් ප්‍රතිසාධනයක් පෙන්නුම් කළ අතර මෙහෙයුම් පරිසරය වඩා යහපත් වීම සහ වසර තුළ මුහුණ දුන් අභියෝගවලට ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් සිදුකරන ලද මෙහෙයුම් වැඩිදියුණු කිරීම් එයට හේතු විය.

### සාර්ව ආර්ථික පරිසරය

එය අභියෝග රාශියකට මුහුණ දුන් වසරකි. ගෝලීය උද්ධමනය අඛණ්ඩව ඉහළ යාම එක් මූලික අභියෝගයක් වූ අතර එය ආර්ථික ක්‍රියාකාරකම් පහත වැටීම කෙරෙහි බලපෑමක් ඇති කළේය. එසේම එමගින් ජීවන වියදම් අර්බුදයකට සහ විවිධ කලාපවල මූල්‍ය තත්ත්වයන් දැඩි කිරීමකටද හේතු විය. විශේෂයෙන්ම යුක්රේනයේ ගැටුම් වැනි භූ දේශපාලනික ගැටලු සහ කොවිඩ්-19 වසංගතයේ කල් පවතින බලපෑම නිසා මෙම තත්ත්වය තවදුරටත් උග්‍ර විය. මෙවැනි සාර්ව ආර්ථික අභියෝග සෘජුවම ගුවන් සේවා කර්මාන්තයට බලපෑ අතර, පැහැදිලි ගැටලු රැසක් ඒ හරහා නිර්මාණය විය.

ගුවන් සේවා අංශයේ සැලකිය යුතු අයුරින් ඇති වූ ගැටලුවක් වූයේ සැපයුම් දාමය බිඳවැටීමයි. මෙවැනි බිඳවැටීම් සේවා සැපයිය යුතු එන්ජින්වල හිඟයක් ඇති කළේය. නඩත්තු කාලසීමාවන්හි පැවති සීමා සහිත බව සහ උපාංග හිඟය මේ සඳහා හේතු විය. මෙම හිඟයන් කර්මාන්තයට සෘජු බලපෑමක් ඇති කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ගුවන් ගමන් කාලසටහන්වලට අදාළ ගැළපීම් සිදු කිරීම සහ මෙහෙයුම් ධාරිතාව අඩු කිරීම සිදු විය. මීට අමතරව, ගෝලීය වෙළඳපොළේ ඉන්ධන මිල ඉහළ යාම හේතුවෙන් මෙම අංශයේ පිරිවැය පදනමට අමතර පීඩනයක් ඇති වූ අතර එය ඉන්ධන වියදම්වල කැපී පෙනෙන ඉහළ යාමක් ඇති කළේය.

ලොව පුරා අභියෝග පැවති පසුබිමක, වසරේ මුල් භාගයේදී දේශීය වශයෙන් ආර්ථික හා දේශපාලනික ගැටලුකාරී තත්ත්වයකට මුහුණ දීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හට සිදු විය. දේශපාලන නොසන්සුන්තාව සමඟ ඇති වූ ආර්ථික අර්බුදය හේතුවෙන් ගුවන් සමාගමට සැලකිය යුතු අලාභයක් සිදු විය. මුදල් අවප්‍රමාණය වීම සහ පොලී අනුපාත ඉහළ යාම හේතුවෙන් ණය බැඳීම වැඩි කිරීමක්ද මේ හරහා සිදු විය. ශ්‍රී ලංකාවට 'අත්‍යවශ්‍ය සංචාර පමණක්' ප්‍රකාශ කෙරෙන සංචාරක උපදේශන හේතුවෙන් සංචාරක ව්‍යාපාරයේ සැලකිය යුතු අන්දමේ අඩුවීමක් වාර්තා විය. එය සංචාරක ඉල්ලුමේ සැලකිය යුතු අඩුවීමක් ඇති කිරීමට හේතු විය. ඊට අමතරව, 2022 ජූනි සිට අගෝස්තු දක්වා කොළඹ ගුවන් යානා ඉන්ධන සැපයුමේ දැඩි හිඟයක් ඇති වීම ගමන් කාලසටහන් වෙනස් කිරීමට සහ මෙහෙයුම් පිරිවැය ඉහළ යාමට හේතු විය.

### උපායමාර්ගික ප්‍රවේශය

මෙවැනි සංකීර්ණ වූත් අභියෝගාත්මක වූත් වාතාවරණයක් තුළ කටයුතු කිරීම සඳහා සමාගමෙහි අභ්‍යන්තර ක්‍රියාවලීන් නැවත තක්සේරු කිරීම සහ ඵලදායිතාව ඉහළ නැංවීම අරමුණු කරගත් පියවර රැසක් ක්‍රියාත්මක කිරීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හට සිදු විය. එබැවින්, සමාගම විසින් පිරිවැය ප්‍රතිව්‍යුහගත කිරීමට යොමු වූ අතර ගෙවීම් නියමයන් පිළිබඳ ප්‍රධාන සැපයුම්කරුවන් සමඟ සාකච්ඡා කළේය. එකල ප්‍රධාන ප්‍රමුඛතාවයක් වූයේ සේවා සැපයිය යුතු ගුවන් යානා ඇණියක් නඩත්තු කිරීමේ අභියෝගයට මුහුණ දීමයි. මෙය අනිවාර්ය නඩත්තු අවශ්‍යතා නිසා නිතර බාධාවට පත් වූවකි. ගුවන් සමාගම විසින් සේවා සැපයුම්කරුවන් සමඟ කාලීන සාකච්ඡාවල නියැලීම හරහා මෙකී ගැටලුවට පිළියම් යොදන ලදී.

ධාරිතා සීමාවන් මධ්‍යයේ ආදායම් උත්පාදනය පිළිබඳ ගැටලුව මෙකී කාලපරිච්ඡේදයේදී ගුවන් සමාගම මුහුණ දුන් තවත් විශේෂ අභියෝගයක් විය. ඊට ප්‍රතිචාර වශයෙන්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් දැනට පවතින ගුවන් ගමන් මාර්ග පිළිබඳ පුළුල් ඇගයීමක් සිදු කරන ලද අතර වඩාත්ම ලාභදායී ඒවා හඳුනාගෙන, ඒ අනුව එහි ධාරිතාව ප්‍රශස්ත කිරීමට කටයුතු කරන ලදී. පවතින මාර්ගවල ගමන් වාර ගණන වැඩි කරන අතරම ගුවන් සමාගම විසින් ප්‍රධාන ගමනාන්තයන් වෙත වන සේවා නැවත ආරම්භ කරන ලදී.

# සභාපතිතුමාගේ වාර්තාව තවදුරටත්.

රට තුළ පවතින අයහපත් තත්ත්වය හේතුවෙන් මඟී පැමිණීමේ සැලකිය යුතු අඩුවීමක් හඳුනා ගත් ශ්‍රීලංකන් එයාර්ලයින්ස්, ගුවන් භාණ්ඩ ප්‍රවාහනය සහ අනුබද්ධ සේවා ශක්තිමත් කරමින් ආදායම් ඉපැයීම සඳහා සංක්‍රමණ ගමනාගමනය තුළින් ආදායම් උත්පාදනය කිරීම කෙරෙහි අවධානය යොමු කළේය. ශ්‍රීලංකන් ඉන්ජිනියරින් හරහා අනෙකුත් ගුවන් සමාගම්වලට විශාල නඩත්තු සේවා සැපයීම කෙරෙහිද ගුවන් සමාගම අවධානය යොමු කොට ඇති අතර, එමඟින් එහි ආදායමට අමතර දායකත්වයක් සැපයේ.

සේවාවේ ගුණාත්මකභාවය සහ තිරසාර ප්‍රගතිය යන දෙකම තීරණය කිරීමේදී පාරිභෝගික අත්දැකීම අත්‍යවශ්‍ය පරාමිතියක් වන අතර, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් සේවා මට්ටම් ඉහළ නැංවීමට පියවර ගන්නා ලදී. සියලු ක්ෂේත්‍ර කෙරෙහි පූර්ණ සැලකිල්ලක් දක්වමින් කාර්යයන් ඉටුකිරීම මෙන්ම පාරිභෝගික අභිමතයන්ට ගැළපෙන පරිදි සිය සේවාවන් සකස් කිරීම කෙරෙහි ගුවන් සමාගම විශේෂ අවධානයක් යොමු කොට තිබේ. තවද, අභ්‍යන්තර ක්‍රියාවලීන් හි කාර්යක්ෂමතාවය සහතික කරන ලද අතර ප්‍රධාන ගුවන් සේවා පද්ධති නවීකරණය කරන ලදී. එසේම පාරිභෝගික අපේක්ෂාවන් සපුරාලීමට සහ ඔවුන්ගේ තෘප්තිය වැඩි කිරීමට ගුවන් යානයේදී මෙන්ම භූමියේදී ඔවුන් ලබන සමස්ත පාරිභෝගික අත්දැකීම වැඩිදියුණු කරන ලදී.

ආර්ථික අර්බුදයෙන් සහ දේශපාලන නොසන්සුන්තාවයෙන් පසුව ශ්‍රී ලංකාව අනාරක්ෂිත සංචාරක ගමනාන්තයක් වශයෙන් වර්ධනය වූ ඍණාත්මක ආකල්පය සැලකිල්ලට ගනිමින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් රට සාමකාමී මෙන්ම ආරක්ෂිත සංචාරක ගමනාන්තයක් ලෙස නිරූපණය කිරීමේ අරමුණින් අලෙවිකරණ ව්‍යාපාර කිහිපයක් දියත් කළේය. මෙම ප්‍රයත්නයන් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ ප්‍රතිසාධනය සහ වර්ධනය සඳහා ඉවහල් වූ අතර ශ්‍රී ලංකාව ප්‍රමුඛ ගමනාන්තයක් වශයෙන් සහතික කිරීමට එය උපකාරී විය.

### ප්‍රශංසනීය කාර්යසාධනය

මූල්‍යමය වශයෙන් සාර්ථක වසරක් වෙනුවෙන් මෙම සියලු ක්‍රියාමාර්ගයන් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හට දායක විය. සමූහය විසින් පසුගිය මූල්‍ය වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය වූ රුපියල් බිලියන 1.7 ට සාපේක්ෂව සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 43.4 ක මෙහෙයුම් ලාභයක් (විනිමය අලාභ සඳහා ගිණුම්ගත කිරීමට පෙර) අත්කර ගනු ලැබීය. කෙසේ වෙතත්, මූලික වශයෙන් මූල්‍ය පිරිවැය රුපියල් බිලියන 51.5 ක් සහ විනිමය අලාභ රුපියල් බිලියන 63.1 ක් වූ බැවින් සමූහය විසින් රුපියල් බිලියන 71.3 ක ශුද්ධ අලාභයක් වාර්තා කරන ලදී.

මෙම කාලසීමාව තුළ සමූහය මඟී සහ භාණ්ඩ ප්‍රවාහන ආදායම් යන දෙඅංශයෙන්ම සැලකිය යුතු වර්ධනයක් අත්කර ගෙන තිබේ. ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි මඟී ආදායම 276% කින් ඉහළ ගොස් ඇති අතර, පසුගිය වසරට සාපේක්ෂව මගීන්ගේ 137% ක වැඩිවීම සහ විනිමය ක්ෂයවීම්වල බලපෑම ප්‍රධාන වශයෙන් මෙම වැඩි වීමට හේතු වී ඇත. භාණ්ඩ හා අනෙකුත් ආදායම්ද පෙර වසරට සාපේක්ෂව 35% ක වර්ධනයක් අත්කර ගෙන තිබේ.

එසේ වුවද, 2021/22 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව සමූහයේ මුළු වියදම 48% කින් ඉහළ ගොස් ඇති අතර, ඉහළ ගිය මෙහෙයුම් ක්‍රියාකාරකම් සහ එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමේ අහිතකර බලපෑම් ප්‍රධාන වශයෙන් එයට හේතු විය.

### ප්‍රධාන කඩයිම්

අර්බුධ හමුවේ අනුවර්තනය වීමට, නව්‍යකරණයන් සිදු කිරීමට සහ ශක්තිමත්ව රැඳී සිටීමට ගුවන් සමාගම සතු හැකියාව පිළිබඳ පරීක්ෂා කළ කාලයක් වශයෙන් මෙම කාලය හැඳින්විය හැකිය. එබැවින්, සියලු ප්‍රයත්නයන් සමඟ, පෙර නොවූ විරූ අභියෝග මධ්‍යයේ මූල්‍ය ස්ථාවරත්වය කරා ළඟාවීම කැපී පෙනෙන ජයග්‍රහණයක් විය. ප්‍රශංසනීය කාර්යසාධනයක් පවත්වා ගැනීම ගුවන් සමාගම සතු ඔරොත්තු දීමේ හැකියාව, ක්‍රමෝපායන්හි ඵලදායීබව සහ සේවකයින්ගේ නොසැලෙන කැපවීම පිළිබඳ තවත් සාක්ෂියකි. සියලු බාධක මධ්‍යයේ වුවද, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සිය සේවා මට්ටම් ඉහළ නැංවීම වෙනුවෙන් කැපවී කටයුතු කළ අතර, ගුවන් සමාගම මඟින් පිරිනමනු ලබන පාරිභෝගික කේන්ද්‍රීය සේවාව සහ කැපී පෙනෙන ගෝලීය අලෙවිකරණ සන්නිවේදන ක්‍රියාමාර්ගයන් ඇගයීමට ලක් කරමින් වසර තුළ සමාගමට හිමි වූ සම්මාන කිහිපයක් මඟින් මෙකී ප්‍රයත්නයන් සඳහා නිසි පිළිගැනීමක් ලැබිණි.

### තිරසාර ගුවන් සේවය

පාරිසරික වශයෙන් තිරසාර ගුවන් සේවයක් බවට පත්වීම අරමුණු කරගත් බැවින් පරිසරය වෙනුවෙන් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි කැපවීම සුවිශේෂී වේ. දේශගුණික විපර්යාස කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම පිළිබඳ සලකා බැලීමේදී, මිහිතලය ආරක්ෂා කිරීමේ සාමූහික වගකීම පිළිබඳ ගුවන් සමාගම විසින් සලකා බැලෙන අතර 2050 වන විට ගුවන් සේවාවලින් සිදුවන කාබන් විමෝචනය ශුද්ධ ශූන්‍ය අගයක් බවට පත් කිරීම සඳහා ප්‍රතිඥා දී ඇත. ඒ සඳහා ගුවන් සමාගමේ කාබන් පියසටහන අඩු කිරීම, ඉන්ධන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ පරිසර හිතකාමී ක්‍රියාමාර්ග ක්‍රියාකාරීව ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කරන ලදී. මෙසේ අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග අගයමින්, ගුවන් සමාගම 2022 ගෝලීය ගුවන් සේවා සම්මාන උළෙලේදී "හොඳම ගුවන් සේවා තිරසාර වැඩසටහන - සමාජ-ආර්ථික අංශය" සම්මානයෙන් පිදුම් ලැබීය.

### ඵලදායී පාලනය

ස්ථිරසාර වර්ධනයක් වෙනුවෙන් නිවැරදි දිශාවට සංවිධානය මෙහෙයවමින් එහි පදනම ශක්තිමත් කරන සංවිධානයේ පාලන ව්‍යුහය ගුවන් සේවය සවිබල ගැන්වීමෙහි අඛණ්ඩව නියැලී සිටී. ගුවන් සමාගම තුළ සාධාරණත්වය, වගකීම, විනිවිදභාවය සහ වගවීම සහිත සංස්කෘතියක් පෝෂණය කරමින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ඉහළම පාලන ප්‍රමිතීන් වෙනුවෙන් පෙනී සිටිමින් ඒවා පවත්වා ගනු ලබයි. සමාගමෙහි සේවා ආචාර ධර්ම, මූලික වටිනාකම් සහ නිරන්තර ඇගයීමට සහ වැඩිදියුණු කිරීම්වලට භාජනය වන වගවීම සහ විනිවිදභාවය පිළිබඳ ශක්තිමත් රාමුව තුළින් එකී කැපවීම පිළිබිඹු වේ.

### ඉදිරි දැක්ම

ගුවන් ගමන් සඳහා ඇති ඉල්ලුම අඛණ්ඩව වර්ධනය වන බැවින්, ගුවන් සේවය සඳහා වන අපේක්ෂාවන් ධනාත්මකව පවතී. රුපියල් බිලියන 51.5 ක පොලී වැඩිවීමක් සිදු වුවද, දශක එකහමාරකට පසු පළමු වතාවට ගුවන් සමාගම සතුටුදායක ලාභයක් වාර්තා කළේය (විගණනය නොකළ ඇමරිකානු ඩොලර් කළමනාකරණ ගිණුම්). සම්පත් භාවිතයෙහිදී ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් අනුගමනය කරන ප්‍රශස්තකරණ ප්‍රයත්නයන් සහ කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම් මෙන්ම වඩාත් හිතකර සාර්ව ආර්ථික පරිසරයද

වසරේ අග භාගයේදී සංචාරක හා ගුවන් ගමන් කෙරෙහි සහය වූ අතර මෙම ප්‍රගතිය සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රධාන කාර්යභාර්යක් ඉටු කළේය.

ගුවන් සේවය වර්ධනය සඳහා වන මාවතක් වෙත යොමු කිරීමේදී, සේවා විශිෂ්ටත්වය සහ පාර්භෝගික විශ්වසනීයත්වය තිරසාරව පවත්වාගෙන යාම අරමුණු කරගත් සේවා වැඩිදියුණු කිරීම්, මානව සම්පත් සංවර්ධනය, පුහුණු වැඩසටහන්, උපකරණ වැඩිදියුණු කිරීම් සහ ක්‍රියාවලි ප්‍රසාධනය ඇතුළු බහුවිධ ක්‍රියාමාර්ග හරහා මෙහෙයුම් ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් කටයුතු කරනු ඇත. ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියානු කලාපයේ නව ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම් ඇති කර ගනිමින් නඩත්තු ආදායම පුළුල් කිරීම කෙරෙහිද අවධානය යොමු කරනු ඇත. මීට අමතරව, වඩාත් ලාභදායී ආදායම් උත්පාදන අපේක්ෂාවන් පිළිබඳ ඵලදායී විශ්ලේෂණයක් හරහා ශක්තිමත් ජාලයක් ගොඩනඟන අතරම ප්‍රසම්පාදන ක්‍රියාමාර්ගයන් කඩිනමින් ක්‍රියාත්මක කිරීමත් සමඟ ගුවන් සේවා සහතික කිරීමට ගුවන් සමාගම කැපවී සිටී.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ප්‍රතිව්‍යුහගත කිරීම සහ පෞද්ගලීකරණය කිරීම සඳහා වන රජයේ ප්‍රයත්නයේදී, රාජ්‍ය හිමිකාරිත්වය සහිත ව්‍යවසාය ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකය (SOERU) සමඟ සමාගම සමීපව කටයුතු කරන අතර සමාගමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පහසුකම් සැපයෙන මූල්‍යමය වශයෙන් තිරසාර, තරඟකාරී, පාරිභෝගික කේන්ද්‍රීය සංවිධානයක් බවට පරිවර්තනය කිරීමක් මෙහිදී සිදු වේ.

ශ්‍රී ලංකාව ගුවන් සේවා මධ්‍යස්ථානයක් ලෙස ස්ථාපිත කිරීමට එහි අද්විතීය භූගෝලීය පිහිටීම සුවිශේෂී දායකත්වයක් සපයනු ලබයි. ආර්ථික හා සමාජීය සංවර්ධනයක් ඇති කිරීමට සහ දේශය සමෘද්ධිමත් කිරීමට මෙමඟින් හැකි වනු ඇත. එබැවින් ගුවන් සේවා ක්ෂේත්‍රය පෝෂණය කිරීම සහ කර්මාන්තයේ තරඟකාරීත්වය ඉහළ නැංවීම සඳහා ගුවන් සැලැස්මක් සකස් කිරීම ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි අනාගත ප්‍රගතිය සඳහා තීරණාත්මක සාධකයක් වනු ඇත.

## ස්තූතිය

අපගේ වටිනා පාරිභෝගික ප්‍රජාව වශයෙන් සැලකෙන දේශීය සහ ජාත්‍යන්තර මගීන්ගේ නොසැලෙන පක්ෂපාතීත්වය සහ අඛණ්ඩ අනුග්‍රහය වෙනුවෙන් ඔවුන්ට මගේ කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ වෙත ලබා දුන් සහයෝගය සහ විශේෂඥතාව වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ මා හිතවත් සාමාජිකයින්ට සහ මෙම අභියෝගාත්මක කාල පරිච්ඡේදය තුළ නායකත්වය ලබා දුන් ප්‍රධාන විධායක නිලධාරී රිචඩ් නට්ල් මහතාට මම මගේ ස්තූතිය පුද කරමි. අභියෝගාත්මක කාලපරිච්ඡේදය තුළ ගුවන් සේවය පවත්වාගෙන යාම සඳහා උනන්දුවෙන් සහ ඉතා ඕනෑකමින් කටයුතු කළ කළමනාකරණ කණ්ඩායමට මම ස්තූතිවන්ත වෙමි.

ශ්‍රී ලංකා රජය, අතිගරු ජනාධිපතිතුමා, ගරු වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා, භාණ්ඩාගාර ලේකම්තුමා, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ ගුවන් සමාගමේ ප්‍රගතිය සඳහා අඛණ්ඩ සහයෝගය සහ දායකත්වය සපයන අදාළ ආයතනවල නිලධාරීන් වෙනුවෙන් කෘතඥතාව පළ කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. තවද අපගේ කොටස් හිමියන් ලබාදුන් සහයෝගයට ද මාගේ කෘතඥතාවය පළ කරමි.

ගුවන් සමාගමේ මෙහෙයුම් තිරසාරව පවත්වාගෙන යාමට සහ අනාගත වර්ධනය වෙනුවෙන් දායක වෙමින් කැපවීමෙන් සහ වෙහෙස මහන්සි වී වැඩ කරන සේවකයින්ට මම මගේ හදපිරි කෘතඥතාව පුද කරමි.

**අශෝක පතිරගේ**
*සභාපති*

# ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය

**"ගෝලීය වර්ධනයන්, ආර්ථික හා දේශපාලනික අස්ථාවරත්වයන් සහ ධාරිතා සීමාකිරීම් වැනි අභියෝගවලට සාර්ථකව මුහුණ දුන් ශ්‍රීලංකන් එයාර්ලයින්ස්, විශේෂයෙන් වසරේ දෙවන භාගයේදී කැපී පෙනෙන ප්‍රගතියක් පෙන්නුම් කළේය.**

**වසර පුරාවටම, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් අවධානය යොමු කළ මූලික කරුණක් වූයේ වර්ධනය සඳහා අවස්ථාවන් ලත් විගස ඒ සඳහා සිය මෙහෙයුම් ස්ථාවරත්වය යළි ස්ථාපිත කිරීමයි."**

2022/2023 මූල්‍ය වර්ෂය සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ ඔබ වෙත ඉදිරිපත් කරනු ලබන්නේ ඉමහත් සතුටිනි.

ලෝකය වසංගත තත්ත්වයෙන් යථා තත්ත්වයට පත් වෙමින් පැවතීම, සාමාන්‍ය ලෙස කාර්යයන් පවත්වා ගැනීමට කටයුතු කිරීම මෙන්ම රට තුළ සහ ලොව පුරා බලපෑමට ලක් වූ ආර්ථිකයන් යළි ගොඩනැගීමට කටයුතු කිරීම වැනි කාරණා හේතුවෙන් මෙම වසර ගෝලීය වශයෙන් වඩාත් සුවිශේෂී වසරක් විය. මෙකී වෙනස්කම් ගුවන් සේවා කර්මාන්තය සඳහාද බලපැවැත්විණ. ලොව පුරා ගුවන් සංචාරයන් එහි පශ්චාත් කෝවිඩ් සමයේ පැවැති තත්වයෙන් භාගයකට කෙමෙන් වර්ධනය වූ අතර, දුර්වල ගෝලීය ආර්ථික හේතුවෙන් ඇති වන අභියෝග මඟින් ගුවන් ප්‍රවාහන සඳහා ඉහළ යන ඉල්ලුම සපුරාලීමට කර්මාන්තයේ පවතින හැකියාවන්ට බාධා ඇති කරනු ලැබිණ.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් වසරේ මුල් භාගය තුළදී පැවති දේශීය ආර්ථික සහ දේශපාලනික අස්ථාවරත්වය හේතුවෙන් මෙකී ගෝලීය උපද්‍රවයන්ට මුහුණ දෙනු ලැබිණ. කෙසේ වෙතත් මූල්‍ය වර්ෂයේ පසු කාලය තුළදී ගුවන් සේවා කර්මාන්තය තුළ ඇතිවන මූලික බාධාවන් අවම කර ගැනීමට ගුවන් සමාගම උදෙසා වඩාත් හිතකර පසුබිමක් ඇති කරමින්, ගෝලීය මෙන්ම දේශීය සාර්ව ආර්ථික තත්ත්වයන්ගේ සැලකිය යුතු වර්ධනයක් දැකගත හැකි විය.

### කර්මාන්තයේ දළ විශ්ලේෂණය

2022 වර්ෂයේදී ගුවන් සේවා කර්මාන්තය තුළ අනාගත වර්ධන අවස්ථාවන් සඳහා අඩිතාලමක් සපයමින් සුවිශේෂී ශක්‍යතාවයක් පෙන්නුම් කරන ලදී. පශ්චාත් කෝවිඩ් අවධියේ ලිහිල් කරන ලද සංචාරක සීමා සහ ඉහළ යන ඉන්ධන මිල ගණන් මධ්‍යයේ එයාර්ලයින්ස් විසින් ක්‍රියාත්මක කරන ලද දැඩි පිරිවැය පාලන ක්‍රියාමාර්ග හේතුවෙන් මඟී ඉල්ලුම අඛණ්ඩව වර්ධනය විය. කෙසේ වෙතත් ඇතැම් කලාප වල සංචාරක සීමා නැවත ක්‍රියාත්මක කිරීම, සේවක හිඟය, ඉහළ පිරිවැය, සැපයුම් දාමයේ ඇති වූ බාධා සහ ආර්ථිකයේ අනපේක්ෂිතතා වැනි නිරන්තර අභියෝග හමුවේ කර්මාන්තයේ කාර්යසාධනය සහ ලාභදායිත්වයට බලපෑම් ඇති වූ අතර, එහි පුරෝකථනයන්ටද බාධා පමුණුවන ලදී.

කෙසේ වෙතත්, මෙම අංශය ඉහළ කාර්යක්ෂමතාව සහ වර්ධනය වන ආදායම යන කරුණු මූලිකව හේතු කොට, කෙටි කාලයකදී වේගවත්ව වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරනු ලබයි. ගුවන් සේවා කර්මාන්තය ඇ.ඩො බිලියන 6.9 ක සැලකිය යුතු ශුද්ධ අලාභයක් වාර්තා කළ අතර එය ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමයේ (IATA) ජූනි මස පුරෝකථනයන් හි දැක්වෙන ඇ.ඩො බිලියන 9.7ක අලාභයට සාපේක්ෂව හිතකර තත්ත්වයක් වේ. මෙය පිළිවෙලින් 2021 සහ 2020 වර්ෂයන්හි උපයන ලද ඇ.ඩො බිලියන 42.0 සහ ඇ.ඩො බිලියන 137.7ක සැලකිය යුතු අලාභයන්ට සාපේක්ෂව වර්ධනයක් පෙන්නුම් කරනු ලබයි. අප විසින් යථා තත්ත්වයට පත්වීමේ ස්ථිර පිළිවෙතක් සැලසුම් කරන හෙයින් 2023 වර්ෂයේදී ඇ.ඩො බිලියන 4.7ක ලාභදායිත්වයක් සමඟ මඟී ආදායම වර්ධන වනු ඇතැයි අපේක්ෂා කරන්නෙමු. (IATA මාධ්‍ය නිවේදනය 56. 2022).

ශ්‍රීලංකන් ගුවන් සේවය විසින් මූල්‍ය වර්ෂයේ මුල් භාගයේදී මුහුණ දෙන ලද අභියෝග අතරට ජෙට් ඉන්ධන හිඟ වීම, යුරෝපීය ගැටුම් හේතුවෙන් ඉන්ධන මිල ඉහළ යාම, ඉහළ පොලී අනුපාතික තත්ත්වය, උද්ධමනීය බලපෑම්, සංචාරක උපදේශන හේතුවෙන් සංචාරක ව්‍යාපාරය අඩු වීම, MRO කටයුතු වල (නඩත්තු කිරීම, අලුත්වැඩියා කිරීම, සහ පූර්ණ අලුත්වැඩියාව) අප්‍රමාණවත් බව සහ සැපයුම් දාමයේ සීමාවන් ඇතුළත් වේ. එසේම යහපත් අවස්ථාවන් තකා ගුවන් සේවයේ නියුතු පුහුණු විශේෂඥයින් විදෙස්ගත වීම හේතුවෙන් කර්මාන්තය විසින් බුද්ධි ගලනයට මුහුණ පාන ලදී.

මූල්‍ය වර්ෂයේ පසු අවධියේදී සංචාරකයින්ගේ පැමිණීම ඉහළ යාම, ජෙට් ඉන්ධන සැපයුම් ස්ථාවරයකට පැමිණීම මෙන්ම විනිමය අනුපාතිකයේ අස්ථාවරත්වය අඩු වීම වැනි කාරණා දැක ගත හැකි වූ හෙයින් ශ්‍රීලංකන් ගුවන් සේවා කර්මාන්තයේ මෙහෙයුම් පසුබිම තුළ වඩාත් හිතකර තත්ත්වයක් ඇති විය.

## ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි කාර්යසාධනය

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් ගෝලීය වර්ධනයන්, ආර්ථික සහ දේශපාලනික බාධාවන් සහ ශක්‍යතා සීමාවන් හේතුවෙන් ඇති වූ අභියෝග සාර්ථකව හසුරුවන ලද හෙයින් 2022/23 මූල්‍ය වර්ෂය තුළ, ප්‍රධාන වශයෙන්ම වසරේ දෙවන භාගයේදී සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන ලදී. ආදායම වර්ධනය කිරීම වෙනුවෙන් අභියෝග නොතකා කාර්යක්ෂමව කටයුතු කිරීමේ ප්‍රයත්නයන්ගේ ප්‍රතිඵලයන් ගුවන් සමාගමේ මූල්‍ය කාර්ය සාධනය තුළින් දැකගත හැකිය.

එයාර්ලයින්ස් විසින් වර්ධනය වූ සංචාරක ව්‍යාපාරය, ස්ථාවර ජෙට් ඉන්ධන සැපයුම ඇතුළු වර්ධිත මෙහෙයුම් පසුබිම හේතුවෙන් වසරේ පසු භාගයේදී ව්‍යාපාරයේ මූලික ක්‍රියාකාරී මුදල් ඒකකය වන ඇමරිකානු ඩොලර් වලින් ශුද්ධ ලාභයක් අත් කර ගන්නා ලදී. ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් මූල්‍ය වර්ෂය සඳහා ශ්‍රීලංකානු රුපියල් බිලියන 365 ක ආදායමක් වාර්තා කර අතර, පෙර මූල්‍ය වර්ෂයේ මෙහෙයුම් ලාභය වූ රු. බිලියන 1.20 සාපේක්ෂව මෙම වර්ෂයේදී රු. බිලියන 40.7ක මෙහෙයුම් ලාභයක් (විනිමය අලාභ ගිණුම් කිරීමට පෙර) වාර්තා කරන ලදී. කෙසේ වෙතත් වර්ෂය තුළ ශ්‍රී ලංකානු රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් රු. බිලියන 63.8ක විනිමය අලාභයක් සහ විනිමය මූල්‍ය සහ මූල්‍ය ගාස්තු ගණනය කිරීමෙන් පසුව සම්පූර්ණ වර්ෂය සඳහා රු. බිලියන 73.6ක ශුද්ධ අලාභයක් ඇති විය.

ගුවන් භාණ්ඩ සේවා අංශය විසින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ආදායම වෙත දළ වශයෙන් 14%ක දායකත්වයක් දක්වමින් වර්ෂය තුළ දී රුපියල් බිලියන 51ක ආදායමක් උත්පාදනය කරන ලදී. කෙසේ වෙතත් ඉහළ ධාරිතාවක් පැවතියද මිලදී ගැනීමේ ශක්‍යතාවයන් අවම කළ මෙන්ම වෙළඳ පරිමාවේ වර්ධනය අවහිර කළ අති උද්ධමනය සහ ඉහළ පොලී අනුපාතයෙහි බලපෑමෙන් ආනයන සහ අපනයන සඳහා ඇති ඉල්ලුම අවම වීම නිසාවෙන් මෙම අංශය පසු බෑමකට ලක් විය.

වර්ෂය පුරා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් අවධානය යොමු කළ එක් පැතිකඩක් වනුයේ අවස්ථාවන් උදා වූ කලක වර්ධනයක් අත් කර ගැනීම වෙනුවෙන් මෙහෙයුම් ස්ථාවරත්වය යළි නඟා සිටු වීමයි. ඒ සඳහා සම්පත් වර්ධනය කරන ලදී, අභ්‍යන්තර ක්‍රියාවලීන් වඩාත් කාර්යක්ෂම කරන ලදී, එමෙන්ම අභ්‍යන්තර මෙන්ම ගොඩබිම් සේවා හි පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කරන ලදී. මගීන් වෙනුවෙන් ශ්‍රී ලාංකීය රසයන් අනූන නව කෑම වට්ටෝරුවක් හඳුන්වාදීම මෙන්ම, අන්තර්ජාලය හරහා ආසන වෙන් කරවා ගැනීමේ පහසුකම් සලසමින් එයාර්ලයින්ස් හි වෙබ් පිටුව වෙත වෙනස්කම් සිදු කිරීම ඉතා වැදගත් සංවර්ධනයන් ලෙස දැක්විය හැකිය.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් ආදායම් උත්පාදන ස්ථාවර තත්ත්වයක පවත්වා ගැනීම උදෙසා, පවතින පසුබිම තුළ ව්‍යාපාර වර්ධනය උදෙසා වඩාත් ලාභදායී ක්‍රමවේදයන් හඳුනාගන්නා ලදී. මේ අතරට ප්‍රධාන ගමනාන්ත වෙත නැවත ගමන් ආරම්භ කිරීම සහ ඉන්දියානු උප මහද්වීපය සහ ඈත පෙරදිග හි පවත්නා ගමනාන්ත වෙත සංඛ්‍යාත ප්‍රමාණය වැඩි කිරීම ඇතුළත් වේ. එමෙන්ම ශ්‍රී ලංකාව වෙත සංචාරක සීමා පැවති කාලය තුළ ආදායම් උපයා ගැනීම උදෙසා ගුවන් සමාගම විසින් සංක්‍රමණ ගමනාගමන කෙරෙහි අවධානය යොමු කරන ලදී.

එසේම ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් එහි පාරිපාලිතය සහ ව්‍යාපාර ඒකක මඟින් උත්පාදනය කරනු ලබන ආදායම් තවදුරටත් වර්ධනය කරන ලදී. ශ්‍රීලංකන් ඉංජිනියරින් ශක්තිමත් කරමින්, ගුවන් සමාගම විසින් අනෙකුත් ගුවන් සමාගම් වෙත විශාල නඩත්තු සේවා පිරිනැමීම, එහි තෙවන පාර්ශ්ව නඩත්තු සේවා පුළුල් කිරීම සහ ඒ සඳහාම වූ වෙබ් අඩවියක් ආරම්භ කිරීම සිදු කරන ලදී. මීට අමතරව, නියමිත වේලාවට සේවා සැපයීම සහතික කිරීම සඳහා ස්වයං-පරීක්ෂා කිරීමේ පද්ධතියක් හඳුන්වා දෙමින්, සීමිත ධාරිතාවක් යටතේ ගොඩබිම් හැසිරවීමේ ව්‍යාපාරය මඟින් විශිෂ්ට සේවාවක් පිරිනමන ලදී. එයාර්ලයින්ස්හි පුහුණු අංශය වන ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යාලය විසින් ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලව අඛණ්ඩව ගුවන් සේවා පුහුණුව ලබා දෙන ලදී. එසේම ඉදිරියේදී උපාධි මට්ටමේ පාඨමාලා පිරිනැමීමට සහ, අමතර ආදායමක් උත්පාදනය වන අන්දමින් ගෝලීය පැවැත්ම පුළුල් කිරීමට සැලසුම් කරනු ලබයි.

එයාර්ලයින්ස් විසින් ශ්‍රී ලංකාව ප්‍රමුඛ සංචාරක ගමනාන්තයක් ලෙසත් සුරක්ෂිත ගමනාන්තයක් ලෙසත් විදහා දක්වන ඉලක්කගත අලෙවිකරණ ව්‍යාපාරයන් සිදු කරන ලදී. එමෙන්ම එමඟින් ලොව පුරා ප්‍රමුඛ සංචාරකයින් නියෝජිතයන් මෙන්ම සංචාර මෙහෙයවන්නන් ආකර්ෂණය කරගත් ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි ගෝලීය විකුණුම් සමුළු වැනි උත්සව වෙනුවෙන් සත්කාරකත්වය ලබා දෙන ලදී. එමෙන්ම ගුවන් සාමාගම විසින් ලොව ප්‍රකට ප්‍රංශයේ ත්‍රාසජනක සංචාරයක් වන රේයිඩ් ඇමසෝන් වෙත 2022 සඳහා සත්කාරකත්වය ලබා දුන් අතර ඉන්දියානු පාරිභෝගිකයින් ඉලක්ක කර ගනිමින් 'Dill Full of Sri Lanka' නම් ව්‍යාපාරය දියත් කරන ලදී.

## වැදගත් සිදුවීම්

සුපුරුදු පරිදි නොගෙවුණු වර්ෂයක් වුවද, මෙහෙයුම් ස්ථිරව පවත්වා ගැනීම සහ තෘප්තිමත් කාර්යසාධනයක් අත් කර ගැනීම තුළින් සුවිශේෂ ජයග්‍රහණයක් පෙන්නුම් කෙරිණ. ශ්‍රී ලංකාව සහ සිංගප්පූරුව අතර නිරන්තර ගුවන් සබඳතා පවත්වා ගැනීම වෙනුවෙන් සහ මගීන්ගේ ගමනාගමනයට සහය වීම වෙනුවෙන් දැරූ ප්‍රයත්නය අගයමින්, 15 වැනි චැංගි ගුවන් සේවා සම්මාන උළෙලේදී ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් 'Resilience Award' සම්මානය ලබා ගැනීම තුළින් අනපේක්ෂිත අභියෝග හමුවේ එමඟින් දක්වන ලද කැපවීම සහ අධිෂ්ඨානය අවධාරණය කරනු ලබයි.

## තිරසාරකත්ව අරමුණු

වගකීමෙන් යුතු ගුවන් සේවයක් ලෙස ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් ගුවන් සේවා මඟින් ඇති වන පාරිසරික බලපෑම කෙරෙහි අවධානය යොමු කිරීමේ වැදගත්කම හඳුනා ගනු ලබයි. ගුවන් සමාගම විසින් එහි පාරිසරික

# ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය තවදුරටත්.

පියසටහන අඩු කිරීම අරමුණු කරගත් ව්‍යාපෘති ඇතුළුව ගුවන් ගමන් වඩාත් තිරසාර කිරීමට අවැසි ක්‍රියාමාර්ග ගෙන ඇත. මේ අතරින් 'මතක' යනු ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි නැවත භාවිත කිරීම් වෙනුවෙන් වූ එක් වැදගත් ව්‍යාපෘතියකි. එතුළින් ගුවන් සමාගමේ ඉවතලන ද්‍රව්‍ය, විවිධ ජීවන කටයුතු වෙනුවෙන් නැවත භාවිත කිරීමට හැකි ලෙස ප්‍රතිනිර්මාණය කරයි. මෙම ව්‍යාපෘතිය සඳහා ශීක් මොහොමඩ් බින් රෂීඩ් අල් මක්ටොයුම් (SMBR) වෙතින් 'විශිෂ්ටතම ගුවන් සේවා තිරසාර වැඩසටහන සඳහා වන ගෝලීය ගුවන් සේවා සම්මානය' හිමි විය.

## ඉදිරි දැක්ම

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි තෘප්තිමත් කාර්ය සාධනයක් උදෙසා මෙහෙයුම් ස්ථාවරත්වය නැවත තහවුරු කිරීම, පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීම සහ ධාරිතා සීමාවන් මඟහරවා ගනිමින් පිරිවැය අඩු කිරීම වැනි ප්‍රායෝගික ක්‍රියාමාර්ග රැකුලක් විය. ඉදිරියේදී, ගුවන් සමාගම විසින් ඉන්දීය සාගරයේ එහි සුවිශේෂී භූගෝලීය පිහිටුම ප්‍රයෝජනයට ගනිමින් ඉදිරි වසර පහ සඳහා සිය උපායමාර්ගික සැලැස්ම ශක්තිමත් කරනු ඇත. මෙහි අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ ආර්ථික සමෘද්ධියට දායකත්වයක් සපයමින් කලාපයෙන්, විශේෂයෙන් ඈත පෙරදිගින් ගුවන් ගමනාගමනය ආකර්ෂණය කර ගැනීම සඳහා ශක්තිමත් ගුවන් සේවා මධ්‍යස්ථානයක් පිහිටුවීමයි. එසේ වුවද, රටේ පවතින අභියෝගාත්මක ආර්ථික තත්ත්වය හේතුවෙන් සිදුවෙමින් පවතින බුද්ධිගලනය කර්මාන්තය සඳහා මහත් බලපෑමක් ඇති කරනු ලබයි. එබැවින් කර්මාන්තයේ වර්ධනය වන ඉල්ලීම් සපුරාලීම සඳහා නිවැරදි දක්ෂතා සහ කුසලතා රඳවා තබා ගැනීම සහ බඳවා ගැනීම ආදිය ගුවන් සමාගමේ අනාගත වර්ධනයට තීරණාත්මක වනු ඇත.

## ස්තුතිය

අවසාන වශයෙන්, මෙම අභියෝගාත්මක කාලපරිච්ඡේදය තුළ නොවෙනස්ව සහයෝගය ලබා දුන් සභාපතිවරයාට, අධ්‍යක්ෂ මණ්ඩලයට, අපගේ ව්‍යාපාරික හවුල්කරුවන්ට මෙන්ම ශ්‍රී ලංකා රජයට මම මාගේ කෘතඥතාව පුද කර සිටිමි. එමෙන්ම මම අපගේ වටිනා පාරිභෝගිකයින් දැක්වූ පක්ෂපාතිත්වය මෙන්ම පියාසැරි සඳහා අපව තෝරා ගැනීම පිළිබඳ ස්තුතිය පුද කර සිටිමි. සාර්ව ආර්ථික සංවර්ධනයන්ගෙන් ඇති වූ අභියෝග රැසක් මධ්‍යයේ වුවද, සේවා විශිෂ්ටත්වය ඉහළ නැංවීම උදෙසා අපගේ කළමනාකාරිත්ව මෙන්ම සේවකයින් දැක්වූ කැපවීම සහ ස්ථිර විශ්වාසය වෙනුවෙන් මම ස්තුතිය පළ කර සිටිමි. ජාතික ගුවන් සේවය ලෙස ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් ගෝලීය ආර්ථිකයට සම්බන්ධ වීමට පහසුකම් සලසමින් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතර, එමඟින් අපේ රටේ ආර්ථික වර්ධනය සඳහා දොරගුළු විවර කරනු ලබයි.

**රිචඩ් නටොල්**
*ප්‍රධාන විධායක නිලධාරි*

# අධ්‍යක්ෂ මණ්ඩලය

## අශෝක පතිරගේ මහතා

2019 දෙසැම්බර් 16 වන දින සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කෙරුණු අශෝක පතිරගේ මහතා, පසුව සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වන ලදී. හෙතෙම සොෆ්ට්ලොජික් හෝල්ඩින්ග්ස් පීඑල්සී, ආසිරි හොස්පිට්ල් හෝල්ඩින්ග්ස් පීඑල්සී, ආසිරි සර්ජිකල් හොස්පිට්ල්ස් පීඑල්සී සහ ඔඩෙල් පීඑල්සී හි සභාපති/කළමනාකරණ අධ්‍යක්ෂවරයා වේ. එතුමා සමූහයේ සෙසු සමාගම්වලට අමතරව, සොෆ්ට්ලොජික් කැපිටල් පීඑල්සී සහ සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීඑල්සී හි සභාපතිවරයා වශයෙන් සේවය කරයි. එතුමා සීමාසහිත එන්.ඩී.බී කැපිටල් හෝල්ඩින්ග්ස් හි සභාපතිරවරයාද වේ.

ශ්‍රී ලංකාවේ ආයතනික ක්ෂේත්‍රය තුළ පැහැදිලි දර්ශනයක් සහිත ව්‍යාපාරික නියමුවකු වශයෙන් ඇගයුමට පාත්‍ර වන ඒ මහතා, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සමූහ ව්‍යාපාරයක් වන සොෆ්ට්ලොජික් සමූහයේ නිර්මාතෘවරයා ද වේ. ඔහු සතු මනා ප්‍රායෝගික දැනුම් සම්භාරය තුළින්, 10,000 කට අධික සේවක පිරිසකට රැකියා අවස්ථා උදාකරමින්, සමාගම් 50 කට අධික සංඛ්‍යාවක් කළමනාකරණය කරනු ලබයි. ප්‍රධාන වෙළඳපොළකට හිමිකම් කියන, සිල්ලර වෙළඳ සහ විදුලි සංදේශ, සෞඛ්‍යාරක්ෂණ සේවා, මූල්‍ය සේවා සහ තොරතුරු තාක්ෂණය, සහ සංචාරක සමූහය සහ මෝටර් රථවාහන යන සමගාමී ක්ෂේත්‍රයන් හතරක පතිරගේ මහතා විසින් ක්‍රමෝපායික මඟපෙන්වීමක් ලබා දෙයි.

## මලික් ජේ. ප්‍රනාන්දු මහතා

2020 ජනවාරි 08 වැනි දින සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කෙරුණු මලික් ජේ. ප්‍රනාන්දු මහතා, පසුව සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කෙරිණ. හෙතෙම ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ සහ එහි පරිපාලිතයේ විගණන කමිටුවෙහි, මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුවේ සහ ව්‍යවසාය අවදානම් කළමනාකරණ කමිටුවෙහි සාමාජිකයෙකි.

ප්‍රනාන්දු මහතා MJF හෝල්ඩින්ග්ස් හි සමසභාපති ලෙසත් ශ්‍රී ලංකාවේ ප්‍රථම සුඛෝපභෝගී නිකේතන සන්නාමය වන MJF ලෙෂර්/ රෙස්ප්ලෙන්ඩන්ට් සිලෝන් හි සභාපති ලෙසත් කටයුතු කරයි. එමඟින් සංචාරකයින් වෙත සැබෑ දේශීය අත්දැකීමක් ලබාදෙමින් ශ්‍රී ලංකාව පුරා කැපී පෙනෙන සංචාරයක ප්‍රදේශ සංවර්ධනය කරමින්, MJF පදනම සහ "ඩිල්මා කන්සවේෂන්" ඔස්සේ දේශීය ප්‍රජාවන් සහ පරිසරය වෙත දායකත්වය සපයයි. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු, ඒ මහතා විසින් 'ලව් ශ්‍රී ලංකා' "Love Sri Lanka" තේමාව යටතේ පෞද්ගලික සංචාරක ක්ෂේත්‍රය නගා සිටුවීම සඳහා දැවැන්ත කාර්යභාරයක් ඉටු කළේය.

ප්‍රනාන්දු මහතා ඇමරිකා එක්සත් ජනපදයේ බැබ්සන් විද්‍යාලයේ (Babson College) ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිධාරියෙකි.

## ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා

ආචාර්ය හංස විජයසූරිය මහතා, 2020 ජනවාරි 23 වන දින සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්කරන ලදී. හෙතෙම මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුවේ, විගණන කමිටුවේ සහ ව්‍යවසාය අවදානම් කළමනාකරණ කමිටුවේ සාමාජිකත්වය දරයි.

ඒ මහතා දැනට ආසියාටා සමූහයේ විදුලි සංදේශ ව්‍යාපාරයෙහි ප්‍රධාන විධායක නිලධාරිවරයා වශයෙන් කටයුතු කරන අතර මැලේසියාව, ඉන්දුනීසියාව, බංග්ලාදේශය, නේපාලය, ශ්‍රී ලංකාව සහ කාම්බෝජය යන රටවල වෙළඳපොළ පුරා පැතිරුණු සමූහයේ කලාපීය විදුලි සංදේශ මෙහෙයුම්වල ප්‍රධානත්වය උසුලයි. ආසියාටා යනු, ආසියාවේ දෙවන විශාලතම විදුලි සංදේශ සමූහය වේ.

ආසියාටා සමූහයේ කලාපීය පරිපාලිතයන් කීපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් කටයුතු කිරීමට අමතරව, එතුමා ආසියාටා සමූහය සහ ඩයලොග් ආසියාටා පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කරයි. 2016 වර්ෂය දක්වා, ආචාර්ය විජයසූරිය මහතා, ඩයලොග් ආසියාටා පීඑල්සී සමූහයේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කළේය. එමෙන්ම ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ජෝන්කීල්ස් හෝල්ඩින්ස් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ ද සේවය කරයි.

2016 වර්ෂයේදී, "ආසියානු ජංගම සන්නිවේදන ක්ෂේත්‍රයට විශිෂ්ඨ දායකත්වය" සම්මානයෙන් පිදුම් ලද ප්‍රථමයා වශයෙන් ආචාර්ය විජයසූරිය GSM සංගමයෙහි ගෞරවයට පාත්‍රවිය. එතුමා GSM සංගමයෙහි කලාපීය කණ්ඩායම වන GSM ඒෂියා පැසිෆික් හි හිටපු සභාපතිවරයෙකු වේ. ආචාර්ය විජයසූරිය මහතා 2008 වර්ෂයේදී 'ප්‍රිමියර් බිස්නස් ජර්නල්, LMD' සඟරාව මඟින් "වසරේ ශ්‍රී ලාංකිකයා" වශයෙන් නම් කෙරිණි. ආචාර්ය විජයසූරිය මහතා ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ව්‍යාපාරික මණ්ඩලය වන ලංකා වාණිජ මණ්ඩලයේ හිටපු සභාපතිවරයා විය.

# අධ්‍යක්ෂ මණ්ඩලය තවදුරටත්.

## ජෝසප් මයිකල් ජයන්ත් පෙරේරා මහතා

ජේ. එම්. ජයන්ත් පෙරේරා මහතා, 2021 මාර්තු 27 වන දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලද අතර පසුව ඔහු 2021 මැයි 21 දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රීලංකන් කේටරින් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. ඔහු සමූහයේ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි අවදානම් කමිටුවේ සභාපති ලෙසද සමාගමේ සහ එහි පරිපාලිතයෙහි විගණන කමිටුවේ සහ මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුවේ සාමාජිකයෙකු ලෙසද කටයුතු කරයි.

මූල්‍ය අංශයේ වසර 40 කට වැඩි පළපුරුද්දක් පෙරේරා මහතාට ඇති අතර ඉන් වැඩි කාලයක් ඔහු ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව සහ අධ්‍යක්ෂ මණ්ඩල තනතුරුවල සේවය කොට තිබේ.

ඔහු වරලත් බැංකුකරුවන්ගේ ආයතනයේ (ලන්ඩන්) සාමාජිකයෙකු වන අතර ලන්ඩන්, නිව් යෝර්ක්, සැන් ෆ්‍රැන්සිස්කෝ, හොංකොං සහ සිංගප්පූරුව වැනි ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථාන රැසක මනා වූ පුහුණුවක් ලබා ඇත.

ඔහු සිංගර් ෆයිනෑන්ස් පීඑල්සී, මැක්ලරන්ස් සමූහය-ප්‍රධාන මණ්ඩලය, ලංකා රේටින්ග්ස් ලිමිටඩ්, ඉන්ටරෝෂන් එනර්ජි ප්‍රයිවට් ලිමිටඩ්, ක්වෙස්ට් ඩෙස්ටිනේෂන්ස් ප්‍රයිවට් ලිමිටඩ්, ක්වෙස්ට් කෑසස් ලිමිටඩ්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්, ශ්‍රීලංකන් කේටරින් සර්විසස් ලිමිටඩ්, ඔඩෙල් පීඑල්සී, හොරන ප්ලාන්ටේෂන්ස් පීඑල්සී සහ සොෆ්ට්ලොජික් ස්ටොක්බ්‍රෝකර්ස් ලිමිටඩ් යන ආයතනයන් හි ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරයි.

හැටන් නැෂනල් බැංකුවෙහි ඔහු දිගු කලක කීර්තිමත් වෘත්තියක නියැලුනු අතර එහිදී ඔහු භාණ්ඩාගාර මෙහෙයුම් ඇතුළුව ජාත්‍යන්තර, ව්‍යාපාර සංවර්ධන සහ ආයතනික ණය පිළිබඳ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස සේවය කළේය. ඔහු HNB ඇෂුවරන්ස් පීඑල්සී හි ආරම්භක අධ්‍යක්ෂවරයෙක්ද විය. HNB හි ඔහුගේ නිල කාලය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සම්බන්ධීකරණය කරමින් ප්‍රතිසංස්කරණ රැසක් සිදු කිරීමට ඔහුට හැකි විය. ඔහු HNB සහ DFCC බැංකු සඳහා හවුල් හිමිකාරිත්වයක් සහිත ඇකියුටි සෙකියුරිටීස් සහ ඇකියුටි පාර්ට්නර්ස්ද ඇතුළුව ඇකියුටි ස්ටොක්බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් හි කළමනාකාර අධ්‍යක්ෂවරයාද විය. මෙම තනතුරුවලදී ඔහු ව්‍යාපාර වර්ධනයට ඉමහත් දායකත්වයක් ලබා දුන්නේය. ඔහු ලංකා වෙන්චර්ස් ප්‍රයිවට් ලිමිටඩ්, LVL එනර්ජි හි අධ්‍යක්ෂ ලෙසද ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන්ද සේවය කළේය.

## ඒ. කේ. ඩී. ඩී. ඩී. අරන්දර මහතා

ඒ. කේ. ඩී. ඩී. ඩී. අරන්දර මහතා 2023 මාර්තු 16 වන දින සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලද අතර පසුව සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් හි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. ඔහු අධ්‍යක්ෂවරයෙකු සහ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිතයෙකු ලෙසත්, මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුවේ, විගණන කමිටුවේ සහ සමූහයේ අවදානම් කමිටුවේ සාමාජිකයෙකු ලෙසත් සේවය කරයි.

අරන්දර මහතා වෘත්තියෙන් නීතිඥවරයෙකු වන අතර මුදල් අමාත්‍යාංශයේ නීති කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස කටයුතු කරයි.

## ඒ. එම්. ඒ. ඒ. ලක්මාල් රත්නායක මහතා

2023 අප්‍රේල් 10 වන දින ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කෙරුණු ලක්මාල් රත්නායක මහතා, පසුව සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

රත්නායක මහතා ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු මෙන්ම වසර 20කට ආසන්න කාලයක් පෞද්ගලික සේවයේ නියැලෙන නීති උපදේශකවරයෙකි. රත්නායක මහතා නීතිඥයෙකු ලෙස පුද්ගලයින්, රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේ ඒකාබද්ධ ආයතන, සහ රාජ්‍ය ආයතන නියෝජනය කොට ඇත. මුල් අධිකරණ සහ අභියාචන අධිකරණ හි සිවිල් සහ සාපරාධී කාරණා සහ රාජ්‍ය නීති නඩුකීම් පිළිබඳ ප්‍රධාන නීතිඥයෙකු ලෙස ද එතුමා කටයුතු කරයි.

ඊට පෙරාතුව රත්නායක මහතා 2010 වර්ෂය පටන් 2015 වර්ෂය දක්වා ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ සභාපති තනතුර දරන ලදී. එකී සභාපති ධූරය දරන කාලය තුළ එතුමා විසින් ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ යටිතල පහසුකම් වර්ධනය කළ අතර එහි පහසුකම් ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූල වන පරිදි සංවර්ධනය කරන ලදී. එමෙන්ම රත්නායක මහතා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් 2011, 2012 සහ 2013 යන වර්ෂයන්හි මැක්සිකෝවේ කැන්ගකුන්, එංගලන්තයේ මැන්චෙස්ටර් සහ දකුණු අප්‍රිකාවේ කේප් ටවුන් හි පවත්වන ලද අන්තර්ජාතික සමූපකාර මහා මණ්ඩලය සඳහා සහභාගී වූවා සේම, 2014 වර්ෂයේ කියුබෙක් කැනඩා හි පවත්වන ලද අන්තර්ජාතික සමූපකාර සමුළුවේදී ශ්‍රී ලංකාව නියෝජනය කෙරුවේය.

එතුමා විසින් සමූපකාර තොග වෙළඳ ආයතනය (C.W.E.) හි සභාපති ධූරයත්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ ධූරයත්, සීමාසහිත ශ්‍රී ලංකා වරාය කළමනාකරණ සහ උපදේශන සේවා (පුද්) සමාගමේ සභාපති ධූරයත්, සීමාසහිත හම්බන්තොට ජාත්‍යන්තර වරාය සේවා (පුද්) සමාගම, සීමාසහිත ලංකා ගල් අඟුරු සමාගම (පුද්) සමාගම, සීමාසහිත කොළඹ ජාත්‍යන්තර බහාලුම් පර්යන්ත සමාගම සහ සීමාසහිත හම්බන්තොට ජාත්‍යන්තර වරාය (පුද්) සමූහය හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ධූරයත් දරා ඇත.

රත්නායක මහතා දැනට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පූර්ණ අයිතිය ඇති අනුබද්ධිත ආයතනයක් වන ජය කන්ටේනර් ටර්මිනල් ලිමිටඩ් හි සභාපති ධූරය දරනු ලබයි.

## ඩී.ඩී. ශිරාන් චමින්ද දම්මගේ මහතා

ශිරාන් පෙරේරා මහතා 2023 මැයි 4 වන දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලද අතර පසුව 2023 මැයි 26 දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රීලංකන් කේටරින් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. ඔහු විගණන කමිටුවේ සභාපති සහ සමාගමේ සහ එහි පරිපාලිතයෙහි සමූහයේ අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කමිටුවේ සාමාජිකයෙකු වශයෙන්ද කටයුතු කරයි.

ඔහු WSO2 මූල්‍ය අධ්‍යක්ෂවරයෙකි. ගෝලීය ගිණුම්කරණ කාලසීමාවන් අවසන් කිරීමට අදාළ වන පිළියෙල කිරීම් සහ සන්නිවේදනය කිරීම්, ගිණුම්කරණ ක්‍රියාවලිය අවසන් කිරීමේ ප්‍රගතිය ඇතුළු මාසිකව සිදු කරන ගෝලීය ගිණුම්කරණ ක්‍රියාවලිය අවසන් කිරීම කළමනාකරණය කිරීමේ වගකීම දරන අතර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සහ ගෝලීය වාර්තා කිරීමේ පැකේජ සම්බන්ධ විමසීම්, සමාලෝචනය සහ විශ්ලේෂණයන්ට අදාළ ගෝලීය කළමනාකරු ලෙසද ක්‍රියා කරයි.

දම්මගේ මහතා ඕස්ට්‍රේලියාවේ එඩිත් කෝවන් විශ්වවිද්‍යාලයෙන් MBA උපාධියක් සහ එක්සත් රාජධානියේ බටහිර ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් MSC උපාධියක් ලබා ඇත. ඔහු එක්සත් රාජධානියේ අලෙවිකරණය පිළිබඳ වරලත් ආයතනයේ (CIM) සහ එක්සත් රාජධානියේ කළමනාකරණ ගිණුම් පිළිබඳ වරලත් ආයතනයේ (CIMA) සහකාර සාමාජිකයෙකුද වේ. ඔහු එක්සත් රාජධානියේ ව්‍යාපාරික විධායකයින්ගේ සංගමයෙහිද (ABE) කටයුතු කරයි. එසේම ඔහු එක්සත් ජනපදයේ කෝනෙල් විශ්වවිද්‍යාලයෙන් නායකත්වය සහ උපායමාර්ගික කළමනාකරණය පිළිබඳ හදාරා ඇත.

# අධ්‍යක්ෂ මණ්ඩලය තවදුරටත්.

## ආනන්ද විජේතිලක අතුකෝරල මහතා

ආනන්ද අතුකෝරල මහතා 2023 පෙබරවාරි 3 වන දින සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලද අතර පසුව සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

ඔහු BSc (ලීඩ්ස් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය), MTT (නෝර්ත් කැරොලිනා රාජ්‍ය විශ්වවිද්‍යාලය, ඇමරිකා එක්සත් ජනපදය) සහ MBA යන උපාධි දරන්නෙකි. ඔහු සීමාසහිත ශ්‍රී ලංකා බැංකු සංගමයේ (සහතික ලත්) සහ ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ (CRIB) හිටපු අධ්‍යක්ෂවරයකු සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සමාජයේ කමිටු සාමාජිකයෙකි. ලන්ඩනයේ සහ අනෙකුත් විදේශීය රාජ්‍යයන්හි, ශ්‍රී ලංකා ANZ ග්‍රින්ඩ්ලේස් බැංකු සමූහයේ සේවය කිරීමෙන් සහ ශ්‍රී ලංකා ANZ ග්‍රින්ඩ්ලේස් බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වශයෙන් මෙන්ම ශ්‍රී ලංකා මැෂ්රෙක් බැංකුව පීඑස්සී හි ශ්‍රී ලංකා කළමනාකරු ලෙස සේවය කිරීමෙන් බැංකුකරණය පිළිබඳ වසර 40 කට වැඩි කාලයක පුළුල් අත්දැකීම් ඔහු සතු වේ.

ඔහු ප්‍රතිපත්ති සංවර්ධන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ හිටපු උපදේශකයෙක්ද විය. ඔහු කාර්මික සංවර්ධන අමාත්‍යාංශය සමඟ USAID අනුග්‍රහය ලබන ව්‍යාපෘතියක් වන පෞද්ගලික අංශය සඳහා වන තාක්ෂණික ක්‍රියාමාර්ග පිළිබඳ ව්‍යාපෘතියෙහි සාමාජිකයෙකු වශයෙන්ද කටයුතු කර ඇති අතර මුදල් හා බැංකු කටයුතු පිළිබඳ ජනාධිපති කොමිසමේ වාණිජ බැංකු අංශයේ සාමාජිකයෙකුද වේ.

ඔහු දැනට NAPPP හි සභාපති ලෙස කටයුතු කරයි. ඔහු NDB කැපිටල් හෝල්ඩින්ග්ස් ලිමිටඩ්, NDB සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්, NDB සෙජීර් පාට්නර්ස් ලිමිටඩ්, මයුරිටියස්, යුනයිටඩ් මෝටර්ස් ලංකා පීඑල්සී, යුනිමෝ එන්ටප්‍රයිසස් ලිමිටඩ්, කලම්බු සිටි හෝල්ඩින්ග්ස් පීඑල්සී, ආර්නි හෝල්ඩින්ග්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ උනවටුන බුටික් රෙසෝට් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනවල ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකුද වේ.

ඔහු NDB බැංකුව පීඑල්සී සහ DHPL ලිමිටඩ් හි ස්වාධීන විධායක නොවන සභාපතිවරයා වශයෙන් මීට පෙර කටයුතු කොට තිබේ. ඔහු DFCC බැංකුව පීඑල්සී, DFCC වර්ධන බැංකුව ලිමිටඩ්, යුනියන් බැංකුව පීඑල්සී, UB ෆයිනෑන්ස් කම්පනි ලිමිටඩ්, ඔරියන්ට් ෆයිනෑන්ස් පීඑල්සී සහ TVS ලංකා ලිමිටඩ් හි ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වශයෙන්ද කටයුතු කොට තිබේ.

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම

**රිචඩ් නටොල් මහතා**
*ප්‍රධාන විධායක නිලධාරී*

රිචඩ් නටොල් මහතා 2021 නොවැම්බර් මස ආරම්භයේ සිට ප්‍රධාන වාණිජ නිලධාරීතුමා ලෙස ගුවන් සේවයට සම්බන්ධ වූ අතර, 2022 ජනවාරි 1 වන දින සිට වැඩ බලන ප්‍රධාන විධායක නිලධාරීතුමා බවට පත් විය. පසුව ඔහු 2022 අප්‍රේල් 29 දින සිට ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත් කරන ලදී. ගුවන් සේවා ක්ෂේත්‍රයේ වසර 30ක පළපුරුද්දක් ඇති ඔහු ලොව පුරා විවිධ මෙහෙයුම් අංගයන් ආවරණය වන පරිදි ගුවන් සේවා රැසක විවිධ ජ්‍යෙෂ්ඨ භූමිකාවන් දරා ඇත.

ඔහු සවුදි එයාර්ලයින්ස්හි විවිධ භූමිකාවන් දරා ඇත. ආරම්භයේදී වෙළඳ පරිවර්තනයේ උප සභාපතිතුමා ලෙස පත් කරන ලදුව, පසුව විකුණුම් අංශයෙහි උප සභාපතිතුමා ලෙස කටයුතු කළ අතර, ඔහු විසින් නිෂ්පාදන සහ අලෙවිකරණය සඳහා අමතර වගකීම්ද දරන ලදී. ඔහු වාර්ෂික ආදායමෙන් ඩොලර් බිලියන 6 ක් සමඟ ගුවන් සමාගමක් සඳහා වන වාණිජ උපාය මාර්ගයේ හිමිකාරීත්වයෙහි කොටස්කරුවෙකු වූ අතර ගෝලීය වශයෙන් 2,700 ක කාර්ය මණ්ඩලයක් මෙහෙයවීය. වසර 3ක් පුරාවට 30% ක ජාත්‍යන්තර මගී වර්ධනයක් ලබාදී, කලාපීය සාමාන්‍යයට වඩා බෙහෙවින් වැඩි, බෙදාහැරීමේ පිරිවැයෙහි 25% ක අඩුවීමක් අත්කර ගත් අතර, ක්ෂේත්‍රයේ හොඳම දෑට අනුකූලව ගුවන් සමාගමේ NPS ලකුණු ඉහළ නංවන සේවාවක් ආරම්භ කිරීමෙහි ලා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළේය. ඔහු සවුදි එයාර්ලයින්ස් හි ස්කයිටීම් අධීක්ෂණ මණ්ඩලයේ නියෝජිතයාද වූ අතර පසුව ඔහු නව පාලන ක්‍රමයක් යටතේ විධායක මණ්ඩලයට සම්බන්ධ විය.

මීට පෙර ඔහු රෝයල් ජෝර්දානියන් හි ප්‍රධාන වාණිජ සහ උපාය මාර්ගික නිලධාරීවරයා ලෙස පත් කරන ලද අතර එහිදී ඔහු ව්‍යාපාරික නායකයින් සහ ජාත්‍යන්තරව කීර්තිමත් උපදේශකයින් කණ්ඩායමකට නායකත්වය ලබා දෙමින් කටයුතු කළේය. එහිදී, ක්‍රියාමාර්ග 70 ක් හඳුනාගෙන කාර්යසාධනය නිරීක්ෂණය කිරීමට සහ මැනීමට රාමුවක් නිර්මාණය කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ශුද්ධ ආදායමේ ඩොලර් මිලියන 80 ක දියුණුවක් සහ 12% ක ආන්තික වර්ධනයක් සහිතව එයාර්ලයින්ස් සමාගම ලාභදායි තත්ත්වයට ගෙන ඒමට ඔහු සමත් විය.

අනෙකුත් තනතුරු අතර, බහරේන් එයාර්හි ප්‍රධාන විධායක නිලධාරීතුමා, කෙන්යා එයාර්වේස් හි වාණිජ අධ්‍යක්ෂකතුමා, පිලිපීන ගුවන් සේවයෙ හි ජ්‍යෙෂ්ඨ වාණිජ උපදේශකතුමා, ධ්‍රැවීය ගුවන් භාණ්ඩ සඳහා ඇමරිකා සමාගමෙහි විකුණුම් සහ අලෙවිකරණ අංශයන්හි උප සභාපතිතුමා සහ කැතේ පැසිෆික් එයාර්වේස්හි කළමනාකරණ භූමිකාවන් ඇතුළත් වේ. නටොල් මහතා ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයෙන් ගණිත උපාධියක් සහ ලන්ඩන් ව්‍යාපාරික අධ්‍යයනායතනයෙන් ස්ලෝන් ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත.

**යසන්ත දිසානායක මහතා**
*සමූහයේ මූල්‍ය කළමනාකරණ ප්‍රධානී*

යසන්ත දිසානායක මහතා 2004 දී සමාගමට සම්බන්ධ වූ අතර, වර්තමානයේ ඔහු මූල්‍ය කළමනාකරණ ප්‍රධානී තනතුර දරයි. සමාගමේ මූල්‍ය හා වාණිජමය ප්‍රසම්පාදන, ලොජිස්ටික්ස් සහ දේපළ අංශයන් අධීක්ෂණය කිරීමේ වගකීම ඔහු වෙත පැවරෙන අතර ඒ සියල්ල ඔහු වෙත වාර්තා කරයි.

ආසියානු කලාපීය සම්මාන දෙකක් විසින් පිළිගත් ප්‍රථම ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව සහ ඉස්ලාමීය මූල්‍යකරණ පහසුකම් ඇතුළු සමාගමේ පුරෝගාමී මූල්‍ය ගනුදෙනු රාශියකට ඔහු නායකත්වය දී තිබේ.

A330-300 ගුවන් යානා ඇණිය සඳහා පූර්ව ලබාදීමේ මූල්‍යකරණ ගනුදෙනු සැකසීමේදී කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කරන ලද අතර, එම ගනුදෙනුව " එයාර්ෆයිනෑන්ස්" සඟරා මගින් 2014 දී "වසරේ පූර්ව ලබාදීම් මූල්‍යකරණ ගනුදෙනුව" වශයෙන් ඇගයුමට පාත්‍ර විය. සමාගම හා සම්බන්ධ වීමට පෙරාතුව, දිසානායක මහතා ආයෝජන බැංකුකරණ සහ විදුලි සංදේශ ක්ෂේත්‍රයන්හි ජ්‍යෙෂ්ඨ තනතුරු රැසක් හෙබවීය. හෙතෙම, වෘත්තියෙන් ගණකාධිකාරිවරයකු (එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයෙහි අධි සාමාජිකයකු) වන අතර, කාඩිෆ් හි වේල්ස් සරසවියේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිධාරියෙකි.

**ඩැල්රීන් තිරුකුමාර් මහත්මිය**
*ආයතනික ලේකම් සේවා ප්‍රධානී/ සමාගම් ලේකම්*

ඩැල්රීන් තිරුකුමාර් මහත්මිය 2013 වසරේදී සමාගමේ සේවයට සම්බන්ධ වූවාය. ඇය සමූහයේ සමාගම් ලේකම් සහ ආයතනික ලේකම් සේවා ප්‍රධානී වශයෙන් කටයුතු කරයි. මෙම අංශය මඟින් සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම, සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් පෞද්ගලික සමාගම වෙත ආයතනික ලේකම් සේවා සපයයි. ඇය මණ්ඩලය පත් කරන ලද සමාගමේ සහ එහි පරිපාලිතයේ අනු කමිටු - විගණන කමිටුව, මානව සම්පත් සහ වේතන කමිටුව සහ ආයතනික අවදානම් කළමනාකරණ කමිටුව සඳහා ලේකම් ලෙස කටයුතු කරනු ලබයි. ඇය "ශ්‍රීලංකන් කෙයාර්ස් ට්‍රස්ට්" භාරයේ භාරකාරිනියකි.

එතුමියට වසර 25 කට වැඩි පළපුරුද්දක් ඇති අතර ලංකාවේ ලැයිස්තුගත විවිධාංගීකරණය වූ සමාගම් හි ඉතා ජ්‍යෙෂ්ඨ තනතුරු හොබවා ඇත. එතුමිය එක්සත් රාජධානියේ වරලත් ලේකම්වරුන් සහ පරිපාලකයින්ගේ ආයතනයේ සාමාජිකාවක් වන අතර ඕස්ට්‍රේලියාවේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිධාරිනියකි. ඇය ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ (SLID) සාමාජිකාවක් මෙන්ම එම ආයතනය නියෝජනය කරමින් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරුන්ගේ සංසදයේ ක්‍රියාකාරී කමිටුවේ සක්‍රීය සාමාජිකාවක වේ.

**චාමර පෙරේරා මහතා**
*සමූහයේ තොරතුරු තාක්ෂණ ප්‍රධානී*

1999 වර්ෂයේදී ගුවන් සේවා ක්ෂේත්‍රයට එක්වූ චාමර පෙරේරා මහතා දශක දෙකක කාලයක් පුරා ජාතික ගුවන් සේවය සමඟ කටයුතු කරයි. ඔහු ගුවන් සමාගමේ කළමනාකරණ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු කිහිපයකම සේවය කර ඇති අතර, 2012 වසරේදී තොරතුරු තාක්‍ෂණ ප්‍රධානී ලෙස පත් විය. පසුව 2021 වසරේදී ශ්‍රීලංකන් සමූහයෙහි තොරතුරු තාක්‍ෂණ අංශයේ වගකීම එම මහතා හට පැවරී ඇත. ගුවන් සේවා තාක්ෂණය හා ස්වයං ව්‍යාපාරික ක්‍රියාවලි පිළිබඳ හසළ දැනුමක් සහ පළපුරුද්දක් සහිත චාමර පෙරේරා මහතා, ගුවන් සේවා ක්ෂේත්‍රයේ දශක දෙකක පරිණත වෘත්තිකයෙකි. හෙතෙම සමූහය වෙත තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල් පරිවර්තනයන් සම්බන්ධයෙන් ක්‍රමෝපායික නායකත්වය ලබා දෙයි.

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම තවදුරටත්.

තොරතුරු තාක්ෂණ සමූහ ප්‍රධානී තනතුර දැරීමට පෙර ගුවන් සේවය තුළ කළමනාකරණ තනතුරු ගණනාවක් දැරීමෙන් කීර්තියට පත් ඔහු එමඟින් ලොව පුරා මෙහෙයුම් ආවරණය වන පරිදි ගුවන් සේවා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපායමාර්ගික පරිවර්තනය සහ ගුවන් සමාගම් සමූහයේ ඩිජිටල් පරිසර පද්ධති පිළිබඳ වගකීම දරයි. පෙරේරා මහතා ගුවන් සේවාවල තාක්‍ෂණික භාවිතය ඉහළ නැංවීම සඳහා, ගුවන් ප්‍රවාහන ක්‍රියාවලීන්හි විවිධ ස්පර්ශක ස්ථාන හරහා මගී කේන්ද්‍රීය ඊ-ව්‍යාපාරික විසඳුම් සහ සේවාවන් ස්ථාපිත කිරීම සඳහා තාක්‍ෂණික නවෝත්පාදනයන්හි බොහෝ පුරෝගාමී ක්‍රියාත්මක කිරීම් මෙහෙයවීය. කඩිනම් සංචාරක තාක්‍ෂණ අනුවර්තනයන් සඳහා වූ IATA ව්‍යාපාරය සරල කිරීමේ වැඩසටහන (StB) ව්‍යාපාර මෙහෙයවීම සඳහා දත්ත පදනම් කරගත් ගුවන් සේවා වේදිකාවක් ක්‍රියාත්මක කිරීම, ගුවන් ප්‍රවාහන ප්‍රමිතීන්ට අනුකූලව ගුවන් සේවා උප පද්ධතිවලට අනුකූල වීම එතුමාගේ නායකත්වය යටතේ ක්‍රියාත්මක වූ ප්‍රධාන ව්‍යාපාර කාර්යයන් වේ. ජාතික ගුවන් සේවයේ සමස්ත තාක්‍ෂණික පිරිවැය තාර්කික කිරීම සඳහා මිල අධික පැරණි ගුවන් සේවා පද්ධති පිරිවැය ඵලදායි හා නවෝත්පාදන කට්ටලයක් සමඟ වෙනස් කිරීමට හා ප්‍රතිස්ථාපනය කිරීමට පෙරේරා මහතා නායකත්වය ලබා දී ඇත. තවද, ගුවන් සේවා ප්‍රජාව සඳහා අලෙවි කළ හැකි සේවා හා විසඳුම් සකස් කරමින්, එතුමාගේ මඟ පෙන්වීම යටතේ ශ්‍රී ලංකන් ගුවන් සේවයේ වැඩි දියුණු කිරීම සහ විසඳුම් සඳහා ජාතික හා ජාත්‍යන්තර සම්මාන දිනාගෙන ඇත.

ISO/ IEC 27001:2013 තොරතුරු ආරක්ෂණ කළමනාකරණය, ISO 9001:2015 මෘදුකාංග තත්ත්ව කළමනාකරණය සහ ISO/IEC 20000:2018 IT සේවා කළමනාකරණය සහ ISO/ IEC 27701:2019 රහස්‍යතා තොරතුරු කළමනාකරණය සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් තොරතුරු තාක්ෂණ සහතිකය ලබා ඇත.

පෙරේරා මහතා ලයිස්ටර් විශ්ව විද්‍යාලයේ (එක්සත් රාජධානියේ) තොරතුරු තාක්‍ෂණ කළමනාකරණය පිළිබඳ විශේෂ ව්‍යාපාර පරිපාලන (MBA) උපාධියක් ලබා ඇත. මොරටුව විශ්වවිද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක් ලබා ඇති එතුමා වෘත්තියෙන් ඉංජිනේරුවරයෙකි. එමෙන්ම එතුමා තොරතුරු තාක්ෂණ විශේෂීකරණයන්ට අදාළ වෘත්තීය සුදුසුකම්, සහතිකපත් සහ ජාත්‍යන්තර ආයතනවල පිළිගැනීම ලබා ඇත.

## බුද්ධිකා මානගේ මහත්මිය

*සමූහයේ මානව සම්පත් හා ගුවන් මැදිරි සේවා ප්‍රධානී*

බුද්ධිකා මානගේ මහත්මිය 2003 වසරේදී කළමනාකරණ පුහුණුකරුවෙකු ලෙස ගුවන් සේවයට බැඳුණු අතර 2004 දී වාණිජ ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරිනියක ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළාය. ඇයට ගුවන් සේවයේ වසර 20 ක පළපුරුද්දක් ඇති අතර, වාණිජ ප්‍රසම්පාදන විධායක (ව්‍යාපෘති), ජ්‍යේෂ්ඨ ගුවන් යානාස්ථ විධායක නිලධාරී (පරිපාලක සහ කාර්ය මණ්ඩල සේවා), ගුවන් ගමන් සේවා කළමනාකාරිනී (පරිපාලක හා කාර්ය මණ්ඩල උපලේඛනගත කිරීම), කළමනාකාරිනී මානව සම්පත් සංවර්ධන හා හවුල් ව්‍යාපාර, ජ්‍යේෂ්ඨ කළමනාකාරිනී මානව සම්පත් සංවර්ධන හා හවුල් ව්‍යාපාර, සහ ගුවන් මැදිරි සේවා ප්‍රධානී ලෙස කටයුතු කරනු ලබයි. ගුවන් මැදිරි සේවා ප්‍රධානී තනතුරට අමතරව, 2020 ජනවාරි සිට වැඩබලන මානව සම්පත් ප්‍රධානීතුමිය ලෙසද එතුමිය පත් කෙරිණි. 2020 ජූලි සිට බලපැවැත්වෙන පරිදි එතුමිය මානව සම්පත් හා ගුවන් මැදිරි සේවා යන අංශ දෙකේම "මානව සම්පත් සහ ගුවන් මැදිරි සේවා ප්‍රධානී" ලෙස ස්ථිරව පත් විය.

2020 සැප්තැම්බර් මාසයේදී එතුමිය ගුවන් සේවයේ රාජකාරිවලට අමතරව, ශ්‍රීලංකන් කේටරින්හි මානව සම්පත් කාර්යය අධීක්ෂණය සඳහා මැදිරි සේවා ප්‍රධානී තනතුර මෙන්ම මානව සම්පත් මැදිරි සේවා සමූහ ප්‍රධානී ලෙස පත් කරන ලදී. ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි සහ ශ්‍රීලංකන් කේටරින්හි සමස්ත මානව සම්පත් ක්‍රියාකාරිත්වය සහ එයාර්ලයින්ස්හි ගුවන් මැදිරි කාර්යය මණ්ඩලය පරිපාලනය සහ ගුවන් යානාස්ථ සේවා මෙහෙයුම් ඇයගේ විෂය පථය යටතේ පවතී.

ප්‍රධාන අංශ දෙකකට එකවර නායකත්වය දෙන ජ්‍යේෂ්ඨ කළමනාකරණ කණ්ඩායමේ එකම සාමාජිකාවද ඇයයි.

ඇය කර්මාන්ත සබඳතා කළමනාකරණය කිරීම, සේවක සහභාගිත්වය සහ යහපැවැත්මට අදාළ ක්‍රියාමාර්ග සහ සේවක කේන්ද්‍රීය පුහුණු සහ සංවර්ධන වැඩසටහන්, වෘත්තීය ආශ්‍රිත කුසලතා කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කිරීම සහ සේවකයින්ගේ වෘත්තිය සහ පෞද්ගලික ජීවිතය අතර සමබරතාවය කළමනාකරණය කිරීම වැනි ක්ෂේත්‍රවල ආදර්ශමත් නායකත්වයක් පෙන්නුම් කර ඇත. විශේෂයෙන් සේවක සංඛ්‍යාව ප්‍රතිව්‍යුහගත කිරීම සහ ප්‍රදානයන් සහ ඇගයීම් පිළිබඳ ආයතනයේ ප්‍රතිපත්තිය ඇතුළු සේවක ප්‍රතිලාභ යෝජනා ක්‍රම සම්බන්ධයෙන් ඇය විසින් ගන්නා ලද පියවර ප්‍රශංසනීය වේ. ගුවන් මැදිරි සේවා ප්‍රධානී වශයෙන්, ගුවන් මැදිරි කාර්ය මණ්ඩලයේ පරිපාලනය, ගුවන් යානා සේවා, අනිවාර්ය සහ පුනරාවර්තන පුහුණුව, තීරුබදු රහිත විකුණුම් සහ ගුවන් ගමන් මෙහෙයුම් කළමනාකරණය කිරීමේදී ඇය සිය උපාය මාර්ගික නායකත්වය ප්‍රදර්ශනය කර ඇත.

එතුමිය කොළඹ විශ්වවිද්‍යාලයෙන් සංඛ්‍යානය පිළිබඳ (ගෞරව) විශේෂ BSc උපාධියක්ද, මොරටුව විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ MSc උපාධියක්ද හිමිකර ගෙන ඇත. වරලත් පිරිස් කළමනාකරණය ආයතනයේ (CIPM) වරලත් සාමාජිකාවකද වේ. ඇය CIPM වෙතින් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වෘත්තීය සුදුසුකම් සහ කම්කරු නීතිය, සැපයුම් දාම කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ සුදුසුකම් ලබා ඇත. ඇය මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමයෙහි (AHRP) වෘත්තීය සාමාජිකාවකි.

## දිමුතු තෙන්නකෝන් මහතා

*ලෝක ව්‍යාප්ත විකුණුම් සහ බෙදාහැරීමේ ප්‍රධානී*

දිමුතු තෙන්නකෝන් මහතාට ගුවන් සේවා අලෙවිය, මූල්‍ය කළමනාකරණය, ආදායම් කළමනාකරණය සහ වාණිජ සැලසුම් පිළිබඳ විශේෂඥ ගුවන් සේවා ක්ෂේත්‍රයේ දශක තුනක අත්දැකීම් තිබේ. ඒ මහතා දැනට ගුවන් සමාගමේ ලෝක ව්‍යාප්ත මගී අලෙවිය, අලෙවි නාලිකා ජාල කළමනාකරණය සහ විකිණුම් මෙහෙයුම් පිළිබඳ මූලිකත්වය ගෙන කටයුතු කරයි. ඔහු දැනට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි ලෝක ව්‍යාප්ත විකුණුම් සහ බෙදාහැරීමේ ප්‍රධානියා වන අතර, ඔහු 2017 වසරේ සිට එම තනතුර හොබවයි. ගුවන් සමාගමේ ලෝක ව්‍යාප්ත මගී විකුණුම්, නාලිකා කළමනාකරණය සහ විකුණුම් මෙහෙයුම් සඳහා නායකත්වය ලබා දෙයි.

1992 වසරේදී එයාර්ලයින්ස් සමාගමට සම්බන්ධ වූ තෙන්නකෝන් මහතා මූල්‍යය, ආදායම් සැලසුම්කරණය, ජාල සැලසුම්කරණය, මාර්ග සැලසුම්කරණය සහ මිලකරණය ආදී විවිධ ක්ෂේත්‍රයන් හි සේවය කර ඇත. එසේම ඔහු ඩුබායි සහ කැනඩාවේ විකුණුම් කළමනාකරු ලෙසද මහාරාෂ්ට්‍ර සහ ගුජරාට් හි කළමනාකරු ලෙසද ආසියා පැසිෆික් සහ ඕස්ට්‍රේලියානු කලාපීය කළමනාකරු සහ මැද පෙරදිග කලාපීය කළමනාකරු ලෙසද කටයුතු කර ඇත.

විදේශ සේවයෙන් පසුව, තෙන්නකෝන් මහතා, වාණිජ මෙහෙයුම් සාමාන්‍යාධිකාරී වශයෙන් කටයුතු කළ අතර එහිදී ඔහු ප්‍රාදේශීය විකුණුම්, විකුණුම් සංවර්ධන, නිෂ්පාදන සංවර්ධන, පාරිභෝගික කටයුතු, ශ්‍රීලංකන්හි නිවාඩු කටයුතු, කර්මාන්ත කටයුතු, ලෝයල්ටි වැඩසටහන ඇතුළු පාරිභෝගික ලැදියා කළමනාකරණය, විද්‍යුත්-වාණිජ්‍යය, ගෝලීය ඇමතුම් මධ්‍යස්ථානය, නාලිකා කළමනාකරණය වැනි විවිධ දෙපාර්තමේන්තු සඳහා නායකත්වය දුන් අතර ඒ හරහා ගුවන් සේවා වාණිජ මෙහෙයුම් පිළිබඳ ඔහු සතු වන විශේෂඥතාව පිළිබිඹු කර ඇත. ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි සේවය කරන අතරතුර, ඔහු ඕමාන් එයාර් සමාගමේ උතුරු ඉන්දියාවේ කළමනාකරු ලෙස කෙටි කලක් සේවය කළ අතර ඕමාන් එයාර් හි උතුරු ඉන්දීය මෙහෙයුම්ද අධීක්ෂණය කළේය.

දැඩි තරඟකාරීත්වය ඇතුළු සමකාලීන අභියෝග මධ්‍යයේ විකුණුම් වර්ධනයේ විප්ලවීය වෙනසක් ඇති කිරීම වෙනුවෙන් තෙන්නකෝන් මහතා ගුවන් සේවා ක්ෂේත්‍රයේ කීර්තියක් ලබා ඇත. නව්‍ය සහ ඵලදායි වාණිජ භාවිතයන් වෙනුවෙන් පෙනී සිටින තෙන්නකෝන් මහතා, ගුවන් සේවයේ වාණිජ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපාය මාර්ගික සැලසුම් සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම පිළිබඳ ඔහුගේ දැක්ම සම්බන්ධව ප්‍රසිද්ධියක් ලබා ඇත. ඔහු තම කණ්ඩායම ප්‍රබෝධමත් කිරීම සහ බලගැන්වීම තුළින් ආයතනික වර්ධනය අපේක්ෂා කරන කැපවූ නායකයෙකි.

තෙන්නකෝන් මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ උපාධිධාරියෙකු මෙන්ම, බකිංහැම්ෂයර් නව විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ජාත්‍යන්තර ශාස්ත්‍රපති උපාධියකට හිමිකම් කියමින් ශ්‍රී ලංකා ගුවන් සේවා නියෝජිත මණ්ඩලයේ සභාපතිවරයා ලෙසද කටයුතු කරනු ලබයි.

## කැප්ටන් පැට්‍රික් ප්‍රනාන්දු මහතා

*ගුවන් මෙහෙයුම් ප්‍රධානී*

ශ්‍රීලංකන් සමාගම, එයාර් ලංකා ලෙස හැඳින්වූ 1992 වසරේදී එතුමා L1011 කණ්ඩායමේ කැඩෙට් නියමුවරයෙකු ලෙස එහි සේවයට බැඳුණේය. එතුමා L1011, A320, 330 සහ A340 ගුවන් යානා පියාසර කර ඇත. වසර 20 කටත් වැඩි කාලයක් කපිතාන්වරයෙකු ලෙසත්, වසර 15 කටත් වැඩි කාලයක් උපදේශකවරයෙකු ලෙසත් කටයුතු කර ඇත. ප්‍රනාන්දු මහතා 2011 වසරේදී නියෝජ්‍ය ප්‍රධාන නියමු පුහුණුව හා ප්‍රමිති සහ පසුව ප්‍රධාන නියමු පුහුණුව හා ප්‍රමිති වශයෙන් කළමනාකාරීත්වට සම්බන්ධ විය.

A320/330 කණ්ඩායමේ වත්මන් අණ දෙන නිලධාරීතුමන්, සිමියුලේටර් සහ රේඛීය උපදේශක මෙන්ම ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) සඳහා නියම කළ පිරික්සුම් නියමුවරයෙකුද වේ.

## සමින්ද පෙරේරා මහතා

*අලෙවිකරණ ප්‍රධානී*

සමින්ද පෙරේරා මහතා විසින් 2015 ජුනි මස සිට ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි අලෙවිකරණ සහ ආයතනික සන්නිවේදන උපායමාර්ගය මෙහෙයවනු ලැබේ. ඔහු දශක දෙකකට වැඩි කාලයක් උපායමාර්ගික අලෙවිකරණය සහ ගෝලීය විකුණුම් පිළිබඳ විශේෂඥයෙකු ලෙස ගුවන් ප්‍රවාහන ක්ෂේත්‍රයේ සේවය කරනු ලබයි. ඔහු එයාර්ලයින්ස් හි ආයතනික සමාජ වගකීම් (CSR) අංශය - ශ්‍රීලංකන් කෙයාර්ස්, ශ්‍රීලංකන් හොලිඩේස් සහ තිරසාර ක්‍රියාමාර්ගයන්ද අධීක්ෂණය කරයි.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම එමිරේට්ස් යටතේ පැවති කාලයේ එහි කළමනාකරණ අභ්‍යාසලාභියෙකු වශයෙන් සම්බන්ධ වූ පෙරේරා මහතා, ආයතනික සන්නිවේදන වැඩබලන ප්‍රධානී, ප්‍රංශයේ වාණිජ කළමනාකරු, ශ්‍රී ලංකාව සහ මාලදිවයින කලාපීය කළමනාකරු සහ ලෝක ව්‍යාප්ත විකිණුම් පිළිබඳ සාමාන්‍යාධිකාරී වැනි ගුවන් සේවයේ ප්‍රමුඛ තනතුරු රැසක් දරන්නට විය.

අලුතින් ස්ථාපිත වෙළඳපොළ/ගමනාන්තයන්හි වෙළඳ සන්නාමය ප්‍රතිෂ්ඨාපනය, අලෙවිකරණ නවෝත්පාදන සහ පාරිභෝගික කේන්ද්‍රීය, සාකල්‍ය සන්නිවේදනය යන ක්ෂේත්‍රයන්හි ඔහු ප්‍රවීණත්වයක් දරයි. ඔහු ජාත්‍යන්තර සංසදවලදී පිළිගන්නා ලද ගෝලීය ගෞරවයට පත් වූ අලෙවිකරණ සන්නිවේදන ප්‍රයත්නයන් රැසකට එයාර්ලයින්ස් අලෙවිකරණ කණ්ඩායම සඳහා මඟ පෙන්වා ඇත.

ඔහු මුම්බායි සරසවියෙන් මූල්‍ය ගිණුම්කරණය සහ විගණනය පිළිබඳ වාණිජවේදී උපාධියක් ලබා ගෙන ඇති අතර ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමයෙන් (IATA) ගුවන් සේවා අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමාවක් (ගුවන්සේවා අලෙවිකරණය, ගුවන්සේවා මූල්‍ය, ගිණුම්කරණය, නැවතුම් කළමනාකරණය) ලබා ගෙන ඇත.

## අර්ජුන කපුගීකියන මහතා

*ගුවන් යානා ඉංජිනේරු අංශයේ ප්‍රධානී*

අර්ජුන කපුගීකියන මහතා, 1984 වසරේදී එවකට එයාර්ලන්කා ලෙස හැඳින්වූ ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි ඉංජිනේරු අංශය සමඟ ආධුනිකයෙකු ලෙස සම්බන්ධ විය. 2018 මැයි මස ගුවන් යානා නඩත්තු කිරීමේ ජ්‍යේෂ්ඨ කළමනාකරු ලෙස පත්වූ අතර 2023 මාර්තු මස ඉංජිනේරු අංශයේ ප්‍රධානියා ලෙස උසස්වීමක් ලබන ලදී. ඔහු ඉංජිනේරු හා ගුවන් යානා නඩත්තු අංශයේ ප්‍රධානියා වේ.

එතුමා, එයාර්බස් A320/330/340 ගුවන් යානා සඳහා සහතික ලත් වරප්‍රසාද සහිත බලපත්‍රලාභී ගුවන් යානා නඩත්තු ඉංජිනේරුවරයෙකි. ඔහු ඉංජිනේරු සහ නඩත්තු අංශයේ කළමනාකරණ තනතුරු රැසක් දැරීය. 1988 වසර සිට 1991 වසර දක්වා ඔහු ගල්ෆ් ගුවන් යානා නඩත්තු සමාගමෙහි බහු සංස්කෘතික පරිසරයක් තුළ කෙටි කාලයක් සේවය කළේය.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙන් ගුවන් යානා නඩත්තු බලපත්‍රයක් හිමි කපුගීකියන මහතා, කැම්බ්‍රියා (එක්සත් රාජධානිය) විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත.

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම තවදුරටත්.

### සුමුදු උපතිස්ස මහතා

*උපාය මාර්ගික කටයුතු ප්‍රධානී*

සුමුදු උපතිස්ස මහතා 2000 වසරේ කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස ගුවන් සේවයට එක් වූ අතර එම වැඩසටහන සාර්ථකව නිම කිරීමෙන් පසු 2001 වසරේ වාණිජ අංශයට මාරු විය. වසර 21 ක කර්මාන්ත පළපුරුද්ද සමඟින්, ජාත්‍යන්තර සබඳතා, කාලසටහන් සැලසුම් කිරීම, ජාල සහ ආදායම් සැලසුම්කරණය, මිලකරණය සහ ආදායම් කළමනාකරණය සහ GSA පරිපාලනය ඇතුළු විවිධ ක්ෂේත්‍රවල වසර 16 කට වැඩි කළමනාකරණ විශේෂඥතාවක් ඔහුට ඇත. 2017 දී ඔහු ආදායම් කළමනාකරණ, සැලසුම්කරණය සහ වාණිජ සහය ප්‍රධානියා ලෙස පත් කරන ලදී. 2023 දී, ඔහු වසර දෙකක වැටුප් රහිත නිවාඩු කාලය සම්පූර්ණ කිරීමෙන් පසු උපාය මාර්ග ප්‍රධානියාගේ භූමිකාව භාර ගත්තේය.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අලෙවි කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ඇති උපාධිධාරියෙකි. මීට අමතරව, ඔහුට ගුවන් සේවා අධ්‍යයනය පිළිබඳ IATA ඩිප්ලෝමාවක් (මොන්ට්‍රියල්) සහ වරලත් අලෙවිකරණ ආයතනයෙන් (එක්සත් රාජධානිය) අලෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්ද ලබා ඇත. එසේම ඔහු එහි ආශ්‍රිත සාමාජිකයෙකු (ACIM) වේ.

### චමින්ද පෙරේරා මහතා

*ගුවන් භාණ්ඩ ප්‍රවාහන ප්‍රධානී*

චමින්ද පෙරේරා මහතා 2022 ජනවාරි මස ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමඟ සම්බන්ධ වූවේය. වාණිජ ගුවන් භාණ්ඩ සහ ගොඩබිම් සේවා මෙහෙයුම් හැසිරවීම සම්බන්ධයෙන් ගුවන්සේවා කර්මාන්තයේ වසර 30 කට අධික පළපුරුද්දක් ඔහු සතු වේ. පෙරේරා මහතා ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි සිය වෘත්තීය කටයුතු ගොඩබිම් සේවා මෙහෙයුම් හැසිරවීම් අංශයෙන් ආරම්භ කළ අතර භාණ්ඩ ප්‍රවාහනයේ වාණිජ අංශයේ කටයුතු හැසිරවීම සම්බන්ධයෙන් ඇති අභිලාෂය හේතුවෙන් ලුෆ්තාන්සා වෙත ගමන් කළේය. ඊළඟ පියවර ලෙස වයනා එයාර්ලයින්ස් වෙත ගුවන් භාණ්ඩ අලෙවි සහ පාරිභෝගික සේවා කළමනාකරු ලෙස වාණිජ සහ ගොඩබිම් සේවා මෙහෙයුම් කටයුතු මෙහෙයවන කණ්ඩායමක් කළමනාකරණය කළ අතර ඉන්පසු එමිරේට්ස්හි වසර 16 ක කාලයක් පුරා සේවය කළේය. එතුමා එහි සේවය අවසන් කරන විට ශ්‍රීලංකා ගුවන් භාණ්ඩ කළමනාකරු ලෙස කටයුතු කරමින් සිටියේය.

### ප්‍රීමාල් ද සිල්වා මහතා

*සාමාන්‍යාධිකාරී - ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය*

1988 දී සමාගමේ ගුවන් කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස සේවයට එක් වූ ප්‍රීමාල් ද සිල්වා මහතා, ගුවන් කර්මාන්තයේ දශක තුනකට වැඩි සේවා කාලයක් සඳහා හිමිකම් කියනු ලබයි. ඔහු යානාස්ථ සේවා කළමනාකරණයේ භාරදූර භූමිකාවන් දරමින් සිට ගුවන් මැදිරි කාර්ය මණ්ඩල තනතුරට පත් විය. ගුවන් මැදිරි ආරක්ෂාව, මෙහෙයුම් සහ පුහුණු කටයුතු කළමනාකරණය ආදිය මෙකී වගකීම් සඳහා ඇතුළත් වේ.

2014 වසරේ ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනයේ ප්‍රධානියා ලෙස පත්වීමට ඔහු ලද ප්‍රගතිය හේතු විය. දැනට සාමාන්‍යාධිකාරීවරයාගේ කාර්යභාරය පැවරී ඇති ඔහු ආයතනයේ බහු ස්ථර අංශයන් අධීක්ෂණය කරයි. වත්මන් භූමිකාවේදී ගුවන්යානා නඩත්තු සහ ඉංජිනේරු පුහුණු ආයතනයට අදාළ වගකීම් භාර කළමනාකරුගේ (147 කොටස) වගකීම්ද ඔහු විසින් දැනු ලැබේ.

ප්‍රීමාල් මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් (PIM) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධියක් ලබා ඇති අතර කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයෙන් කම්කරු සබඳතා හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධියක් දරයි. එතුමා ශ්‍රී ලංකා පුහුණු හා සංවර්ධන ආයතනයෙන් පුහුණු හා සංවර්ධන පිළිබඳ ජාතික ඩිප්ලෝමාවක් හිමිකර ගෙන ඇත.

### ලුතිනන් කර්නල් බන්දුල වේරගම මහතා

*සාමාන්‍යාධිකාරී - සමූහ ආරක්ෂණය*

ශ්‍රී ලංකා යුද හමුදාවේ වසර 23 ක සේවා කාලයකින් පසුව වර්ෂ 2012 දී ලුතිනන් කර්නල් බන්දුල වේරගම මහතා සමාගමේ සේවයට එක් විය. ත්‍රිවිධ හමුදා පරිසරය ආශ්‍රිත අණදීම හා පුහුණුවට අමතරව ඒ මහතා එක්සත් ජාතීන්ගේ සාම මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙහිද සේවය කර ඇත. සමාගමේ මානව සම්පත්, ගුවන් යානාස්ථ හා ආරක්ෂක අංශවලට සේවා සැපයූ වේරගම මහතා ගුවන්තොටුපළ හා ගොඩබිම් සේවා අංශයේ ප්‍රධානියා ලෙස 2016 වසරේ පෙබරවාරි මාසයේදී පත් කරන ලදී. බන්දුල මහතා, 2020 අප්‍රේල් මාසයේදී භාරගත් පත්වීමක් වශයෙන් කණ්ඩායම් ආරක්‍ෂක අංශයේ කටයුතු මෙහෙයවයි. කැළණිය විශ්වවිද්‍යාලයේ ආරක්ෂක අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධියක් හිමි එතුමා පකිස්තානයේ ක්වෙට්ටා විශ්වවිද්‍යාලයේ විද්‍යාපති උපාධියක්ද ලබාගෙන ඇත.

### දීපාල් පල්ලේගංගොඩ

*ගුවන් තොටුපළ සහ ගොඩබිම් හැසිරවීම් සේවා පිළිබඳ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ*

දීපාල් පල්ලේගංගොඩ මහතා 1991 දී ගුවන් සේවයට සම්බන්ධ විය. 1994 දී ඔහු ගුවන් සේවයෙන් ඉවත් වී දෝහා ගුවන්තොටුපළට සම්බන්ධ වූ අතර එහිදී කටාර් එයාර්වේස් හැන්ඩ්ලිං පිහිටුවීමේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. ඔහු 1995 දී නැවත ගුවන් සේවයට සම්බන්ධ විය.

ඔහු කාර්ය කළමනාකරු, ගුවන් යානා පිටත් කරන්නා, ගුවන් තොටුපළ සේවා උපදේශක (දේශීය/විදේශීය) සහ ස්ථාන කළමනාකරු ලෙස ගුවන්තොටුපළ මෙහෙයුම් කටයුතුවල සෑම අංශයකම සේවය කර ඇත. ඔහු 2010 දී වාණිජ කණ්ඩායමට සම්බන්ධ වූ අතර විකුණුම් විධායක, සහකාර විකුණුම් කළමණාකරු, ප්‍රාදේශීය කළමනාකරු, රජයේ සංචාරක සහ මහජන කටයුතු කළමනාකරු ලෙස සේවය කළේය. පසුව ඔහු 2023 මැයි මාසයේදී ගුවන්තොටුපළ සහ ගොඩබිම් සේවා ජ්‍යෙෂ්ඨ කළමනාකරු ලෙස පත් කරන ලදී.

ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් සේවා කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සහ කාඩිෆ් විශ්ව විද්‍යාලයෙන් (එක්සත් රාජධානිය) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. තවද ඔහු සිටි සහ ගිල්ඩ්ස් හි සහතිකලත් උපදේශකවරයෙකි.

## ක්ෂානක සපරමාදු මහතා

*ආදායම් කළමනාකරණය පිළිබඳ ජ්‍යේෂ්ඨ කළමනාකරණ*

2000 වසරේදී කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස ක්ෂණක සපරමාදු මහතා ගුවන් සේවයට එක් වූ අතර වාණිජ අංශයේ සිය වෘත්තීය ජීවිතය පුරාවට විවිධ නායකත්ව තනතුරු දරා ඇත. වසර 15 කට වැඩි කළමනාකරණ භූමිකාවන් ඇතුළුව වාණිජ ගුවන් සේවා කර්මාන්තයේ දශක 2 කට වැඩි පළපුරුද්දක් ඇති ඔහු විශේෂඥතාව ලබා ඇති ක්ෂේත්‍ර වන්නේ ආදායම් සැලසුම්කරණය, ජාල ප්‍රශස්තකරණය සහ ආදායම් කළමනාකරණයයි.

ඔහු 2001 දී ආදායම් සැලසුම් දෙපාර්තමේන්තුවට සම්බන්ධ වූ අතර ආදායම් සැලසුම් කළමණාකරු ලෙස කණ්ඩායම මෙහෙයවීමට ගියේය. ඉන් අනතුරුව ඔහු ආදායම් සැලසුම් සහ ජාල සැලසුම් කණ්ඩායම් දෙකෙහිම නායකත්වයේ වැඩි දියුණු කළ වගකීම් සමඟින් 2010 දී කළමනාකරු සැලසුම් කිරීමේ මට්ටමට උසස් කරන ලදී. ඔහු පසුව යුරෝපීය කලාපය සඳහා ආදායම් කළමනාකරණයේ කාර්යයන් අධීක්ෂණය කරමින් ආදායම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වාණිජ කළමනාකරු ලෙස පත් කරන ලදී. ඉන්පසු ඔහු යුරෝපයේ සහ ඈත පෙරදිග ප්‍රදේශ සඳහා ඉන්වෙන්ටරි සහ මිලකරණයේ සමස්ත කාර්යයන් මෙහෙයවන ජ්‍යේෂ්ඨ කළමනාකරු ආදායම් කළමනාකරණ භූමිකාවට උසස් කරන ලදී. ඔහු දැනට ආදායම් කළමනාකරණ අංශය, ජාල සැලසුම්කරණය සහ පර්යේෂණ මෙන්ම ගුවන් සේවයේ ජාත්‍යන්තර සම්බන්ධතා දෙපාර්තමේන්තුව සඳහා නායකත්වය සපයයි.

ඔහු කොළඹ විශ්වවිද්‍යාලයේ වාණිජ විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් සහ ගුවන් සේවා අධ්‍යයනය පිළිබඳ IATA ඩිප්ලෝමාව (මොන්ට්‍රියල්) ලබා ඇත. ඔහු වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයෙන් (එක්සත් රාජධානිය) ඉගෙනුම් සම්පූර්ණ කළ අයෙකි.

## තුෂාරි පෙරේරා මහත්මිය

*සමූහයේ නීති කටයුතු පිළිබඳ ජ්‍යේෂ්ඨ කළමනාකරු*

තුෂාරි පෙරේරා මහත්මිය ශ්‍රීලංකන් සමූහයේ නෛතික කටයුතු කළමනාකාරතුමිය ලෙස කටයුතු කරයි. සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි මානව සම්පත් අංශයෙන් සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ ඇය, මානව සම්පත් කළමනාකරණයේ විවිධ අංශවල සේවයේ නිරත වූවාය. ඇය කාර්මික සහ කම්කරු සබඳතා සහ සේවකයින් සම්බන්ධ කාරණාවන්හි නඩු පැවරීම් ආදිය පිළිබඳ අත්දැකීම් සම්භාරයක් ලබා ඇත. 2013 වසරේදී සමූහයේ නෛතික කටයුතු දෙපාර්තමේන්තුවට සම්බන්ධ වූ  දින සිට, ආයතනික සහ නියාමන කටයුතු, මතභේද විසඳීම, විදේශයන්හි බහු අධිකරණ සහ දේශීය නඩු, බුද්ධිමය දේපළ, කාර්මික සහ කම්කරු සබඳතා සහ නොතාරිස් කටයුතු ඇතුළු සමූහයේ වාණිජ සහ ගුවන් සේවා කොන්ත්‍රාත්තු සෑම අංශයක්ම ඇය විසින් කළමනාකරණය කරනු ලබයි.

පෙරේරා මහත්මිය වෘත්තියෙන් නීතිඥවරියෙකි. ඉංග්‍රීසි සහ සිංහල භාෂා සඳහා නොතාරිස් බලපත්‍ර හිමි අයෙකි. ඇය ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය (IATA) විසින් පවත්වනු ලබන ගුවන් යානා අත්පත් කර ගැනීමේ සහ මූල්‍යකරණ පාඨමාලාව සාර්ථකව නිම කර ඇත. ඇය සිය නීති අධ්‍යාපනයට අමතරව ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනයේ (IPM) මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාවද කළමනාකරණ පශ්චාත් උපාධි ආයනතයේ කළමනාකරණ සංවර්ධන වැඩසටහනද සාර්ථකව සම්පූර්ණ කර ඇත.

## සුදත් මඩපාත මහතා

*සමූහයේ සුරක්ෂිතභාවය හා මෙහෙයුම් ගුණාත්මකභාවය පිළිබඳ ජ්‍යේෂ්ඨ කළමනාකාර*

1995 වසරේදී ගොඩබිම් සේවා පාලන අංශයෙහි පැටවුම් පාලකවරයෙකු ලෙස සමාගමට ප්‍රථම වරට සම්බන්ධ වූ කපිතාන් සුදත් මඩපාත මහතා ගුවන් සේවා ක්ෂේත්‍රයේ වසර 27 ක පමණ සිට සේවය කරනු ලබන අතර 1998 වසරේදී ඔහු බලපත්‍රලාභී පියාසර හසුරුවන්නෙකු ලෙස ගුවන් ගමන් මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙහි සේවයට බැඳුණි. ඔහු 2001 වසරේදී ගුවන් නියමු කෙඩෙට් නිලධාරී ලෙස තේරී පත් වූ පසු එයාර්බස් A330 හි සෘජු ඇතුළත් කිරීම්හි ප

2006 වසරේදී ඔහු එතිහාඩ් එයාර්වේයිස් සමඟ සම්බන්ධ වූ අතර A320, A330, A340 මෙන්ම A380 එයාර්බස් බලඇණියේ ඔහු පියාසර කර ඇත.

එමෙන්ම ඔහු එතිහාඩ් ආරක්ෂක කටයුතු සහ තත්ත්ව දෙපාර්තමේන්තුව සඳහා මඟ පෙන්වන විගණකවරයා ලෙස කටයුතු කළ අතර මෙහෙයුම් විෂය ක්ෂේත්‍රයන් රැසක තත්ත්ව සහතිකකරණ විගණකවරයා ලෙස අභ්‍යන්තර සහ බාහිර විගණන කටයුතු සිදු කරන ලදී. 2019 දී ඔහු නැවතත් ශ්‍රීලංකන් හි කපිතාන්වරයෙකු ලෙස සම්බන්ධ වූ අතර, 2020 වසරේ IOSA සහතික කිරීමේ විගණන සැකසීම සඳහා IOSA විගණන උපදේශකවරයෙකු ලෙස ගිවිස ගන්නා ලදී. ඊළඟට ඔහු 2021 වසරේ සමූහයේ ආරක්ෂක කටයුතු සඳහා ජ්‍යේෂ්ඨ කළමනාකරු ලෙස උසස් වීමක් ලැබීමට පෙර ගුවන්යානා ආරක්ෂක කටයුතු කළමනාකරු ලෙස පත්විය. දැනට ඔහු ආයතනික ආරක්ෂක කටයුතුවලට අමතරව මෙහෙයුම් හි තත්ත්වය අධීක්ෂණය කරයි.

කපිතාන් මඩපාත මහතා එයාර්ලයින්ස්හි අභ්‍යන්තර පුහුණුව ඇතුළු EASA, IATA, එයාර්බස් සහ බොයිං වෙතින් ආරක්ෂක කළමනාකරණ පද්ධතිය පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා ඇත. ඔහු කලාපීය ගුවන් සේවා ආරක්ෂක කටයුතු සැලසුම් සඳහා වන තත්කාර්ය ක්‍රියාකාරකම් කණ්ඩායමේ සේවය කරන අතර වන්වර්ල්ඩ් සේෆ්ටි බෙස්ට් ප්‍රැක්ටිස් කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි. එසේම ඔහු ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් සිදු කරනු ලබන ජාතික ගුවන් ගමන් ආරක්ෂක කටයුතු සැලසුම් හි සංවර්ධනය සඳහා ගුවන් සේවය නියෝජනය කරයි.

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය

## මෙහෙයුම් පරිසරය

### ගෝලීය සාර්ව ආර්ථික පසුබිම

2022 වර්ෂය පුරාවටත් 2023 වර්ෂයේ මුල් භාගයේදීත්, සාර්ව ආර්ථික අභියෝග රැසක බලපෑමට ගෝලීය ආර්ථිකය ලක්වූ අතර 2021 දී 6% කට වඩා වැඩි අගයක පැවති දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය 2023 දී 3% ට වඩා අඩු අගයක් දක්වා පහත වැටීමට එය හේතු විය. පශ්චාත්-වසංගත වාතාවරණය තුළ ගෝලීය ප්‍රතිසාධනයෙහි ප්‍රගතියක් ඇති වෙමින් පැවතියද, ලෝකය ගැටලු රාශියකට මුහුණ පා තිබේ. යුරෝපයේ ගැටුම බලශක්ති හා ආහාර මිල ගණන් වෙත සැලකිය යුතු බලපෑමක් එල්ල කළේය. මීට අමතරව, ඉහළ උද්ධමන අනුපාතවලට ප්‍රතිචාර වශයෙන් මහ බැංකු බොහොමයක් දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කළහ. තවද, ගෝලීය සැපයුම් දාම බිඳවැටීම් හරහා දැනට ක්‍රියාත්මක වන ගුවන් යානා සඳහා අවශ්‍ය අමතර කොටස් ලබා ගැනීම සහ නව ගුවන් යානා බෙදා හැරීම සඳහා බාධා එල්ල වූ අතර ශ්‍රම වෙළඳපොළේ පැවති දැඩි තරඟ කාරීබව ගෝලීය ආර්ථිකයට සහ ගුවන් සේවා කර්මාන්තයට ප්‍රබල අභියෝගයක් විය.

අභියෝග හමුවේ නොසැලී කටයුතු කිරීමට ඇති ශක්තිය 2022 වසරේ පිළිබිඹු කරමින් ගෝලීය ගුවන් සේවා කර්මාන්තය අනාගතයේ තවදුරටත් වැඩි දියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. අනාගත ප්‍රගමනය පිළිබඳ මෙකී දැක්ම සඳහා මූලික වශයෙන් මගී සහ ගුවන් භාණ්ඩ ප්‍රවාහන ව්‍යාපාර වැඩිදියුණු කිරීම සහ ලෝක වෙළඳපොළේ ඉන්ධන මිල ඉහළ යාම හමුවේ එම අංශය විසින් අනුග මනය කරන ලද ශක්තිමත් පිරිවැය පාලන ක්‍රියාමාර්ග වැඩිදියුණු කිරීම මඟින් ඉහළ ගිය ප්‍රතිලාභ හේතු විය. අපේක්ෂිත වර්ධන මට්ටමට ළඟාවීමට නොහැකි වුවද, කර්මාන්තය තවමත් වසර පුරා පවතින සම්බන්ධතා සඳහා ඉහළ ගිය ඉල්ලුම හේතුවෙන් වර්ධන මාවතක ගමන් කරමින් සිටී.

### දේශීය සාර්ව ආර්ථික පරිසරය

නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකා ඉතිහාසයේ ඇති වූ දරුණුතම ආර්ථික පසුබෑමට 2022 මූල්‍ය වර්ෂයේදී මුහුණ පෑමට සිදු විය. වසරේ මුල් භාගය තුළ ආර්ථිකය මුහුණ දුන් අභියෝග සහ අවිනිශ්චිතතාවන් වැඩි වූ නමුත් වසර අවසාන භාගයේ දී යම් ස්ථාවරත්වයක් පෙන්නුම් කළේය. මධ්‍ය කාලීනව ස්ථාවර වර්ධනයක් කරා ආර්ථිකය මෙහෙයවීම ඉලක්ක කරගත් ප්‍රතිපත්තිමය මැදිහත්වීම් කිහිපයක් මෙකී ප්‍රගතිය සඳහා ඉවහල් විය.

කොවිඩ්-19 වසංගතයෙන් පසු යථා තත්ත්වයට පත් වීමේ මාවතක සිටියද, රජයේ අයවැයේ සහ බාහිර ජංගම ගිණුමේ මතු වෙමින් පැවති ද්විත්ව හිඟය එකී ප්‍රගතියේ ශීඝ්‍රතාවට යම් බාධාවක් එල්ල කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පෙර නොවූ විරූ අයුරින් ඇති වූ ආර්ථික අර්බුදයේ නොවැළැක්විය හැකි බලපෑම් හේතුවෙන් වසරේ මුල් භාගය තුළ ආර්ථිකය සංකෝචනය වූ අතර, ප්‍රධාන අංශ සියල්ලෙහි කාර්යසාධනය පහත වැටීමක් පෙන්නුම් කළේය. නිරන්තරයෙන් සිදු වූ විදුලිය ඇනහිටීම්, සැපයුම් මාධ්‍යයන්ට බාධාවක් වන අන්දමින් සිදු වූ දිගුකාලීන ඉන්ධන හිඟය, අමුද්‍රව්‍ය හිඟය සහ නිෂ්පාදන පිරිවැය ඉහළ යාම, දේශීය හා ගෝලීය වෙළඳපළවල මිල වැඩිවීම් මධ්‍යයේ ආර්ථිකයේ සෑම අංශයකම ආර්ථික ක්‍රියාකාරකම් සැලකිය යුතු ලෙස පහත වැටිණි. තවද, දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ පවතින අරමුදල් හිඟය හේතුවෙන් විනිමය අනුපාතිකය මත සැලකිය යුතු පීඩනයක් ඇති වූ අතර, 2022 ඔක්තෝබර් අවසානය දක්වා වසර තුළ ශ්‍රී ලංකා රුපියල 44.8% කින් අවප්‍රමාණය විය.

දේශීය සංචාරක ව්‍යාපාරය යථා තත්ත්වයට පත්වීම ආර්ථික අර්බුදය හේතුවෙන් අඩාල විය. ප්‍රධාන වශයෙන් නොසන්සුන්තාවකින් පසු විවිධ රටවල් විසින් පැනවූ සංචාර සීමා කිරීම් සහ පවතින මුදල් අර්බුදය හේතුවෙන් මෙම අංශය මුහුණ දුන් අභියෝග 2022 අග භාගය දක්වා පැවතුණි. මෙම සාධක, රට තුළට සහ ඉන් පිටතට සිදුවන සංචාරක ව්‍යාපාරයට සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. රට තුළ පවතින අස්ථාවර තත්ත්වය හේතුවෙන් මාර්තු මාසයේදී 100,000 ඉක්මවූ සංචාරකයින් සංඛ්‍යාව 29,000 දක්වා පහත බැස ඇති බව නිල දත්ත හරහා පෙන්නුම් කෙරේ.


*මූලාශ්‍ර:*

1. Global Outlook for Air Transport - Sustained Recovery Amidst Strong Headwinds – December 2022 – IATA
2. Global Outlook for Air Transport - Highly Resilient, Less Robust – June 2023 – IATA
3. Recent Economic Development 2022. November 2022. Central Bank of Sri Lanka. Downloaded from https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/red/2022/Chapter_1_e.pdf
4. Sri Lanka revises down 2022 tourism target to 800,000. October 2022. Downloaded from https://economynext.com/sri-lanka-revises-down-2022-tourism-target-to-800000-100794/]


## අපගේ මෙහෙයුම්

සුවපහසු ගමනාගමන අත්දැකීම් ලබාදීම මෙන්ම ප්‍රමාදයකින් තොරව ලොව පුරා භාණ්ඩ ප්‍රවාහනය සිදු වන බවට තහවුරු කරලීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි මගීන් සහ භාණ්ඩ මෙහෙයුම් මඟින් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. සමාගමේ ආර්ථික ශක්‍යතාවයන් මෙන්ම තිරසාරත්වය කාර්යක්ෂමව පවත්වා ගනිමින් මෙකී ද්විත්වයන්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි මූලික ආදායම් මාර්ගය ලෙස කටයුතු කරයි. මෙහෙයුම් පසුබිමේ අනපේක්ෂිත අභියෝග ඇති වූ වසරක, මෙකී අංශවල වර්ධනය ශක්තිමත් කරලීමට සමාගම විසින් උපායමාර්ග ක්‍රියාමාර්ග ගණනාවක් සිදු කරන ලදී. ඒ අනුව, සමාගම විසින් පිරිවැය කළමනාකරණ උපායමාර්ග ක්‍රියාවට නංවා ඇති අතර, දකුණු ආසියානු උපමහාද්වීපයේ කීර්තිමත් ගුවන් සේවයක් ලෙස එහි තත්ත්වය පවත්වා ගැනීම උදෙසා පවත්නා ජාලය ශක්තිමත් කරමින්, අවදානම විවිධාංගීකරණය කිරීම සඳහා විකල්ප ආදායම් මාර්ග සංවර්ධනය කිරීම පිළිබඳව සොයා බලන ලදී. වැදගත් කාර්යයන් සම්බන්ධීකරණය කරනු ලබන සහ ප්‍රශස්ත කරනු ලබන ශක්තිමත් තාක්ෂණ ප්‍රතිපත්ති මෙම මුලපිරීම් සඳහා රැකුලක් විය. එමඟින් විධිමත් ක්‍රියාවලීන්, වැඩිදියුණු කළ පාරිභෝගික තෘප්තිය මෙන්ම මෙහෙයුම් කාර්යක්ෂමතාව උපරිමය කරනු ලැබීය.

### මගී මෙහෙයුම්

වසර තුළදී, ගෝලීය වශයෙන් මෙන්ම රට තුළ පැවැති සාර්ව ආර්ථික අභියෝග යන් මඟින් මගී මෙහෙයුම් සඳහා සැලකිය යුතු ලෙස බලපෑම් ඇති කරන ලදී. රට තුළ පැවති තත්ත්වය සමඟ සංචාරක කර්මාන්තයේ ශීඝ්‍ර පසුබෑම හේතුවෙන් මගී ගමනාගමනය සැලකිය යුතු ලෙස අඩු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ආදායම එහි අපේක්ෂිත මට්ටමට වඩා අඩු විය. මගී පැමිණීමේ අපේක්ෂිත මට්ටම සඳහා තවදුරටත් බලපෑම් ඇති කරමින් අදාළ කලාපවල ඇතැම් ප්‍රධාන දායකත්වය

දක්වන රටවල් විසින් ඔවුන්ගේ දේශසීමා නැවත විවෘත කිරීම පිළිබඳ අස්ථිර ප්‍රතිපත්ති අනුගමනය කිරීම හේතුවෙන් වසංගත තත්ත්වයෙන් පසු යථාතත්ත්වයට පත්වීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සඳහා දිගු කාලයක් ගත විය. එමෙන්ම වසරේ මුල් භාගයේදී ගුවන් යානා ඉන්ධන හිඟය සහ නඩත්තු, අලුත්වැඩියා සහ මෙහෙයුම් හි පැවති සීමිත ශක්‍යතාව මඟින් ඇති වූ ගැටලු හේතුවෙන් ධාරිතා බාධාවන් උත්සන්න විය. ඒ අනුව වසරේ ප්‍රගතියත් සමඟ ඉහළ යන ඉල්ලුමට සරිලන ලෙස ගුවන් සේවා සැපයීමේදී බාධා ඇති විය.

ජෙට් ඉන්ධන හිඟය මඟින් ක්‍රියාවලීන්ට බාධා ඇති කරන ලදී. මේ හේතුවෙන් නියමිත ගුවන් ගමන් සංඛ්‍යාව නොවැළැක්විය හැකි ලෙස අඩු වූ අතර එමඟින් මඟී ධාරිතාවට බාධා ඇති කරන ලදී. මේ අනුව කාලසීමාව තුළදී දළ වශයෙන් ඇ.ඩො මිලියන 20 ක අලාභයක් ඇති විය. එබැවින් ඉන්ධන නැවත පිරවීම සඳහා දකුණු ඉන්දීය ත්‍රිවාන්ද්‍රම්, මදුරාසි සහ කොචින් යන ස්ථාන හරහා යුරෝපය, ජපානය සහ ඕස්ට්‍රේලියාව වෙත ගුවන් ගමන් සිදු කිරීම ඇතුළුව සිය දිගු දුර ගුවන් ගමන් සියල්ල සඳහා විකල්ප ක්‍රියාත්මක කිරීමට සිදු විය. ආපසු පැමිණීමේදී, කොළඹට නැවත පැමිණීමට පමණක් නොව, ඉන්ධන නැවත පිරවීම සඳහා දකුණු ඉන්දියාවට පැමිණීමට අවශ්‍ය අමතර මෙහෙයුම් දුර සඳහා ප්‍රමාණවත් ඉන්ධන පවතින බවට සහතික කිරීම අත්‍යවශ්‍ය විය.

ඉන්ධන අර්බුදය හේතුවෙන් සිදු කළ වෙනත් සැපයුම් වෙනස්කම් ද විය. ගමනාන්ත වෙත පැමිණෙන වේලාව වෙනස් කිරීම හේතුවෙන් දකුණු ඉන්දියානු නැවතුම් ස්ථානය හරහා (ගුවන් ගමන් වල වක්‍ර මෙහෙයුම්) සිදු කරන ලද සෘජු ගුවන් ගමන් සඳහා දිගු පියාසර කිරීමේ කාලයක් ගත වූ අතර, මේ හේතුවෙන් මඟීන් විසින් එය තෝරා ගැනීමේ අඩුවක් දැකගත හැකි විය. ඉන්ධන ගැටළු හේතුවෙන් නැවතුම් කිහිපයක ගොඩබෑමට වීම හේතුවෙන් වෙළඳපළේ විශ්වාසය සැලකිය යුතු ලෙස අඩු විය. එමෙන්ම, ගමන් ගන්නා මාර්ග යේ වෙනස් කිරීම හේතුවෙන් ගොඩබෑම, ගොඩබිම් මෙහෙයුම් සහ කාර්ය මණ්ඩලය හැසිරවීම සම්බන්ධ අමතර වියදම් ද ඇති විය.

මෙම තත්ත්වයන් යටතේ අඩු මඟීන් සංඛ්‍යාවකින් ආදායම් උත්පාදනය කිරීමට ගුවන් සමාගමට සිදු වූ අතර මෙහෙයුම් පවත්වාගෙන යාමට සහ ආදායම් උත්පාදනය සඳහා දුරදර්ශී විකුණුම් උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමට සිදු විය.

එබැවින්, ආදායම් ඉලක්ක සපුරාලීම සඳහා අදාළ නැවතුම්වල වඩාත් යෝග්‍ය ක්‍රමය හඳුනාගැනීමට එක් එක් ගමනාන්තය, ගමන් ගාස්තු සහ සාක්ෂාත් කරගත හැකි ඉල්ලුම අනුව වෙන් වශයෙන් විශ්ලේෂණය කරන ලදී. අදාළ වෙළඳපොළවලදී විකුණුම් නියෝජිතයින් හා එක්ව ගොඩබිම් මෙහෙයුම් සිදු කරන ලද අතර, අදාළ මාධ්‍ය හරහා ප්‍රශස්ත ආදායමක් ලබා ගැනීම සඳහා ඉලක්ක පැවරීමට කටයුතු කරන ලදී. මෙම කාල සීමාව තුළදී අන්තර්ජාලය හරහා වෙන්කරවා ගැනීමේ එන්ජිම (IBE) හරහා විකුණුම් කටයුතු දිරිමත් කරන ලදී. එකී ජාලය හරහා මාසික ආදායමෙන් 15% ක දායකත්වයක් ලබා දී ඇත.

මෙම කාල සීමාව තුළදී ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් විකල්ප ක්‍රමවේද ඔස්සේ ආදායම ප්‍රශස්ත කරලීමට දැඩි ලෙස අවධානය යොමු කරන ලදී. වසරේ මුල් භාගයේදී අහිතකර සමාජ ආර්ථික තත්ත්වයන් හේතුවෙන් ශ්‍රී ලංකාව වෙත සිදු කෙරෙන සෘජු සංචාරක ගමන්මාර්ග දැඩි ලෙස බලපෑමට ලක් වන ලදී. එහිදී ගුවන් සමාගම විසින් ශ්‍රී ලාංකේය ප්‍රජාව අතර ජනවාර්ගික සහ මිතුරන්ගේ සහ නෑදෑයින්ගේ සුවදුක් විමසීමට පැමිණීම (VFR) පිළිබඳ වූ සංචාරක කටයුතුවල උනන්දුවක් ඇති කරලීමට වැඩි වශයෙන් කටයුතු කරන ලදී. තවද, ඉන්දියානු උප-අන්තර්ගතයේ සිට පවතින වෙළඳපළ වෙත සංක්‍රමණ ගමනාගමනය, විශේෂයෙන් ඈත පෙරදිග කලාපයේ ගමනාගමන, කොළඹ කේන්ද්‍රස්ථානය හරහා බාධාවකින් තොරව සහ පහසු සම්බන්ධතාවයකින් සුරක්ෂිත විය. ගුවන් ගමන් සඳහා ඇති ඉල්ලුම ක්‍රමානුකූලව නැවත වර්ධනය වීම හේතුවෙන් ශ්‍රී ලංකාව වෙත නැවත මෙහෙයුම් ආරම්භ කිරීම තුළින් වසරේ දෙවන භාගය වන විට ගොඩබිම් හැසිරවීමේ සේවා සහ අනෙකුත් ගුවන් සමාගම් සඳහා ආහාර සැපයීම ඔස්සේ ආදායම් මාර්ග තවදුරටත් වැඩිදියුණු කරන ලදී.

මෙම කාලසීමාව පුරාවටම, ගුවන් ගමන් මාර්ගවල ලාභදායිතාවය හඳුනා ගැනීමටත්, මූල්‍ය ශක්‍යතාව පිළිබඳ තීරණ ගැනීමේදීත්, පිරිවැය අවම කර ගැනීම සඳහා අදාළ මාර්ගවල නියමිත ගුවන් යානා වෙන් කිරීම තීරණය කිරීමටත් දිනපතා ගුවන් ගමන් පිළිබඳ නිරීක්ෂණය කිරීම් සිදු කරන ලදී. ආදායම ඉහළ නැංවීමට සහ පිරිවැය ප්‍රශස්ත කරලීමට ගුවන් යානා භාවිතය තවදුරටත් වැඩිදියුණු කිරීමට ගුවන් යානා හැරවීම් සඳහා ශක්තිමත් ක්‍රියාමාර්ග සකස් කරන ලදී. මෙම ක්‍රමවේද මඟින් සැලකිය යුතු පිරිවැය ඉතිරියක් ලබා ගැනීමට සහ ආදායම් උත්පාදනය උපරිම කිරීමට හැකි විය. තවද, දැනට පවතින ගමනාන්ත විශේෂයෙන් ඉන්දියානු උප මහාද්වීපය සහ ඈත පෙරදිග කලාපය සඳහා සංඛ්‍යාත වැඩි කිරීමට අමතරව, සිඩ්නි ගමනාන්තයට මෙහෙයුම් හඳුන්වාදීමෙන් ජාලය පුළුල් කරන ලදී. සාර්ථක ලෙස ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් ලොව පුරා ගමනාන්ත 78ක් සමඟ කේත හුවමාරු හවුල්කාරිත්වයන් පිහිටුවා ගැනීමට අමතරව, මාර්ගගත මඟී ගමනාන්ත 34ක් වෙත නියමිත මඟී ගුවන් ගමන් ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව, 2022/23 මූල්‍ය වර්ෂය සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් බිලියන 293.3 ක මඟී ආදායමක් අත් කර ගත් අතර, එය පෙර වසරට සාපේක්ෂව 276% ක වර්ධනයක් වේ. මෙය පූර්ව කොවිඩ් ආදායම් මට්ටමෙන් 97%ක සැලකිය යුතු වර්ධනයකි. මෙම කාලසීමාව තුළ ගුවන් සමාගම මඟීන් මිලියන 3.48ක් ප්‍රවාහනය කළ අතර, එය පෙර වසරට සාපේක්ෂව 137%ක සුවිශේෂී වර්ධනයක් වන්නා සේම පූර්ව කොවිඩ් මඟී මට්ටම්වලින් 75% ක වර්ධනයක් වේ. තවද, පෙර වසරට සාපේක්ෂව 29% ක වර්ධනයක් සනිටුහන් කරමින්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් මඟී කිලෝමීටරයකට ආදායම (RPK) 7.08ක් සහ ආසන සාධකය 77.65%ක හිතකර ප්‍රතිලාභයක් අත්කර ගැනීමට සමත් විය. සමස්ත ආදායමෙන් 6% ක් දක්වමින් අනුපූරක සේවා පිරිනැමීම් මඟින් රුපියල් බිලියන 20.7 ක ආදායමක් උත්පාදනය කරන ලදී.

හිතකර වර්ධන පසුබිමක් මධ්‍යයේ, විවිධ අවදානම් සාධක ගුවන් සමාගමේ වර්ධන සැලසුම් සඳහා නිරන්තරයෙන් අභියෝග කරයි. මේ වන විට උපයෝජ්‍ය ආදායමක් ලෙස පෙන්නුම් කරනු ලබන පවතින ආර්ථික අස්ථාවරත්වය අනුව, කෙටි කාලීනව ගමන් කිරීමට ඇති නැඹුරුව අඩු වීම මෙන්ම ආදායම මත බලපෑම වැඩි විය හැක. කෙසේ වෙතත්, ආරක්ෂිත ගමනානතයක් ලෙස ශ්‍රී ලංකාව පිළිබඳ පාරිභෝගික විශ්වාසය වර්ධනය වීම හේතුවෙන් මූල්‍ය වර්ෂයේ දෙවන භාගයේදී සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රගතියක් ඇති වීම තුළින් අනාගතයේ මඟී ගමනාගමනයේ යථා තත්ත්වයට පත් වීම පිළිබඳ බලාපොරොත්තු ඇති කරයි.

## උපායමාර්ගික හවුල්කාරීත්වය

ගුවන් සමාගමේ අන්තර් ගිවිසුම් සහ කේත හුවමාරු හවුල්කාරිත්වය මඟින්ද නව වෙළඳපොළ වෙත යොමු වීමට එහි ජාලය පුළුල් කරමින්, අමතර ආදායම් අවස්ථා

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.

නිර්මාණය කරමින් මෙහෙයුම්වල වටිනාකම වැඩිදියුණු කරන ලදී. මෙම හවුල්කාරිත්වය ඔස්සේ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හට පවතින ගුවන්යානා ඇණිය වෙත නව වෙනස්කම් සිදු නොකරමින්, මාර්ගගත නොවන ගමනාන්තයන් සඳහා සම්බන්ධතාවයක් සලසමින්, එහි මාර්ගගත ගමනාන්තයන්හි පවතින ජාලයන් පුළුල් කිරීමට හැකි විය. එසේම, මෙමගින් මාර්ගගත මෙහෙයුම් ආරම්භ කිරීමට මූල්‍යමය වශයෙන් හැකියාවක් නොමැති වෙළඳපළ වෙත සේවා සැපයීමට ගුවන් සමාගමට හැකි විය.

මෙම හවුල්කාරිත්වයන් මගීන්ට එක් ප්‍රවේශපත්‍රයකින් ගුවන් සමාගම් කිහිපයකට සම්බන්ධ ගමනාන්ත වෙත ගමන් කිරීමේ විකල්පය, විධිමත් ගමන් මලුවල හැසිරවීමේ පහසුව සහ ප්‍රමාද වූ විට ප්‍රමාණවත් ආරක්ෂාවක් ලබා ගැනීමේ අමතර ප්‍රතිලාභය ඇතුළත්ව ඉහළ තෘප්තියක් මෙන්ම විශ්වාසයක් ඇති කරමින් මගීන්ට බාධාවකින් තොරව ගමන් අත්දැකීමක් සහතික කර ඇත.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් 2014 වර්ෂය පටන් "වන්වර්ල්ඩ්" එකමුතුව හි සාමාජිකත්වය දරන අතර, එමගින් සංචාරකයින් වෙත ලොව වටා වන්වර්ල්ඩ් ගමනාන්ත 1,100කට අධික ප්‍රමාණයක් ගවේෂණය කිරීමට අවස්ථා සලසනු ලබයි. ඉන්දීය උප මහද්වීපයෙන් එකමුතුව වෙත ඇතුළත් වූ ප්‍රථම ගුවන්සේවය ලෙස ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් ගුවන් සේවා ව්‍යාපාරවල විශාලතම මෙන්ම උසස් සන්නාමයන් කිහිපයක් සමඟ සාමාජිකත්වය බෙදා ගන්නා ලදී. එකී සන්නාමයන් අතරට ඇලස්කා එයාර්ලයින්ස්, ඇමරිකන් එයාර්ලයින්ස්, බ්‍රිතිෂ් එයාර්වේස්, කැතේ පැසිෆික්, ෆින්එයාර්, ඉබේරියා එයාර්ලයින්ස්, ජපන් එයාර්ලයින්ස්, මැලේයාර්සියා එයාර්ලයින්ස්, කොන්ටර්ස්, කටාර් එයාර්වේස්, රෝයල් එයාර් මැරොක් සහ රෝයල් ජෝර්ඩාර්නියන් ඇතුළත් වේ.

කලාපීය වාහකයෙකු ලෙස එහි සන්නාම වටිනාකම ගෝලීය මට්ටම දක්වා පුළුල් කරමින් ගුවන් සේවා ජාලයේ වර්ධනය උදෙසා මෙම හවුල්කාරිත්වය ඉවහල් වී ඇති අතර, පාරිභෝගික කාණ්ඩ වෙන්කර හඳුනා ගැනීම සඳහා ඔවුන්ට පුද්ගලාරෝපිත සේවාවක් පිරිනමමින් ලෝයල්ටි වැඩසටහන වෙත සහය සපයයි. වන්වර්ල්ඩ් නිරන්තරයෙන් භාවිත කරනු ලබන සාමාජිකයින් විසින් ව්‍යාපාරික පන්තියේ ලියාපදිංචි වීම, ප්‍රමුඛතා පොරොත්තු ලේඛනය, ප්‍රමුඛතා පැටවුම්, ඉහළ ගමන් මලු දීමනාව සහ ලොව පුරා විසිත්ත කාමර 550කට වැඩි ප්‍රමාණයකට ප්‍රවේශය ඇතුළු විවිධ ප්‍රතිලාභ භුක්ති විඳිනු ලබයි. මීට අමතරව, ගනුදෙනුකරුවන්ට සියලුම එලායන්ස් සාමාජික වාහකයන්වල නිතර පියාසර සැතපුම් ඉපයීම සහ භාවිතය සිදු කළ හැකි අතර එමගින් සාමාජිකයින් වෙත විවිධාකාර වූ විකල්පයන් ලබා දේ.

මූල්‍ය වර්ෂය තුළදී, ජර්මන් රේයිල් සමඟ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් අන්තර් සම්බන්ධතා ගිවිසුමකට එළැඹෙන ලදී. එමගින් පාරිභෝගිකයින්ට ශ්‍රීලංකන් ගුවන් සේවය හරහා සංචාරය කරන විට එක් වෙන් කරවා ගැනීමක් ඔස්සේ ජර්මනියේ සිට ඕනෑම ස්ථානයකට ඔවුන්ගේ සම්පූර්ණ ගමන වෙන්කරවා ගැනීමේ පහසුව සලසා දෙනු ලබයි. මේ ආකාරයට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් කුවේට් එයාර්වේස් සමඟ කේත බෙදාගැනීමේ හවුල්කාරිත්වයක් ඇති කර ගනිමින් වැඩිදියුණු කළ සම්බන්ධතාවක් සහ ගුවන් සමාගම් දෙකෙහිම පාරිභෝගිකයින්ට පහසුවක් එක් කළේය.

### භාණ්ඩ මෙහෙයුම්

ගුවන් යානා ඉන්ධන අර්බුදය හේතුවෙන් පියාසැරි හරහා භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ ධාරිතාව අඩු වූ අතර එමගින් 2022/23 මූල්‍ය වර්ෂය තුළ භාණ්ඩ ප්‍රවාහනය සඳහා සැලකිය යුතු අභියෝග එල්ල විය. මේ හේතුවෙන් වසරේ මුල් භාගය තුළ ගනුදෙනුකරුවන්ට සහ ව්‍යාපාරවලට සැලකිය යුතු පාඩුවක් සිදු විය. මෙම කාලපරිච්ඡේදය තුළ, සමස්ත භාණ්ඩ ප්‍රමාණය ටොන් මිලියන 0.8 සිට 17% කින් පහත වැටුණු අතර, භාණ්ඩ ප්‍රමාණය, ආදායම් ටොන් කිලෝමීටර් (RTK) 26% කින් අඩු කිරීමට හේතු විය.

මෙම කාලපරිච්ඡේදය තුළ, ලෝක ව්‍යාප්ත මූල්‍ය අර්බුදය සහ ආර්ථික පසුබෑම පාරිභෝගිකයින්ගේ මිලදී ගැනීමේ ශක්තිය අඩු කිරීමට හේතු වූ අතර එමගින් වෙළඳාම අනුක්‍රමිකව අඩු වී ගුවන් භාණ්ඩ ප්‍රවාහන සඳහා ඇති ඉල්ලුම පහත වැටුණි. පොහොර ආනයනය අඩු වීම හෝග අස්වැන්න පහත වැටීමට හේතු වූ අතර ඒ හේතුවෙන් සමස්ත අපනයන භාණ්ඩ අංශයට බලපෑමක් ඇති කරමින් නශ්‍ය අපනයන වෙත බලපෑමක් එල්ල කළේය. පශ්චාත්-වසංගත අවධියේදී භාණ්ඩ අංශයේ වර්ධනයට ධනාත්මක බලපෑමක් ඇති කළ මාර්ගගත මිලදී ගැනීම්වල පැහැදිලි වැඩිවීමක් පෙන්නුම් කළ අතර, මෙහෙයුම් පරිසරයේ වර්ධනයන් මෙම ගම්‍යතාවය යටපත් කළේය. මේ අනුව, වසරේ අවසාන භාගයේදී ධාරිතාව වැඩි කළද, ඉල්ලුම අඩුවීම හේතුවෙන් ගුවන් භාණ්ඩ අංශයට අහිතකර බලපෑමක් එල්ල විය.

කෙසේ වෙතත්, ගුවන් භාණ්ඩ ප්‍රමාණයේ අඩුවීමක් තිබියදීත්, වාර්ෂික ගුවන් භාණ්ඩ ආදායම පෙර වසරට සාපේක්ෂව 16% ක වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් බිලියන 51 දක්වා ළඟා විය. වසරේ මුල් භාගයේදී, රටේ දේශපාලන හා ආර්ථික අස්ථාවරත්වය මධ්‍යයේ, රෙදිපිළි සහ නශ්‍ය භාණ්ඩ රටෙන් පිටතට ප්‍රවාහනය කිරීමට පහසුකම් සැලසීම හරහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි භාණ්ඩ මෙහෙයුම් ආදායම ඉහළ ගිය අතර එමගින් ගුවන් සේවයේ මාර්ගගත සේවා ගමනාන්තයන්ගෙන් පිටත වෙළඳපළ වෙත ප්‍රවේශය වැඩි විය. මෙමඟින් පශු සම්පත් ප්‍රවාහනය, නශ්‍ය භාණ්ඩ සහ නිමි අපනයනය හරහා ආදායම් උත්පාදනය කිරීම සඳහා ගුවන් භාණ්ඩ අංශයට නව වෙළඳපළ අවස්ථා නිර්මාණය විය.

ආදායමට සැලකිය යුතු දායකත්වයක් ලබා දෙමින් ශ්‍රීලංකන් කාගෝ විසින් ඉන්දියාවෙන් මෙට්‍රික් ටොන් 10,000 කට ආසන්න භාණ්ඩ තොගයක්ද ප්‍රවාහනය කර ඇත. මෑතදී නිමාවට පත් වූ 2023 ඉන්දියා කාගෝ සම්මාන උළෙලේදී හොඳම ජාත්‍යන්තර භාණ්ඩ ප්‍රවාහන ගුවන් සේවය ලෙස පිළිගැනීමට ලක් විය. එපමණක් නොව, ශ්‍රී ලංකා ලොජිස්ටික්ස් සහ භාණ්ඩ ප්‍රවාහනය කරන්නන්ගේ සංගමය (SLFFA) විසින් ශ්‍රීලංකන් කාගෝ හි නව්‍ය විසඳුම් අගයමින් ගුවන් සේවා කාණ්ඩයේ "රන්" සම්මානය ප්‍රදානය කරන ලදී.

භාණ්ඩ ප්‍රවාහන අංශයේ ඖෂධ සහ ඊ-වාණිජ්‍ය ක්ෂේත්‍ර කාලපරිච්ඡේදය තුළ සැලකිය යුතු වර්ධනයක් (වසරින් වසර 6% ක වර්ධනයක්) පෙන්නුම් කළේය. එබැවින් නුදුරු අනාගතයේදී ආදායම් උත්පාදනය සඳහා ශ්‍රීලංකන් කාගෝ විසින් මෙම ක්ෂේත්‍ර දෙකට ප්‍රමුඛත්වය දෙනු ඇත. තවද, ඇතැම් රටවල් තම නිෂ්පාදන මෙහෙයුම් වියට්නාමය, ඉන්දියාව, කාම්බෝජය සහ ලාඕසය වෙත මාරු කර ඇති බැවින් භාණ්ඩ ප්‍රවාහන ක්ෂේත්‍රය සැලකිය යුතු වෙනස්කම්වලට භාජනය වී ඇත. සාම්ප්‍රදායික ක්‍රම වෙතින් ඉවත් වී නව ව්‍යාපාරික මාර්ග ගවේෂණය කිරීමේ අවශ්‍යතාව මෙයින් පැහැදිලි වේ. මීට අමතරව, විශේෂයෙන් නශ්‍ය භාණ්ඩ නිෂ්පාදනය කිරීමේදී, වර්ධනය වන වෙළඳපොළක් ලෙස අප්‍රිකානු කලාපය හඳුනාගත හැකිය.

අනාගතයේදී, සැලකිය යුතු අවදානම් සාධකයක් වනුයේ, පුද්ගලයන් සහ සමාගම් විසින් විශේෂයෙන් ගුවන් භාණ්ඩ ප්‍රවාහනය හරහා අභිමත භාණ්ඩ වෙනුවෙන් සිදු කරන වියදම් අඩු කිරීමයි. මෙය ආර්ථිකයේ මන්දගාමීත්වයට හේතු වන අතර ඒ හරහා ගුවන් භාණ්ඩ ආදායම සහ ලාභදායිත්වය අඩු වීමට ඉඩ ඇත. කෙසේ වෙතත්, කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා හේතු වන භාණ්ඩ මෙහෙයුම් සඳහා අනාගත සංවර්ධන සැලසුම් සහ නව ආනයන පර්යන්තයක් පිහිටුවීම සහ කුරියර් සහ නශ්‍ය මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීම ඇතුළු නවතම තාක්ෂණික වැඩි දියුණු කිරීම් ක්‍රියාත්මක වේ.

### තාක්ෂණය යොදා ගනිමින් මෙහෙයුම් ක්‍රියාකාරම්වල ඵලදායීතාවය වැඩි කිරීම

කාලෝචිත තාක්ෂණික මැදිහත්වීම් සමඟින් මෙහෙයුම් ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් යොමු වී ඇත. මෙමඟින්, මෙහෙයුම් ක්‍රියාවලියේ ප්‍රධාන අංශවල විප්ලවීය වෙනසක් ඇති කිරීමත් විශිෂ්ට, විශ්වාසදායක සහ බාධාවකින් තොර පාරිභෝගික අත්දැකීමක් ලබා දීම සඳහා වූ කැපවීම යළි තහවුරු වීමත් සිදු වනු ඇත.

### 1. නව ආදායම් කළමනාකරණ පද්ධතිය

ශ්‍රීලංකන් ගුවන් සමාගම, 2004 වසරේ හඳුන්වා දුන් දැනට පවතින ක්‍රමය ප්‍රතිස්ථාපනය කරන කෘතිම බුද්ධිය (AI) සහ යාන්ත්‍රික ඉගෙනුම (ML) මඟින් මෙහෙයවනු ලබන වැඩිදියුණු කළ පුරෝකථනය කිරීමේ හැකියාවන් සහිත ගමනාරම්භ සහ ගමනාන්ත ක්‍රියාකාරීත්වයෙන් සමන්විත කර්මාන්තයේ ප්‍රමුඛ ආදායම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවලියක නියැළී සිටී. පුද්ගලාරෝපිත අත්දැකීම්, තරඟකාරී මිලකරණය සහ පුද්ගල මඟී අවශ්‍යතා සහ මනාපයන් අනුව සකස් කරන ලද කාර්යක්ෂම සේවා සැපයීම සඳහා පවතින ඉන්වෙන්ටරි ප්‍රශස්ත කිරීම මඟින් ආදායම් කළමනාකරණය සඳහා මඟී කේන්ද්‍රීය ප්‍රවේශයකට පහසුකම් සැලසීම නව ක්‍රමයේ අරමුණයි.

කණ්ඩායම් මඟී ප්‍රමාණය සහ ආදායම ප්‍රශස්ත කිරීම සඳහා කණ්ඩායම් කළමනාකරණ ක්‍රියාවලිය විධිමත් කිරීමේ අරමුණින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් කණ්ඩායම් කළමනාකරණ පද්ධතියක් සඳහාද ආයෝජනය කර ඇත. ව්‍යාපෘතිය දැනට පරිශීලක පරීක්ෂණ මට්ටමේ පවතින අතර ඉදිරි මුදල් වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය.

### 2. ස්වයංක්‍රීය නව පියාසැරි සැලසුම් පද්ධතිය

පියාසැරි සැලසුම්හි විප්ලවීය වෙනසක් ඇති කරමින්ද කාර්යක්ෂමතාව සහ ආරක්ෂාව ඉහළ නංවමින්ද ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් ස්වයංක්‍රීය නව පියාසැරි සැලසුම් පද්ධතියක් ක්‍රියාවට නංවන ලදී. මෙම පද්ධතිය ඉන්ධන කාර්යක්ෂම පියාසැරි මාර්ග, තත්‍ය කාලීන කාලගුණ දත්ත සහ පියාසර කාර්ය මණ්ඩලය සඳහා කාලය ඉතිරි කර ගැනීමට හැකි ස්වයංක්‍රීය පියාසැරි සැලසුම් සහ පියාසැරි කාලසටහන් වඩාත් නිවැරදිව සැලසුම් කිරීම සම්බන්ධ තොරතුරු සපයයි.

### 3. නව ජංගම යෙදුම

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් නවීන තාක්ෂණයෙන් සමන්විත පරිශීලක-හිතකාමී අතුරු මුහුණතක් සහිත නව්‍ය ජංගම යෙදුමක් දියත් කරන ලදී. එමඟින්, මඟීන්ට ඔවුන්ගේ ගුවන් ගමන්වලට අදාළ වෙන් කිරීම් පහසුවෙන් කළමනාකරණය කිරීමටත් අගය එකතු කළ සේවාවන් මිලදී ගැනීමටත් FlySmiLes ගිණුමක් සඳහා ලියාපදිංචි වීමටත් අවැසි විශේෂාංග කිහිපයක් ඉදිරිපත් කෙරේ. මෙම යෙදුම හරහා මඟියාට ගුවන් ගමන අතරතුර ඔවුන්ගේ කෑම වේල තෝරා ගැනීමට, ආසන වෙන් කරවා ගැනීමට, ගමන් දින සහ අංශ වෙනස් කිරීමට, අතිරික්ත ගමන් මලු, සංචාරක රක්ෂණ සහ තීරුබදු රහිත භාණ්ඩ වැනි අගය එකතු කළ සේවාවන් මිලදී ගැනීමට සහ ගුවන් ගමන් පිළිබඳ කල්තියා පරීක්ෂා කිරීමට හැකියාව ලබා දේ. නවතම 'My Trips' විශේෂාංගය හරහා යෙදුම තව දුරටත් වැඩිදියුණු කරන ලද අතර එමඟින් පාරිභෝගිකයෙකුට ඉදිරි ගුවන් ගමනක් සඳහා අවශ්‍ය වැදගත් තොරතුරු නියමිත වේලාවට යෙදුමේ මුල් පිටුවෙහි පෙළ ගස්වනු ලැබේ. මෙම මුල් පිටුවේ පියාසැරි කාලසටහන පිළිබඳ නවතම තොරතුරු ඇතුළත් වන අතර නවතම ගනුදෙනු සහ ප්‍රවර්ධන ගාස්තු පිළිබඳ යාවත්කාලීන කිරීම් සමඟින් ගුවන් ගමන්වලට අදාළ පිටත්වීමේ සහ පැමිණීමේ වේලාවන් සොයා ගැනීමට පරිශීලකයින්ට ඉඩ සලසයි.

### 4. නව ආදායම් ගිණුම්කරණ පද්ධතිය

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් දැනට එහි මඟී ආදායම් ගිණුම්කරණ පද්ධතියේ සම්පූර්ණ පරිවර්තනයක් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී. මෙම ප්‍රතිස්ථාපන ක්‍රියාවලිය සඳහා සම්පූර්ණ ස්වයංක්‍රීය දෛනික ඇස්තමේන්තු ඒකාබද්ධ කිරීම, මානව මැදිහත්වීම අඩු කිරීම සඳහා ස්වයංක්‍රීය කූපන් සැකසීම සහ ගුවන් යානා ලියාපදිංචි කිරීමේ මට්ටම දක්වා ආදායම ගණනය කිරීමේ හැකියාව ඇතුළත් වේ. ගුවන් සමාගම විසින් තීරණාත්මක තොරතුරු වෙත පහසු ප්‍රවේශයක් ලබා දෙමින් වැඩිදියුණු කළ පරිශීලක අත්දැකීමක් සහ ප්‍රතිචාරාත්මක වෙබ් නිර්මාණයක් පිරිනැමෙන සත්කාරක විසඳුමක්ද අනුගමනය කර ඇත. එපමණක් නොව, නව වාර්තාකරණ මොඩියුලය මඟින් ඉල්ලුම මත වැඩි දියුණු කරන ලද වාර්තාකරණ ක්‍රමවේදය භාවිත කරමින් දත්ත මත පදනම් වූ තීරණ ගැනීමේ හැකියාව සංවිධානය සතු වේ.

### 5. Cloud First IT ක්‍රමෝපාය

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් Cloud-first IT උපාය මාර්ගයක් ක්‍රියාවට නංවා ඇති අතර, "ඔබ වර්ධනය වන විට ගෙවන්න" ආකෘතිය සමඟින්, පරිමාණය සහ නම්‍යශීලී බව සහතික කරන අතරම ක්ලවුඩ් තාක්ෂණයේ වාසි ප්‍රයෝජනයට ගෙන ඇත. මෙම ප්‍රවේශය මඟින් වියදම් විධිමත් කිරීම සහ සම්පත් වෙන් කිරීම සිදු කරමින් විකාශනය වන ඉල්ලුම සපුරාලීම සඳහා තොරතුරු තාක්ෂණ සම්පත් ඵලදායී ලෙස අනුවර්තනය කිරීමට ගුවන් සමාග මට හැකියාව ලබා දී ඇත. "ඔබ වර්ධනය වන විට ගෙවන්න" ආකෘතිය සමඟ ක්ලවුඩ් පරිමාණය අනුකලනය කිරීමෙන්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හට මෙහෙයුම්හි කාර්යක්ෂමභාවය ලබා ගැනීමට, නවීන විසඳුම් සැපයීමට සහ විධිමත් සහ නම්‍යශීලී ඩිජිටල් යටිතල පහසුකම් හරහා මඟී අත්දැකීම වැඩිදියුණු කිරීමට හැකි වී ඇත.

## අපගේ මානව සම්පත

අපගේ උපායමාර්ගික මුලපිරීම්වල පදනම ලෙසත් වටිනාකම් නිර්මාණය කිරීම සඳහා වන අපගේ ක්‍රියාවලිය පිටුපස ඇති මූලික බලවේගය ලෙසත් අප සේවක ප්‍රජාව නිරන්තරයෙන් ක්‍රියා කරයි. ඔවුහු අපගේ මෙහෙවර මූර්තිමත් කරන අතර අප පාරිභෝගිකයින්ගේ අත්දැකීම්වලට සෘජුවම බලපෑම් කරමින් අපගේ වෙළඳ නාමය ලොවට ගෙන යන පිරිස වශයෙන් කටයුතු කරති. එබැවින්, වෘත්තීය වර්ධනය සඳහා අවස්ථා, කර්මාන්තයට සමාන වේතන සහ විවිධ ක්‍රියාකාරකම් සඳහා සහභාගී වීමට අවස්ථා ඇතුළු ප්‍රතිලාභ රැසක් ලබා දීම තුළින් සේවා ස්ථානයේ ඔවුන්ගේ යහපැවැත්ම සහ තෘප්තිය සහතික කිරීමට අපි කැපවී සිටින්නෙමු. ඔවුන් තුළ කැපීපෙනෙන කාර්යසාධනය සහ සමාගමට දක්වන පක්ෂපාතිත්වය කාලීන වශයෙන් අගයමින් තිළිණ ප්‍රදානය කිරීම හරහා සමාගම වෙත ඔවුන් විසින් ලබා දෙන අගනා දායකත්වයට නිසි වටිනාකමක් ලබා දෙනු ලැබේ.

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.

2022/23 මූල්‍ය වර්ෂය වන විට, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි සමස්ත සේවක සංඛ්‍යාව 5440 ක් විය. ඉන් 69% ක් පිරිමි සේවකයින් වන අතර 31% ක් කාන්තා සේවිකාවන් වේ. එකී සේවකයින් විවිධ උපාය මාර්ගික
ව්‍යාපාරික ඒකක අතර බෙදී යන අතර බහුතරයක් 1-7 ශ්‍රේණි කාණ්ඩයට අයත් වේ.

### 2022/23 වන විට ස්ත්‍රී-පුරුෂභාවය අනුව මුළු සේවක වර්ගීකරණය

| ස්ත්‍රී-පුරුෂභාවය | සේවක සංඛ්‍යාව | අනුපාතය |
|---|---|---|
| ස්ත්‍රී | 1687 | 31% |
| පුරුෂ | 3753 | 69% |
| එකතුව | 5440 | 100% |

### 2022/23 වන විට කාණ්ඩය අනුව මුළු සේවක වර්ගීකරණය

| කාණ්ඩය | සේවක සංඛ්‍යාව |
|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහ අනෙකුත් කළමනාකරුවන් | 263 |
| ගුවන් නියමුවරු | 273 |
| ගුවන් සේවක/සේවිකා | 937 |
| ගුවන්යානා ඉංජිනේරු සහ තාක්ෂණ ශිල්පීන් | 645 |
| පුහුණු අභ්‍යාසලාභී, 1-7 ශ්‍රේණි සහ විධායක නිලධාරීන් | 3322 |
| එකතුව | 5440 |

### විවිධත්වය සහ සමානත්වය

ස්ත්‍රී-පුරුෂ භාවය, වයස, ජනවර්ගය, ආබාධිතභාවය, ආගම, ලිංගික අනන්‍යතාව හෝ සංස්කෘතික පසුබිම නොසලකා සේවකයින්ට ස්වකීය දියුණුව සලසාගත හැකි, වෙනස් කොට සැලකීමකින් තොර පරිසරයක් සහතික කරලමින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් සේවා පරිසරය තුළ විවිධත්වය, සමානාත්මතාවය සහ පිළිගැනීම වර්ධනය කොට තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමස්ත ව්‍යාපාරික ක්‍රියාවලිය සඳහා අගනා දායකත්වයක් සපයන විවිධ කුසලතා සහිත විවිධ සමාජ පසුබිම්වල පුද්ගලයින් රැසක් සිය සේවක කණ්ඩායම වෙත ආකර්ෂණය කර ගැනීමට සමාගම සමත් වී තිබේ. මෙම සේවකයින් බඳවා ගැනීමේ සහ වෘත්තීය සංවර්ධනයේ සිට උසස්වීම් හෝ ඔවුන්ගේ කාර්යසාධනය සහ ධාරිතාව මත පදනම්ව සිදු කරනු ලබන ඕනෑම වැඩි දියුණුවීමක් දක්වා සමස්ත සේවක ජීවන චක්‍රය පුරාම සමාන අවස්ථා පිරිනමනු ලැබේ.

### ශ්‍රීලංකන් එයාර්ලයින්ස් මානව සම්පත් ප්‍රතිපත්තිය

මෙහෙයුම් වාර ගණන වැඩි වීම මඟින් වසර තුළ ගුවන් සේවා කර්මාන්තය වැඩි දියුණු වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළ අතර එය සැලකිල්ලට ගනිමින් ශ්‍රීලංකන් ගුවන් එයාර්ලයින්ස් හි මානව සම්පත් අංශය එහි මානව සම්පත් කළමනාකරණ උපායමාර්ගය වෙත අවධානය යොමු කළේය. මෙහිදී, ධාරිතා සීමාකිරීම්, වෙළඳපළ අස්ථාවරත්වය සහ සම්පත් සීමා සහිත වීම වැනි සාධකවල බලපෑම සහිත පරිසරයක් තුළ ලාභදායිත්වය ඉහළ නැංවීම වෙනුවෙන් කටයුතු කිරීමට සමාගමේ සමස්ත උපාය මාර්ග යට සහය දැක්වීම අරමුණු කෙරිණි. එබැවින්, සමාලෝචිත කාල සීමාව තුළ මානව සම්පත් අංශය උපායමාර්ගික වැදගත්කමකින් යුතු පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරන ලදී.

- වැඩි කරන ලද මෙහෙයුම් කටයුතු සඳහා සහය වන අයුරින් මානව සම්පත ඵලදායීව කළමනාකරණය කිරීම.
- සේවකයින් දිරිමත් කිරීමට සහ විවිධ කටයුතු සඳහා ඔවුන්ගේ සහභාගීත්වය ඇති කිරීමට ත්‍යාග සහ පාරිශ්‍රමික පිරිනැමීම.
- ව්‍යාපාරයෙහි අඛණ්ඩ පැවැත්ම සහතික කිරීම සඳහා ශක්‍යතා සංවර්ධනය සහ කුසලතා වැඩි දියුණු කිරීම.
- ඵලදායී ශ්‍රම බලකායක් සහතික කිරීම සඳහා සේවකයින්ගේ සෞඛ්‍යය සහ යහපැවැත්ම තහවුරු කිරීම.
- ධනාත්මක මෙන්ම සාමූහික හැඟීමෙන් කටයුතු කරන සේවා පරිසරයක් නිර්මාණය කිරීම සඳහා සේවා ස්ථානය තුළ සමගිය වර්ධනය කිරීම.

### බඳවා ගැනීම සහ රඳවා ගැනීම

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි සාධාරණ සහ අපක්ෂපාතී බඳවා ගැනීමේ ක්‍රියාවලිය හරහා සෑම පුරප්පාඩුවක් සඳහාම ඊට සුදුසුම අයදුම්කරුවන් ආකර්ෂණය කර ගැනීම සහ බඳවා ගැනීම කෙරෙහි අවධානය යොමු කෙරේ. අපේක්ෂකයින් තෝරාගනු ලබන්නේ ඔවුන්ගේ සුදුසුකම් සහ රැකියා භූමිකාව සඳහා වන යෝග්‍යතාවය මත ය. තෝරා ගැනීමේ ක්‍රියාවලියේදී, ඔවුන් ලිඛිත, පෞර්ෂ, චර්යාත්මක සහ මනෝමිතික ඇගයීම් ඇතුළත් දැඩි තක්සේරුවකට භාජනය කෙරෙන අතර එයට සම්මුඛ පරීක්ෂණයක්ද ඇතුළත් වේ. තවද, අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ තහවුරු කිරීමට අමතරව කළමනාකරණ තනතුරු සඳහා නිර්දේශක පරීක්ෂණද සිදු කෙරේ.

එවකට පැවති ආර්ථික හා දේශපාලන අස්ථාවරත්වය, වසර තුළ 9% ක ඉහළ සේවක පිරිවැටුම් අනුපාතය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් එල්ල කළේය. මේ වන විට දියුණු වෙමින් පවතින මැද පෙරදිග ගුවන් සමාගම් වෙත රැකියා සොයා යාමේ ප්‍රවණතාවක් ඇති වී ඇති බැවින් බොහෝ සේවකයෝ නිපුණතා සංක්‍රමණය යන විකල්පය තෝරා ගෙන තිබේ. නැගී එන ප්‍රවණතා හේතුවෙන් ඉහළ මට්ටමේ අවදානමක් පෙන්නුම් කෙරෙන අතර විශේෂයෙන් ඉංජිනේරුවන්, කාර්මික ශිල්පීන්, ගුවන් නියමුවන්, ගුවන් මැදිරි කාර්ය මණ්ඩලය මෙන්ම විධායකයින් සහ කළමනාකරුවන් වැනි ශ්‍රේණි සලකා බැලීමේදී එම කුසලතා මට්ටමට සමාන මට්ටමකින් එකී භූමිකාවන්ට නව සේවකයින් පත් කිරීම සඳහා සැලකිය යුතු කාලයක් ගත වේ.

සේවකයින් සේවය හැර යාම වැඩිවීමේ ගැටලුවට ප්‍රතිචාර වශයෙන්, වැටුප් වර්ධක සහ සංචාරක ප්‍රතිලාභ ලබා දීම වැනි පියවර කිහිපයක් අනුගමනය කරමින් අපි සේවක රඳවා ගැනීම දිරිමත් කළෙමු.

### නවීකරණය කරන ලද බඳවා ගැනීමේ ක්‍රමවේදයක් තුළින් මානව සම්පත ඉහළ නැංවීම

බඳවා ගැනීම් සහ මානව සම්පත් කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් නවීනතම ඩිජිටල් බඳවා ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. මෙමඟින් ඩිජිටල් යෙදුම් (රැකියා අයදුම්පත් ඉදිරිපත් කිරීම), ස්වයංක්‍රීය පිරික්සීම (පෙර නිර්ණය කළ නිර්ණායක මත පදනම්ව සුදුසු අපේක්ෂකයින් ස්වයංක්‍රීයව හඳුනා ගැනීම)

සහ දත්ත මත පදනම් වූ තීරණ ගැනීම (දත්ත විශ්ලේෂණ හරහා බඳවා ගැනීමේ උපාය මාර්ගවල සඵලතාවය ඇගයීම) සඳහා අවස්ථාව සැලසේ.

### කාර්යසාධනය ඇගයීම

කාර්යසාධනය මත පදනම් වූ සේවකයින්ට සාමාන්‍යයෙන් කාර්යසාධන අපේක්ෂාවන් ඉක්මවා ඵලදායිතාව ඉහළ නැංවීමට තුඩු දෙන ඔවුන්ගේ භූමිකාවන්හි විශිෂ්ටත්වය දැක්වීමට වැඩි අභිප්‍රේරණයක් ඇති වේ. එබැවින්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් උපාය මාර්ගික මට්ටමින් නිර්මාණය කර ඇති ප්‍රධාන කාර්යසාධන දර්ශක මත පදනම්ව සේවකයින්ගේ වාර්ෂික සහ මධ්‍ය වාර්ෂික සමාලෝචන පවත්වයි. මීට අමතරව, ආයතනය තුළ කාර්යසාධනය මත පදනම් වූ සංස්කෘතියක් ගොඩනැගීම සඳහා මූල්‍ය වර්ෂය තුළ ක්‍රියාමාර්ග රැසක් ගන්නා ලදී.

වර්ෂය තුළදී, කාර්යසාධන චක්‍රය සඳහා ආංශික ප්‍රධාන කාර්යසාධන දර්ශක සමඟ සේවක ඉලක්ක පෙළගැස්වීම කෙරෙහි සමාගම විසින් අවධානය යොමු කෙරුණු අතර, අඩු කාර්යසාධනයක් සහිත සේවකයින් සඳහා කාර්යසාධනය වැඩිදියුණු කිරීමේ සැලැස්මක් (PIP) හඳුන්වා දීම, කාර්යසාධන පරතරයන් අවම කිරීම සඳහා රේඛීය කළමනාකරුවන් සහ අඩු කාර්යසාධනයක් සහිත සේවකයින් සමඟ සාකච්ඡා කිරීම ආදිය සිදු කරන ලදී. එලෙසම, අපි කාර්යසාධන ඇගයීම් ක්‍රියාවලිය, අභියාචනා ක්‍රියාවලිය සහ ඇගයීම් ක්‍රියාවලිය හැසිරවීම සඳහා මාර්ගෝපදේශ සකස් කර එකී ක්‍රියාවලීන් විධිමත් කළෙමු. සමාගමේ වැටුප් ගෙවීමේ ක්‍රමවේදය සේවක කාර්යසාධනයට සෘජුවම අදාළ වේ. මෙහිදී සියලුම වාර්ෂික වැටුප් වර්ධක, කාර්යසාධන ශ්‍රේණිය මත පදනම් වන අතර මෙම කාර්යසාධන ශ්‍රේණි, උසස්වීම් ලබා දීමේදී සහ සේවකයින් ඔවුන්ගේ ඊළඟ මට්ටමේ උසස්වීම සඳහා සුදුසුකම් ලැබීමේදී සැලකිල්ලට ගනු ලැබේ.

### ප්‍රතිලාභ

සේවකයින්ට ප්‍රතිලාභ ලබා දීමෙන්, සේවයෙහි නියැලීමේදී ඔවුන් ලබන තෘප්තිය සහ චිත්ත ධෛර්යය ඉහළ නැංවීමට හේතු වන අතර එමඟින් ඔවුන්ට වඩා යහපත් ප්‍රතිඵල අත්කර දෙනු ඇත. මේ සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් සේවකයන්ට නීතියෙන් නියම කර ඇති පරිදි ගෙවනු ලබන ව්‍යවස්ථාපිත ප්‍රතිලාභවලට අමතරව ප්‍රතිලාභ කිහිපයක්ම ලබා දෙන ලදී.

ප්‍රධාන වශයෙන් ප්‍රතිලාභ සපයනු ලබන්නේ කාර්ය මණ්ඩල සුබසාධක සංගමය හරහා වන අතර සිල්ලර අලෙවිසැල්, බැංකු සේවා, පළතුරු අලෙවිසැල්, වාර්ෂික සහ උත්සව අලෙවිය, කුලී මිලදී ගැනීමේ පහසුකම් මෙන්ම නිවාඩු බංගලා පහසුකම්ද මීට ඇතුළත් වේ. මීට අමතරව, සුභසාධක සංගමය විසින් කාර්ය මණ්ඩලයේ දරුවන්ගේ අධ්‍යයන කටයුතු දිරිමත් කරමින් ඒ සඳහා අනුග්‍රහයක් ලබා දීම අරමුණු කරමින් ශිෂ්‍යත්ව වැඩසටහන් පිරිනමනු ලැබේ.

තවද, සමාගම විසින් සේවකයින්ට වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කිරීමට හැකි වන පරිදි වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් ස්ථාපිත කර ඇති අතර විශේෂ උපදේශන සහ වෛද්‍ය කඳවුරු සමඟින් වෛද්‍ය සේවා ලබා ගැනීමට පැය 24 පුරා ක්‍රියාත්මක වෛද්‍ය මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ඇත. කටුනායක ප්‍රදේශයේ සියලුම කාර්ය මණ්ඩලය සඳහා පැය 24 පුරා ක්‍රියාත්මක ආපනශාලා පහසුකම් සහ ප්‍රවාහන සේවාවක්ද ඇත.

### ඉගෙනීම සහ සංවර්ධනය

නව නිපුණතා සහ දැනුම ලබා ගැනීමේදී ඉගෙනුම් සහ සංවර්ධන වැඩසටහන් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. සේවකයින්ට ඔවුන්ගේ රැකියා වඩාත් ඵලදායී සහ කාර්යක්ෂ අයුරින් ඉටු කිරීමට මෙය උපකාරී වේ. සංවිධානයේ කාර්යසාධන ප්‍රමිතීන්ට අනුකූලව නිපුණතා ගොඩනැගීම කෙරෙහි අවධානය යොමු කරන ලද මෘදු කුසලතා පුහුණු වැඩසටහන් මාලාවකට අමතරව වසර තුළ සියලුම කාණ්ඩවල සේවකයින් සඳහා නායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් ලබා දීම කෙරෙහි අපි අවධානය යොමු කළෙමු. මීට අමතරව, ප්‍රධාන පුහුණු වැඩසටහන් අධීක්ෂණ කුසලතා සංවර්ධනය, අලුතින් උසස් කරන ලද විධායකයින් සහ ඉංජිනේරුවන් සඳහා නිපුණතා සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරන ලදී. ඇතැම් වැඩසටහන් සඳහා සුදුසුකම් ලත් අභ්‍යන්තර සම්පත් මණ්ඩල මඟින් පහසුකම් සැලසෙන අතර, විධායක සහ කළමනාකාරිත්වය සඳහා වන වැඩසටහන් වෙනුවෙන් රාජ්‍ය විශ්වවිද්‍යාල හරහා පහසුකම් සලසන ලදී.

### සෞඛ්‍යය සහ ආරක්ෂාව

සේවකයින්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා අප සතු වන සදාචාරාත්මක වගකීම අප විසින් අවබෝධ කරගෙන සිටින අතර එමඟින් ඔවුන්ගේ ශාරීරික හා මානසික යහපැවැත්ම ආරක්ෂා කිරීමට නිරන්තරයෙන් වෙර දරමු. ආරක්ෂිත සහ සෞඛ්‍ය සම්පන්න සේවා පරිසරයක් තුළ පෝෂණය වන සේවකයින් වශයෙන් ඔවුන්ගේ චිත්ත ධෛර්යය සහ ඵලදායිතාව වැඩිදියුණු වී ඇති අතර එමඟින් ඔවුන්ගේ කාර්යක්ෂමතාවය උපරිම වනු ඇතැයි අපි විශ්වාස කරමු.

එබැවින්, එම නිර්දේශිත සෞඛ්‍ය සහ ආරක්ෂණ මාර්ගෝපදේශ/ප්‍රමිතීන් කාලානුරූපව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා සෞඛ්‍යයට අදාළ ඕනෑම වැඩි දියුණු කිරීමක්/නව රෙගුලාසියක් අධීක්ෂණය කිරීමට සමාගම අදාළ බලධාරීන් සහ ජාතික නියෝජිතායතන සමඟ සමීප සම්බන්ධතාවක් පවත්වා ගනී. අවදානම් අවම කිරීම සහ ආරක්ෂිත සහ සෞඛ්‍ය සම්පන්න සේවා පරිසරයක් සහතික කිරීම සඳහා වත්මන් ජාත්‍යන්තර සහ දේශීය ප්‍රමිතීන්ට අනුකූලව අපි මෙහෙයුම් ක්‍රියාවලීන්ද වෙනස් කර ඇත්තෙමු.

එසේම, සේවා ස්ථාන තුළ ආරක්ෂාව පවත්වා ගැනීම සඳහා සේවකයින්ට අවශ්‍ය පුහුණුව සහ මාර්ගෝපදේශ ලබා දීමට අමතරව අපි අපගේ කාර්ය මණ්ඩල සාමාජිකයින් දැනුවත් කිරීමේ ව්‍යාපාර, වැඩමුළු සහ වෛද්‍ය කඳවුරු හරහා සෞඛ්‍යය සහ ආරක්ෂාව පිළිබඳව නිතිපතා දැනුවත් කිරීම් සිදු කරන්නෙමු. සෞඛ්‍ය ආරක්ෂණ ප්‍රමිතීන් වැඩි කිරීම සඳහා සම්පූර්ණ සේවා පරිශ්‍රයද නිතිපතා අධීක්ෂණය කොට සකස් කරනු ලැබේ. ඊට අමතරව, කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව ආයතනික ආරක්ෂණ ඒකකය විසින් මනාව අධීක්ෂණය කරනු ලබන අතර, සමාග මේ වෛද්‍ය මධ්‍යස්ථානය හරහා සියලුම කාර්ය මණ්ඩලයට පැය 24 පුරා ඇමතුම් වෛද්‍ය සහයක් සහ නිතිපතා සිදු කරනු ලබන අනිවාර්ය සෞඛ්‍ය පරීක්ෂාවන් ලබා දෙනු ලැබේ. ආරක්ෂිත කළමනාකරණ පද්ධති අත්පොතක්ද ක්‍රියාත්මක වන අතර එය නියමිත වේලාවට යාවත්කාලීන කරනු ලැබේ.

### සේවක බැඳීම සහ වෘත්තීය-පෞද්ගලික ජීවිතය අතර සමබරතාවක් පවත්වා ගැනීම

පවතින අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් සේවක බැඳීම අඩු වූ කාල පරිච්ඡේදයකට පසුව, කාර්ය මණ්ඩලයේ චිත්ත ධෛර්යය, කණ්ඩායම් හැඟීම සහ වෘත්තීය-පෞද්ගලික ජීවිතය අතර සමබරතාවක් පවත්වා ගැනීම ඉහළ නැංවීම සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් සේවක බැඳීම් වර්ධනය කිරීමේ ආයතනික සහ තේමාගත ක්‍රියාකාරකම් මාලාවක් නැවත හඳුන්වා දෙන ලදී. මීට අමතරව, අවශ්‍යතාවය අනුව, සේවක බැඳීම වැඩි

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.

දියුණු කිරීම සඳහා විවිධ අතිරේක වැඩසටහන් සංවිධානය කරන ලදී.

වසර පුරාවට සියළු ප්‍රජාවන්ට විශේෂිත වූ විශේෂ වැඩසටහන්, දැනුවත් කිරීමේ ව්‍යාපාර සහ ආයතනික සමාජ වගකීම ඉටු කිරීම සඳහා වන ව්‍යාපෘති සිදු කිරීමටද සමාගම විසින් පියවර ගන්නා ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙම වැඩසටහන් විවිධ ඒකක සහ දෙපාර්තමේන්තු අතර අන්තර්-සහයෝගිතාව මෙන්ම වෘත්තීය සමිති සමඟ සබඳතා වර්ධනය කිරීමට උපකාරී වී ඇත. මෙකී වැඩසටහන්වලට අමතරව, සහයෝගීතාව, අන්තර්-සංස්කෘතික අත්දැකීම් සහ දැනුම හුවමාරු කර ගැනීම සඳහා අපි කර්මාන්ත හවුල්කරුවන් සහ බාහිර සංවිධාන සමඟ විශේෂ සහයෝගීතා වැඩසටහන් සංවිධානය කළෙමු.

### දුක් ගැනවිලි නිරාකරණය

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් දුක්ග ැනවිලි සහ ආරවුල් විසඳීමේ ප්‍රතිපත්තියක් පවත්වා ගෙන යනු ලබන අතර එය කාලයට අනුව යාවත්කාලීන කෙරේ. සෘණාත්මක ප්‍රතිවිපාකවලට මුහුණ දීමෙන් පීඩාවට පත් නොවී සිය ආසන්නතම සුපරීක්ෂකවරුන්ට හෝ මානව සම්පත් ප්‍රධානියාට ස්වකීය ගැටලු විවෘතව ප්‍රකාශ කිරීමට මෙමඟින් සේවකයින්ට අවකාශය සැලසේ. දුක්ගැනවිලි ලැබීමෙන් පසු, අපි ඒ පිළිබඳ විමසීමට/පරීක්ෂණ පැවැත්වීමට කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා අතර එමඟින් ගැටලුව විසඳීමට නිවැරදි ක්‍රියාමාර්ග ගන්නෙමු. තවද, හිරිහැර සම්බන්ධ දුක්ග ැනවිලි විමර්ශනය කිරීමට කමිටුවක්ද පිහිටුවා ඇත.

## මඟී අත්දැකීම්

මගීන් වෙනුවෙන් අවශ්‍ය තරම් විකල්ප පවතින දැඩි තරඟකාරීත්වයෙන් යුතු ගුවන් සේවා කර්මාන්තයේ පසුබිම තුළ පාරිභෝගික සේවාවේ ගුණාත්මකභාවය යනු ගුවන් සමාගමේ සාර්ථකත්වය මෙන්ම කීර්තිනාමය තහවුරු කරනු ලබන වැදගත් කරුණකි. ගුවන් ගමන් ප්‍රවේශ පත්‍ර වෙන් කර ගැනීමේ සිට ගොඩබෑම දක්වා වූ පාරිභෝගිකයාගේ සංචාරයේ තුළදී ඇති වන විවිධ සබඳතා මඟින් ගුවන් සමාගම පිළිබඳ ඔවුන්ගේ ආකල්ප සඳහා බලපෑම් ඇති කරනු ලබයි. මෙකී අවබෝධය තුළින් ශක්තිමත් පක්ෂපාතිත්වයක් ඇති කරමින් සමාගමේ සන්නාම ප්‍රතිරූපය ගොඩනඟනු ලබයි. එබැවින්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් සිය පාරිභෝගිකයින් වෙත ඔවුන්ගේ පක්ෂපාතිත්වය දක්වමින්, ඉදිරි ගුවන් ගමන් වලදී ශ්‍රීලංකන් එයාර්ලයින්ස් තෝරා ගැනීමට දිරිමත් කරමින් වෙනස්වන අවශ්‍යතා සපුරාලීම සඳහා පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීමට නිරන්තරයෙන් උත්සාහ කරයි.

### පිරිනමනු ලබන නිෂ්පාදන සහ සේවා

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් සිය වටිනා පාරිභෝගිකයන් වෙත උසස් සේවාවක් තහවුරු කිරීම සඳහා පිරිනමනු ලබන නිෂ්පාදන තවදුරටත් වැඩිදියුණු කරයි. මගීන්ගේ ප්‍රියතම ගුවන් සේවය ලෙස නැවත තහවුරු කරමින්, යානස්ථ අත්දැකීම් වැඩිදියුණු කිරීමට ගුවන් සමාගමේ කැපවීම නිසි පිළිගැනීමට භාජනය කොට ජාතික ගුවන් සේවය වෙත ගුවන් මගී අත්දැකීම් සංගමය (APEX) විසින් ශ්‍රීලංකන් ගුවන් සේවය සඳහා මධ්‍යම/දකුණු ආසියාවේ හොඳම ආසන පහසුව සහ හොඳම ආහාරපාන වෙනුවෙන් 2023 මගී තේරීම් සම්මානය ප්‍රදානය කරන ලදී.

තවද, මගීන් සඳහා සැබෑ 'ශ්‍රී ලාංකික අත්දැකීමක්' පිරිනැමීම උදෙසා ගුවන් සමාගම විසින් ලෝකය වෙත සාම්ප්‍රදායික වට්ටෝරු සහ කුළුබඩු යොදා ගෙන, ශ්‍රීලාංකික ආහාර මෙන්ම එහි අතීත ඉවුම්පිහුම් කලාව ඉදිරිපත් කරමින් "ශ්‍රී ලාංකේය රසයන් පිළිබඳ ව්‍යාපාරයක්" ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපාරය "නව ආහාරපාන" කාණ්ඩය යටතේ 2023 යානස්ථ සත්කාරක සම්මානය උළෙලේදී ඉහළ පැසසුමට ලක් වන ලදී.

### ශ්‍රීලංකන් හොලිඩේස්

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් ජාතික ගුවන් සේවයේ විවේක අංශය වන ශ්‍රීලංකන් හොලිඩේස් හරහා තම සේවා ජාලය යොදා ගනිමින් රට තුළට සහ ඉන් පිටතට සිදුවන සංචාරක කටයුතු ඉහළ නංවනු ලබයි. ශ්‍රීලංකන් හොලිඩේස් බොහෝ ප්‍රමුඛ පෙළේ හෝටල්, සංචාරක ක්‍රියාකරුවන් සහ සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ වෙනත් ආයතන සමඟ හවුල් වීමෙන්, සංචාරකයින්ගේ අවශ්‍යතාව වලට සරිලන සියල්ල ඇතුළත් නිවාඩු පැකේජ ඇතුළුව පුළුල් පරාසයක නිවාඩු අවස්ථා ලබා දීම අරමුණු කරයි.

ගුවන් සමාගම විසින් පුළුල් ගමනාන්ත ජාලයක් වෙත පියාසර මෙහෙයුම් පවත්වාගෙන යාමෙන් අභ්‍යන්තර සංචාර ශක්තිමත් කරමින් ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරක ව්‍යාපාර දියුණු කිරීම කෙරෙහි නිරන්තරයෙන් මූලිකත්වය ලබා දෙමින් කටයුතු කරයි.

ඒ හැරුණු විට, ශ්‍රීලංකන් හොලිඩේස් විශේෂ සංචාරක අවශ්‍යතා සහ ශ්‍රී ලංකාවේදී අත්විඳිය හැකි ත්‍රාසජනක/ක්‍රීඩා අත්දැකීම් පිළිබඳ විශේෂ අවධානය යොමු කරයි. මේ වන විට බොහෝ ඉල්ලුමක් පවතින බොරළු මාර්ගවල බයිසිකල් පැදීම මේ සඳහා නිදසුනක් වන අතර, තවත් එවැනි බොහෝ අත්දැකීම් මීට ඇතුළත් වේ. තරු පන්තියේ ආගන්තුක සත්කාරය සමඟින් වඩාත් ආකර්ෂණීය ගමනාන්ත අත්දැකීම් පෙරදැරි කර ගත් විශේෂයෙන් සකස් කරන ලද සංචාරක කාලසටහනකින් යුතු උපායමාර්ක සැලසුමක් වන 'Dil Full of Sri Lanka' PAN ඉන්දියා ප්‍රචාරණ ව්‍යාපාරයද වැදගත් අවස්ථාවක් විය.

එයාර්ලයින්ස් ජාලයේ ගොඩබිම් සේවා ශක්තිමත් කිරීම සඳහා, ශ්‍රීලංකන් හොලිඩේස් විසින් නව ශ්‍රීලංකන් හොලිඩේස් වරලත් මෙහෙයුම්කරුවන් යොදා ගනිමින් සිය ජාලය තවදුරටත් පුළුල් කරයි.

රටින් පිටතට සිදුවන සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් ගත් කල, 2022/23 මූල්‍ය වර්ෂය වසර ආරම්භයේදී සංචාර දිරිගැන්වීම්වල දැඩි පහත වැටීමක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, රටින් පිටතට සිදුවන සංචාර සඳහා "උපාධි ප්‍රදානෝත්සව කණ්ඩායම්" වැනි කණ්ඩායම් දිරිගැන්වීම් රැසක් ආකර්ෂණය කර ගැනීමට ශ්‍රීලංකන් හොලිඩේස් සමත් විය. වඩාත් සිත් ඇදගන්නාසුළු සහ මනා දැනුවත්භාවයකින් යුතු සංචාරක පැකේජ නිර්මාණය කිරීම සඳහා එක්සත් අරාබි එමීර් රාජ්‍යය, තායිලන්තය, නේපාලය සහ ඉන්දුනීසියාව යන රටවල සංචාරක ක්‍රියාකරුවන් පස් දෙනෙකු සමඟ හවුල්කාරිත්වයන් ඇති කර ගනිමින් ඔවුන්ගේ ප්‍රවීණත්වය ලබා ගැනීම හරහා ගුවන් සමාගම තවදුරටත් අභ්‍යන්තර සංචාරක ව්‍යාපාරය පුළුල් කළේය. වියට්නාමයේ ශ්‍රීලංකන් හොලිඩේස් ග්‍රවුන්ඩ් ඔපරේටර්ස් (SHGO) සමඟ ඇතිකරගත් හවුල්කාරිත්වය ඔස්සේ ශ්‍රීලංකන් හොලිඩේස් විසින් වියට්නාමය/කාම්බෝජය වැනි නොබැඳි ගමනාන්ත රැසකට නිවාඩු පැකේජ ප්‍රවර්ධනය කරමින් සිය වෙළඳපළ ප්‍රවේශය පුළුල් කර ඇත.

ශ්‍රීලංකන් හොලිඩේස් විසින් විවිධ කර්මාන්තවල පුද්ගලයන් සම්බන්ධ කර ගැනීම, නව අදහස් ප්‍රවර්ධනය කිරීම සහ වර්ධනය දිරිගැන්වීම සඳහා රැස්වීම්, දිරිගැන්වීම්, සම්මන්ත්‍රණ සහ ප්‍රදර්ශන (MICE) සංචාරක ඉසව් ප්‍රවර්ධනය කරන ලදී. එබැවින්, වසර තුළදී, ජාත්‍යන්තර සහභාගීවන්නන් සියයකට අධික පිරිසකගේ සහභාගීත්වයෙන් MICE Expo 2023 සාර්ථකව පවත්වන ලදී. එමෙන්ම නේපාලය සහ ඉන්දියාව වෙත ව්‍යවසායකයින්ගේ සංවිධානය (EO) සමඟ සහයෝගීතාවයෙන් කණ්ඩායම් සංවිධානය

කරන ලදී. මීට අමතරව, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් LUPINE ඉන්දියා-ඖෂධ සමාගම වෙනුවෙන් අමුත්තන් 84 දෙනෙකු සහ සහභාගීවන්නන් 229 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සඳහා ශ්‍රී ලංකා ප්‍රසව හා නාරිවේද විශේෂඥයින්ගේ 55 වන වාර්ෂික විද්‍යාත්මක සමුළුව සංවිධානය කරන ලදී.

## අලෙවිකරණ සහ සන්නිවේදනය

වසර තුළ ශ්‍රී ලංකාවේ ඇති වූ අහිතකර වෙනස්කම් මඟින් ශ්‍රීලංකන් ගුවන් සමාගමේ සන්නාම ප්‍රතිරූපයට සැලකිය යුතු බලපෑම් ඇති කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රී ලංකාවේ සංචාරවලට එරෙහි සංචාරක උපදේශන හේතුවෙන් සංචාරක කර්මාන්තය තුළ අඩු කාර්ය සාධනයක් පෙන්නුම් කළේය. මෙම පසුබිමට එරෙහිව, ගමනාන්ත අත්දැකීමට බාධාවක් වූ ආරක්ෂක ගැටළු සහ අත්‍යාවශ්‍ය භාණ්ඩ හිඟය සඳහා පිළියම් දක්වමින් සිය සන්නාම ප්‍රතිරූපය ගොඩනඟා ගැනීමට ගුවන් සමාගමට සිදුවිය.

මෙකී තත්වයට විසඳුමක් ලෙස, ප්‍රධාන සංචාරක ප්‍රභවය සහ ගුවන් සේවය සඳහා තනි විශාලතම වෙළඳපොළ ඉන්දියාව වන හෙයින් ඉන්දියානු සංචාරකයින් අතර දැනුවත්භාවයක් ගොඩනැගීම කෙරෙහි ගුවන් සමාගම පළමුවෙන් අවධානය යොමු කළේය. ගමනාන්තය පිළිබඳ සැබෑ අත්දැකීම ලබා දෙමින් හිතෛෂී චාරිකා මාලාවකට පහසුකම් සලසමින්, ඉන්දියාවේ ප්‍රමුඛ නියෝජිතයන් සහ අන්තර්ගත නිර්මාපකයින් හරහා රටේ ආරක්ෂාව පිළිබඳ උපදේශනය ගොඩනැගීමට ගුවන් සමාගම ක්‍රියාශීලීව පියවර ගත්තේය. ප්‍රධාන ධාරාවේ මාධ්‍ය වාර්තා මගින් නිරූපණය කරන ලද දෙයට පටහැනිව, වර්තමාන තත්වය පිළිබඳ සැබෑ අවබෝධයක් ලබා දීමට මෙය ප්‍රයෝජනවත් විය. තත්ත්වය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වෙමින් තිබූ හෙයින්, ගුවන් සමාගම මෙම අන්තර්ගත නිර්මාපක සහයෝගිතාව ඕස්ට්‍රේලියාව සහ මැදපෙරදිග වැනි අනෙකුත් වෙළෙඳපොළ සඳහාද යොදා ගන්නා ලදී.

## *රේයිඩ් ඇමසෝන් 2022*

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ප්‍රංශ ක්‍රීඩිකාවන් වෙනුවෙන් වූ ප්‍රමුඛ ප්‍රංශ ත්‍රාසකර මාවතක් වන රේයිඩ් ඇමසෝන් 2022 හි ගුවන් හවුල්කරු බවට පත්විය. ඉන්ධන අර්බුදය මධ්‍යයේ කාණ්ඩ දෙකකින් සීගිරියේ පැවැති මෙම තරගාවලියට ක්‍රීඩක ක්‍රීඩිකාවන් 500කට අධික සංඛ්‍යාවක් සහභාගී වූ අතර උත්සව සංවිධායකයන් දක්වන ආකාරයට එමඟින් යුරෝ මිලියන 10කට අධික වටිනාකමකින් යුත් ගෝලීය මාධ්‍ය වෙත යොමු වීමට හැකි විය. උත්සවයේ පළවෙනි කොටස ලෙස ක්‍රීඩක ක්‍රීඩිකාවන් 250කට අධික සංඛ්‍යාවක් සමඟින් 2023 මාර්තු මාසයේදී රේයිඩ් වැඩසටහන නැවත ශ්‍රී ලංකාව තුළ පැවැත්වීම හේතුවෙන්, උත්සව පැවැත්වූ පසුගිය වසර 21ක කාලය තුළ අඛණ්ඩව වසර දෙකක් මෙම උත්සවය සඳහා සත්කාරකත්වය දැක්වූ එකම ගුවන් සමාගම ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විය.



# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.

*ගෝලීය විකුණුම් සම්මේලනය 2022*
ආරක්ෂිත සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමට ශක්තියක් වෙමින්, ශ්‍රීලංකන් සමාගම විසින් සිය ලෝක ව්‍යාප්ත ජාලයේ ඉහළම සංචාරක වෙළඳ හවුල්කරුවන් 250 කට අධික සංඛ්‍යාවක් එක් කර ගනිමින් 2022 නොවැම්බර් මාසයේදී ගෝලීය විකුණුම් සමුළුව මූලිකත්වයක් ගෙන සංවිධානය කරන ලදී. නියෝජිතයන්ට රට පිළිබඳ අත්දැකීම් ලබා දීම උදෙසා වැඩි සැලකිල්ලක් දක්වමින් නිර්මිත පූර්ව සම්මන්ත්‍රණ චාරිකා වලින් යුතු වූ මෙම උත්සවය සඳහා ප්‍රමුඛ පෙළේ ආගන්තුක සත්කාර හවුල්කරුවන් සහ සංචාරක සමාගම් වෙතින් ශ්‍රීලංකන් සමාගමට සහය ලැබුණි. මෙතෙක් සිදු වූ දැවැන්තම සංචාරක ප්‍රවර්ධනය වන මෙම සමුළුව මඟින් ශ්‍රී ලාංකේය සංචාරක සමාගම්/ සංචාරක පාර්ශවකරුවන් හට ඔවුන්ගේ ජාත්‍යන්තර ව්‍යාපාර සගයන් හමුවීමට 500කට අධික අවස්ථාවන් සඳහා පහසුකම් සලසා දුන් අතර, සාමාන්‍යයෙන් බහු ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයකට සහභාගී වීමට අවශ්‍ය වන එක් ස්ථානයක් තුළ පුළුල් අත්දැකීමක් ලබා දෙයි.

*'Around the Island' ගමනාන්ත වීඩියෝව එළිදැක්වීම*
ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් රටේ පවත්නා සුන්දරත්වය මෙන්ම ප්‍රසන්නභාවය නිරූපණය කරන්නා වූ නවතම ගමනාන්ත වීඩියෝවක් 'Around the Island' නමින් එළිදක්වන ලදී. එතුළින් දිවයිනේ ජීවන රටාව, එහි සැබෑ පරිසරය පිළිබඳ තතු ඉදිරිපත් කරමින්, සුවිශේෂී වූ කුළුපඟභාවය වෙනුවෙන් කීර්තිය ලත් දිවයින වෙත නැවත පැමිණෙන්නට සදාකාලික ඇරයුමක් ගෙන එයි.

*රයිඩ් ශ්‍රී ලංකා 2023*
2023 වසර ආරම්භයේදී ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් ඕස්ට්‍රේලියාව, ඇමරිකා එක්සත් ජනපදය සහ කැනඩාව යන රටවල් වලින් ලෝක ශූරයන් එක් කරගනිමින් රයිඩ් ශ්‍රී ලංකා 2023 නමින් රට හරහා පාපැදි සවාරියක් ප්‍රථම වරට පවත්වන ලදී. මේ හේතුවෙන් ශ්‍රී ලංකාව සංචාරය සඳහා හිතකර ගමනාන්තයක් ලෙස නැවත වරක් තහවුරු වන ලදී. 2023 ජනවාරි 23 සිට 28 දක්වා කාලය තුළ පවත්වන ලද පාපැදි සවාරිය, ශ්‍රී ලංකාවේ උතුරේ සිට දකුණට විහිදුණු, රටේ වඩාත්ම කැපී පෙනෙන භූ දර්ශන සහ විවිධ භූමි ප්‍රදේශ හරහා විහිදුණු ගෝලීය පාපැදි සංචාරයකි. මෙම Ride Sri Lanka, UK Influencers' Edition වැඩසටහන 2023 ජුනි 13-23 පැවැත්වුණු අතර එය එංගලන්තයේ ප්‍රසිද්ධ පාපැදිකරුවන් සහ සංචාරක අන්තර්ගත නිර්මාණකරුවන්ගේ දස දෙනෙකුගේ සහභාගීත්වයෙන් සිදුවිය.

*'Dil full of Sri Lanka' ව්‍යාපාරය*
ඉන්දීය වෙළඳපොළ අවස්ථාවන් කෙරෙහි අවධානය යොමු කරමින් සමාගම විසින් සංචාරකයින්ගේ විවිධ ඉල්ලීම් සහ රුචි අරුචිකම් වලට සරිලන පරිදි දිවයිනේ අත්දැකීම් ඇතුළත් නිවාඩු පැකේජ මාලාවක් සපයන 'දිල් ෆුල් ඔෆ් ශ්‍රී ලංකා' උපායශීලී ව්‍යාපාරය ආරම්භ කරන ලදී. ප්‍රචාරක ප්‍රවර්ධනයට සඳහා නියෝජිත සහයෝගීතා, මාධ්‍ය සබඳතා සහ සංචාර ඇතුළත් වේ.

**ෆ්ලයිස්මයිල්ස් (FlySmiLes)**
නිරන්තර පියාසර කරන මගීන් වෙනුවෙන් වූ වැඩසටහන වන ෆ්ලයිස්මයිල්ස් වෙත ශ්‍රීලංකන් පාරිභෝගිකයින්ට ප්‍රවේශ වීමේ පහසුකම් පවතී. එමඟින් පාරිභෝගිකයින්ට ලොව පුරා ජාත්‍යන්තර විවේකාගාර 600 කට අධික සංඛ්‍යාවකට ප්‍රවේශ වීමෙන් ප්‍රතිලාභ රැසක්, අතිරික්ත ගමන් මලු දීමනා සඳහා කැමැති පරිදි පැටවුම් සඳහා අවස්ථාව ලබා දෙන අතර වැඩි දියුණු වූ නිරන්තර පියාසර අත්දැකීමක් ලබා දේ. එමෙන්ම, මෙම වැඩසටහන මඟින් ශිෂ්‍ය සමාජයක් හඳුන්වාදීම, සිසුන්ට වට්ටම් අතිරික්ත ගමන් මලු සඳහා අවස්ථාව ලබා දීම, සහ ශිෂ්‍ය ප්‍රජාව සඳහා වැඩි දියුණු කළ සේවාවක් සහතික කිරීම ඇතුළු ප්‍රසාද සැතපුම් සහ මුදල් සහ සැතපුම් ප්‍රවර්ධනයන් ද පිරිනමයි.

තවද, පශ්චාත් වසංගත යුගයේ පාරිභෝගික පක්ෂපාතිත්වය පෙන්නුම් කිරීම වෙනුවෙන් සාමාජිකයින් හට 2023 මාර්තු 31 දක්වා ස්ථර තත්ත්ව දීර්ඝ කිරීම් ලබා දෙන ලදී. සේවා ප්‍රතිසාධනය සඳහා සැපයිය යුතු සැතපුම් හඳුන්වාදීම අභිමත අංගයක් වූ අතර, එහිදී අසතුටට පත් මගීන්ට නියමිත වන්දි ලබා ගැනීමේ විකල්පයක් පිරිනමන ලදී. ඉහළ පෙළේ සාමාජිකයින් විසින් මේ වන විට සියලුම ගුවන්තොටුපළවල උසස් කිරීම් අධිභාර සඳහා සුවිශේෂී වට්ටමක් භුක්ති විඳින අතර, සියලුම ප්‍රතිසාධන ප්‍රවේශපත්‍ර ගුවන්තොටුපළ අධිභාර වැඩිදියුණු කිරීම් සඳහා සුදුසුකම් ලබා ඇත.

වසර තුළදී, වඩා හොඳ සහයෝගීතාවයක් සහ බාධාවකින් තොර පාරිභෝගික අත්දැකීමක් සඳහා මගීන්ට එක් ගමනාන්තයක සේවය කිරීමට හැකිවන පරිදි FlySmiLes කාර්යාලය කොළඹ ප්‍රවේශපත්‍ර කාර්යාලය සමඟ ඒකාබද්ධ කිරීමට තීරණය කරන ලදී. මීට අමතරව, නිෂ්පාදන සහ සේවා පිරිනැමීම් වැඩිදියුණු කිරීම සඳහා ඔවුන්ගේ ප්‍රතිපෝෂණ ලබා ගැනීම සඳහා සියලුම සාමාජික ස්ථර නියෝජනය කරමින් කණ්ඩායම් මුල් කර ගත් සාකච්ඡා පවත්වන ලදී.

**පාරිභෝගික පැමිණිලි කළමනාකරණ පද්ධතිය**
ගුවන් සමාගම තම නිෂ්පාදන සහ සේවා සැපයීම වැඩිදියුණු කිරීමේදී පාරිභෝගිකයින්ගේ අදහස් කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කරන බැවින්, එමඟින් වැරදි නැවත සිදු නොවීම සහතික කරනු ලබයි. එබැවින්, ගුවන් සමාගම වෙත ඔවුන්ගේ ගැටළු සෘජුව ඉදිරිපත් කිරීමට මගීන් දිරිමත් කරනු ලබයි.

නව පාරිභෝගික කටයුතු කළමනාකරණ පද්ධතිය දියත් කිරීමත් සමඟ ක්‍රියාත්මක කළ යුතු ලැයිස්තුවේ හඳුනාගෙන ඇති පැමිණිලි සිදු කළ මගීන්ට ඉක්මන් වන්දි පිරිනැමීම සඳහා ක්ෂණික පාරිභෝගික සේවා ප්‍රතිසාධන යාන්ත්‍රණයක් ද ගුවන් සමාගම විසින් ස්ථාපිත කර ඇත.

**වඩාත් යහපත් පාරිභෝගික අත්දැකීම් වෙනුවෙන් ක්‍රියා පිළිවෙළ හි වර්ධනයන් සිදු කිරීම**

*Omni Channel පාරිභෝගික අදහස් නිරාකරණය*
ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධති විසින් එමඟින් පිරිනමනු ලබන සේවාවන් පිළිබඳ මගීන්ගේ අදහස් ප්‍රමාණවත් ලෙස මැන බැලීම සඳහා Omni Channel පාරිභෝගික ප්‍රතිපෝෂණ විසඳුමක් ඉදිරිපත් කොට ඇත. මෙම සර්ව සම්පූර්ණ විසඳුම සඳහා සවිස්තරාත්මක මගී ප්‍රතිපෝෂණ සමීක්ෂණයක් සහ NPS (ශුද්ධ ප්‍රවර්ධක ලකුණු) ප්‍රතිපෝෂණ ග්‍රහණය කිරීමේ විසඳුමක් ඇතුළත් වේ. එමඟින් පාරිභෝගික අවශ්‍යතා සපුරාලීමට සේවා මට්ටම් අඛණ්ඩව වැඩිදියුණු කිරීමට ගුවන් සමාගම සඳහා සහය සපයනු ලබන විවිධ මාධ්‍යවල මගී ප්‍රතිපෝෂණ රැස් කිරීම සිදු කරරනු ලබයි. වෙබ් අඩවි, පසු පියාසැරි සමීක්ෂණය සහ ජංගම යෙදුම හරහා ලැබෙන මගී තෘප්තිමත්භාවය පිළිබඳ වූ සමීක්ෂණය හරහා ලැබෙන ප්‍රතිපෝෂණ තුළින්ද පාරිභෝගික අවශ්‍යතා පිළිබඳ සලකා බැලේ.

*සබඳතා ස්ථාන සේවා සඳහා වෙන් කිරීම් ක්‍රියා පිළිවෙළ (CPSS)*
අභ්‍යන්තර සංචාරක ව්‍යාපාරය තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා, ශ්‍රීලංකන් හොලිඩේස් විසින් සබඳතා ස්ථාන සේවා සඳහා වෙන් කිරීම් ක්‍රියා පිළිවෙළක් (CPSS) හඳුන්වා දෙන ලදී. මෙම පද්ධතිය තෙවන පාර්ශ්වය විසින් වෙන් කිරීම් සිදු කිරීමට භාවිත කරයි. ගුවන් සේවයේ අභ්‍යන්තර තොරතුරු තාක්ෂණ කණ්ඩායම විසින් සැලසුම් කර සංවර්ධනය කරන ලද පිරිවැය-ඵලදායී මාධ්‍ය හරහා මගීන් තම

වවුචර ලබා ගැනීමට පැමිණෙන විට, මින් පෙරදී එම කටයුතු ලිඛිතව සිදු කළ බැවින් මාරු කිරීම් කවුළුවේ (transfer desk) ගත කරන කාලය අවම කිරීම අරමුණු කරයි. මෙකී පද්ධතිය පරිශීලක-හිතකාමී අතුරු මුහුණත, PNR හෝ Booking Voucher මගින් වෙන් කරවා ගැනීමක් සෙවීමේ හැකියාව, විද්‍යුත් තැපෑල සහ මුද්‍රණ විකල්ප ලබා ගැනීමේ හැකියාව, හෝටල් හිමියන් සමඟ සබඳතාවක් පවත්වා ගැනීම සහ වාර්තා සකස් කිරීම ආදී ගුණාංග වලින් යුතු වේ.

### AI-සහය ලබා දෙන පාරිභෝගික සේවා

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් මගීන් වෙනුවෙන් WhatsApp සන්නිවේදන ක්‍රමයක් ක්‍රියාත්මක කළ අතර, මේ වන විට ඒ හරහා මගීන් වෙත දැනුම්දීම් සිදු කරනු ලබයි. ගුවන් ගමන් කාලසටහන්, ප්‍රමාදයන්, වෙනස්කම් සහ අනෙකුත් වැදගත් යාවත්කාලීන කිරීම් පිළිබඳව මගීන් දැනුවත් කිරීම මින් අරමුණු කරයි. ගමන පුරාවට මගීන් දැනුවත්ව සිටින බැවි තහවුරු කරලීමට ඔවුන් වෙත විද්‍යුත් තැපෑල, කෙටි පණිවුඩ, හෝ ගුවන් සමාග මේ ජංගම යෙදුම හරහා දැනුම්දීම් සිදු කරනු ලබයි.

### FlySmiLes ජංගම යෙදුම

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් FlySmiLes ජංගම යෙදුමක් හඳුන්වා දුන් අතර, එමගින් පාරිභෝගිකයින්ට පහසු ප්‍රවේශයක් සහ පරිශීලක-හිතකාමී විශේෂාංග ලබා දෙයි. සාමාජිකයින්ගේ පහසුව ඉහළ නංවමින් විදේශීය මධ්‍යස්ථාන ඇතුළු ගුවන්තොටුපළවල සාමාජිකත්වය ලබා ගැනීම සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් QR කේත හරහා ලියාපදිංචි කිරීමේ ක්‍රමයද ක්‍රියාත්මක කරන ලදී.

## ප්‍රජා සවි බල ගැන්වීම

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ප්‍රජාව කෙරෙහි සිය සමාජයීය වගකීම පිළිබඳ දැනුවත් අතර, අඩු වරප්‍රසාද සහිත පුද්ගලයන්ගේ ජීවිතවලට සහය දැක්වීම සහ නඟා සිටුවීම අරමුණු කරගත් විවිධ වැඩසටහන් ඔස්සේ ධනාත්මක බලපෑමක් ඇති කිරීමට උත්සාහ කරයි. මෙකී ප්‍රජාවන් සවිබල ගැන්වීම සහ ඔවුන්ගේ දිගුකාලීන සංවර්ධනය තහවුරු කිරීම තුළින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් සෑම පුද්ගලයෙකුටම සමෘද්ධිමත් විය හැකි වඩාත් සාධාරණ සමාජයක් නිර්මාණය කිරීමට උත්සාහ කරයි. සෞඛ්‍ය, අධ්‍යාපනය සහ තරුණ සවිබල ගැන්වීමේ මූලික ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් එහි ආයතනික සමාජීයීය වගකීම් අංශය වන ශ්‍රීලංකන් කෙයාර්ස් හරහා සිය ප්‍රජා මුලපිරීම් ක්‍රියාත්මක කරනු ලබයි. එමඟින් ශ්‍රී ලංකාව පුරා වෙසෙන ළමුන් සහ තරුණයින් දිරිමත් කරලීමට අදාළ වැඩසටහන් සිදු කරනු ලබයි. දරුවන්ගේ අධ්‍යාපනයේ සහ සෞඛ්‍යයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ අරමුණින් සමාගම මඟින් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරනු ලබන අතර, ශිෂ්‍යත්ව සහ සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා ඉඩ සලසා දෙයි. මෙකී ව්‍යාපෘති සඳහා බහුතරයක් අරමුදල් සේවක දායකත්වයෙන් සහ සම සංවිධාන සමඟ හවුල්කාරිත්වයෙන් ලබා ගනී.

### සෞඛ්‍යාරක්ෂණ සහය

ශ්‍රීලංකන් කෙයාර්ස් මඟින් ආර්ථික අපහසුතා පවතින ප්‍රජාවන්ගේ සමස්ත යහපැවැත්ම වැඩිදියුණු කිරීම අරමුණු කරගත් වැදගත් මුලපිරීම් මාලාවක් හරහා රටේ සෞඛ්‍ය සේවා අංශය වෙත නිරන්තර සහයෝගය දක්වයි. මෙම පුද්ගලයින්ට ඔවුන්ගේ වෛද්‍ය අවශ්‍යතා සඳහා උපකාර ලබා දෙමින් අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවා සඳහා පහසුකම් නොමැති රටේ ජනගහනයෙන් කොටසකට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් සහයෝගය ලබා දී ඇත.

### සහයෝගය දැක්වීමේ වැඩසටහන්

ශ්‍රී ලංකාවේ රෝහල්වල පවතින ඖෂධ හිඟයට පිළියමක් වශයෙන් රෝහල් සඳහා ජාත්‍යන්තරයෙන් පරිත්‍යාග කරන ලද අත්‍යවශ්‍ය ඖෂධ සහ වෛද්‍ය උපකරණ නොමිලේ ගුවනින් ප්‍රවාහනය කිරීමට ශ්‍රීලංකන් කෙයාර්ස් ඉදිරිපත් විය.

ඊට අමතරව, ජීවිතයේ අවදානමක් පවතින, අඩු ආදායම්ලාභී පසුබිමක සිටින අවම වරප්‍රසාද සහිත දරුවන්ට (වයස අවුරුදු 18ට අඩු) ශ්‍රී ලංකාව තුළ නොපවතින වෛද්‍ය ප්‍රතිකාර සඳහා විදේශ ගතවීම උදෙසා වෛද්‍ය ප්‍රවේශපත්‍ර ක්‍රමයක් ද ස්ථාපිත කර ඇත. මෙකී ක්‍රමය ඔස්සේ අවශ්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා තෝරාගත් ගමනාන්තය වෙත ළඟා වන්නට රෝගී දරුවාට සහ දෙමාපියන්ට වැය වන ගුවන් ගමන් ගාස්තු ආවරණය වන පරිදි ගුවන් ටිකට්පත් පිරිනමන ලදී. මෙවැනි සහය අවශ්‍ය පුද්ගලයින් වෙත මේ පිළිබඳ දන්වාලීමට ශ්‍රීලංකන් කෙයාර්ස් විසින් දිවයින පුරා රෝහල්වල පෝස්ටර් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී.

මෙම මුලපිරීම සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි නිරන්තර පියාසර වැඩසටහන, ෆ්ලයිස්මයිල්ස් (FlySmiLes) මඟින් අනුග්‍රහය ලැබේ.

තවද, වෛද්‍ය ප්‍රතිකාර ලබන දරුවන්ගේ මුවගට සිනහවක් සහ සතුටක් ගෙන ඒමට ශ්‍රීලංකන් කෙයාර්ස් නිරන්තරයෙන් කටයුතු කරයි. ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි 43 වැනි සංවත්සරය වෙනුවෙන්, ශ්‍රීලංකන් කෙයාර්ස් විසින් කොළඹ රිජ්වේ ආර්යා ළමා රෝහලේ දරුවන් සියදෙනෙකු සඳහා පරිත්‍යාග ලබා දෙන ලද්දේ ඔවුන්ගේ සිතට සතුටක් මෙන්ම චිත්ත ධෛර්යයක් එක් කරමින්ය.

### වෛද්‍ය කඳවුරු

ශ්‍රීලංකන් කෙයාර්ස් දිවයින පුරා දුෂ්කර ප්‍රදේශ හි වෙසෙන පුද්ගලයින් වෙනුවෙන් වෛද්‍ය කඳවුරු පවත්වමින් වෛද්‍ය පහසුකම් සඳහා සීමිත ප්‍රවේශයක් ඇති ප්‍රජාවන් වෙත සහය දක්වන ලදී. මෙම මුලපිරීම මගින් දරුවන්ට සහ වැඩිහිටියන්ට ඔවුන්ගේ වෛද්‍ය අවශ්‍යතා සපුරාලීමට අවස්ථාවක් ලබා දෙමින්, නොමිලේ වෛද්‍ය උපදේශන සහ අනෙකුත් මූලික වෛද්‍ය අවශ්‍යතා පිරිනමන ලදී.

මෙම වෛද්‍ය ප්‍රවේශ වැඩසටහන්වලින් පළමුවැන්න නුවරඑළියේ පිහිටි බෝපත්තලාව සිංහල විද්‍යාලයේදී සිදු කරන ලද අතර, දෙවැන්න දිගන පිහිටි මහබේරියතැන්න දෙමළ පාසලේදී සංවිධානය කරන ලදී. මෙම වෛද්‍ය කඳවුරු මගින් සිසුන්ට මෙන්ම එවැනි සේවා අවට ප්‍රදේශ හි නොපවතින බැවින් අත්‍යාවශ්‍ය සෞඛ්‍ය සේවා ලබා ගැනීමට නොහැකි අනෙකුත් සහභාගිවන්නන්ට ද නොමිලේ සෞඛ්‍ය පරීක්ෂණ, දෘෂ්ටි පරීක්ෂණ, ප්‍රතිකාර සහ ඖෂධ ලබා දෙන ලදී.

තවත් මෙවැනිම වෛද්‍ය සත්කාරක වැඩසටහන් හම්බන්තොට දෙහිගහලන්ද මහා විද්‍යාලයේ, සීදූව වෘත්තීය පුහුණු ආයතනයේ සහ කෝට්ටපිටියේ පිහිටි ගඟේයාය ප්‍රාථමික විද්‍යාලයේ ද සංවිධානය කරන ලදී. මෙකී වැඩසටහන් තුළින් අවම පහසුකම් පවතින ප්‍රදේශවල සිසුන්ට මෙන්ම පවුල්වලටද උපකාර කරන ලදී.

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.



*ශ්‍රීලංකන් කෙයාර්ස් බෝපත්තලාවේ වෛද්‍ය කඳවුරක් පවත්වනු ලබයි.*

ශ්‍රීලංකන් කෙයාර්ස් විසින් ඇතැම් වෛද්‍ය කඳවුරු වෙනත් සමාගම්වල සහයෝගය සමඟ  සිදු කරන ලදී. මේ අතරට සීමාසහිත ලික්විඩ් අයිලන්ඩ් (පුද්) සමාගම, ෂැංග්‍රීලා හම්බන්තොට, ශ්‍රී ලංකා හමුදා වෛද්‍ය විද්‍යාලයේ සාමාජිකයින් සහ ශ්‍රී ලංකා අභ්‍යන්තර සංචාරක ක්‍රියාකරුවන්ගේ සංගමයේ (SLAITO) තරුණ පාර්ශවය ඇතුළත් වේ.

මෙකී මුලපිරීම් හරහා මූල්‍ය වර්ෂය තුළදී ශ්‍රීලංකන් කෙයාර්ස් හි සෞඛ්‍ය ආරක්ෂාව වෙනුවෙන් සහය සැලසීමේ ක්‍රියාවලියෙන් පුද්ගලයන් 1000කට (ළමුන් සහ වැඩිහිටියන් යන දෙපිරිසම) ආසන්න ප්‍රමාණයකට උපකාර කරන ලදී.

## අධ්‍යාපනික සහය

දිළිඳුකම තුරන් කිරීම සහ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා වැදගත්ම සාධකයක් වූ අධ්‍යාපන ලබා ගැනීමට පහසුකම් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රීලංකන් කෙයාර්ස් විසින් දුෂ්කර ප්‍රදේශවල පාසල් සඳහා අධ්‍යාපනික ආධාර සපයනු ලබයි.

## ජාත්‍යන්තර දින සැමරුම

ශ්‍රීලංකන් කෙයාර්ස් විවිධ ක්‍රියාකාරකම් හරහා අවම වරප්‍රසාද සහිත දරුවන් සමඟ සිය සබඳතාව තවදුරටත් ශක්තිමත් කරයි. ඒ අනුව 2022 ලෝක ළමා දිනය සැමරීමේදී ශ්‍රීලංකන් කෙයාර්ස් විසින් ළමා සංවර්ධන මධ්‍යස්ථානයක ළමුන් සඳහා විශේෂ වැඩසටහනක් සංවිධානය කරන ලදී. ශ්‍රීලංකන් කෙයාර්ස් විසින් පසුගිය වසර කිහිපය පුරාවටම පවත්වන ලද, ශ්‍රී ලංකාවේ සංචාරය කිරීම සහ සංචාරක කර්මාන්තය හඳුන්වාදීම වෙනුවෙන් වූ අධ්‍යාපනික ක්‍රියාකාරකම් සමඟින් සංවර්ධන මධ්‍යස්ථානයේ ළමුන් සඳහා දැනුම සහ විනෝදයෙන් පිරුණු දිනයක් සංවිධානය කරන ලදී. තම ප්‍රදේශයෙන් පිටතට විනෝද චාරිකා සඳහා වරප්‍රසාද නොලබන මෙම සිසුන් වෙත කොළඹ නගරය, වරාය, ගුවන් තොටුපළ සහ ගුවන් යානයක අභ්‍යන්තරය පිළිබඳ අධ්‍යාපන චාරිකා පිරිනමමින් ඔවුන්ට සුවිශේෂී අත්දැකීමක් ලබා දෙන ලදී. මෙය ගෝල් ෆේස් හොටෙල් සහ ඊබර්ට් සිල්වා හොලිඩේස් සමග සිදු කළ සහයෝගී ප්‍රයත්නයකි.

ශ්‍රීලංකන් කෙයාර්ස් විසින්, බාහිර නවාතැන්වල නවාතැන් ගැනීමට හැකියාවක් නොමැති හෝ ප්‍රතිකාර සඳහා තම ග්‍රාමීය නිවෙස්වල සිට බොහෝ දුර ගමන් කිරීමට නොහැකි පුද්ගලයින් සඳහා වන, බාහිරින් පැමිණෙන පිළිකා රෝගීන්ගේ සහ ඔවුන් රැකබලාගන්නන්ගේ සංක්‍රමණ වාසස්ථානය වනම් CCC Home හිදී ප්‍රීතිමත් නත්තල් දිනයක් උත්සවශ්‍රීයෙන් සමරන ලදී. CCC Home හි පදිංචිකරුවන්ට (වැඩිහිටියන් සහ ළමුන් යන දෙපිරිසම) තම නිවෙස්වලින් බැහැරව ජීවත්වීමේ මූල්‍යමය දුෂ්කරතා සමනය කිරීම සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ඇසුරුම් 578 ක් පරිත්‍යාග කරන ලදී.

තවත් විශේෂ වැඩසටහනක් රත්මලානේ පිහිටි ලංකා බිහිරි සහ අන්ධ විද්‍යාලයේ සිසුන් වෙනුවෙන් සිදු කරන ලදී. එහිදී ඔවුන්ට නෞකාවක් තුළ විශේෂ නත්තල් සාදයක් පැවැත්වීම ඇතුළුව කොළඹ නගරයේ සහ වරායේ පැවැති උත්සව සමඟින් විනෝදයෙන් පිරුණු දිනයක් ගත කිරීමට අවස්ථාව සැලසුණි. සාමාන්‍යයෙන් එවැනි විනෝදාස්වාද අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාවක් නොලබන දරුවන්ට මෙය මහඟු අවස්ථාවක් විය.

## අත්දැකීම් ලබා දීමේ චාරිකා

මූල්‍ය වර්ෂය තුළදී ශ්‍රීලංකන් කෙයාර්ස් විසින් වල්පොල ශ්‍රී රතනසාර ප්‍රාථමික විද්‍යාලය, සීදූව වෘත්තීය පුහුණු ආයතනය, හිඟුරක්ගොඩ ආනන්ද බාලිකා ජාතික පාසල, ආඬිඅම්බලම මහා විද්‍යාලය, මීගමුව දකුණ ජාත්‍යන්තර පාසල් ජාලය සහ දෙපානම ධර්මපාල ප්‍රාථමික පාසලේ තෝරාගත් සිසුන් කණ්ඩායම් වෙනුවෙන් අත්දැකීම් ලබා දීමේ චාරිකා සංවිධානය කරන ලදී. ගුවන් යානා අභ්‍යන්තරය, මෙහෙයුම් අංග, ක්‍රියාකාරීත්වය සහ ගුවන් යානා නඩත්තු අංශය වන ශ්‍රීලංකන් ඉන්ජිනියරින් පිළිබඳ දරුවන්ට අවබෝධය සහ අත්දැකීම ලබා දීම සඳහා මෙකී අත්දැකීම් ලබා දීමේ චාරිකා මූලික වශයෙන් සැලසුම් කරන ලදී.

මෙකී මුලපිරීම් ඔස්සේ මූල්‍ය වර්ෂය තුළදී ශ්‍රීලංකන් කෙයාර්ස් අධ්‍යාපන ආධාර මගින් පාසලේ සිසුන් 3000කට ආසන්න ප්‍රමාණයක් වෙත උපකාර සිදු කරන ලද අතර, එකී දරුවන්ගේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහ අභිවෘද්ධිය සඳහා එය දායක විය.

## තිරසාරත්ව කාර්යසාධනය

ජාතික ගුවන් සමාගම වශයෙන් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් අනාගත පරපුර උදෙසා පරිසරය සුරැකීමේ සිය ජාතික වගකීම වෙනුවෙන් ස්ථිර කැපවීමකින් කටයුතු කරයි. මෙකී අරමුණ සාක්ෂාත් කරලීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් සිය දෛනික මෙහෙයුම් සඳහා තිරසාරත්වය මුල් කරගත් ක්‍රියාකාරකම් එක් කර ගනිමින්, පරිසර හිතකාමී වැඩපිළිවෙතක් අනුගමනය කර ඇත. මෙහෙයුම්වල පාරිසරික පිය සටහන අඩු කරමින් සහ නව සංවර්ධනයන්වලදී පරිසර හිතකාමී ආයතනික දර්ශනය සඵල කරගනිමින් ප්‍රතිඵලදායක තිරසාරත්ව ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම වෙනුවෙන් ගුවන් සමාගම විසින් නව අවස්ථාවන් නිරන්තරයෙන් ගවේෂණය කරනු ලැබිණ.

### ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි පාරිසරික ක්‍රමෝපාය

පහත දැක්වෙන පරිදි ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් මූලික පදනම් හයක් යටතේ පාරිසරික ක්‍රමෝපායන් පවත්වා ගනු ලබයි.

| | | |
|---|---|---|
| 1. | කාබන් පියසටහන් අවම කිරීම | ඍජු සහ වක්‍ර ක්‍රම ඔස්සේ සිදුවන කාබන් විමෝචනය අවම කිරීම. |
| 2. | සම්පත් කාර්යක්ෂමතාව සහ අපද්‍රව්‍ය අවම කිරීම | ඉහළ කාර්යක්ෂමතාවයකින් මෙහෙයුම් සඳහා යොදා ගන්නා විදුලිය, ජලය සහ සෙසු යෙදවුම් භාවිත කිරීම. පරිසර හිතකාමී යෙදවුම් යොදා ගැනීම. |
| 3. | පාරිසරික අනුකූලතාව | අදාළ සියලු පාරිසරික රෙගුලාසි සහ ප්‍රතිපත්තිවලට ගුවන් සේවා මෙහෙයුම් අනුකූල බව සහතික කිරීම. |
| 4. | ජෛව විවිධත්වය සංරක්ෂණය සහ ආරක්ෂා කිරීම | රටේ ජෛව විවිධත්වය සහ පරිසර පද්ධති ආරක්ෂා කිරීම උදෙසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. |
| 5. | පාරිසරික තිරසාර අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ළමා හා තරුණ සවිබල ගැන්වීම | ශ්‍රී ලංකාව තුළ පාරිසරික විද්‍යාව පිළිබඳ කුසලතා සහ දැනුම වර්ධනය සහතික කිරීම. |
| 6. | ප්‍රජා සවිබල ගැන්වීම | සංවේදී පරිසර පද්ධති වටා සිටින ප්‍රජාව වෙනුවෙන් තිරසාර ජීවිකාවන්. |

### 2022/23 මූල්‍ය වර්ෂය තුළ සිදු කළ මූලික කර්තව්‍යයන්

*කඩොලාන රෝපණය කිරීමේ ව්‍යාපෘතිය*

ශ්‍රී ලංකාවේ කඩොලාන වනාන්තර පවතිනුයේ ඉතා සීමිත ප්‍රමාණයක් වන අතර, එය ශීඝ්‍රයෙන් අඩුවෙමින් පවතී. එබැවින් එතුළින් සංරක්ෂණ කටයුතු ඉක්මනින් සිදු කිරීමේ වැදගත්කම අවධාරණය කරයි. වෙරළ ඛාදනයේ සිට සුනාමි වැනි ආන්තික සිදුවීම් දක්වා මුහුදෙන් ඇති වන ඕනෑම ස්වාභාවික තර්ජනයකින් රට මුදවා ගන්නා පළමු ආරක්ෂකයා ලෙස කඩොලාන කටයුතු කරයි. කඩොලානවල පවතින කාබන් වෙන් කිරීමේ ඉහළ හැකියාව හේතුවෙන්, ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමට එරෙහිව වැදගත් කාර්යභාරයක් සිදු කරනු ලබයි. පරිසර දූෂණය සහ අනෙකුත් මිනිස් ක්‍රියාකාරකම් මගින් කඩොලාන සඳහා බලපෑම් ඇති වීම හේතුවෙන් අපගේ වෙරළබඩ ප්‍රදේශ අවදානමට ලක් වේ.

ශීඝ්‍රයෙන් ක්ෂය වන කඩොලාන ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් ශ්‍රී ලංකා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ එක්ව මීගමුව කලපුවේ කඩොලාන වනාන්තර සංරක්ෂණය කිරීමේ සහයෝගී ප්‍රයත්නයක් ලෙස කඩොලාන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මෙම ක්‍රියාමාර්ගයේ කොටසක් ලෙස, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත කඩොලාන තවානක් පරිත්‍යාග කළ අතර, දෙපාර්තමේන්තුව සමඟ එක්ව කඩොලාන රෝපණ කටයුතු සිදු කර ඇත. තවද, ඉදිරියේදී දිවයින වටා පවතින සංවේදී පරිසර පද්ධති සංරක්ෂණය හා ආරක්ෂා කිරීම සඳහා අදාළ පාර්ශවකරුවන් සමඟ සම්බන්ධ වීමට ගුවන් සමාගම සැලසුම් කරයි.

*Upcycling ව්‍යාපෘතිය*

අර්ථවත් සහ ඵලදායී ක්‍රියාමාර්ග හරහා පරිසරයට රැකගැනීම සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් 2021 වර්ෂයේදී 'මතක' නමින් සුවිශේෂී ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. ගුවන් සමාගමෙන් ඉවතලන භාණ්ඩ, වාණිජමය වටිනාකමක් සහිත පරිසර හිතකාමී නව නිෂ්පාදනයක් බවට පත් කොට නැවත භාවිත කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය. ගුවන් සමාගම විසින් එහි මෙහෙයුම් වලින් ඉවත ලන අපද්‍රව්‍ය භාවිත කරයි. ආසන ආවරණ, බ්ලැන්කට්, නිල ඇඳුම් සහ අනෙකුත් දෑ නැවත භාවිතයට ගනිමින් පරිසරයට ඇති වන දිගුකාලීන ඍණාත්මක බලපෑම එතුළින් අවම කරයි. 'ශීක් මොහොමඩ් බින් රෂීඩ් අල් මක්ටොයුම්' - 2022 ගෝලීය ගුවන සේවා සම්මාන උළෙලේදී සමාජ- ආර්ථික කාණ්ඩය යටතේ හොඳම ගුවන් සේවා තිරසාර වැඩසටහන සඳහා ජාත්‍යන්තර සම්මානය හිමි වීමෙන් මෙම ව්‍යාපෘතිය ජාත්‍යන්තර මට්ටමෙන් දැඩි ලෙස ප්‍රශංසාවට ලක් විය.

මේ වන විට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් ඉදිරි මූල්‍ය වර්ෂයන්හිදී වැඩිදියුණු කිරීමේ අදහසින් මෙම කාර්යය යටතේ සාර්ථක නිෂ්පාදන ත්‍රිත්වයක් ක්‍රියාත්මක කොට ඇත. භාවිත කළ නිල ඇඳුම් බැහැර කිරීමේ පිරිවැය අවම කිරීමට මෙන්ම ඉවතලන ද්‍රව්‍ය භූමියේ එකතු වීම වළක්වාලීමට මෙම ව්‍යාපෘතිය ඉවහල් විය. දැනට මෙම නිෂ්පාදන සන්නාමගත සිහිවටන සහ තෑගි භාණ්ඩ ලෙස භාවිත කරයි.

අපගේ ව්‍යාපෘති හවුල්කරුවන් වන House of Lonali and Women in Need (WIN) සමඟ ගොඩනඟා ගත් ව්‍යාපාරික සබඳතාව තුළින් අඩු ආදායම්ලාභී ප්‍රජාව තුළ කාන්තාවන්ට ජීවනෝපායක් සොයා ගැනීමට මෙන්ම ඔවුන්ගේ පවුල් නඩත්තු කිරීමට සවිබල සැපයීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ශක්තිමත් මානුෂීය පැතිකඩකින්ද යුතුය.

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.




*ශ්‍රීලංකන් ගුවන් සේවය 'Mathaka' ව්‍යාපෘතිය ජාත්‍යන්තර සම්මානයට පාත්‍ර වෙයි.*

### කාබන්හරණ ක්‍රියාමාර්ග

කාබන්හරණය ක්‍රියාමාර්ගයක් ලෙස, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් සිය විමෝචනය අවම කිරීම සඳහා කර්මාන්තයේ හොඳම භාවිතයන් අඛණ්ඩව අනුගමනය කරනු ලබයි. කර්මාන්තය තුළ නිර්දේශිත හරිත මෙහෙයුම් ක්‍රියා පටිපාටි අනුගමනය කිරීම, පියාසැරි සැලසුම් ප්‍රශස්ත කිරීම සහ ගුවන් යානා මෙහෙයුම් බර කළමනාකරණය කිරීම මඟින් මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම මේ සඳහා අදාළ වේ. සමාගම විසින් ගුවන් මෙහෙයුම් ප්‍රදේශය තුළ එයාර්බස් හරිත මෙහෙයුම් අත්පොතට අනුකූලව කටයුතු කිරීමට දිරිමත් වන්නා සේම, ICAO CORSIA වැඩසටහන යටතේ ගුවන් යානා විමෝචන දත්ත අධීක්ෂණය, වාර්තා කිරීම සහ සත්‍යාපනය සිදු කරයි.

එමෙන්ම, යටිතල පහසුකම් ආශ්‍රිත බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ක්‍රියාමාර්ග, දැනුවත් කිරීමේ වැඩසටහන් සහ යහපත් නඩත්තු කටයුතු ක්‍රියාත්මක කරමින් ගුවන් සමාගම සිය විදුලි පරිභෝජනය අවම කිරීමට නිරන්තරයෙන් කටයුතු කරයි. කාබනික අපද්‍රව්‍ය වලින් කොටසක් මුළුතැන්ගෙයි ඉන්ධන බවට පරිවර්තනය කිරීම සඳහා ජීව වායු ඒකකයක් ද භාවිත වේ.

### දැනුම සහ කුසලතා සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් ඩ්‍රෝන තාක්ෂණය භාවිතයෙන් මුහුදු තෘණ රෝපණය සිතියම්ගත කිරීම පිළිබඳ තායිලන්තයේ ප්‍රින්ස් සොන්ග්ක්ලා විශ්ව විද්‍යාලයේ මුහුදු තෘණ පිළිබඳ විශේෂඥ ආචාර්ය මිලිකා ස්ටැන්කොවික් විසින් පවත්වන ලද පුහුණුව වෙනුවෙන් සත්කාරකත්වය සහ අනුග්‍රහය දැක්වීය. විද්‍යාඥයින්, පර්යේෂණ සිසුන් සහ රාජ්‍ය ආයතනවල නිලධාරීන් සඳහා ශ්‍රී ලංකාව තුළ ජාතික ශක්‍යතාවයක් ගොඩනැගීම මෙම ක්‍රියාමාර්ගයේ අරමුණ විය. එමෙන්ම, එයාර්ලයින්ස් විසින් ලෝක මුහුදු තෘණ දිනයේ ජාතික සැමරුම සඳහා අනුග්‍රහය දැක්වූ අතර "රටක තිරසාර සංවර්ධනය උදෙසා නිල් කාබන් පරිසර පද්ධතිය සහ සාගර ආර්ථිකය යොදා ගැනීම" මැයෙන් වෙබිනාර් සැසියක් පවත්වන ලදී.

තවද, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් ස්පාඤ්ඤයේ පැවති ලෝක මෝර මසුන් පිළිබඳ සමුළුවේ (World Shark Conference) ශ්‍රී ලංකාවේ නියෝජිතයින්ගේ ගුවන් ගමන් සඳහා අනුග්‍රහය දැක්වීය. එහිදී ශ්‍රී ලංකාව ලෝක මෝර මසුන් පිළිබඳ සමුළුවේ 5 වන සංස්කරණයේ සත්කාරකත්වය ලබා ගැනීමේ ලංසුව දිනා ගන්නා ලදී. ශ්‍රී ලංකාව අවට වෙසෙන මෝරුන් යොදා ගෙන ධාරිතා පරතරය විසඳීම සඳහා සිදු කළ වැඩමුළුවකට සම්බන්ධ වූ ග්‍රොනින්ග න් විශ්ව විද්‍යාලයෙන් සහ රාජකීය නෙදර්ලන්ත මුහුදු පර්යේෂණ ආයතනයේ ආචාර්ය ගයිඩෝ ලෙයර්ස් වෙනුවෙන් සංචාරක පහසුකම් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් සලසන ලදී.

### දැනුවත්භාවය ඇති කරලීම

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් පාරිසරික ගැටලු පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා, රැකියා ස්ථානය සහ ඉන් බාහිර පාරිසරික ගැටළු සම්බන්ධයෙන් පුළුල් දැනුවත් කිරීමේ වැඩසටහන් නිරන්තරයෙන් පවත්වනු ලබයි. ස්වේච්ඡා ක්‍රියාකාරකම් සංවිධානය කිරීම සහ පාරිසරික තිරසාරභාවය පිළිබඳ කර්මාන්තයට විශේෂිත වූ පුහුණු සැසි සංවිධානය කිරීම තුළින් කාර්ය මණ්ඩලයේ අවබෝධය තවදුරටත් වර්ධනය කරනු ලබයි.

## නියාමන අනුකූලතාවය

නියාමන අනුකූලතාව යනු ගුවන් සමාගමේ ප්‍රධානතම අංගයක් වන අතර, ඒ හරහා මගීන්ගේ ආරක්ෂාව මෙන්ම කාර්යක්ෂම මෙහෙයුම් තහවුරු කරනු ලබයි. ගුවන් ප්‍රමිතීන් සහ ක්‍රියා පටිපාටි දැඩි ලෙස පිළිපැදීම තුළින් මිනිස් ජීවිත හා දේපළ අවදානම අවම කරමින් අනතුරු සහ සිදුවීම් වළක්වාලනු ඇත. එමෙන්ම, මෙම නීතිරීති සහ රෙගුලාසි මඟින් සමාගම තුළ පැහැදිලි වගකීම් සහ වගකීම් පිහිටුවාලමින්, බාධාවකින් තොර ව්‍යාපාරික මෙහෙයුම් සඳහා ස්ථාවර පදනමක් සපයයි. මේ අනුව, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් අදාළ වන සියලුම දේශීය සහ ජාත්‍යන්තර කර්මාන්ත ප්‍රමිතීන් වලට දැඩි ලෙස අනුගතව කටයුතු කරයි.

### ආරක්ෂක කළමනාකරණ පද්ධතිය (SMS)

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සතුව ආයතනය පුරා සන්නිවේදනය කරනු ලබන ආරක්ෂක ප්‍රතිපත්තියක් ඇතුළුව වගකිවයුතු කළමණාකරු (ප්‍රධාන විධායක නිලධාරී) විසින් පිටසන් කරන ලද අනුමත ආරක්ෂක කළමනාකරණ පද්ධතියක් (SMS) පවතී. ආරක්ෂක කළමනාකරණ පද්ධතිය සඳහා සමාගමේ උපද්‍රව හඳුනාගැනීමට සහ අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා වැඩිදුර විශ්ලේෂණය කිරීමට ඉඩ සලසනු ලබන ආරක්ෂිත අවදානම් කළමනාකරණ පද්ධතිය ඇතුළත් වේ. උපද්‍රව හඳුනාගැනීම ආයතනය පුරා ක්‍රියාත්මක වන මනාව ස්ථාපිත කළ ආරක්ෂිත වාර්තාකරණ යාන්ත්‍රණයක් හරහා සිදු කරනු ලැබේ. එමෙන්ම, එක් එක් මෙහෙයුම් කටයුතු සඳහා ආරක්ෂිත මෙහෙයුම් සහතික කිරීමට ක්‍රියාකාරී මට්ටමේ තීරණ ගනු ලබන ආරක්ෂිත ක්‍රියාකාරී කණ්ඩායම් පිහිටුවා ඇත.

පුද්ගලයින්ට සිදුවන තුවාල සහ උපකරණවලට සිදුවන හානිය අවම කරමින් රාජකාරි ඉටු කිරීම සහතික කරනු ලබන වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂණ වැඩසටහනක් පවතින අතර, එමඟින් රැකියා ස්ථානයේ උපද්‍රව පිළිබඳ සලකා බැලේ.

## ගුවන් ප්‍රමිතීන් සහ ක්‍රියා පටිපාටිය

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් ගුවන් සේවා කර්මාන්තයට අදාළ සියලුම ජාතික සහ ජාත්‍යන්තර රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරයි. මේ සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ (CAASL), ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමයේ (IATA) සහ ගුවන් සේවා කර්මාන්තය සඳහා වන රෙගුලාසි සහ ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කරන යුරෝපා සංගම් ගුවන් සේවා ආරක්ෂණ ඒජන්සියේ (EASA) රෙගුලාසි ඇතුළත් වේ.

## තත්ත්ව කළමනාකරණ පද්ධති

ඉංජිනේරු සහ මෙහෙයුම් තත්ත්ව දෙපාර්තමේන්තු විසින් විගණන, පරීක්ෂණ සහ නිරීක්ෂණ තුළින් අනුකූලතා සහ සමානත්වතා මට්ටම නිරීක්ෂණය කිරීම සහ තක්සේරු කිරීම සඳහා ක්‍රියාවලි ඇතුළත් තත්ත්ව කළමනාකරණ පද්ධති ස්ථාපිත කර ඇත. මූල්‍ය වර්ෂය තුළදී, ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමයේ බලය ලත් ක්ෂේත්‍ර ප්‍රවීණයන් විසින් දින පහක් ඇතුළත IATA මෙහෙයුම් ආරක්ෂණ විගණන (IOSA) අලුත් කිරීමේ විගණනයකදී 800+ ප්‍රමිතීන් මත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි විගණන කටයුතු සිදු කරන ලදී. 2025 ජනවාරි 26 දක්වා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් IOSA ලියාපදිංචිය අලුත් කරමින් අවම සොයාගැනීම් සහිතව විගණනය සාර්ථකව නිම කරන ලදී.

රටේ ආර්ථික අර්බුධය සහ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි මූල්‍ය තත්ත්වය සැලකිල්ලට ගනිමින් මෙහෙයුම් තත්ත්ව දෙපාර්තමේන්තුව විසින් විදේශයන් හි පවතින ආයතනවල විගණන පවත්වන ලදී. සියලු ආයතන සඳහා භෞතිකව සම්බන්ධ වීම වෙනුවට ස්ථානීය කළමනාකරුගේ සහය මත පිරිවැය ඉතුරුම් විකල්පයක් වශයෙන් මාර්ගගත ක්‍රමවේදයට අනුව පවත්වන ලදී.

## සයිබර් ආරක්ෂණ සහ දත්ත ආරක්ෂණ

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් මගී දත්තවල ආරක්ෂාවට ප්‍රමුඛත්වය දෙන අතර, සයිබර් ආරක්ෂණ තත්ත්වයන් වැඩිදියුණු කරලීමට කෘත්‍රිම බුද්ධිය (AI) සහ යන්ත්‍ර ඉගෙනුම් (ML) ඇතුළු තාක්ෂණයන් සහ ක්‍රියාමාර්ග රැසක් භාවිත කරයි. මෙකී ක්‍රියාමාර්ග සඳහා ස්වයංක්‍රීය හඳුනාගැනීම් සහ පාලනය, අවසාන අධියර හඳුනාග ැනීම් සහ ප්‍රතිචාර දැක්වීම, අනතුරු තක්සේරුව, ආරක්ෂක තොරතුරු සහ සිදුවීම් කළමනාකරණය (SIEM), ජාල හැසිරීම් සහ විශ්ලේෂණය, ස්පෑම් සහ තතුබෑම් (Phishing) හඳුනාගැනීම් සහ සංකේතනය ඇතුළත් වේ. ඊට අමතරව, යුරෝපීය සංගමයේ සාමාන්‍ය දත්ත ආරක්ෂණ රෙගුලාසි (GDPR) සහ ශ්‍රී ලංකාවේ 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත (PDPA) ඇතුළුව, සහ ඊට සීමා නොවෙමින්, ගුවන් සේවය විසින් දත්ත ආරක්ෂණ රෙගුලාසිවල අවශ්‍යතා සපුරාලීම සඳහා නිරන්තරයෙන් මෙහෙයුම් වැඩිදියුණු කරයි.

සයිබර් ආරක්ෂාව සහ දත්ත ආරක්ෂා කිරීම තවදුරටත් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ අංශය විසින් ISO/IEC 27001:2013 තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය, ISO/IEC 27701:2019 රහස්‍යතා තොරතුරු කළමනාකරණ පද්ධතිය, ISO/IEC 20000:2018 තොරතුරු තාක්ෂණ සේවා කළමනාකරණ පද්ධතිය සහ මෘදුකාංග සංවර්ධනය සඳහා ISO 9001:2015 තත්ත්ව කළමනාකරණ පද්ධතිය ආදිය ඇතුළත් අනුකූලතා පවත්වා ගැනීම සහ සහතික ලබා ගැනීම අඛණ්ඩව සිදු කරනු ලබයි.

## මූල්‍ය සමාලෝචනය

ගෝලීය ගුවන් සේවා කර්මාන්තය තුළ යළි පිබිදීමක් ඇති වීමත් සමඟ, මෙතෙක් පැවති විශාලතම අර්බුදය නොතකා, සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් (SLA) විසින් සැලකිය යුතු මට්ටමක ඉහළ මූල්‍ය කාර්යසාධනයක් වාර්තා කරන ලදී. එය විශේෂයෙන්ම මෙවන් අභියෝගාත්මක කාලවකවානුවකට ශක්තිමත්ව මුහුණ දීමට සමූහය සතු හැකියාව සහ එහි සාර්ථකත්වය පිළිබිඹු කරන්නකි. පෙර මූල්‍ය වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය වූ රුපියල් බිලියන 1.7 හා සැසඳීමේ දී සමාලෝචිත වසර තුළ රුපියල් බිලියන 43.4 ක මෙහෙයුම් අතිරික්තයක් (විනිමය අලාභයට පෙර) සමඟ ඉහළ මෙහෙයුම් ලාභයක් සාක්ෂාත් කර ගැනීම, කළමනාකාරිත්වය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගයන්හි ප්‍රතිඵලයක් වූ මනා සම්බන්ධීකරණ ප්‍රයත්නයන් සහ අප සේවකයින්ගේ නොසැලෙන කැපවීම සනාථ කරන්නාවූ ප්‍රබල සාක්ෂියකි. එපමණක් නොව, ශක්තිමත් ජාලයක් ස්ථාපිත කිරීමට සහ දකුණු ආසියානු උප මහාද්වීපයේ වසර ගණනාවක පටන් පැවත එන ප්‍රමුඛ ගුවන් සමාගමක් වශයෙන් සිය ස්ථාවරය පවත්වා ගැනීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් දරන අඛණ්ඩ ප්‍රයත්නයන් මෙම සුවිශේෂී ජයග්‍රහණය සඳහා ඉවහල් වී ඇත.

කෙසේ වෙතත්, විශේෂයෙන්ම භූ දේශපාලනික ගැටලු, ආර්ථික අර්බුද, උද්ධමනය සහ ඉන්ධන අර්බුද සහිත කාලපරිච්ඡේදයක් වූ මෙකී පරිවර්තනීය අවධිය ශ්‍රී ලංකාවේ ජාතික ගුවන් සේවයට අභියෝගාත්මක කාලවකවානුවක් විය. නියමිත ගුවන් වාර සීමා කිරීම් සහ ආපසු ගමන් සඳහා ප්‍රමාණවත් ඉන්ධන සැපයීම සඳහා මගීන් සහ භාණ්ඩ ප්‍රවාහනය සීමා කිරීම මධ්‍යයේ, රට තුළ පමණක් ගුවන් යානා ඉන්ධන සැපයුමේ පැවති උග්‍ර හිඟය හේතුවෙන් සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ දළ වශයෙන් ඩොලර් මිලියන 20 ක අලාභයක් ඇති විය. එපමණක් නොව, පෙර මූල්‍ය වර්ෂවල සිට පැන නැගි, සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පැවති ණය පොලී අනුපාත හේතුවෙන් උක්ත මෙහෙයුම් ලාභයට බාධා එල්ල විය.

මූලික වශයෙන් මූල්‍ය පිරිවැය රුපියල් බිලියන 51.5 ක් සහ විනිමය අලාභය රුපියල් බිලියන 63.1 දක්වා ළඟා වීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් සමූහය රුපියල් බිලියන 71.3 ක ශුද්ධ අලාභයක් වාර්තා කළේය.

| | 2022/2023 | % අලාභය සඳහා දායකත්වය | 2021/2022 | % අලාභය සඳහා දායකත්වය |
|---|---|---|---|---|
| මූල්‍ය පිරිවැය | 51.48 | 72% | 22.90 | 14% |
| විනිමය අලාභය | 63.13 | 89% | 142.61 | 87% |

එසේ වුවද, පිරිවැය ඉතිරි කිරීම සඳහා අදාළ වන ක්‍රියාමාර්ගවලට ප්‍රමුඛත්වය දීම, මුදල් ක්ෂය වීම අවම කිරීම සහ වඩාත් හිතකර ආදායම් අපේක්ෂාවන් වෙත යොමු කෙරෙන මාර්ග උපායශීලීව තෝරා ගැනීම හරහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් මෙකී අභියෝගාත්මක කාලපරිච්ඡේදය දක්ෂ ලෙස හැසිරවිය. අපගේ වියදම්වලින් 75% ක් ඇමරිකානු ඩොලර්වලින් වීම සහ අපගේ ආදායමෙන් 85% ක් විදේශ ව්‍යවහාර මුදල්වලින් ලබාගත් හෝ අගය කිරීම හේතුවෙන් ඇමරිකානු ඩොලර්වලින් සකස් කරන ලද සමාගමේ

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.

කළමනාකරණ ගිණුම් හරහා මෙය පිළිබිඹු වේ. සමාගම, එක්සත් ජනපද ඩොලර්වලින් එහි ශුද්ධ ලාභයෙහි කැපී පෙනෙන දියුණුවක් අත්කර ගත් අතර එය දශක එකහමාරකට පසුව සමාගම් ඉතිහාසය තුළ වැදගත් සංධිස්ථානයක් වනු ඇත.

## ඉපැයීම්

දේශපාලන හා ආර්ථික අර්බුදය හේතුවෙන් වසරේ මුල් භාගයේ දී රටට පැමිණෙන සංචාරකයින්ගේ කැපී පෙනෙන අඩුවීමක් පෙන්නුම් කළ අතර, සංක්‍රමණ ගමනාගමනය හරහා ආදායම් උත්පාදනය කිරීම කෙරෙහි ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සිය අවධානය යොමු කළේය. එසේ වුවද, 2022 අග භාගයේදී රට යම් ස්ථාවරත්වයක් අත්කරගත් හෙයින් ගුවන් සමාගමේ ඉපැයීම් ඉහළ ගියේය. ඒ කොළඹට සිය මෙහෙයුම් නැවත ආරම්භ කළ අනෙකුත් ගුවන් සමාගම්වලට ගොඩබිම් හැසිරවීමේ සේවා සැපයීම සහ ආහාර සැපයීම මඟිනි. රටින් පිට අපනයන ප්‍රවාහනය කිරීම සඳහා වගකිව යුතු භාණ්ඩ ප්‍රවාහන මෙහෙයුම්වලින් උපයාගත් ඉපැයීම් සහ ශ්‍රීලංකන් ඉන්ජිනියරින් විසින් අනෙකුත් ගුවන් සමාගම් වෙත නඩත්තු සේවා සැපයීම මඟින් ලද ඉපැයීම් මඟින් මෙය තවදුරටත් ශක්තිමත් විය.

සමූහයේ ආදායම රුපියල් බිලියන 369.5 ඉක්මවා ගිය අතර එය පෙර මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 175% ක වර්ධනයකි. එසේ වුවද, ගෝලීය පරිමාණයෙන් ක්‍රියාකරුවන්ට බලපෑ එයාර්බස් 320/1 නියෝ එන්ජින්වල විශ්වසනීයත්වය සහ නඩත්තුව හා සම්බන්ධ අනපේක්ෂිත අභියෝගයන්ට මුහුණ දීමට සිදු වූ පසුබිමක සහ දැනට විසඳුම් සකස් කිරීමේ ක්‍රියාවලියේ යෙදී සිටින නිෂ්පාදකයින් සමඟ, මෙම ගුවන් යානාවලින් බහුතරයක් ගොඩබිමට ගැනීමට සහ නිශ්චිත ගමනාන්තයන් වෙත සිදු කරන ගමන් වාර සංඛ්‍යාව අඩු කිරීමට ගුවන් සමාගමට සිදු විය. සමාලෝචිත මූල්‍ය වර්ෂයේ අවසාන භාගයේ සමාගමේ ආදායම පහත වැටීමට මෙය හේතු විය.

2022/23 මූල්‍ය වර්ෂය සඳහා මගී ආදායම රුපියල් බිලියන 293.3 ක් වූ අතර, පෙර වසරට සාපේක්ෂව එය 276% ක වැඩිවීමකි. මෙම කාල සීමාව තුළ රැගෙන ගිය මගීන් සංඛ්‍යාව මිලියන 3.48 ක් වූ අතර, පෙර වසරට සාපේක්ෂව එය 137% ක කැපී පෙනෙන වර්ධනයකි.

**මගී මෙහෙයුම්**




2021/22 මූල්‍ය වර්ෂය හා සසඳන විට 16% ක වර්ධනයක් පිළිබිඹු කරමින් වාර්ෂික භාණ්ඩ ආදායම රුපියල් බිලියන 51 ක් දක්වා ළඟා විය. සමාලෝචිත වර්ෂයේ මුල් මාසවල රට තුළ පැවති දේශපාලන හා ආර්ථික අස්ථාවරත්වය මධ්‍යයේ වුවද, රෙදිපිළි සහ දිරාපත් වන භාණ්ඩ රටෙන් පිටතට ප්‍රවාහනය කිරීම තුළින් එහි ආදායම ශක්තිමත් කර ගැනීම සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි භාණ්ඩ මෙහෙයුම් අංශය විසින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන ලදී. මෙකී පියවර, ආදායම් ඉහළ නැංවීමට දායක වූවා පමණක් නොව, පශු සම්පත්, දිරාපත් වන භාණ්ඩ සහ සුදානම් කළ අපනයන ප්‍රවාහනය කිරීමෙන් ගුවන් භාණ්ඩ ඉල්ලුම ඵලදායී ලෙස සපුරාලන අතරම, ගුවන් සමාගමේ මාර්ගගත ගමනාන්තවලින් ඔබ්බෙහි පවතින වෙළඳපළ වෙත සම්බන්ධතාවක් ඇති කිරීමටද අවස්ථාව සැලසීය.

ආදායම් වැඩිවී තිබියදීත්, සමස්ත ගුවන් භාණ්ඩ ප්‍රමාණය ටොන් මිලියන 0.8 ක් දක්වා 17% කින් පහත වැටීමක් පෙන්නුම් කරන ලදී.

**භාණ්ඩ මෙහෙයුම්**




සමාලෝචිත වර්ෂයේදී ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් පාරිභෝගික කේන්ද්‍රීය අත්දැකීමක් ලබා දීම සඳහා සිය සේවාවන්හි ගුණාත්මක භාවය ඉහළ නැංවීමෙහිලා සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් දේශීය මෙන්ම ජාත්‍යන්තර මගීන්ගේ ඉල්ලුම සපුරාලමින් ෆ්ලයිස්මයිල්ස් (FlySmiLes) මුදාගැනීම්, ගුවන් ගමන් වැඩිදියුණු කිරීම්, ප්ලස්ග්‍රේඩ් වාරික ආසන විකල්ප, අතිරික්ත ගමන් මලු හැසිරවීම, ඉහළ මට්ටමේ ආසන වෙන්කිරීම්, තීරුබදු රහිත විකුණුම්, පෙර-ඇණවුම් කේක් සහ ආහාර සේවා සහ වරලත් මෙහෙයුම් වැනි ආදායම් මූලාශ්‍රයන් ඇතුළු සිය අනුපූරක සේවා පරාසයද පුළුල් කළේය.

## වියදම

2021/22 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 49% ක සැලකිය යුතු වර්ධනයක් සමඟ සමාගමේ මුළු වියදම රුපියල් බිලියන 444 ක් විය. මෙම වියදම් වැඩිවීමට හේතු වී ඇත්තේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වැඩි වීම සහ එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල දුර්වල වීමේ අහිතකර බලපෑමයි. මෙම හේතුවෙන් විදේශ විනිමය අලාභය සමස්ත පිරිවැයෙන් 14%ක් වන රුපියල් බිලියන 63.13 දක්වා තවදුරටත් ඉහළ යන ලදී. සමූහයේ වියදම් බෙදී යාම පිළිබඳ සවිස්තරාත්මක අයුරින් පහත වගුවේ දැක්වේ.

| | 2023 | | 2022 | | වෙනස | |
|---|---|---|---|---|---|---|
| | වටිනාකම (රු. මිලි.) | දායකත්වය (%) | වටිනාකම (රු. මිලි.) | දායකත්වය (%) | වටිනාකම (රු. මිලි.) | දායකත්වය (%) |
| ගුවන් යානා ඉන්ධන පිරිවැය | 155,559 | 35.00% | 42,759 | 14.31% | 112,800 | 263.80% |
| ගුවන් යානා නඩත්තු හා අලුත්වැඩියා පිරිවැය | 42,199 | 9.49% | 23,088 | 7.73% | 19,111 | 82.77% |
| සේවක පිරිවැය | 26,553 | 5.97% | 17,416 | 5.83% | 9,137 | 52.47% |
| ගුවන්තොටුපළ, අතරමැදි සහ මගී වියදම් | 40,761 | 9.17% | 17,753 | 5.94% | 23,008 | 129.60% |
| ,විකුණුම්,, අලෙවි හා ප්‍රචාරණ වියදම්, | 24,643 | 5.54% | 7,250 | 2.43% | 17,393 | 239.92% |
| ගුවන් සේවක වියදම් | 7,661 | 1.72% | 3,231 | 1.08% | 4,430 | 137.11% |
| ක්ෂය/ක්‍රමක්ෂය | 15,153 | 3.41% | 14,656 | 4.91% | 497 | 3.39% |
| වෙනත් මෙහෙයුම් වියදම් | 16,822 | 3.78% | 7,026 | 2.35% | 9,796 | 139.41% |
| ගුවන් යානා සහ අමතර එන්ජින් කෙටි කාලීන බදු පදනමට කුලියට දීම | 504 | 0.11% | 43.66 | 0.01% | 460 | 1054.37% |
| විනිමය අලාභය | 24,749 | 5.57% | 34,730 | 11.63% | -9,981 | -28.74% |
| **මෙහෙයුම් වියදම්** | **354,604** | **79.78%** | **167,952** | **56.22%** | **186,653** | **111.13%** |
| මූල්‍ය පිරිවැය | 51,483 | 11.58% | 22,904 | 7.67% | 28,579 | 124.78% |
| පොලී දරන වගකීම් මත විනිමය අලාභය | 38,379 | 8.63% | 107,881 | 36.11% | -69,502 | -64.42% |
| **මූල්‍ය වියදම්** | **89,862** | **20.22%** | **130,785** | **43.78%** | **-40,923** | **-31.29%** |
| **මුළු වියදම්** | **444,466** | **100.00%** | **298,736** | **100.00%** | **145,730** | **48.78%** |

ගුවන් යානා ඉන්ධන පිරිවැය, පසුගිය මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 14% ක වෙනසක් දක්වමින් සමාගමේ මුළු වියදම්වලින් 35% ක් ලෙස වාර්තා විය. රුසියාව විසින් යුක්රේනය ආක්‍රමණය කිරීමෙන් පසු ඉන්ධන මිල ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස ඉන්ධන පිරිවැය සැලකිය යුතු ලෙස වැඩි විය. එකී කරුණත්, කොළඹ නගරය තුළ ජෙට් ඉන්ධන හිඟ වීමත් හේතුවෙන් ඉන්ධන සඳහා මූලික මිල ගණන් ඉහළ නැංවීමට සහ රට තුළට අඛණ්ඩ සම්බන්ධයක් පවත්වා ගැනීම උදෙසා ඉහළ පිරිවැයක් දරමින් නැවත ඉන්ධන පිරවීමට අමතර නැවතුම්පොළවල්හි ගොඩබැසීම් සිදු කිරීමට විය. වර්ධනය වූ ගුවන් ගමන් වාර සංඛ්‍යාව සහ මගී ප්‍රමාණයට සමගාමීව ගුවන්තොටුපළ අතරමැදි සහ මගීන්ට අදාළ වියදම්හි සැලකිය යුතු වර්ධනයක් ඇති විය. මෙය පසුගිය වසරට සාපේක්ෂව 130% කින් ඉහළ යන ලදී. ගුවන් යානා නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම සඳහා වූ වියදම රුපියල් බිලියන 42 ක් වන අතර එය මුළු වියදමෙන් 9% කි. ප්‍රධාන වශයෙන් එන්ජින් අලුත්වැඩියා කිරීම සහ අලුත්වැඩියා කිරීමේ අවශ්‍යතා ඉහළ යාම හේතුවෙන් පෙර වසරට සාපේක්ෂව 83% ක වර්ධනයක් මෙම වියදම් කාණ්ඩය තුළ දැකගත හැකි විය. එමෙන්ම විකුණුම්, අලෙවිකරණ සහ ප්‍රචාරණ වියදම් පෙර වසරට සාපේක්ෂව 240% ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරන ලදී.

ඇතැම් වියදම් ඉහළ ගියද, කලාපීය තරඟකරුවන් සමඟ බලන කල්හි ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් සාමාන්‍යයෙන් පිරිමැසුම් පිරිවැය ක්‍රමයක් පවත්වා ගැනීමට සමත් විය. මෙය සඳහා විශේෂයෙන්ම වසංගතය තුළ සහ වර්ෂය පුරා ක්‍රියාත්මක කරන ලද පිරිවැය අවම කිරීමේ ක්‍රියාමාර්ගය හේතු විය.

## මූල්‍ය තත්ත්වය

2023 මාර්තු 31 වන විට, සමූහයේ මුළු වත්කම් රුපියල් බිලියන 211 ක් වූ අතර, එය මූලික වශයෙන් රුපියල් බිලියන 70.5 ක් වූ වත්කම් භාවිතයේ හිමිකම් සහ රුපියල් බිලියන 70 ක් වූ බදු දෙන්නන් සඳහා ලබා දී ඇති කෙටි කාලීන සහ දිගු කාලීන සුරැකුම්පත් ආකාරයේ අනෙකුත් ලැබිය යුතු දෑවලින් සමන්විත වේ. කෙටි කාලීන වෙළඳ සහ අනෙකුත් ගෙවීම් හැර ආයතනයේ සම්පූර්ණ ණය රුපියල් බිලියන 532.8 කි. කල්බදු වගකීම් සමග මේ මුළු වගකීම් වලින් 30% ක් වේ.

## මුදල් තත්ත්වය

ආයතනය/සමාගම ධනාත්මක මූල්‍ය තත්වයක් සලකා බලන අවුරුද්ද පුරාම පවත්වාගෙන ගොස් ඇත. ආයතනික ශුද්ධ මෙහෙයුම් මූල්‍ය ප්‍රවාහ රුපියල් බිලියන 14 සිට 36.8 දක්වා වර්ධනය වීම මෙයට සාක්ෂි දරයි. විලම්බිත ගෙවීම් සැලසුම් ක්‍රියාත්මක කිරීම සහ අනෙකුත් ප්‍රධාන සැපයුම්කරුවන් සමඟ සාකච්ඡා කොටගත් අඩු කිරීම්ද සමඟ මෙම ක්‍රියාමාර්ගය වසර තුළ මූල්‍ය පුරෝකථනයක් සිදු කළ හැකි වාතාවරණයක් නිර්මාණය කිරීම සඳහා දායක වී ඇත.

## ව්‍යාපාර ඒකකයන්හි කාර්යසාධනය

### ශ්‍රීලංකන් ගුවන්තොටුපළ සහ ගොඩබිම් සේවා

*දළ විශ්ලේෂණය*

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි ගොඩබිම් හැසිරවීම් සිදු කරනු ලබන ශ්‍රීලංකන් ගුවන්තොටුපොළ සහ ගොඩබිම් සේවා (A&GS) අංශය විසින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ (BIA) සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ (MRIA) වෙතින්

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.

ක්‍රියාත්මක වන දේශීය හා ජාත්‍යන්තර ගුවන් සේවා විශාල සංඛ්‍යාවකට සේවා සපයනු ලබයි. වර්තමානයේ, එමඟින් ගොඩබිම් හැසිරවීමේ මෙහෙයුම් පිළිබඳ මනා පුහුණුව ලද්දා වූ සහ පළපුරුද්ද ඇති දළ වශයෙන් 2000 පමණ වූ සේවකයින්ගේ ශක්තිය පෙරදැරි කරගනිමින්, 30 කට අධික සංඛ්‍යාවක් වූ සාමාන්‍ය පාර්භෝගික ගුවන් සේවා සහ තත් කාර්ය වාහක සඳහා සේවා සපයනු ලබයි. වසර තිහකට අධික කාලක පළපුරුද්ද තුළින් පරිපාලිත ආයතනය විසින් සිය මූලික හරයන් වන ආරක්ෂාව, නිරවද්‍යතාව, සහ සේවා විශිෂ්ටත්වය තහවුරු කරමින් උසස් තත්ත්වයේ සේවා සැපයීම වෙනුවෙන් කීර්තියක් ගොඩනගා ඇත.




## කාර්යසාධනය

මූල්‍ය වර්ෂය, ගුවන්තොටුපොළ සහ ගොඩබිම් සේවා අංශයෙහි සියලු මෙහෙයුම් සඳහා වඩාත් අභියෝගාත්මක වසරක් විය. මන්ද යත් ඔවුනට ප්‍රතිසාධන ප්‍රයත්න කළමනාකරණය කිරීමටත්, සීමිත සම්පත් යටතේ කටයුතු කරමින් ගුවන් ගමන් සහ මගී ප්‍රමාණයේ වැඩිවීමකට ඉඩ සැලසීමටත් සිදු වූ බැවිනි. මෙහෙයුම් වලට බාධා වන සෙසු බාධක ද විය. රටේ මූල්‍ය දුෂ්කරතා, ඉන්ධන අර්බුදය, බ.ජා.ගු හි ඉන්ධන හයිඩ්‍රන්ට් වැඩිදියුණු කිරීම හේතුවෙන් බාධා ඇති වීම, සීමිත යටිතල පහසුකම්වල සහ කාර්ය මණ්ඩල සහ ගොඩබිම් සේවා උපකරණ (GSE) හිඟය නිසාවෙන් අඛණ්ඩ මෙහෙයුම්වල බාධා ඇති වීම මේ අතර වේ. ගුවන්තොටුපොළ සහ ගොඩබිම් සේවා අංශයට මෙම සීමාවන් මධ්‍යයේ වැඩිවන ඉල්ලුමට සරිලන පරිදි කටයුතු කිරීමට සිදු විය.

කෙසේවෙතත්, ගුවන්තොටුපොළ සහ ගොඩබිම් සේවා අංශය විසින් පසුගිය මූල්‍ය වර්ෂයට සාපේක්ෂව මෙම මූල්‍ය වර්ෂය තුළදී 24% ක වර්ධනයක් දක්වමින් ඇ.ඩො මිලියන 34.86 ක සමස්ත ආදායමක් සනිටුහන් කරමින් ඉහළ මූල්‍ය ප්‍රතිලාභ ලබා ගැනීමට සමත් විය. (පසුගිය මූල්‍ය වර්ෂයේ ආදායම - ඇ.ඩො මිලියන 28). ගුවන් ගමන් වාර 38,497 ක් වාර්තා කරමින් හසුරුවන ලද මුළු ගුවන් ගමන් සංඛ්‍යාව පසුගිය වසරට සාපේක්ෂව 46% කින් වර්ධනය වී ඇති අතර, පසුගිය වසරට සාපේක්ෂව මගී සංඛ්‍යාව ද මිලියන 5.8 ක් ලෙස 80% කින් වර්ධනය විය. මීට අමතරව, මෙම කාල සීමාව තුළ භාණ්ඩ මෙට්‍රික් ටොන් 160,000ක් ද ගොඩබිම් සේවා මඟින් හසුරුවා ඇත. ශ්‍රීලංකන් ගුවන් සමාගමේ මගීන් හැසිරවීමේ විශ්වසනීයත්වය 97.7% ක් ද අනෙකුත් ගුවන් සමාගම් වල මගීන් හැසිරවීමේ විශ්වාසනීයත්වය 99.9% ලෙස පවත්වා ගත් අතර, වැරදි ලෙස හසුරුවන ලද ගමන් මලු අනුපාතය මගීන් 1000 කට 0.74 ලෙස පැවතුණි.

**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ තුළ හසුරුවන ලද ගුවන් ගමන් සංඛ්‍යාව**




**හසුරුවන ලද මගී සංඛ්‍යාව මිලියන**




## ප්‍රධාන උපාය මාර්ග

වසර පුරා වැඩි වූ මගී ගුවන් සේවා ප්‍රමාණය හේතුවෙන් ඇති වූ ධාරිතාව පිළිබඳ ගැටලුවට විසඳුමක් වශයෙන් ගුවන්තොටුපොළ සහ ගොඩබිම් සේවා අංශය විසින් බඳවා ගැනීම් සිදු කරමින් සිය ශ්‍රම බලකාය පුළුල් කරන ලදී. මීට අමතරව, කාර්යක්ෂමතාව වැඩි කිරීමට සහ මගීන්ට සහ කාර්ය මණ්ඩලයට කාලය ඉතිරි කර ගැනීමට සිදුවන ප්‍රමාදයන් අවම කිරීම සඳහා ස්වයං පරීක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී. බ.ජා.ගු හි අපගේ ප්‍රීමියර් ගෝල්ඩ් රූට් සේවාවේ සම්පූර්ණ පිරික්සුම් ක්‍රියාවලිය, විදේශ ගමන් බලපත්‍ර පාලනය සහ ගමන් මලු පිරික්සුම වෙනුවෙන් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් කාර්ය මණ්ඩලය යෙදවූ අතර, මෙහෙයුම් ප්‍රමාදයන් වළක්වාලීමට කාර්ය මණ්ඩලය වෙනුවෙන් පිරික්සුම් කවුන්ටර වෙන් කිරීමෙන් බාධාවකින් තොරව එම කටයුතු පවත්වා ගැනීම තහවුරු කෙරිණ.

## විශේෂ කඩඉම්

කාලපරිච්ඡේදය තුළ සිදුවූ ප්‍රධාන සන්ධිස්ථානයක් ලෙස අක්‍රමිකතා අවම කරමින් මගී ගමන් මලු බෙදා හැරීම නිරීක්ෂණය කිරීම සහ කඩිනම් කිරීම සඳහා නව ගමන් මලු ප්‍රතිසන්ධාන පද්ධතියක් (BRS) ආරම්භ කිරීම දැක්විය හැකිය.

## ඉදිරි දැක්ම

ගුවන් සංචාර සඳහා ඉහළ ඉල්ලුමක් සමඟ වෙළඳපළ වර්ධනය වන බැවින්, වැඩිවන ඉල්ලුමට සරිලන පරිදි ධාරිතාව පුළුල් කිරීමේ අවශ්‍යතාවයක් පවතී. එබැවින්, ගුවන්තොටුපොළ සහ ගොඩබිම් සේවා අංශය විසින් කාර්ය මණ්ඩලය සඳහා අදාළ පුහුණුව ලබා දීමෙන් සහ නුදුරු අනාගතයේ සේවා මට්ටම් ඉහළ නැංවීම සඳහා බිම් හැසිරවීමේ උපකරණ සඳහා ආයෝජනය සිදු කිරීමෙන් මානව සම්පත් සඳහා ආයෝජන සිදු කරනු ඇත. මේ වන විට පරිපාලිතය මඟින් ආදායම් උත්පාදන මූලපිරීමක් ලෙස බ.ජා.ගු හි අධීක්ෂණ හැසිරවීම හඳුන්වා දීමට සැලසුම් කරයි (ගොඩබෑම, වාහන නැවැත්වීම,

සංචාලනය අනුමත කිරීම්, මගීන් සහ ඔවුන්ගේ ගමන් මලු, රැම්ප් හැසිරවීම සහ තාවකාලික පාරිභෝගික ගුවන් ගමන් වලට අදාළ භාණ්ඩ ප්‍රවාහනය සඳහා අදාළ අධීක්ෂණ සහ සම්බන්ධීකරණ කාර්යභාරය ඉටු කිරීමේදී එවැනි ගුවන් ගමන් ආරක්ෂිතව සහ කාලෝචිත ලෙස යැවීම සඳහා නවීන ක්‍රියාවලි සහ පද්ධති භාවිත කිරීම.) එමෙන්ම කලාපය තුළ අනෙකුත් ජාත්‍යන්තර ගුවන් තොටුපළවල බිම් හැසිරවීමේ සේවා සැපයීමේ හැකියාවන් පිළිබඳ තවදුරටත් සොයා බැලීම් සිදු කරනු ලබයි. ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් සමඟ සම්බන්ධ වන ආරම්භක සහ අවසාන ස්ථානය ලෙස කටයුතු කරනු ලබන ශ්‍රීලංකන් ගුවන් තොටුපළ සහ ගොඩබිම් සේවා අංශය විසින් මෙම අඛණ්ඩ වැඩිදියුණු කිරීම් ඔස්සේ ඔවුන්ගේ පාරිභෝගික අත්දැකීම්වල ගුණාත්මකභාවය සැලකිය යුතු ලෙස වැඩිදියුණු කරනු ඇතැයි විශ්වාස කරයි.

## ශ්‍රීලංකන් ඉංජිනේරු අංශය (SLE)

### *දළ විශ්ලේෂණය*

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සතු එකම ඉංජිනේරු අංශය, ශ්‍රීලංකන් ඉංජිනේරු අංශය (SLE) වන අතර එයට ගුවන් යානා නඩත්තුව සම්බන්ධයෙන් දශක තුනකට වැඩි ප්‍රවීණතාවයක් ඇත. කොළඹ, මාලේ සහ මත්තල යන ස්ථාන තුනක් යටතේ මෙහි මෙහෙයුම් කටයුතු සිදුවේ. ශ්‍රීලංකන් ඉංජිනේරු අංශය විසින් ගුවන් සේවාවන් රැසක් සපයන අතර එමඟින් ගුවන් යානා සහ ඒ ආශ්‍රිත උපාංගවල සම්පූර්ණ නඩත්තු කිරීම, අලුත්වැඩියා කිරීම සහ ප්‍රතිසංස්කරණය (MRO) කිරීම යන සේවාවන් ඇතුළත් වේ. ශ්‍රීලංකන් ඉංජිනේරු අංශය විසින් ශ්‍රීලංකන් එයාලයින්ස් සමාගමට සහ තවත් ගෝලීය ගුවන් සේවා ආයතනයන රැසකට සිය සේවාවන් සපයමින් ඉදිරියේදී සිය සේවාවන් තුළින් පුළුල් ගනුදෙනුකරුවන් ජාලයක් ගොඩනගා ගැනීමට අරමුණු කෙරේ.

EASA 147 පුහුණුවක් ලද, මනා සුදුසුකම් සහ කැපවීමක් සහිත ඉංජිනේරු සේවකයින් 800 කට අධික කණ්ඩායමකින් සැදුම්ලත් ශ්‍රීලංකන් ඉංජිනේරු අංශය අති නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් සිය සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යයි. කලාපය තුළ පුළුල් වශයෙන් ගුවන් යානා නඩත්තු සේවා සැපයීම සම්බන්ධයෙන් ශ්‍රීලංකන් ඉංජිනේරු අංශය විසින් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය (CAASL) යුරෝපීය ගුවන් සේවා ආරක්ෂණ ඒජන්සිය (EASA) සහ තවත් ජාතික ගුවන් සේවා අධිකාරීන් (NAAs) අතර ඉහළ පිළිගැනීමක් අත් කරගෙන ඇත.

### *කාර්යසාධනය*

මේ දක්වා ශ්‍රීලංකන් ගුවන් සමාගමේ මූලික ඉංජිනේරු සහ නඩත්තු කටයුතුවල නියැලෙමින් සිටි ශ්‍රීලංකන් ඉංජිනේරු අංශය, මෙම මූල්‍ය වර්ෂය තුළදී ලොව පුරා පුළුල් පාරිභෝගික පදනමක් සඳහා පූර්ණ MRO සේවා සැපයීම දක්වා සිය සේවාවන් වර්ධනය කරන ලදී. මෙමඟින් කලාපයේ කුඩා හා මධ්‍යම පරිමාණ පාරිභෝගිකයින් හරහා වඩා හොඳ අවස්ථාවන් නිර්මාණය කර ගැනීමට හැකි වූ අතර තුන්වන පාර්ශ්ව මෙහෙයුම්වලින් ලද වසර අවසාන ලාභය ඇ.ඩො මිලියන 1.87 ක් විය.

මෙහෙයුම් කාර්යසාධනය සලකා බැලීමේදී, A320 සහ A330 ගුවන් කාණ්ඩ මඟින් මගී ගෙනයාමේ විශ්වසනීයත්වය 98.5 ක සාමාන්‍ය මට්ටමක පවත්වා ගෙන යන ලදී.

### *ප්‍රධාන උපාය මාර්ග*

සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ, ශ්‍රීලංකන් ඉංජිනේරු අංශයෙහි ප්‍රධාන අරමුණ වූයේ ව්‍යාපාර වර්ධනය සඳහා නව අවස්ථා උපයෝගී කර ගැනීම, තෙවන පාර්ශ්වීය නඩත්තු කටයුතු නව පාරිභෝගික ගුවන් සේවයක් දක්වා පුළුල් කිරීමයි.  එබැවින්, ශ්‍රීලංකන් ඉංජිනේරු අංශයේ මූලික නඩත්තු අංශය විසින් මැදපෙරදිග, දකුණු ආසියාව සහ අග්නිදිග ආසියාවේ කලාප තුළ කුඩා හා මධ්‍යම පරිමාණ පාරිභෝගික ප්‍රජාවන් ග්‍රහණය කර ගැනීම කෙරෙහි අවධානය යොමු කර ඇත. සමීපතම භූගෝලීය කලාප තුළ සිය පැවැත්ම සහ සන්නාමය වැඩි දියුණු කිරීම සහ යාත්‍රාංගණයන්හි පවතින ඉඩකඩ වඩා නම්‍යශීලී අයුරින් ප්‍රයෝජනයට ගැනීමට ශ්‍රීලංකන් ඉංජිනේරු අංශය හට ඉඩ සැලසීම මෙහිදී අපේක්ෂා කෙරේ.

දිගු කාලීනව, මූලික රේඛීය නඩත්තු නිෂ්පාදන කාණ්ඩ වැඩි දියුණු කිරීම, අප විසින් සපයනු ලබන එන්ජින් වර්ගවල හැකියාවන් ඉහළ නැංවීම සහ බෝයින් 737 කාණ්ඩයේ මූලික නඩත්තු කිරීමේ හැකියාවන් ලබා ගැනීම මඟින් ශ්‍රීලංකන් ඉංජිනේරු අංශය විසින් සිය ධාරිතාව වැඩි කිරීම දිගටම කරගෙන යනු ඇත. රේඛීය නඩත්තුව සම්බන්ධයෙන් ගත් කළ, ශ්‍රීලංකන් ඉංජිනේරු අංශය විසින් ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ සිය වෙළඳපළ කොටස් සහ පාරිභෝගික පදනම පවත්වාගෙන යාම සහ වර්ධනය කිරීම දිගටම කරගෙන යනු ඇත.



# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.

*විශේෂ කඩඉම්*

මූල්‍ය වර්ෂය තුළ ළඟා වූ ප්‍රධාන සන්ධිස්ථානයන් ලෙස, ශ්‍රීලංකන් ඉංජිනේරු අංශය විසින් සෙරීන් එයාර් (Serene Air) සමග සුවිශේෂී මූලික නඩත්තු ගිවිසුමක් අත්සන් කිරීමත් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි ගුවන් යානා සහ එන්ජින් වර්ග සංයෝග යක් (GE CF6 එන්ජින් සහිත Airbus A330) සඳහා පළමු C ශණයේ පරීක්ෂාවක් සඳහා ගිවිසුමක් අත්සන් කිරීමයි. මූල්‍ය වර්ෂය තුළදී එයාර් සියල් (Air Sial) සමග SLE සිය පළමු ජාත්‍යන්තර සංරචක නඩත්තු ගිවිසුම අත්සන් කළේය.

තවද, ශ්‍රීලංකන් ඉංජිනේරු අංශයෙහි තෙවන පාර්ශ්වීය ගුවන් යානා නඩත්තු කිරීම, අලුත්වැඩියා සහ පිරිවැඩියා කිරීමේ (MRO) හැකියාවන් ප්‍රදර්ශනය කරමින්ද වත්මන් සහ අනාගත ගනුදෙනුකරුවන් වෙනුවෙන් එම නඩත්තු සේවාවන්ට අදාළ තොරතුරු සහ භූමිය වෙන්කරවා ගැනීම සඳහා පහසු ප්‍රවේශයක් සලසමින්ද ශ්‍රීලංකන් ඉංජිනේරු තොරතුරු තාක්ෂණ අංශය සමග එක්ව වෙබ් අඩවිය (srilankanengineering.com) නිර්මාණය කර දියත් කරන ලදී. මීට අමතරව, සංවර්ධනය සඳහා නව ගනුදෙනුකරුවන් සහ ව්‍යාපාරික අවස්ථා හඳුනා ගැනීම, සම්බන්ධතා ජාලයක් ඇති කිරීම සහ ගනුදෙනුකරුවන් අත්පත් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා ව්‍යාපාර සංවර්ධන කණ්ඩායමක් පිහිටුවන ලදී.

*ඉදිරි දැක්ම*

ඉදිරි ගමන් මග තුළ, ශ්‍රීලංකන් ඉංජිනේරු අංශය විසින් සැලසුම් කර ඇති සියලුම ගුවන් යානා නැවත බෙදා හැරීම්, ගුවන් යානා අත්කර ගැනීම් සහ ශ්‍රී ලංකන් ගුවන් යානා ඇණියේ විශාල නඩත්තු කටයුතු සාර්ථකව නිම කිරීම ආදියට ප්‍රමුඛත්වය දෙනු ඇත. එබැවින් ඉදිරි මූල්‍ය වර්ෂය තුළ, ගුවන් යානා නැවත බෙදාහැරීම්, ගුවන් යානා අත්කර ගැනීම්, එන්ජින් වෙනස් කිරීම්, සහ සැලසුම් කළ විශාල නඩත්තු කටයුතු සොයා බැලීම් සමඟින් ශ්‍රීලංකන් ගුවන් යානා ඇණියේ විශාල වශයෙන් සිදු කරන නඩත්තු ක්‍රියාකාරකම් සඳහා නඩත්තු ස්ථාන සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගන්නා බැවින් අනෙකුත් ගුවන් යානා හි මූලික නඩත්තුවෙන් ලැබෙන ආදායම සම්බන්ධයෙන් එය අභියෝගාත්මක වසරක් වනු ඇත. එසේ වුවද, ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ නව ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම් අත්සන් කිරීම මඟින් රේඛීය නඩත්තු ආදායමේ වැඩි වීමක් සිදුවනු ඇතැයි අපි විශ්වාස කරන්නෙමු. එමෙන්ම නව ජාත්‍යන්තර පාර්භෝගිකයින් සමඟ අත්සන් කළ ගිවිසුම් මඟින් සංරචක නඩත්තු ආදායමද ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය (SLAC)

*දළ විශ්ලේෂණය*

දශක තුනකට අධික කාලයක් පුරාවට ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලව ගුවන් සේවා පුහුණුව සපයමින් විශිෂ්ටත්වයක් ලබා ඇති ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යාතනය (SLAC) ශ්‍රීලංකන් ගුවන් සමාගමේ ගෞරවනීය පුහුණු අංශය වන අතර, එමගින් අප දේශයේ මෙන්ම අප කලාපයේ අවශ්‍යතා සපුරාලීම සඳහා විවිධ පුහුණුවීම් රැසක් සිදු කරනු ලැබේ. ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය යනු බහුවිධ ජාත්‍යන්තර පිළිගැනීම සහ සිවිල් ගුවන් සේවා අනුමැතිය හිමි ශ්‍රී ලංකාවේ එකම ආයතනය වන අතර අග්නිදිග ආසියාව පුරා කීර්තිමත් ප්‍රතීතනයන් රැසකට හිමිකම් කියන විද්‍යායතන කිහිපය අතරටද එක් වී ඇති ආයතනයකි. ලෝ ප්‍රකට පුහුණු විද්‍යායතන සමඟ සහයෝගයෙන් කටයුතු කරමින්, අප විද්‍යායතනය මඟින් ආධුනික සිසුන්ට මෙන්ම පළපුරුදු වෘත්තිකයින්ටද අත්දැකීම් ලබා ගත හැකි වන පරිදි පුළුල් පරාසයක ගුවන් සේවා සහ ආයතනික පුහුණු අවස්ථාවන් සපයනු ලැබේ.

ගුවන් සේවා ආරක්ෂණ නියෝජිතායතනය (EASA), ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සමාගම (IATA), ප්‍රමිතිකරණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (ISO), ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය, පකිස්ථාන සිවිල් ගුවන්සේවා අධිකාරිය සහ මාලදිවයින් සිවිල් ගුවන්සේවා අධිකාරිය ඇතුළු කීර්තිමත් ආයතන රැසක පිළිගැනීම ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය වෙත ලැබී තිබේ. එසේම එය රාජකීය ගගන නාවික සමාජයෙහි (RAES) සහ යුරෝපා ගුවන්සේවා නඩත්තු පුහුණු කමිටුවෙහි (EAMTC) සාමාජිකයෙක්ද වෙයි.

*කාර්යසාධනය*

ජාත්‍යන්තර වශයෙන් සිසුන් ආකර්ෂණය කර ගනිමින් රටේ විදේශ විනිමය ඉපැයීමට දායක වීම සඳහා ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලදී. පසුගිය මූල්‍ය වසර හතර තුළ, කර්මාන්තයේ උච්චාවචනයන්ට අභියෝග කරමින් ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 3 ක ප්‍රශංසනීය ආදායමක් උපයා ගැනීම සඳහා විද්‍යාතනය දායක වී ඇත. දේශීය සිසුන්ට ජාත්‍යන්තරව පිළිගත් ගුවන් සේවා සුදුසුකමක් ලබා ගැනීම සඳහා ප්‍රවේශයක් ලබා දීම මඟින් විදේශ මුදල් රටින් පිටතට ගලායාම අවම කිරීමටද විද්‍යායතනය මඟින් ලබාදුන් දායකත්වය ඉමහත්ය.

*විශේෂ කඩඉම්*

ඉහළ පෙළේ ගුවන් සේවා පුහුණු අවස්ථාවන් ලබා දීමේ පුරෝගාමියෙකු ලෙස නැගී එමින්, ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය විසින් සුවිශේෂී ශාස්ත්‍රීය සහ කර්මාන්ත සහයෝගීතාවන් ඔස්සේ සිය ස්ථාවරය අඛණ්ඩව ශක්තිමත් කර ගනිමින් ගුවන් පුහුණු මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව දකුණු ආසියානු කලාපය තුළ ප්‍රමුඛස්ථායක පිහිටුවනු ලබයි.

ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය විසින් ජාත්‍යන්තරව ගෞරවාදරයට පාත්‍ර වූ එම්බ්‍රි- රිඩ්ල් ගගන නාවික විශ්වවිද්‍යාලය සහ ලන්ඩන් හි කින්ග්ස්ටන් විශ්වවිද්‍යාලය ඇතුළු ගුවන් සේවාව හා සම්බන්ධ සුප්‍රසිද්ධ අධ්‍යාපන ආයතන සමඟ හවුල්කාරිත්වයන් ගොඩනගා ගෙන ඇත. මෙම සහයෝගීතාවන් මඟින් ගුවන් සේවාව හා සම්බන්ධ වෘත්තිකයින් සඳහා අදාළ වන පශ්චාත් උපාධි සුදුසුකම් පිරිනැමීම වෙනුවෙන් අවැසි පහසුකම් සැපයේ. මීට අමතරව, ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය විසින් කර්මාන්තයේ දැවැන්තයින් වන බෝයින් සමූහය (Boeing Group) සහ එයාර්බස් පුහුණු පාඨමාලාව සමඟ සහයෝගීතාවක් ඇති කර ගෙන ඇති අතර, ගුවන් සේවා අංශයේ දිනෙන් දිනෙන් දින වැඩි වන ඉල්ලුමට සරිලන පරිදි ගුවන් පුහුණු වැඩසටහන් මාලාවක් පිරිනැමීමට විද්‍යායතනය කටයුතු කරයි. දේශීය වශයෙන්, ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය ගුවන් යානා නඩත්තුව පිළිබඳ විද්‍යාවේදී උපාධිය සඳහා ජෙනරල් සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සමඟ හවුල්කාරිත්වයක් ඇති කරගෙන තිබේ. SLAC, බ්‍රිතාන්‍ය ව්‍යවහාරික විද්‍යාව පිළිබඳ විද්‍යාලය (BCAS) සමඟ සහයෝගයෙන් කටයුතු කරන අතර ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයන්හි සිය සේවාවන් පුළුල් කරමින් කලාපීය වශයෙන් සිසුන්ගේ වෘත්තීය අපේක්ෂාවන් වැඩි කිරීමට පුළුල් පුහුණු වැඩසටහන් මාලාවක් පිරිනමයි.

අධ්‍යයන පාඨමාලාවන්හි ගුණාත්මකභාවයක් පවත්වා ගැනීම සඳහා ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යාතනය විසින් දරන අඛණ්ඩ කැපවීම හේතුවෙන් එකී පාඨමාලාවන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) තත්ත්වය ලබා දී ඇත. මෙමඟින් වෘත්තීය සුදුසුකම් ලබාග ැනීමට සිසුන් දිරිගැන්වීම පමණක් නොව දේශීය හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල පවතින උපාධි පාඨමාලා සඳහා පාර්ශ්වීය ප්‍රවේශයටද මග පෑදේ.

*ඉදිරි දැක්ම*

අඛණ්ඩ වර්ධනයේ සහ නවෝත්පාදනයේ මාවතක් තුළ ස්ථිරසාරව ගමන් කරන ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය, උපාධි පිරිනමන උසස් අධ්‍යාපන ආයතනයක ගෞරවනීය තත්ත්වයට පත්වීම උදෙසා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ගුවන් සේවා අමාත්‍යාංශය සමඟ මේ වන විට සාකච්ඡාවල නිරත වෙමින් සිටී. මෙකී අරමුණ ඉටුකර ගත් පසු, ජාත්‍යන්තර පිළිග ැනීමක් සහිත ගුවන් සේවා විශ්වවිද්‍යාලයක අධ්‍යාපනය ලැබීමට කලාපයේ සිසුන් හට අවස්ථාව සැලසෙනු ඇත.

විශිෂ්ටත්වය සොයා යන නොනවතින ගමනේදී, මෙම විද්‍යායතනය ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙන් අනුමත පුහුණු සංවිධානයක් (ATO) සඳහා වන සහතිකය ලබා ගැනීම සඳහා කටයුතු කරමින් සිටී. ශ්‍රී ලංකාව තුළ අනුමත පුහුණු සංවිධානයක් ලෙස නිල වශයෙන් සහතික කිරීම සඳහා අවශ්‍ය වන ගුවන් සේවා වෘත්තීය පිළිබඳ පුළුල් අධ්‍යයනයන්හි විශේෂඥභාවය ලත් ප්‍රමුඛ ආයතනය වීමට මෙම කඩයිමට ළඟා වීමෙන් ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනයට හැකි වනු ඇත.

දැනට IATA හි ප්‍රතීතනය ලත් පුහුණු මධ්‍යස්ථානයක් ලෙස බලයලත් පුහුණු මධ්‍යස්ථාන (ATC) දහය අතරින් එකක් බවට පත් වී තිබෙන ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය, IATA කලාපීය පුහුණු සහකරු (RTP) බවට පත්වෙමින් සුවිශේෂී පියවරක් තැබීමට සූදානමින් සිටී. IATA සමඟ සහයෝගීතාවයෙන් ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය ලොව හොඳම පුහුණු මධ්‍යස්ථාන තිහ අතරින් එකක් වීමේ අරමුණට ළඟා වෙමින් සිටී.

එපමණක් නොව, ප්‍රතිලාභදායක ගුවන් සේවා වෘත්තියක් අපේක්ෂා කරන සිසුන් වෙනුවෙන් ඒ සඳහා විශ්වාසයෙන් යුතුව අවතීර්ණ විය හැකි මාර්ගයක් සකස් කර දෙමින් ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය විසින් බංග්ලාදේශය සහ නේපාලය ඇතුළු රටවල සිසුන්ටද එහි අධ්‍යයන හා පුහුණු අවස්ථා ලබා ගැනීමට අවකාශය සලසමින් ගෝලීය මට්ටමින් සිය ව්‍යාප්තිය තහවුරු කරනු ඇත.

ඉදිරියේදී, ගුවන් සේවා අධ්‍යාපනයේ අනාගතය හැඩගැස්වීමත්, කුසලතා වර්ධනය කිරීමත්, දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් ගුවන් සේවා කර්මාන්තයෙහි වර්ධනයට දායක වීමත් සඳහා ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය නිරන්තරයෙන් කැපවී කටයුතු කරනු ඇත.

## සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම

*දළ විශ්ලේෂණය*

සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම (SLC), ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි පූර්ණ හිමිකාරී පරිපාලිතය යනු, ශ්‍රී ලංකාවේ එකම ගුවන් සේවා ආහාරපාන සැපයුම් සමාගම වන අතර, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වූ සීමාසහිත වගකීම් සහිත සමාග මකි. සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම හි මූලික ව්‍යාපාරික ක්‍රියාකාරකම් වනුයේ, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් මෙන්ම බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ සහ කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපළ, රත්මලාන වෙතින් ක්‍රියාත්මක වන සෙසු ජාත්‍යන්තර ගුවන් සේවා වෙනුවෙන් යානාස්ථ ආහාරපාන සැපයීමයි. එමෙන්ම සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම විසින් ආහාරපාන සැපයුම්, රෙදි සේදුම් සේවාව සහ අවන්හල් කළමනාකරණය ඇතුළත් ගුවන් සේවා විවේකාග ාර සහ අවන්හල් සඳහා සේවාවන් ගණනාවක් සපයනු ලබයි. දශක හතරකට අධික කාලයක් පුරා ලොව විශිෂ්ටතම ගුවන් සමාගම්වල මගීන් වෙනුවෙන් සතුටුදායක සේවාවක් පිරිනැමීමේ අත්දැකීම් පෙරදැරි කරගනිමින්, සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම විසින් ලොව විශිෂ්ටතම ගුවන් සේවා ආහාරපාන සපයන්නන්ට සමගාමීව කටයුතු කරමින්, සිය සියලුම ව්‍යාපාර කටයුතුවලදී පාරිභෝගිකයන් වෙනුවෙන් විශේෂඥතාවයෙන් සහ වෘත්තීයභාවයෙන් යුතු අඛණ්ඩ සේවාවක් සපයනු ලබයි. සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම, ජාත්‍යන්තර පියාසැරි ආහාර සැපයුම් සංගමයේ (IFCA) සහ ජාත්‍යන්තර යානස්ථ ආහාර සැපයුම් සේවා සංගමයේ (IFSA) ක්‍රියාකාරී සාමාජිකයෙකු වේ.

සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම විසින් සිය ව්‍යාපාර මෙහෙයුම් ස්වාභාවය සැලකිල්ලට ගනිමින්, දැඩි තත්ත්ව පාලන ක්‍රියා පටිපාටිවලට අනුකූලව සනීපාරක්ෂාව පිළිබඳ පරිපූර්ණ ප්‍රමිතීන් පවත්වා ගැනීමට සැලකිය යුතු පූර්වාරක්ෂාවන් සිදු කරන අතර, පහත ප්‍රධාන මාර්ගෝපදේශවලට අනුකූල වේ.

- ISO 9001:2015 – UKAS (එක්සත් රාජධානියේ ප්‍රතීතන සේවාව) ප්‍රතීතනය සහිත තත්ත්ව කළමනාකරණ පද්ධතිය
- ISO 22000:2018 – SAS (ස්විට්සර්ලන්තයේ ප්‍රතීතන පද්ධතිය) ප්‍රතීතනය සහිත ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය
- HACCP – උපද්‍රව විශ්ලේෂණය සහ තීරණාත්මක පාලන ස්ථාන සමඟ ආහාර සුරක්ෂිතතා සහතිකය
- ISO 14001:2015 – (ස්විට්සර්ලන්තයේ ප්‍රතීතන පද්ධතිය) ප්‍රතීතනය සහිත පාරිසරික කළමනාකරණ පද්ධතිය
- හලාල් සහතිකය - මැලේසියානු ගුවන් සේවය විසින් සහතික කොට ඇත.
- 1980 අංක 26 දරන ආහාර පනත; 1991 අංක 20 දරන ආහාර (සංශෝධන) පනත මඟින් සංශෝධිත පරිදි



# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.

*කාර්යසාධනය*

ශ්‍රීලංකන් කේටරින් විසින් පසුගිය මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 221% ක වර්ධනයක් දක්වමින් රු. මිලියන 12,543 ක පිරිවැටුමක් සමඟ වර්ෂය තුළ කැපී පෙනෙන කාර්යසාධනයක් සහතික කරන ලදී. වසංගත තත්ත්වයෙන් පසු ඇති වූ මගීන් පැමිණීමේ වර්ධනය මෙන්ම ගුවන් සමාගම් කිහිපයක් විසින් මෙහෙයුම් ආරම්භ කිරීම සහ සාර්ව ආර්ථික පරිසරය තුළ ඇති වූ වර්ධනය හේතුවෙන් සියලුම ප්‍රධාන කාර්යසාධන දර්ශක සැලකිය යුතු ලෙස වර්ධනය විය.

ශ්‍රීලංකන් කේටරින් විසින් වසර තුළදී රු. මිලියන 5,010 (2021/22 - රු. මිලියන 474) ක් ලෙස මෙහෙයුම් ලාභය වාර්තා කළ අතර, පසුගිය මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 76% ක වර්ධනයක් (රු. මිලියන 3,231) සහිත රු. මිලියන 5,701 ක බදු ගෙවීමට පෙර ශුද්ධ ලාභයක් පෙන්නුම් කරන ලදී. මේ සඳහා මූල්‍ය වර්ෂය පුරාවටම දැකගත හැකි වූ ඇ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් ඇති වූ රු. මිලියන 706 ක (2021/22 - රු. මිලියන 2,823) විනිමය ලාභය ද ඇතුළත් වේ.

බදු අය කළ හැකි ආදායමේ වර්ධනය හේතුවෙන්, ශ්‍රීලංකන් කේටරින් හි ආදායම් බදු වියදම් පසුගිය වසරට සාපේක්ෂව 134% කින් (රු. මිලියන 429) වර්ධනය විය.

**මූල්‍ය කාර්යසාධනය**




*මූලික උපායමාර්ග*

සමාලෝචිත වර්ෂය තුළ, ශ්‍රීලංකන් කේටරින් විසින් දැනට පවතින ව්‍යාපාරික ඒකක හරහා ආදායම් උත්පාදන මාර්ග සක්‍රියව පරීක්ෂාවට ලක් කළ අතර, සිංගප්පූරු ගුවන් සේවය, ෆ්ලයි ඩුබායි සහ රෙඩ් වින්ග්ස් වැනි ප්‍රමුඛ පෙළේ ගුවන් සමාගම් සමඟ නව ගිවිසුම් ඇති කර ගැනීමට සමත් විය. ශ්‍රීලංකන් කේටරින් විසින් සිය සුවිශාල නිෂ්පාදන සහ මෙහෙයුම් ශක්‍යතාවයන් උපයෝගී කර ගනිමින් පරිභෝජනයට සූදානම් කළ ආහාර අංශය, Cuisine Gastronome දේශීය මෙන්ම අපනයන වෙළෙඳපොළ වෙත ව්‍යාප්ත කරන ලදී. නුදුරු කාලීනව අපනයන සහ දේශීය වෙළෙඳපොළ තවදුරටත් පුළුල් කිරීමේ අරමුණ ඇතිව, දැනට ශ්‍රීලංකන් කේටරින් විසින් මෙම ආහාර වර්ග ඕස්ට්‍රේලියාව, ඇමරිකා එක්සත් ජනපදය සහ කැනඩාව වෙත අපනයනය කරනු ලබයි.

එමෙන්ම ශ්‍රීලංකන් කේටරින් විසින් පිරිවැය කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා සම්පත් ප්‍රශස්තකරණය කෙරෙහි අවධානය යොමු කරමින් මෙහෙයුම් පිරිවැය කළමනාකරණය කිරීමට නිරන්තරයෙන් කටයුතු කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රීලංකන් කේටරින් විසින් සේවක කාර්ය මණ්ඩලය ප්‍රශස්ත මට්ටමෙන් පවත්වා ගෙන ගිය අතර, අඩු වූ මෙහෙයුම් මට්ටමට සමානුපාතිකව අනෙකුත් සෘජු මෙහෙයුම් වියදම් අඩු කරන ලදී. එමෙන්ම, ශ්‍රීලංකන් කේටරින් විසින් ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සහ පිරිවැය කළමනාකරණ මුලපිරීම් වර්ධනය කරලීමට තීරණාත්මක සහ හදිසි ප්‍රාග්ධන අවශ්‍යතා කෙරෙහි පමණක් අවධානය යොමු කරමින් ප්‍රධාන ප්‍රාග්ධන වියදම් ව්‍යාපෘති අත්හිටුවන ලදී.

*මූලික සුවිශේෂතා*

මෙම මූල්‍ය වර්ෂය තුළ සිදුවූ සුවිශේෂී සංධිස්ථානයක් ලෙස ගුවන්යානා මුළුතැන්ගෙයි සහ අවන්හල් අංශවල ක්‍රියාකාරිත්වය වර්ධනය වීම හේතුවෙන් පෙර මූල්‍ය වර්ෂයට සාපේක්ෂව ආදායමේ සැලකිය යුතු වර්ධනයක් ඇති වීම දැක්විය හැකිය.

මෙකී වර්ධනයේ ප්‍රධාන හේතුව ලෙස පෙර වසරට සාපේක්ෂව යානස්ථ ආහාරපාන සැපයුම් හි ආදායම 221%කින් (රු. මිලියන 6,701) සහ බ.ජා.ගු අවන්හලෙහි ආදායම 193%කින් (රු. මිලියන 932) වර්ධනය වීමක් දැක්විය හැකිය.

පසුගිය මූල්‍ය වර්ෂයේ නිෂ්පාදිත ආහාර වේල් ප්‍රමාණය වන මිලියන 2.2 ට සාපේක්ෂව, වර්ෂයකට ආහාර වේල් මිලියන 4.5 ක් සකස් කරමින් යානස්ථ මුළුතැන්ගෙයි නිෂ්පාදනය කරන ලද ආහාර ප්‍රමාණය හි 106% ක සැලකිය යුතු වර්ධනයක් වසර තුළදී දැකගත හැකි විය. යානස්ථ කේටරින් හි ප්‍රධාන පාරිභෝගිකයා වන ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් යානස්ථ කේටරින් හි මුළු පිරිවැටුමෙන් 73%කට දායකත්වය දැක්වූ අතර, වර්ෂය තුළ නිෂ්පාදනය කරන ලද මුළු ආහාර වේල් සංඛ්‍යාවෙන් 82%ක් භාවිත කළේය.

පෙර මූල්‍ය වර්ෂයට (2021/22 - රු. මිලියන 483) සාපේක්ෂව රු. මිලියන 1,416 ක් දක්වා 193% කින් ආදායමක් ඉහළ නංවමින් බ.ජා.ගු ගුවන්තොටුපළ අවන්හල (පොදු සහ සංක්‍රමණ) මඟින් සමාගමේ මුළු ආදායමට 11% ක් දායකත්වයක් දක්වන ලදී. එමෙන්ම, අනෙකුත් අනුබද්ධ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල පිරිවැටුම රුපියල් මිලියන 1,397 ක් (2021/22 - රු. මිලියන 390) දක්වා 258% කින් වර්ධනය විය.

*ඉදිරි සැලසුම්*

සාර්ව ආර්ථික පසුබිම සංචාරක කර්මාන්තයට වඩාත් හිතකර වීමත්, ගුවන් ගමන් හි වර්ධනයක් අත්විඳින හෙයින් සමාගමේ ඉදිරි දැක්ම ශුභවාදී තත්ත්වයක පවතී. මෙම වර්ධනයන් උපයෝගී කරගනිමින්, වසංගත තත්ත්වය හේතුවෙන් අත්හිටුවන ලද ආහාර සැපයීම් සේවය නැවත ආරම්භ කිරීම සඳහා ශ්‍රීලංකන් කේටරින් විසින් මේ වන විට අනෙකුත් ගුවන් සමාගම් සමඟ සාකච්ඡා සිදු කරමින් පවතී. ඊට සමගාමීව, ශ්‍රීලංකන් කේටරින් විසින් වඩා හොඳ මෙහෙයුම් සහයෝගීතාවයක් උදෙසා සිය තොරතුරු තාක්ෂණ පද්ධති ප්‍රතිසංස්කරණය කිරීමට අමතරව, එහි ක්‍රියාවලීන්හි ගුණාත්මකභාවය, කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීමේ අරමුණින් සිය සැපයුම්කරුවන්ගේ පදනම පුළුල් කිරීමට කටයුතු කරනු ලබයි.

# ආයතනික පාලන වාර්තාව

සමාගමේ කාර්යසාධනයේ තිරසාරත්වය උදෙසා මනා ආයතනික පාලනයක් අත්‍යවශ්‍ය වන බවත්, කළමනාකාරීත්වයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය මූලික වන හෙයින් රජය සතු ව්‍යාපාරයන්හි යහපාලන භාවිතයන් ක්‍රියාවට නැංවීම අත්‍යවශ්‍ය බවත්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරීත්වය විසින් විශ්වාස කරනු ලබයි.

යුතුකම්, වගකීම, විනිවිදභාවය සහ වගවීම යන අංශයන්හි හිතකර සමතුලිතතාව වැඩිදියුණු කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ආයතනික පාලන මූලධර්ම සහ භාවිතයන්හි ප්‍රමිතීන් අඛණ්ඩව ඉහළ නැංවීමට සමාගම කැපවී සිටී.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස්, සිය ආයතනික පාලනයේ කොටසක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද පහත සඳහන් නීති සම්පාදන, කේත සහ ස්වේච්ඡා ප්‍රතිපත්ති රාමුවලට අනුකූල වේ.

- 2007 අංක 7 දරන සමාගම් පනත
- සමාගමේ සාංගමික ලේඛන
- 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ යටතේ නිකුත් කරන ලද, රජය සතු ව්‍යාපාරයන් සඳහා ආයතනික පාලනය සහ මෙහෙයුම් සංග්‍රහය පිළිබඳ මාර්ගෝපදේශ
- අභ්‍යන්තර සමාගම් නීති සහ ක්‍රියාවලි සහ කර්මාන්තයේ විශේෂිත නීති සහ රෙගුලාසි

## අධ්‍යක්ෂ මණ්ඩලය

### *මණ්ඩලයේ සංයුතිය*

සමාගමේ සාංගමික ලේඛනයන් ප්‍රකාරව, සමාගමේ කොටස්වලින් සියයට 50 කට වඩා වැඩි ප්‍රමාණයක් රජය සතු වන තාක්, භාණ්ඩාගාර ලේකම්තුමා හරහා ක්‍රියාකරනු ලබන, ශ්‍රී ලංකා රජය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරනු ලබයි. රජය සතු ව්‍යාපාර සාර්ථක ව්‍යාපාර බවට පත් කිරීමට හැකියාව ඇති සුදුසුකම් ලත්, දක්ෂ පුද්ගලයින්ගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත බව තහවුරු කිරීම සඳහා තේරීම් කමිටුවක් හරහා රජය විසින් අධ්‍යක්ෂවරුන් මණ්ඩලයට පත් කරනු ලබයි. ව්‍යාපාරයන්හි පොදු අයිතිය රජයට පැවරී ඇති බැවින්, අධ්‍යක්ෂ මණ්ඩලය සෘජුවම රජයට වගකියනු ලබයි.

### අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය

සමාගමේ පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් සහය වීමට අධ්‍යක්ෂ මණ්ඩලය උපායමාර්ගික මගපෙන්වීමක් සපයන අතර, ජාතික ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතාවලට අනුකූල වන බව උපායමාර්ගික සැලැස්ම මඟින් තහවුරු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමතුලිතතාවය සහ බලය සහ අධිකාරිය සඳහා පහසුකම් සලසනු ලබන කළමනාකරණය අතර පැහැදිලි වගකීම් බෙදීමක් සිදු කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ මූලික වගකීම් වනුයේ;

- විශේෂයෙන්ම උපායමාර්ගික නියෝග ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසෙන මෙහෙයුම් තීරණ ගැනීමේදී, කළමනාකරණයට ප්‍රමාණවත් බලයක් පැවරීම තහවුරු කිරීම.
- තීරණ ගැනීම සහ වගවීම සඳහා පහසුකම් සපයන, ස්ථිර සහ විශ්වසනීය කළමනාකරණ තොරතුරු පද්ධතියක් සමාගම සතු බව තහවුරු කිරීම.
- ගිණුම්කරණ සහ මූල්‍ය වාර්තාකරණ පද්ධතිවල සම්පූර්ණත්වය සහතික කිරීම, අවදානම් කළමනාකරණ සහ මෙහෙයුම් පාලනය වැනි පාලන පද්ධති, නීති, රෙගුලාසි සහ අදාළ ප්‍රමිතීන්ට අනුකූල වීම තහවුරු කිරීම.
- මෙහෙයුම්, පරිපාලන සහ මූල්‍ය ක්‍රියාවලි ඇතුළු ප්‍රධාන ක්‍රියාවලි සහ ක්‍රියා පටිපාටි නිසි ලෙස ලේඛනගත කර ඇති බවට සහ කාලානුරූපීව යාවත්කාලීන කරන බවට තහවුරු කිරීම.
- සමාගමේ වෙබ් අඩවිය හරහා කිසිදු ව්‍යවස්ථාපිත හෝ මෙහෙයුම් අවශ්‍යතාවකට හානියක් නොවන පරිදි, මූල්‍ය සහ මූල්‍ය නොවන ආකාරයේ උපරිම තොරතුරු එහි පාර්ශ්වකරුවන්ට හෙළිදරව් කිරීම තහවුරු කිරීම.

අධ්‍යක්ෂවරුන්ට සිය වගකීම් ඉටු කිරීමට, කාලීන සහ නිරවද්‍ය තොරතුරු සැපයීම සඳහා පහත දැක්වෙන ක්‍රියාදාමයන් ක්‍රියාත්මක කරනු ලබයි.

- සියලුම අධ්‍යක්ෂවරුන් සඳහා නිරවද්‍ය, අදාළ, කාලෝචිත, පැහැදිලි සහ සමබර තොරතුරු ලැබේ.
- කමිටු, අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂවරුන් සහ අනෙකුත් ප්‍රධාන කළමනාකාරීත්වය අතර තොරතුරු ලබා දීම සඳහා සමාගම් ලේකම්තුමිය සම්බන්ධක ලෙස කටයුතු කරනු ලබයි.
- ප්‍රධාන විධායක නිලධාරීතුමා ඇතුළු අදාළ අංශ ප්‍රධානීන් විසින් ඔවුන්ගේ ඉදිරිපත් කිරීම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉල්ලා සිටින අවශ්‍ය පැහැදිලි කිරීම් ලබා දෙනු ලබයි.
- ඊට අමතරව, සමාගමේ තිරසාර මුලපිරීම්වලට අනුකූලව, සියලුම අධ්‍යක්ෂ මණ්ඩල ලිපි ලේඛන, විද්‍යුත් ලේඛන ලෙස ලබා ගත හැකිය.

අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාකාරකම් සඳහා සවිමත් තොරතුරු තාක්ෂණයෙන් සහය ලබා ගන්නා අතර, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට ආරක්ෂිත සම්බන්ධතාවයක් හරහා ඔවුන්ගේ අධ්‍යක්ෂ මණ්ඩල ලිපි ලේඛන වෙත ප්‍රවේශ වීමට සහ දුරස්ථ රැස්වීම් සඳහා සහභාගී වීමට හැකියාව ලබා දෙනු ලබයි.

### අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වෙත බලය පැවරීම

මනා පාලනයක් සහ හොඳම භාවිතයන් සපුරාලීම සඳහා එයාර්ලයින්ස් විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු පිහිටුවා ඇත. පවරන ලද කමිටු වෙත තම විශේෂඥතාවය සහ පළපුරුද්ද ලබා දිය හැකි අධ්‍යක්ෂවරුන්ගෙන් මෙම කමිටු සමන්විත වේ. වගකීම්, යොමු කිරීමේ අනුදේශයන්හි විධිමත්ව දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු ලේකම්තුමා, සමාගම් ලේකම්තුමිය වේ.

යොමු කිරීමේ අනුදේශයන්හි නිශ්චිතව දක්වා ඇති, ඔවුන්ගේ අධිකාරිය සහ වගවීම සම්බන්ධ කරුණු සලකා බැලීමට සහ සාකච්ඡා කිරීමට කමිටු නිතිපතා රැස්වේ. ඔවුන්ගේ නිරීක්ෂණ සහ නිර්දේශ නිරන්තරයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලබයි.

### අධ්‍යක්ෂවරුන්ට වන්දි පූරණය

සමාගමේ සාංගමික ලේඛනයන්ට අනුකූලව, අධ්‍යක්ෂවරුන්ට, සමාගමේ අධ්‍යක්ෂවරුන් ලෙස ඔවුන්ගේ තනතුරු අනුව වගකීම් ඉටුකිරීම සඳහා, දරනු ලබන වගකීම් සම්බන්ධයෙන් නීතියෙන් අවසර දී ඇති ප්‍රමාණයට සමාගමෙන් වන්දි පූර්ණයක්

ලබා දෙනු ලැබේ. අධ්‍යක්ෂතුමා විසින් වංචනික ලෙස හෝ වංක ලෙස ක්‍රියා කර ඇති බව ඔප්පු වුවහොත්, වන්දිය මඟින් කිසිදු ආවරණයක් සපයන්නේ නැත. සමාගම වසර පුරාවට අධ්‍යක්ෂවරුන්ගේ සහ නිලධාරීන්ගේ වගකීම් රක්ෂණ ආවරණයක් පවත්වාගෙන යනු ලැබ ඇත.

### සභාපතිතුමාගේ සහ ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ කාර්යභාරය

උපායමාර්ගික සහ මෙහෙයුම් කරුණු අතර වෙනස, සභාපතිතුමාගේ සහ ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ වගකීම් බෙදීම අනුව පැහැදිලිව දක්වයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිතුමා, විධායක නොවන පත්වීමක් වන අතර, උපායමාර්ගික ගැටලු කෙරෙහි අවධානය යොමු කිරීම, ව්‍යාපාර සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම අධීක්ෂණය සිදු කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියා පටිපාටි අනුගමනය කිරීම සහ සියලුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් රැස්වීම් සඳහා එලදායී ලෙස සහභාගී වීම ඔහු විසින් තහවුරු කරනු ලබයි.

එදිනෙදා ව්‍යාපාර කළමනාකරණය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායමේ නායකත්වය සහ සමූහයේ උපායමාර්ගික සහ මෙහෙයුම් සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන විධායක නිලධාරිතුමා වගකීමෙන් බැඳේ. සමාගමේ කාර්යසාධනය, මෙහෙයුම් කටයුතු සහ මානව සම්පත් සම්බන්ධ ඕනෑම ගැටලුවක් සාකච්ඡා කිරීමට සභාපතිතුමා සහ ප්‍රධාන විධායක නිලධාරිතුමා නිරන්තරයෙන් රැස් වනු ලබයි.

### අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණය

දැනට පවතින අභ්‍යන්තර පාලන රාමුව සකසා ඇත්තේ, අවදානම් කළමනාකරණ රාමුව, මූල්‍ය පාලනය, අභ්‍යන්තර විගණනය සහ ආධාරක ප්‍රතිපත්ති මගිනි. සමාගමේ අභ්‍යන්තර පාලන රාමුවේ පරමාර්ථය වනුයේ, මෙහෙයුම්හි එලදායීත්වය සහ උපායමාර්ගික ඉලක්ක සමඟ මනාව ගැළපීම සහතික කිරීමයි. අභ්‍යන්තර පාලන රාමුව මඟින් නිවැරදි, විශ්වසනීය, සම්පූර්ණ සහ කාලෝචිත මූල්‍ය වාර්තාකරණය සහ කළමනාකරණ තොරතුරු සහතික කිරීමට අදහස් කරනු ලබයි. මෙම රාමුව මඟින් සදාචාරාත්මක වටිනාකම්, යහපත් ආයතනික පාලනය සහ අවදානම් කළමනාකරණ භාවිතයන් අනුමත කරනු ලබයි.

### ව්‍යවස්ථාපිත අනුකූලතාවය

අධ්‍යක්ෂකවරුන්, ඔවුන්ගේ පරම දැනුම සහ විශ්වාසය අනුව, එයාර්ලයින්ස් සේවකයන්ට අදාළ ගෙවීම් නිසි කලට සිදු කරනු ලැබ ඇති බවට සෑහීමකට පත් වේ.

# ආයතනික අවදානම් කළමනාකරණය

ශ්‍රීලංකන් එයාර්ලයින්ස්, සිය ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා එදිනෙදා මෙහෙයුම් කටයුතුවල අවදානම් කළමනාකරණය වැදගත් කොට සලකනු ලබයි. එබැවින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් සියලු ව්‍යාපාර අංශ ඇතුළත් අවදානම් කළමනාකරණ රාමුවක් ස්ථාපිත කොට ඇත. සමාගමට බලපෑම් ඇති කළ හැකි අවදානම් කල් තියා හඳුනාගැනීම, ඒවායේ ප්‍රතිවිපාක තක්සේරු කිරීම, සහ එහි මෙහෙයුම්වල අවදානම් අවම කිරීමට ක්‍රමවේද සකස් කිරීම මේ හරහා කරනු ලබයි.

අවදානම් කළමනාකරණ සම්මතයන් සහ කර්මාන්තයේ අවශ්‍යතාවයන් අනුව ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපිත කොට ඇති අතර, එය අධ්‍යක්ෂ මණ්ඩලය මණ්ඩලය විසින් අනුමත කොට ඇත.

## අවදානම් පාලනය

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි අවදානම් අධීක්ෂණය මෙන්ම, සමාගමේ අවදානම් කළමනාකරණ රාමුව අනුමත කිරීම සඳහා ද අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ. ව්‍යාපාර අවදානම් හඳුනාගැනීම, ඇගයීම සහ කළමනාකරණය සඳහා කළමනාකරණ මට්ටමෙන් පිහිටුවා ඇති ක්‍රියාපටිපාටි පරීක්ෂා කරමින්, විගණක කමිටුව විසින් අධීක්ෂණ වගකීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහය ලබා දේ.

ප්‍රධාන විධායක නිලධාරියා විසින් අවදානම් කළමනාකරණය සඳහා උපායමාර්ගික උපදේශන ලබා දෙන අතර, අවදානම් පිළිබඳ මනාව සොයා බැලීම සහ අවදානම් මූලධර්ම යෙදවීම සම්බන්ධයෙන් ආයතනය තුළ තීරණ ගැනීම සහතික කරනු ලබයි.

ජ්‍යේෂ්ඨ කළමනාකරණ කමිටුව මඟින් ව්‍යාපාර ඒකකවල අදාළ අවදානම් පිළිබඳ විස්තර විශ්ලේෂණය කිරීම සහ මෙම අවදානම් ඵලදායීව කළමනාකරණය කිරීම සඳහා උපායමාර්ග සකස් කිරීම සිදු කරනු ලබයි. දෙපාර්තමේන්තු/ අංශ කළමනාකරුවන් විසින් ඔවුන් වගකියනු ලබන ක්ෂේත්‍රයේ අවදානම් හඳුනා ගැනීමේ සහ ඒවා කළමනාකරණයට ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේ වගකීම් දරයි.

## අවදානම් පාලන රාමුව




මූල්‍ය වර්ෂය නිමාවෙන් පසුව, රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයන්ට අනුකූලව, මෙහෙයුම් අවදානම් වල බලපෑම සොයා බැලීමට මෙන්ම ඕනෑම අහිතකර බලපෑමක් අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට සමූහ අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කමිටුව පිහිටුවන ලදී.

## අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

අවදානම් හඳුනාගැනීම, අවදානම් විශ්ලේෂණය, අවදානම් නිරාකරණය සහ අවදානම් වාර්තාකරණය සහ අධීක්ෂණය ආදි කටයුතු වලින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සමන්විත වේ.

අවදානම් හඳුනාගැනීම, තක්සේරුකරණය, කළමනාකරණය සහ වාර්තාකරණය පිළිබඳ වගකීම ව්‍යාපාර ඒකක වෙත පැවරේ. හඳුනාගත් අවදානම්, සිදු විය හැකි සම්භාවිතාව සහ එවායේ බලපෑම මත පදනම්ව විශ්ලේෂණය කරනු ලබන අතර, අවදානම් ලකුණු අනුව සැලකිය යුතු, ඉහළ, මධ්‍යස්ථ හෝ අවම ලෙස වර්ගීකරණය කරනු ලබයි.

අවදානම් වර්ගීකරණය සහ අවදානම් ලකුණු පදනම් කරගනිමින් ක්‍රියාකාරී සැලසුම් ගණනය කරනු ලබයි. ප්‍රධාන විධායක නිළධාරී/අදාළ ජ්‍යේෂ්ඨ කළමනාකරණ කමිටු සාමාජිකයින් විසින් සැලකිය යුතු අවදානම් විසඳීමට ගෙන ඇති ක්‍රියාමාර්ග සමාලෝචනය කරයි.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් අවදානම් වාර්තා පිළිබඳ දත්ත ගබඩා කිරීමේ පද්ධතියක් පවත්වා ගෙන යන අතර, සමූහ තහවුරුකරණය සහ උපදේශන සේවා අංශයේ මඟ පෙන්වීම යටතේ ව්‍යාපාරික ඒකක හි වගකිව යුත්තන් විසින් ඒවා නිතිපතා සමාලෝචනය කර යාවත්කාලීන කරනු ලබයි.

## අවදානම් වපසරිය

වෙනස්වීමට භාජනයවන ව්‍යාපාර පසුබිමක් තුළ කටයුතු කරනු ලබන ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් 2022/23 මූල්‍ය වර්ෂය පුරා විවිධාකාර අවදානම්වලට මුහුණ දෙනු ලැබීය. ගෝලීය ගුවන් සේවා කර්මාන්තයේ සාර්ව ආර්ථික සාධක සහ ශ්‍රී ලංකාවේ ආර්ථික හා දේශපාලන අස්ථාවරත්වය මඟින් ගුවන් සේවයට බලපෑම් ඇති විය. විශේෂයෙන්ම, ඉහළ ඉන්ධන පිරිවැය, ගුවන් සේවා සැපයුම් දාමයේ අවහිරතා සහ පරිපූර්ණ ජාල මෙහෙයුම් වෙත සහය වීම සඳහා ගුවන් යානා ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඇති වූ ධාරිතා සීමාවන් වැනි ගැටලු වලට ගුවන් සමාගම විසින් මුහුණ දෙන ලදී.

තවද, ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදයේ හේතුවෙන් සමාජ සහ දේශපාලන නොසන්සුන්තාවයන් ඇති වූ අතර, මේ හේතුවෙන් රට තුළට පැමිණෙන සංචාරකයින්ගේ අඩුවක් දැක ගත හැකි වූ අතර, ජාත්‍යන්තර සංචාරක උපදේශන මඟින් ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට එරෙහිව දැනුවත් කිරීම් සිදු කරන ලදී. ඊට අමතරව ආර්ථික අර්බුධයේ ප්‍රතිඵලයක් ලෙස කොළඹ නගරයේ ජෙට් ඉන්ධන හිඟයක් ඇති වීම හේතුවෙන් ඉන්ධන අතිරික්තයන්ගේ අවශ්‍යතාවයක් ඇති විය. ඒ අනුව ගුවන් ගමන් කාලසටහන් සඳහා බාධා ඇති විය. එසේම ගෝලීය වශයෙන් පුහුණු සේවකයින් සඳහා ඉල්ලුම වැඩි වීමත්, පුද්ගලයින් වෙනත් රටවල් වෙත සංක්‍රමණය කිරීම ඉහළ යාම හේතුවෙන්, පුහුණු ශ්‍රම බලකාය විශේෂයෙන්ම ගුවන් සේවා සහ වෘත්තීය කාණ්ඩවල පිරිස් රඳවා ගැනීම, ආකර්ෂණය කරගැනීම සම්බන්ධයෙන් ගුවන් සමාගම සැලකිය යුතු ලෙස බලපෑමට ලක්වන ලදී.






අභියෝගයන්හි ශක්තිමත්ව...
අපගේ ඉලක්ක වෙත අරමුණු පෙරදැරිව...
අනාගතය වෙනුවෙන් ධනාත්මක ආකල්පයකින් යුතුව

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

2023 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා වාර්ෂික වාර්තාව සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉතා සතුටින් ඉදිරිපත් කර සිටී.

**මූලික ක්‍රියාකාරකම් සහ ව්‍යාපාරික කටයුතු සමාලෝචනය**

ශ්‍රී ලංකාවේ නිල ගුවන් සේවය වශයෙන් සමාගමේ මූලික ක්‍රියාකාරකම් වනුයේ, මගී ප්‍රවාහනය, භාණ්ඩ හා තැපැල් ප්‍රවාහනය සඳහා කාර්ය සටහන් සහිතව සහ රහිතව ජාත්‍යන්තර ගුවන් සේවා මෙහෙයුම් සම්පාදනයයි. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ ("BIA") සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ ("MRIA") හරහා ගුවන් පර්යන්ත සේවාවන් සැපයීම, ගුවන් මගීන් වෙත තීරු බදු රහිත භාණ්ඩ අලෙවි කිරීම, අභ්‍යන්තර සහ බාහිර නිවාඩු ගත කිරීමේ සැලසුම් අලෙවි කිරීම සමාග මෙහි අනෙකුත් ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. තෙවන පාර්ශ්ව ගුවන්යානා නඩත්තු සේවා, ගුවන්යානා මෙහෙයුම් සේවා ප්‍රතිපාදනය කරමින් සමාගමේ ගුවන්සේවා ආශ්‍රිත පුහුණු පැවැත්වීම ආදිය සමාගම විසින් සිදු කරන අතිරේක ක්‍රියාකාරකම් යටතට ඇතුළත් වේ. මූල්‍ය වර්ෂය තුළ සමාග මේ ක්‍රියාකාරකම්වල ස්වාභාවයේ සැලකිය යුතු වෙනසක් දැකගත නොහැකි විය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ ("BIA") සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ ("MRIA") හරහා මෙහෙයුම් කටයුතුවල යෙදෙන ගුවන් සමාගම් සඳහා ආහාරපාන සේවා සැපයීම මූලික කාර්යය ලෙස සිදුකරනු ලබන, සමාගමෙහි සම්පූර්ණ හිමිකාරිත්වය සහිත පරිපාලිතය වන සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාග මෙන් සමූහය සමන්විත වේ. සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් හි අනෙකුත් අතිරේක සේවාවන් වනුයේ මහජන සහ සංක්‍රමණික අවන්හල් පවත්වාගෙන යාම, අධි ශීතකළ ආහාර කාණ්ඩ, ලොන්ඩරි සේවා සැපයීම සහ සංක්‍රමණික හෝටල් කළමනාකරණය කිරීම ආදියයි.

**මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තාව**

මූල්‍ය කළමනාකරණ ප්‍රධානී සහ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් නිසි පරිදි අත්සන් තබන ලද සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ සහ ඒ පිළිබඳ 2023 මාර්තු 31 දිනට අවසන් වන වසර සඳහා වන විගණන වාර්තාව මෙම වාර්තාව සමඟ අමුණා තිබේ.

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

මූල්‍ය ප්‍රකාශ සැකසීමේදී භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති 63 සිට 75 පිටුවල ඉදිරිපත් කර ඇත.

**සමූහයේ පිරිවැටුම**

සමූහයේ පිරිවැටුම රුපියල් මිලියන 369,470 (2021/22: රුපියල් මිලියන 134,301) කි. සමූහයේ පිරිවැටුමෙහි සවිස්තරාත්මක විශ්ලේෂණයක් මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 20 හි දක්වා ඇත. සමාගම සහ එහි පූර්ණ හිමිකාරිත්වය ඇති පරිපාලිත ආයතනය වන සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම අතර ගනුදෙනු සාධාරණ වෙළඳපොළ මිල ගණන් අනුව සිදුකරනු ලබයි.

**ප්‍රතිඵල**

වසර සඳහා සමූහයෙහි බදුවලට පසු ශුද්ධ අලාභය රුපියල් මිලියන 71,307 (2021/22: රුපියල් මිලියන 163,583) කි. සමූහය විසින් රුපියල් මිලියන 1,361 (2021/22: රුපියල් මිලියන 426) ක බදුකරණ වියදමක් දරන ලදී. වසර සඳහා වන ලාභ හෝ අලාභ ප්‍රකාශය 59 පිටුවෙහි දක්වා ඇත.

**සමූහයේ ආයෝජන**

වසර තුළ දේපළ, පිරියත සහ උපකරණ සඳහා සමූහයේ ප්‍රාග්ධන වියදම් රුපියල් මිලියන 1,309 (2021/22: රුපියල් මිලියන 474) ක් විය.

**දේපළ, පිරියත සහ උපකරණ**

වාර්තා කරන දිනට සමූහයේ දේපළ, පිරියත සහ උපකරණ සඳහා ගිණුම් පොතෙහි සඳහන් ශුද්ධ වටිනාකම රුපියල් මිලියන 11,460 (2021/22: රුපියල් මිලියන 6,251) ක් විය.

දේපළ, පිරියත සහ උපකරණ සහ ඒවායේ සංචලනයන් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන 3 හි දක්වා ඇත.

**ප්‍රකාශිත ප්‍රාග්ධනය**

සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 96,361 කි.

**සංචිත**

2023 මාර්තු 31 දිනට සමූහයේ සංචිත ඍණ රුපියල් මිලියන 590,791 (2021/22: ඍණ රුපියල් මිලියන 522,785) ක් විය. මෙය රුපියල් මිලියන 601,782 (2021/22: රුපියල් මිලියන 529,213) ක සමුච්චිත අලාභවලින් සමන්විත වේ.

**ආයතනික පරිත්‍යාග**

සමූහය වර්ෂය තුළ කිසිදු පරිත්‍යාගයක් සිදු කර නැත (2021/22: නැත).

**අයබදු**

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත මත පදනම්ව 2018 අප්‍රේල් 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සමාගමෙහි සියලුම ව්‍යාපාරික කටයුතුවලට අදාළව ආදායම් බද්ද සඳහා සමාගම බැඳී සිටී. දැනට ද්විත්ව බදු ගිවිසුම් නොමැති රටවල සමාගමෙහි විදේශීය මෙහෙයුම්වලට අදාළ බදු සඳහා සමාගම බැඳී සිටී.

ගුවන් යානා මුළුතැන්ගෙය සහ සංක්‍රමණික අවන්හල වෙතින් ලැබෙන ආදායම 2021 මැයි 31 දක්වා ආදායම් බද්දෙන් නිදහස් කර ඇති අතර ආයෝජන මණ්ඩලය (BOI) සමඟ ඇති කර ගත් ගිවිසුමට අනුව 2029 මැයි 31 දිනෙන් අවසන් වන වසර 8 ක් සඳහා 15% ක සහනදායී අනුපාතයකට බදු ගෙවිය හැකිය. වෙනත් මූලාශ්‍රයන්ගෙන් ලැබෙන ආදායමට අදාළව සාමාන්‍ය අනුපාතයට වගකීමෙන් බැඳී ඇත.

**කොටස් පිළිබඳ විස්තර**

2023 මාර්තු 31 දින වන විට කොටස් පිළිබඳ විස්තර පහත දැක්වෙන පරිදි වේ.

| කොටස් හිමිකාරිත්වය | කොටස් සංඛ්‍යාව | හිමිකාරිත්වය % |
|---|---|---|
| ශ්‍රී ලංකා රජය | 959,006,469 | 99.52% |
| සේවක අර්ථසාධක අරමුදල | 1,863,676 | 0.19% |
| වෙනත් | 2,736,510 | 0.29% |

**නීතිරීති සහ රෙගුලාසිවලට අනුකූලත්වය**
සමාගම සෑමවිටකම අදාළ නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරන බවට තහවුරු කොට ඇත. අනුකූලතාවය සම්බන්ධයෙන් වගකිව යුතු කළමනාකරණ නිලධාරීන් විසින් විගණන කමිටුවේ කාර්තුමය රැස්වීම්වලදී අනුකූලතාවය සම්බන්ධ වාර්තාවක් සභාගත කරනු ලබයි.

**සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු**
සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 28 හි දක්වා ඇත.

**අසම්භාව්‍ය වගකීම් සහ ප්‍රාග්ධන බැඳීම්**
2023 මාර්තු 31 වැනි දිනට අසම්භාව්‍ය වගකීම් සහ එම දිනට ප්‍රාග්ධන වියදම් මත දරන ලද බැඳීම් මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 25 හි ඉදිරිපත් කොට ඇත.

**වාර්තාකරණ දිනට පසු සිදුවීම්**
මූල්‍ය ප්‍රකාශයන්හි සටහන 27 හි දක්වා ඇති කරුණු හැරුණු විට, වෙනස් කිරීමක් හෝ හෙළිදරව් කිරීමක් අවශ්‍ය වන ආකාරයේ කිසිදු තත්ත්වයක් වාර්තාකරණ දින සිට උද්ගතව නැත.

**මානව සම්පත්/සේවා නියුක්ති ප්‍රතිපත්ති**
මානව ප්‍රාග්ධනය සංවර්ධනය සඳහා ආයෝජනයන් සිදු කිරීමත් නව ව්‍යාපාර ප්‍රමුඛතා වටා එලදායී ශ්‍රම බලකායක් ඒකරාශී කිරීමත් සමාගමේ ඉදිරි සාර්ථකත්වය සඳහා අවශ්‍ය කරන දැනුමින් සහ කුසලතාවලින් සිය සේවකයින් සන්නද්ධ වන්නේදැයි සහතික කර ගැනීමත් සඳහා සමාගම නිරන්තරයෙන් කටයුතු කරයි. සමූහයේ සේවා නියුක්ති ප්‍රතිපත්ති පුද්ගලයින්ට නිසි ගෞරවය ලබා දෙමින් ස්ත්‍රී පුරුෂ භාවය, ජාතිය හෝ ආගම නොසලකා ඔවුන්ට සම වෘත්තීය අවස්ථාවන් පිරිනමයි. එමෙන්ම, වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂණ ප්‍රමිතීන් වෙත සැලකිය යුතු අවධානයක් ලබා දේ. වසර අවසානයේ සමාගම විසින් සේවයේ යොදවා ඇති පුද්ගලයින් සංඛ්‍යාව 5,440 (2021/22: 5,833) වන අතර පරිපාලිතය විසින් සේවයේ යොදවා ඇති පුද්ගලයින් සංඛ්‍යාව 763 (2021/22 - 819) විය.

**ව්‍යවස්ථාපිත ගෙවීම්**
සේවකයින්ට සහ ශ්‍රී ලංකා රජයට අදාළ සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නිසි කලට සිදු කර ඇති බවට අධ්‍යක්ෂවරුන්, ඔවුන්ගේ පරම දැනුම හා විශ්වාසය අනුව සෑහීමකට පත්වේ.

**පරිසර ආරක්ෂණය**
සමූහයේ ව්‍යාපාරික ක්‍රියාකාරකම් පරිසරයට සෘජු හා වක්‍ර බලපෑම් ඇති කළ හැකිය. පරිසරයට අහිතකර බලපෑම් අවම මට්ටමක තබා ගැනීම සහ අදාළ බලධාරීන් සහ රෙගුලාසි සමඟ අනුකූලතාව පවත්වා ගැනීම සඳහා සහයෝගීව කටයුතු කිරීම සමූහයේ ප්‍රතිපත්තිය වේ.

**අඛණ්ඩ පැවැත්ම**
අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශයේ සඳහන් කර ඇති පරිදි, භාණ්ඩාගාර/මුදල් අමාත්‍යාංශ, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති පිළිබඳ ලේකම්වරයාගේ සහතිකය මත අධ්‍යක්ෂවරුන් විසින් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම අනුගමනය කර ඇත. ඒ අනුව, ආයතනය ප්‍රතිව්‍යුහගත කරන තෙක් අඛණ්ඩ පැවැත්ම අනුව ඉදිරියට යාමට, 2022/23 වසර සඳහා අවශ්‍ය විටෙක ශ්‍රී ලංකා රජය විසින් සමාගමට මූල්‍ය සහාය ලබා දෙනු ඇත.

**අධ්‍යක්ෂ මණ්ඩලය**
සමාගමෙහි සාංගමික ව්‍යවස්ථාවලියෙහි 79 වගන්තිය ප්‍රකාරව, අධ්‍යක්ෂවරුන් භාණ්ඩාගාර ලේකම් වරයා විසින් පත් කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ කෙටි හඳුන්වාදීමක් වාර්ෂික වාර්තාවේ පිටු අංක 13 සිට 16 හි ඉදිරිපත් කර ඇත.

මූල්‍ය වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දාහතරක් කැඳවා තිබූ අතර ඒවා සඳහා අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය පහත පරිදි විය.

| 2022/23 මූල්‍ය වර්ෂය තුළ අධ්‍යක්ෂවරයාගේ නම | අධ්‍යක්ෂ ධුර කාලය තුළ සහභාගී වී ඇති රැස්වීම් ගණන |
|---|---|
| අසෝක පතිරගේ මහතා (සභාපති) | 14/14 |
| මලික් ජේ. ප්‍රනාන්දු මහතා | 14/10 |
| ජනාධිපති නීතිඥ මනෝහර රත්නවිභූෂණ ද සිල්වා මහතා (2022 අගෝස්තු 18 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) | 14/03 |
| ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා (2022 අගෝස්තු 18 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) | 14/03 |
| ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා | 14/13 |
| ජෝසප් ජයන්ත් මයිකල් පෙරේරා මහතා | 14/14 |
| ආනන්ද විජේතිලක අතුකෝරල මහතා | 14/02 |
| ඩී. කේ. ඩී. ඩී. ඩී. අරන්දර මහතා/භාණ්ඩාගාර නියෝජිත (2023 මාර්තු 16 දින සිට බලපැවැත්වෙන පරිදි තේරී පත්විය) | 14/01 |

* ඩී. එම්. ඩී. ඩී. ලක්මාල් රත්නායක මහතා (2023 අප්‍රේල් 10 දින සිට බලපැවැත්වෙන පරිදි තේරී පත්විය).
* ඩී. ඩී. ශිරාන් චමින්ද ධම්මගේ මහතා (2023 මැයි 4 දින සිට බලපැවැත්වෙන පරිදි තේරී පත්විය).
* සංජය මොහොට්ටාල මහතා (2022 අප්‍රේල් 29 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය).

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව තවදුරටත්.

**විගණන කමිටු සාමාජිකයන්**

විගණන කමිටුව පහත දැක්වෙන සාමාජිකයින්ගෙන් සැදුම්ලත් වේ.

| කමිටු සාමාජිකයින් 2022/23 මූල්‍ය වර්ෂය | සහභාගී වී ඇති රැස්වීම් ගණන |
|---|---|
| මලික් ජේ. ප්‍රනාන්දු මහතා | 2/2 |
| ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා | 2/0 |
| ජෝසප් ජයන්ත් මයිකල් පෙරේරා මහතා | 2/2 |
| ඒ. කේ. ඩී. ඩී. ඩී. අරන්දර මහතා/භාණ්ඩාගාර නියෝජිත (2023 මාර්තු 16 දින සිට බලපැවැත්වෙන පරිදි තේරී පත්විය) | - |

*ඩී. ඩී. ශිරාන් චමින්ද ධම්මගේ මහතා/විගණන කමිටු සභාපති (2023 මැයි 26 දින සිට බලපැවැත්වෙන පරිදි තේරී පත්විය)
*සංජය මොහොට්ටාල මහතා (2022 අප්‍රේල් 29 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)
*ජනාධිපති නීතීඥ මනෝහර රත්නවිභූෂණ ද සිල්වා මහතා (2022 අගෝස්තු 18 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)
*වීරසිංහ ආරච්චිගේ සරත් කුමාර මහතා (2022 අගෝස්තු 26 දින සිට බලපැවැත්වෙන පරිදි තේරී පත්විය / 2023 පෙබරවාරි 3 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)

විගණන කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 52 හි දක්වා ඇත.

**අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ සේවක පාරිශ්‍රමික කමිටුව**

මානව සම්පත් සහ සේවක පාරිශ්‍රමික කමිටුවෙහි ප්‍රධාන අරමුණු වනුයේ, පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් වැඩි දියුණු කිරීම සහ පාරිශ්‍රමික ව්‍යුහයක් ස්ථාපනය කිරීම උදෙසා විධිමත් සහ විනිවිදභාවයෙන් යුතු ක්‍රියාපටිපාටියක් ස්ථාපනය කිරීමේ කාර්යය වෙනුවෙන් මගපෙන්වීමයි.

වෙළඳපොළ සහ කර්මාන්ත සාධක සහ සමූහයේ සියලු සමාගම්වල පුද්ගල කාර්යසාධනය මත පදනම්ව පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් සකස් කර ඇත. මානව සම්පත් සහ සේවක පාරිශ්‍රමික කමිටුව අවශ්‍යතාව පරිදි රැස්වේ.

මානව සම්පත් සහ සේවක පාරිශ්‍රමික කමිටුව, පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

| කමිටු සාමාජිකයින් 2022/23 මූල්‍ය වර්ෂය | සහභාගී වූ රැස්වීම් ගණන |
|---|---|
| මලික් ජේ. ප්‍රනාන්දු මහතා - සභාපති | 3/3 |
| ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා | 3/3 |

*ඒ. එම්. ඒ. ඒ. ලක්මාල් රත්නායක මහතා (2023 අප්‍රේල් 28 දින සිට බලපැවැත්වෙන පරිදි තේරී පත්විය)
*ජෝසප් ජයන්ත් මයිකල් පෙරේරා මහතා (2023 මාර්තු 31 දින සිට බලපැවැත්වෙන පරිදි තේරී පත්විය)
*ඒ. කේ. ඩී. ඩී. ඩී. අරන්දර මහතා/භාණ්ඩාගාර නියෝජිත (2023 මැයි 26 දින සිට බලපැවැත්වෙන පරිදි තේරී පත්විය)
*ජනාධිපති නීතීඥ මනෝහර රත්නවිභූෂණ ද සිල්වා මහතා (2022 අගෝස්තු 18 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)
*ජනාධිපති නීතීඥ සමන්ත රත්වත්ත මහතා (2022 අගෝස්තු 18 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)

## සමූහයේ අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කමිටුව (BGRC)

ආයතනයේ ව්‍යාපාරික මෙහෙයුම් කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි අවදානම් හඳුනා ගැනීමට සහ තක්සේරු කිරීමට මෙන්ම මූල්‍ය හා මූල්‍ය නොවන අවදානම්වල බලපෑම ගණනය කිරීමට සමූහයේ අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කමිටුව අවශ්‍ය වේ. BERC හි සාකච්ඡා මඟින් ආයතනයේ ක්‍රියාකාරිත්වයට බලපාන අවදානම්වල බලපෑම සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම සහ කිසියම් අහිතකර බලපෑමක් වේ නම් එය අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වනු ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල සමූහ අවදානම් කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වේ;

### කමිටු සාමාජිකයින්

ජෝසප් ජයන්ත් මයිකල් පෙරේරා මහතා - සභාපති

මලික් ජේ. ප්‍රනාන්දු මහතා

ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා

ඒ. කේ. ඩී. ඩී. ඩී. අරන්දර මහතා

ඩී. ඩී. ශිරාන් චමින්ද ධම්මගේ මහතා

ආනන්ද විජේතිලක අතුකෝරල මහතා (නිරීක්ෂක)

## සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය

සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගමෙහි වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය පහත දැක්වේ;

අසෝක පතිරගේ මහතා (සභාපති)

මලික් ජේ. ප්‍රනාන්දු මහතා

ජනාධිපති නීතිඥ මනෝහර රත්නවිභූෂණ ද සිල්වා මහතා (2022 ජූලි 11 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)

ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා (2022 ජූලි 11 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)

සංජය මොහොට්ටාල මහතා (2022 අප්‍රේල් 29 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)

ජෝසප් ජයන්ත් මයිකල් පෙරේරා මහතා

වීරසිංහ ආරච්චිගේ සරත් කුමාර මහතා (භාණ්ඩාගාර නියෝජිත 2022 සැප්තැම්බර් 30 දින සිට බලපැවැත්වෙන පරිදි තේරී පත්විය / 2023 පෙබරවාරි 3 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)

ආනන්ද විජේතිලක අතුකෝරල මහතා (2023 මාර්තු 13 දින සිට බලපැවැත්වෙන පරිදි තේරී පත්විය)

ඒ. කේ. ඩී. ඩී. ඩී. අරන්දර මහතා (භාණ්ඩාගාර නියෝජිත 2023 මාර්තු 31 දින සිට බලපැවැත්වෙන පරිදි තේරී පත්විය)

ඒ. එම්. ඒ. ඒ. ලක්මාල් රත්නායක මහතා (2023 අප්‍රේල් 10 දින සිට බලපැවැත්වෙන පරිදි තේරී පත්විය)

ඩී. ඩී. ශිරාන් චමින්ද ධම්මගේ මහතා (2023 මැයි 04 දින සිට බලපැවැත්වෙන පරිදි තේරී පත්විය)

## අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය

සමාගමේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් සඳහා වන්දි ගෙවීම් හෝ පාරිශ්‍රමික ගෙවීමක් සිදු වී නොමැත.

## අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකාරීත්වය

අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකාරීත්වය කාර්යාලයේ බලතල අනුව, ශ්‍රී ලංකා රජයේ :ඨධීබ* නාමයෝජක අධ්‍යක්ෂ ඒ. කේ. පතිරගේ මහතා/සභාපති, සමාගමෙහි සාමාන්‍ය කොටස් 3 ක හිමිකාරීත්වය දරයි.

## සබඳතා ලේඛනය

2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධානය අනුව සමාගම මඟින් සබඳතා ලේඛනයක් පවත්වාගෙන යනු ලබයි. සියලුම අධ්‍යක්ෂවරුන් තමන් වෙනත් සමාගම්වල පවත්වාගෙන යන සබඳතා පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අනාවරණය කොට ඇති අතර 2007 අංක 7 දරන සමාගම් පනතෙහි අංක 192 (1) සහ 192 (2) යන වගන්ති ප්‍රකාරව අදාළ සබඳතා පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ සබඳතා ලේඛනයෙහි වාර්තා කොට ඇත.

## අධ්‍යක්ෂවරුන්ගේ ගිවිසුම් සබඳතා

සමාගමෙහි ව්‍යාපාරික කටයුතුවලට අදාළ කිසිදු ගිවිසුමක් හෝ යෝජිත ගිවිසුමක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශ සටහන් අංක 28 හි අනාවරණය කොට ඇති දෑට අමතරව අධ්‍යක්ෂකවරුන්ට කිසිදු සෘජු හෝ වක්‍ර සම්බන්ධතාවයක් නොතිබුණි.

## වාර්ෂික මහා සභා රැස්වීම

සමාගමේ හතළිස් පස්වන වාර්ෂික මහා සභා රැස්වීම, 2023 නොවැම්බර් 30 වන බ්‍රහස්පතින්දා දින ප.ව. 3.00 ට බෞද්ධාලෝක මාවත, කොළඹ 7, ශ්‍රී ලංකාව, ලිපිනයේ පිහිටි 'සිනමා ආලින්දය' බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී (BMICH) පැවැත්වේ.

වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ නිවේදනය, වාර්ෂික වාර්තාවේ 121 පිටුවේ ඇත.

## විගණකවරුන්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තිය ප්‍රකාරව සමාගමෙහි විගණකවරුන්, විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලැබේ. විගණක ගාස්තු පිළිබඳ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 22 හි දක්වා ඇත. සමාගම හෝ එහි පරිපාලිත ආයතනය සමඟ (විගණකවරයෙකු වශයෙන් පවතින සම්බන්ධය හැරුණු විට) විගණකවරුන්ගේ කිසිදු සබඳතාවයක් නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී,

**අසෝක පතිරගේ**
*සභාපති*

**ජයන්ත් පෙරේරා**
*අධ්‍යක්ෂ*

**ඩැල්රින් තිරුකුමාර් මහත්මිය**
*ආයතනික ලේකම් සේවා ප්‍රධානී/සමාගම් ලේකම්*

2023 ඔක්තෝබර් 23

කටුනායක

# අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව

**කාර්යභාරය සහ වගකීම්**
ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි (BAC) විෂය පථය සහ වගකීම්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර, සම්මත කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තිය ප්‍රකාරව පාලනය කරනු ලැබේ. අභ්‍යන්තර පාලන පද්ධතිය, මූල්‍ය වාර්තාකරණ ක්‍රියාපටිපාටි, අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටි, පාලන ක්‍රියාපටිපාටි, අභ්‍යන්තර සහ බාහිර විගණන ක්‍රියාපටිපාටි, සහ නීති හා රෙගුලාසි සමඟ අනුකූලතාවය නිරීක්ෂණය කිරීමේ ක්‍රියාපටිපාටි පිළිබඳ ස්වාධීන සමාලෝචනයක් සපයමින්, අධීක්ෂණ වගකීම් ඉටු කිරීම සඳහා සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහයවීම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ කාර්යභාරය වේ.

**කමිටුවෙහි සංයුතිය**
2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි සේවය කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වූයේ, සංජය මොහොට්ටාල මහතා (සභාපති, 2022 අප්‍රේල් 29 දින ඉල්ලා අස්වන ලදී), සරත් කුමාර මහතා (සභාපති, 2022 අගෝස්තු 26 දින පත් විය, 2023 පෙබරවාරි 03 දින ඉල්ලා අස්වන ලදී), ජයන්ත් පෙරේරා මහතා (සාමාජික සහ 2023 මාර්තු 31 දින තාවකාලික සභාපති ලෙස පත් වන ලදී), මලික් ප්‍රනාන්දු මහතා (සාමාජික), ආචාර්ය හංස විජේසූරිය මහතා (සාමාජික), මනෝහර ද සිල්වා මහතා (සාමාජික, 2022 අගෝස්තු 18 දින ඉල්ලා අස්වන ලදී), ඒ. කේ. ඩී. ඩී. ඩී. අරන්දර මහතා (සාමාජික, 2023 මාර්තු 31 දින පත් වන ලදී).

වසර අවසානයෙන් පසුව, ශිරාන් දම්මගේ මහතා 2023 මැයි 26 දින විගණන කමිටුව වෙත පත්වන ලදී.

ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරී වන ඒ.ඩී. දිල්රුක්ෂි මහත්මිය ස්වාධීන නිරීක්ෂකයෙකු ලෙස විගණන කමිටුවේ රැස්වීම් වලට සහභාගී වූවාය.

**රැස්වීම්**
2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් දෙකක් (2) පැවැත්විණි. නිශ්චිත ගැටලු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට පැහැදිලි කිරීම සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ කළමනාකරණ සාමාජිකයින් ආරාධනා මත රැස්වීම්වලට සහභාගී විය.

**සමූහ සහතිකකරණ සහ උපදේශක සේවා අංශය**
ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ සමූහ සහතිකකරණ සහ උපදේශක සේවා අංශය (GAAS) විසින් අභ්‍යන්තර විගණනයන් පවත්වන අතර, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත සෘජුවම වාර්තා කරයි.

මූල්‍ය වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ප්‍රධාන ක්‍රියාකාරකම්

- වසර අවසාන විගණනය කළ මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කිරීම සහ මණ්ඩලයේ අනුමැතිය සඳහා නිර්දේශ කිරීම සිදු කරන ලදී.
- වාර්තාකරණ වගකීම්වල ස්වාධීනත්වය සහ බලතල සහතික කිරීමට අභ්‍යන්තර විගණන කාර්යය සමාලෝචනය කරන ලදී.
- අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම සිදු කරන ලදී.
- අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කිරීම සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ක්‍රියාවට නංවන ලද කළමනාකරණ ක්‍රියාමාර්ග නිරීක්ෂණය කිරීම සිදු කරන ලදී.
- ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ආයතනික අවදානම් ලේඛනය සහ ප්‍රධාන ව්‍යාපාරික අවදානම් අවම කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාපටිපාටි සමාලෝචනය කරන ලදී.
- සංශෝධිත ආයතනික තොරතුරු ආරක්ෂණ සහ රහස්‍යතා සංග්‍රහය සහ ව්‍යාපාර අඛණ්ඩතාව කළමනාකරණ සංග්‍රහය සමාලෝචනය කර අනුමැතිය සඳහා මණ්ඩලය වෙත නිර්දේශ කරන ලදී.
- අදාළ සියලුම නීති සහ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කර ඇති බවට සහතික කරලීමට කාර්තුමය අනුකූලතා පාලන රාමුව සමාලෝචනය කරන ලදී.
- තොරතුරු දත්ත ආරක්ෂාව පිළිබඳ තාක්ෂණ අනුකූලතාව සමාලෝචනය කරන ලදී.
- මෙහෙයුම්/ව්‍යාපාරික කරුණු මත අත්හැර දැමූ ලියකියවිලි සඳහා ලබා දුන් අනුමැතිය සමාලෝචනය කරන ලදී.
- කාර්තු පදනම යටතේ නිකුත් කළ සම්බන්ධිත පාර්ශව ගනුදෙනු විස්තර සමාලෝචනය කරන ලදී.
- කාර්තු පදනම යටතේ වඩාත් ප්‍රමුඛ ණයගැතියන් පිළිබඳ සමාලෝචනය කරන ලදී.

**ජයන්ත් පෙරේරා මහතා**
*සභාපති (මූලාසනය හොබවන ලද)*

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

2023 ඔක්තෝම්බර් 23

# අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්, 55 පිටුවේ දක්වා ඇති විගණකවරුන්ගේ වාර්තාවේ සඳහන් ඔවුන්ගේ වගකීම්වලට වඩා වෙනස් වේ.

2007 අංක 7 දරන සමාගම් පනතෙහි අවශ්‍යතා ප්‍රකාරව අධ්‍යක්ෂකවරුන් විසින් සෑම මූල්‍ය වර්ෂයක් සඳහාම මූල්‍ය ප්‍රකාශය, මූල්‍ය වර්ෂය අවසානය සඳහා සමාගම සහ සමූහයේ ක්‍රියාකාරකම් පිළිබඳව නිවැරදිවූත්, සාධාරණවූත් විනිශ්චයක් ලබා දෙමින්, මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ සහ සමූහයේ ලාභ හෝ අලාභ දක්වමින් සැකසිය යුතුය. මූල්‍ය ප්‍රකාශය සැකසීමේදී උචිත ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගෙන ඒවා අවශ්‍ය පරිදි යොදා ගෙන ඇති අතර සාධාරණ සහ විචක්ෂණශීලි විනිශ්චයන් සහ තක්සේරු සිදු කරමින් අදාළ වන්නා වූ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කර ඇත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ 2007 අංක 07 දරන පනතේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුව මූල්‍ය ප්‍රකාශ සැකසීම සහ ඉදිරිපත් කිරීම සිදුකර ඇති බවට සහතික කිරීමට, සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වයෙහි නිවැරදි බව සමඟ අනාවරණය කිරීමට ප්‍රමාණවත් ගිණුම්කරණ වාර්තා සමාගම සහ සමූහය පවත්වා ගෙන යන බවට සහතික කිරීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීමකි. එමෙන්ම ඔවුන්, සමූහයේ වත්කම් සඳහා ආරක්ෂාව සැලසීමට අවැසි ක්‍රියාමාර්ග ගැනීම සහ ඒ සම්බන්ධව වංචා සහ අක්‍රමිකතා සිදුවීම හඳුනාගැනීමට සහ වැළැක්වීම සඳහා ගැළපෙන අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපනය කිරීම වෙනුවෙන් නිසි සැලකිල්ලක් දැක්වීමට වගකියනු ලැබේ.

බැංකු ණය පහසුකම් ලබාගැනීම සඳහා සහනශීලී ලිපි සපයමින් රජයේ සහතිකවීම මාර්ගයෙන් ශ්‍රී ලංකා රජය (GoSL) විසින් ලබාදෙන අඛණ්ඩ සහයෝගය සහ ශ්‍රී ලංකා රජය විසින් සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමට ගත් ප්‍රයත්නයන් සහ සමාගමේ මෙහෙයුම් සහ මූල්‍ය තත්ත්වයන් නඟා සිටුවීම පිළිබඳ සැලකීමෙන් අනතුරුව අධ්‍යක්ෂවරුන් විසින් 'අඛණ්ඩ පැවැත්ම' යන සංකල්පය මූල්‍ය ප්‍රකාශ සැකසීමේදී තවදුරටත් පවත්වා ගෙන යන ලදී. තවද, මූල්‍ය සටහන්හි 3 වන සටහන යටතේ විස්තර කර ඇති පරිදි, යෝජිත ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කරන තෙක් "අඛණ්ඩ පැවැත්ම" පදනම යටතේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදුකිරීමට අවශ්‍ය මූල්‍ය අනුග්‍රහය තවදුරටත් ශ්‍රී ලංකා රජය විසින් සපයනු ලබන බවට 2022 ඔක්තෝම්බර් 25 වන දිනැති කැබිනට් මණ්ඩල අනුමැතියක් හරහා ශ්‍රී ලංකා රජය විසින් තහවුරු කර ඇත (2022 නොවැම්බර් 8 දින භාණ්ඩාගාරික ලේකම් විසින් ලිපිය නිකුත් කර ඇත).

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ ඔවුන්ගේ මතය ගොඩනැගීම සඳහා සුදුසු යැයි සලකනු ලබන කවර හෝ පරීක්ෂාවක් සිදු කිරීමට විගණකවරුන්ට සෑම අවස්ථාවක්ම සලසා ඇති බවට සහතික වීම සඳහා අධ්‍යක්ෂවරුන් විසින් අවශ්‍ය පියවර ගෙන ඇත.

ගිණුම් වාර්තා කරනු ලබන දිනට සමාගමට සහ එහි පරිපාලිත සමාගමට අදාළ සියලු බදු, අයකිරීම් සහ මූල්‍ය බැඳීම් ගෙවා හෝ ඊට අදාළ ප්‍රමාණවත් ප්‍රතිපාදනය මූල්‍ය ප්‍රකාශ තුළ සිදුකර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්වකීය දැනුම අනුව තහවුරු කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

**ඩැල්රින් තිරුකුමාර් මහත්මිය**
*සාංගමික ලේකම් සේවා ප්‍රධානී/*
*සමාගම් ලේකම්*

2023 ඔක්තෝබර් 23

# ස්වාධීන විගණකගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. AAV/B/SLAL/FA/2022/38 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 01 November 2023

**සභාපති**
**සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස්**

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව, 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සීමාසහිත ශ්‍රීලංකන් එයාලයින්ස් සමාගමේ සහ එහි පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශ සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව**

**1. මූල්‍ය ප්‍රකාශ**

*1.1 මතය*

2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 මාර්තු 31 දිනෙන් අවසන් සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශයේ විගණනය සහ සමාගමේ සහ එහි පරිපාලිතයේ ("සමූහය") මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තියෙහි සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පාර්ලිමේන්තුවට මා විසින් ඉදිරිපත් කළ යුතු වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ඇත. මෙම විගණනය සිදු කිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියේ නියුතු වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයක් මට සහය විය.

මූල්‍ය ප්‍රකාශවලින් 2023 මාර්තු 31 දිනට සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

*1.2 මතය සඳහා පදනම*

මම මගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට (SLAuSs) අනුකූලව සිදු කළෙමි. එම ප්‍රමිති යටතේ මගේ වගකීම් මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම් යටතේ තවදුරටත් විස්තර කෙරේ. මා ලබාගත් විගණන සාක්ෂි මගේ මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ සුදුසු යැයි මම විශ්වාස කරමි.

*1.3 කාරණා අවධාරණය කිරීම*

**(අ) අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාව**

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ (2022 රුපියල් මිලියන 163,583.08) සමූහය රුපියල් මිලියන 601,781.56 ක සමුච්චිත අලාභයක් (2022 - රුපියල් මිලියන 529,212.71) සහිතව රුපියල් මිලියන 71,306.66 ක ශුද්ධ අලාභයක් ලබා ඇති බව හෙළි කරන මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 2.1.1 වෙත අවධානය යොමු කරමි. එම දිනය වන විට, සමූහයේ ජංගම වගකීම්, එහි ජංගම වත්කම් රුපියල් මිලියන 418,568.67 කින් (2022 - රුපියල් මිලියන 292,420.15) ඉක්මවා ඇති අතර මුළු වගකීම්, එහි මුළු වත්කම් රුපියල් මිලියන 494,429.99 කින් (2022 - රුපියල් මිලියන 426,423.83) ඉක්මවා ඇත. තවද, 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර තුළදී සමාගම රුපියල් මිලියන 73,621.53 ක ශුද්ධ අලාභයක් දරා ඇත (2022 - රුපියල් මිලියන 166,369.68). වසර තුළ සමුච්චිත අලාභය රුපියල් මිලියන 612,376.11 (2022 - රුපියල් මිලියන 537,505.15) කි. එදිනට සමාගමේ ජංගම වගකීම්, එහි ජංගම වත්කම් රුපියල් මිලියන 431,624.55 කින් (2022 - රුපියල් මිලියන 302,702.50) ඉක්මවා ඇති අතර මුළු වගකීම්, එහි මුළු වත්කම් රුපියල් මිලියන 509,174.88 කින් (2022 - රුපියල් මිලියන 437,036.92 මිලියන) ඉක්මවා ඇත.

සටහන 2.1.1 හි දක්වා ඇති අනෙකුත් කාරණා සමඟ එවැනි අවස්ථාවක් හෝ කොන්දේසියක පැවැත්ම දක්වනුයේ, සමූහයට/සමාගමට අඛණ්ඩ පැවැත්මක් පවත්වා ගැනීමට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි අවිනිශ්චිතතාවයක් පවතින බවයි.

**(ආ) ගුවන් යානා පූර්ව ලබාගැනීමේ ගෙවීම්**

සැපයුම්කරු සමඟ ගිවිසුමේ දක්වා ඇති ආරවුල් විසඳීමේ යාන්ත්‍රණය හරහා සමාගම විසින් එම මුදල අයකර ගැනීම සඳහා හිමිකම් පෑමක් සිදු කර ඇති බැවින් 2023 මාර්තු 31 දිනට රුපියල් මිලියන 6,288.68 (ඇ.ඩො. මිලියන 19.21) ක් වූ ගුවන් යානා පූර්ව ලබාගැනීමේ ගෙවීම්වලට අදාළ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 5 වෙත මාගේ අවධානය යොමු කරන ලදී.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මෙම කරුණු සම්බන්ධයෙන් මගේ මතය වෙනස් කර නැත.

### *1.4 සමාගමේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් වෙනත් තොරතුරු*

වෙනත් තොරතුරු සඳහා වාර්ෂික වාර්තාවේ තොරතුරු ඇතුළත් වන අතර, ඒ සඳහා මූල්‍ය ප්‍රකාශ සහ මෙම විගණකගේ වාර්තාවේ දිනයට පෙර ලබාගත් මාගේ විගණකගේ වාර්තාව ඇතුළත් නොවේ. වෙනත් තොරතුරු සම්බන්ධයෙන් කළමනාකාරිත්වය වගකීමෙන් බැඳේ.

මූල්‍ය ප්‍රකාශ සම්බන්ධ මාගේ මතය මඟින් වෙනත් තොරතුරු ආවරණය නොවන අතර, ඒ සම්බන්ධයෙන් මවිසින් කිසිදු ආකාරයක තහවුරුවක් හෝ නිගමනයක් සපයනු නොලැබේ.

මූල්‍ය ප්‍රකාශ විගණනය සම්බන්ධයෙන් මාගේ වගකීම වනුයේ, ඉහත සඳහන් කරන ලද වෙනත් තොරතුරු කියවා බැලීම වන අතර, එහිදී වෙනත් තොරතුරු හා මූල්‍ය ප්‍රකාශ අතර ප්‍රමාණාත්මක නොගැළපීමක් පවතීද, විගණනයේදී මා ලද දැනුම අනුව හෝ වෙනත් ආකාරයකින් කිසියම් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් සිදුවී ඇතිද යන්න සොයා බලනු ලබයි.

මා වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ ඇති බව මා නිගමනය කරන්නේ නම්, එම කාරණය නිවැරදි කිරීම සඳහා පාලනයට සම්බන්ධ අය වෙත දැනුම් දීමට මට අවශ්‍ය වේ. තවදුරටත් ප්‍රමාණාත්මක නිවැරදි නොකළ සාවද්‍ය ප්‍රකාශ තිබේ නම් ඒවා නියමිත වේලාවට සභාගත කෙරෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියේ විධිවිධාන අනුව මම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### *1.5 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ කළමනාකාරීත්වයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම්*

මෙම මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම මෙන්ම වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකාරිත්වයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී, සමූහයේ අඛණ්ඩ පැවැත්මේ පදනම තීරණය කිරීම කළමනාකාරිත්වයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විසින් සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර, අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම, සමාගමේ සහ සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකාරිත්වයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා පාලනයේ වගකීම ඇති අය වගකිව යුතුය.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තියට අනුව, වාර්ෂික සහ වාරාන්තරව සමාගමෙහි සහ සමූහයෙහි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා, සමාගම සහ සමූහය විසින් සිය ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් පිළිබඳ නිසි පොත් සහ වාර්තා පවත්වා ගෙන යා යුතුය.

### *1.5 මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකවරුන්ගේ වගකීම්*

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශ පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි සාධාරණ ලෙස බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය විචක්ෂණභාවයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද මවිසින්,

- වංචා හෝ දෝෂයක් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණාත්මක වැරදි අර්ථකථනයක අවදානම් හඳුනාගෙන ඒවා තක්සේරු කිරීම, එම අවදානම්වලට ප්‍රතිචාර දක්වන විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සහ ඉටු කිරීම සහ මාගේ මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම සිදුකරමි. වංචාවේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාණාත්මක වැරදි අර්ථකථනයක් හඳුනා නොගැනීමේ අවදානම, වැරැද්දක ප්‍රතිඵලයක් ලෙස එසේ හඳුනානොගැනීමට වඩා වැඩි ය, මන්ද

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

වංචාවක් තුළ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සෑදීම, හිතාමතා ඌනතා ඇතිකිරීම, වැරදි ලෙස නිරූපණය කිරීම හෝ අභ්‍යන්තර පාලනය ඉක්මවා යාම ඇතුළත් විය හැකි බැවිනි.

- අවස්ථාවෝචිතව සුදුසු විගණන ක්‍රියාපටිපාටි සැලසුම් කිරීම සඳහා විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගනිමි. නමුත් එසේ සිදුකරන්නේ සමාගමේ සහ සමූහයේ ඵලදායීතාවය සහ අභ්‍යන්තර පාලනය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණින් නොවේ.
- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සහ කළමනාකාරීත්වය විසින් සිදු කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ ඊට සම්බන්ධ අනාවරණය කිරීම්වල සාධාරණත්වය ඇගයීම සිදු කරමි.
- කළමනාකාරීත්වය විසින් ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්මේ පදනම භාවිත කිරීමේ යෝග්‍යතාවය පිළිබඳව නිගමනය කරන අතර, ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, සමූහයට අඛණ්ඩ පැවැත්මක් ඇති වීමේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයක් ඇති කරන සිදුවීම් හෝ කොන්දේසිවලට අදාළව ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින්නේද යන්න තීරණය කරමි. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශවල අදාළ අනාවරණයන් පිළිබඳ මවිසින් මගේ විගණක වාර්තාවේ අවධානය යොමු කිරීම අවශ්‍ය වන අතර, නැතහොත් එවැනි අනාවරණය කිරීම් ප්‍රමාණවත් නොවේ නම්, මගේ මතය වෙනස් කිරීම සිදු කළ යුතුය. මගේ නිගමන පදනම් වී ඇත්තේ මගේ වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මත ය. කෙසේ වෙතත්, අනාගත සිදුවීම් හෝ තත්ත්වයන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හේතු විය හැකිය
- අනාවරණය කිරීම් ඇතුළුව මූල්‍ය ප්‍රකාශවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය තක්සේරු කිරීම සහ මූල්‍ය ප්‍රකාශ මඟින් එහි ඇතුළත් ගනුදෙනු සහ සිදුවීම් පිළිබඳ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමක් නියෝජනය කරන්නේද යන්න තක්සේරු කරමි.
- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතනවල හෝ ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු පිළිබඳ ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම සිදුකරමි. කණ්ඩායම් විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්යසාධනය

මගේ විගණනයේදී මා හඳුනා ගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව, අනෙකුත් කරුණු අතර සැලකිය යුතු විගණන සොයා ගැනීම් සම්බන්ධයෙන් පාලනය භාරව සිටින අය සමඟ මම සන්නිවේදනය කරමි.

## 2. වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

*2.1* 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතා සම්බන්ධව නිශ්චිත විධිවිධාන ඇතුළත් කර ඇත.

2.1.1 විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගෙන ඇති අතර, මගේ පරීක්ෂාවෙන් පෙනී යන පරිදි, සමාගම විසින් 2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියට අනුව නිසි පරිදි විගණන වාර්තා තබා ඇත.

2.1.2 ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ අවශ්‍යතාවයට අනුව පෙර වසරට අනුකූල වේ.

2.1.3 ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශවල 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ අවශ්‍යතාවයට අනුව පෙර වසරේ මා විසින් කරන ලද සියලුම නිර්දේශ ඇතුළත් වේ.

*2.2* අනුගමනය ලද ක්‍රියාපටිපාටි සහ ලබාගත් සාක්ෂි මත පදනම්ව, ප්‍රමාණාත්මක කරුණුවලට සීමා වූ කිසිවක් මගේ අවධානයට ලක්ව නැත;

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තිය අනුව, සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලින් බැහැරව, සමාගම විසින් ඇති කරගන්නා ඕනෑම කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් සමාගමේ පාලන මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකුට සෘජු හෝ වක්‍ර උනන්දුවක් ඇති බව ප්‍රකාශ කිරීම.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව, සමූහයේ පාලන අධිකාරිය විසින් නිකුත් කරන ලද අදාළ ලිඛිත නීති, සාමාන්‍ය සහ විශේෂ විධානවලට සමූහය අනුකූල වී නොමැති බව ප්‍රකාශ කිරීම.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව, සමාගම එහි බලතල, කාර්යයන් සහ රාජකාරි අනුව කටයුතු කර නොමැති බව ප්‍රකාශ කිරීම.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව අදාළ නීතිවලට අනුකූලව සහ නිසි කාල රාමු තුළ සමාගමේ සම්පත් ප්‍රසම්පාදනය කොට ඒවා පිරිමැසුම්සහගව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස භාවිත කර නොමැති බව ප්‍රකාශ කිරීම.

**ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න**
*විගණකාධිපති*

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| 2023 මාර්තු 31 දිනට<br>වත්කම් | සටහන | සමූහය<br>2023<br>රු. මිලියන | 2022<br>රු. මිලියන | සමාගම<br>2023<br>රු. මිලියන | 2022<br>රු. මිලියන |
|---|---|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 3 | 11,459.71 | 6,250.74 | 7,164.89 | 4,206.28 |
| භාවිත හිමිකම් වත්කම් (ROU) | 4 | 70,496.87 | 82,808.36 | 70,320.69 | 82,539.30 |
| ගුවන් යානා පූර්ව බෙදාහැරීමේ ගාස්තු | 5 | 6,288.68 | - | 6,288.68 | - |
| ගුවන් යානා නඩත්තු සංචිතය | 6 | 43,116.59 | 30,391.33 | 43,116.59 | 30,391.33 |
| ගුවන් යානා සහ අතිරේක එන්ජින් තැන්පතු | 7 | 5,713.80 | 5,439.55 | 5,713.80 | 5,439.55 |
| අස්පෘශ්‍ය වත්කම් | 8 | 135.79 | 78.78 | 125.72 | 66.63 |
| ආයෝජන | 9.1 | 0.40 | 0.40 | 42.44 | 42.44 |
| | | 137,211.84 | 124,969.16 | 132,772.81 | 122,685.53 |
| **ජංගම වත්කම්** | | | | | |
| තොග | 10 | 5,972.97 | 4,268.37 | 5,392.52 | 4,015.64 |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | 11 | 33,534.74 | 27,807.64 | 28,266.13 | 27,052.31 |
| ගුවන් යානා නඩත්තු සංචිතය | 6 | 18,857.02 | 16,966.56 | 18,857.02 | 16,966.56 |
| ගුවන් යානා සහ අතිරේක එන්ජින් තැන්පතු | 7 | 2,346.66 | 937.40 | 2,346.66 | 937.40 |
| ආයෝජන | 9.2 | 2,253.13 | 1,937.38 | 1,826.00 | 1,681.78 |
| මුදල් සහ බැංකු ශේෂයන් | 12 | 11,000.05 | 5,376.82 | 9,993.62 | 4,804.95 |
| | | 73,964.57 | 57,294.17 | 66,681.95 | 55,458.64 |
| **මුළු වත්කම්** | | 211,176.41 | 182,263.33 | 199,454.76 | 178,144.17 |
| **හිමිකම් සහ වගකීම්** | | | | | |
| **හිමිකම්** | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 13 | 96,360.67 | 96,360.67 | 96,360.67 | 96,360.67 |
| සංචිත | 14 | 10,990.90 | 6,428.21 | 6,840.56 | 4,107.56 |
| සමුච්චිත අලාභ | | (601,781.56) | (529,212.71) | (612,376.11) | (537,505.15) |
| | | (494,429.99) | (426,423.83) | (509,174.88) | (437,036.92) |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| පොලී දරන වගකීම් | 15 | 154,201.38 | 215,585.08 | 153,472.18 | 214,699.18 |
| වෙනත් වගකීම් | 16 | 58,871.78 | 43,387.76 | 56,850.96 | 42,320.77 |
| | | 213,073.16 | 258,972.84 | 210,323.14 | 257,019.95 |
| **ජංගම වගකීම්** | | | | | |
| ගුවන් ප්‍රවාහන පූර්ව විකුණුම් | 17 | 53,390.92 | 28,704.31 | 53,390.92 | 28,704.31 |
| වෙනත් වගකීම් | 16 | 31,260.34 | 23,653.30 | 31,260.34 | 23,653.30 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | 18 | 172,817.98 | 132,862.79 | 179,116.25 | 141,522.63 |
| ගෙවිය යුතු ආදායම් බදු | | 528.16 | 216.54 | 175.45 | 175.45 |
| පොලී දරන වගකීම් | 15 | 234,535.84 | 164,277.38 | 234,363.54 | 164,105.45 |
| | | 492,533.24 | 349,714.32 | 498,306.50 | 358,161.14 |
| මුළු වගකීම් | | 705,606.40 | 608,687.16 | 708,629.64 | 615,181.09 |
| මුළු හිමිකම් සහ වගකීම් | | 211,176.41 | 182,263.33 | 199,454.76 | 178,144.17 |

මෙම මූල්‍ය ප්‍රකාශ 2007 අංක 7 දරන සමාගම් පනතෙහි අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල කරන ලදී.

**යසන්ත දිසානායක**
*මූල්‍ය කළමනාකරණ ප්‍රධානී*

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ. අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ ඒ වෙනුවෙන් අත්සන් තබන ලද්දේ,

**ජයන්ත් පෙරේරා**
අධ්‍යක්ෂ

**අසෝක පතිරගේ**
අධ්‍යක්ෂ

පිටු අංක 63 සිට 112 දක්වා ඉදිරිපත් කොට ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවලට අදාළ කොටසකි.

2023 ඔක්තෝබර් 23
කොළඹ

# ලාභ හෝ අලාභ ප්‍රකාශය

| 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | සටහන | 2023 රු. මිලියන | 2022 රු. මිලියන | 2023 රු. මිලියන | 2022 රු. මිලියන |
| **ආදායම** | 20. | 369,470.04 | 134,301.36 | 365,171.77 | 132,936.23 |
| **වියදම** | | | | | |
| ගුවන් යානා ඉන්ධන පිරිවැය | | (155,559.11) | (42,759.12) | (155,559.11) | (42,759.12) |
| සේවක පිරිවැය | | (26,552.99) | (17,415.80) | (24,341.47) | (15,969.51) |
| ගුවන්තොටුපළ, ගමන් සහ මඟී වියදම් | | (40,761.00) | (17,752.91) | (48,474.28) | (19,272.39) |
| ගුවන් යානා නඩත්තු සහ අලුත්වැඩියා පිරිවැය | | (42,199.29) | (23,088.11) | (42,199.29) | (23,088.11) |
| ක්ෂයවීම් / ක්‍රමක්ෂය | | (15,153.46) | (14,655.59) | (14,685.12) | (14,188.27) |
| කෙටිකාලීන බදු ගුවන් යානා සහ අමතර එන්ජින් සඳහා බදු කුලිය | | (504.44) | (43.66) | (504.44) | (43.66) |
| විකුණුම්, අලෙවි සහ ප්‍රචාරණ වියදම් | | (24,643.41) | (7,249.61) | (24,627.60) | (7,180.41) |
| ගුවන් කාර්ය මණ්ඩල වියදම් | | (7,660.86) | (3,230.96) | (7,660.86) | (3,230.96) |
| වෙනත් මෙහෙයුම් වියදම් | | (16,821.96) | (7,026.34) | (12,516.36) | (6,665.43) |
| | | 39,613.52 | 1,079.26 | 34,603.24 | 538.37 |
| වෙනත් ආදායම් සහ ලැබීම් | 21. | 3,758.04 | 613.40 | 6,140.34 | 698.96 |
| **විනිමය අලාභයට පෙර මෙහෙයුම් ලාභය / (අලාභය)** | | 43,371.56 | 1,692.66 | 40,743.58 | 1,237.33 |
| පොලී දරන වගකීම් හැර විනිමය අලාභය | | (24,748.95) | (34,729.60) | (25,560.09) | (37,812.00) |
| විනිමය අලාභයට පසු මෙහෙයුම් ලාභය / (අලාභය) | | 18,622.61 | (33,036.94) | 15,183.49 | (36,574.67) |
| **ශුද්ධ මූල්‍ය පිරිවැය** | | | | | |
| මූල්‍ය ආදායම | 23.1 | 1,293.58 | 664.17 | 1,220.87 | 639.25 |
| මූල්‍ය පිරිවැය | 23.2 | (51,482.84) | (22,903.90) | (51,394.83) | (22,813.07) |
| පොලී දරන වගකීම් මත විනිමය අලාභය | 23.3 | (38,379.05) | (107,880.72) | (38,273.72) | (107,621.19) |
| | | (88,568.31) | (130,120.45) | (88,447.68) | (129,795.01) |
| **බදු පෙර අලාභය** | | (69,945.70) | (163,157.39) | (73,264.19) | (166,369.68) |
| ආදායම් බදු (වියදම) / ප්‍රතිවර්තනය | 24. | (1,360.96) | (425.69) | (357.34) | - |
| **වසර සඳහා අලාභය** | | (71,306.66) | (163,583.08) | (73,621.53) | (166,369.68) |

පිටු අංක 63 සිට 112 දක්වා ඉදිරිපත් කොට ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවලට අදාළ කොටසකි.

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | සටහන | සමූහය 2023 රු. මිලියන | සමූහය 2022 රු. මිලියන | සමාගම 2023 රු. මිලියන | සමාගම 2022 රු. මිලියන |
|---|---|---|---|---|---|
| **වසර සඳහා අලාභය** | | (71,306.66) | (163,583.08) | (73,621.53) | (166,369.68) |
| **වෙනත් විස්තීර්ණ ආදායම / (අලාභය)** | | | | | |
| **පසු කාලපරිච්ඡේදයන්හිදී ලාභ හෝ අලාභ වෙත ප්‍රතිවර්ගීකරණය නොකෙරෙන වෙනත් විස්තීර්ණ ආදායම / (අලාභ) :** | | | | | |
| පාරිතෝෂිකය මත ආයුගණන ලැබීම් / (අලාභය) | 16.3 | (1,142.09) | 636.51 | (1,135.92) | 598.05 |
| පාරිතෝෂකය සඳහා වන ආයුගණන ලැබීම් / (අලාභය) මත විලම්බිත බදු බලපෑම | 24.1 | 1.85 | (5.77) | - | - |
| උපයාගත් නිවාඩු ගෙවීම් මත ආයුගණන ලැබීම් / (අලාභය) | 16.3 | (125.63) | 22.83 | (113.57) | - |
| උපයාගත් නිවාඩු ගෙවීම් සඳහා වන ආයුගණන ලැබීම් / (අලාභය) මත විලම්බිත බදු බලපෑම | 24.1 | 3.62 | (3.42) | - | - |
| දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය | 3 | 5,346.90 | - | 2,733.06 | - |
| දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම මත විලම්බිත බදු බලපෑම | 24.1 | (784.15) | - | - | - |
| වසර සඳහා මුළු වෙනත් විස්තීර්ණ ආදායම / (අලාභය), ශුද්ධ බදු | | 3,300.50 | 650.15 | 1,483.57 | 598.05 |
| **වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම / (අලාභය), ශුද්ධ බදු** | | (68,006.16) | (162,932.93) | (72,137.96) | (165,771.63) |

පිටු අංක 63 සිට 112 දක්වා ඉදිරිපත් කොට ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවලට අදාළ කොටසකි.

# ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

| සමූහය<br>2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ<br>වසර සඳහා | ප්‍රකාශිත<br>ප්‍රාග්ධනය<br>රු. මිලියන | ප්‍රත්‍යාගණන<br>සංචිතය<br>රු. මිලියන | ප්‍රාග්ධන<br>සංචිතය<br>රු. මිලියන | සමුච්චිත<br>අලාභ<br>රු. මිලියන | එකතුව<br><br>රු. මිලියන |
|---|---|---|---|---|---|
| **2021 අප්‍රේල් 01 දිනට ශේෂය** | 79,352.43 | 5,441.27 | | (366,284.57) | (281,490.87) |
| ප්‍රකාශිත ප්‍රාග්ධනයට අත්තිකාරම් (සටහන 13) | (27,734.99) | - | - | - | (27,734.99) |
| කොටස් නිකුතුව (සටහන 13) | 44,743.23 | - | 991.74 | - | 45,734.96 |
| වසර තුළ බැහැර කිරීම හේතුවෙන් ප්‍රත්‍යාගණන අතිරික්තය පැවරුම | - | (4.80) | - | 4.80 | - |
| වසර සඳහා අලාභය | - | - | - | (163,583.08) | (163,583.08) |
| වෙනත් විස්තීර්ණ ආදායම | - | - | - | 650.15 | 650.15 |
| මුළු විස්තීර්ණ ආදායම / (අලාභය) | - | - | - | (162,932.93) | (162,932.93) |
| **2022 අප්‍රේල් 01 දිනට ශේෂය** | 96,360.67 | 5,436.47 | 991.74 | (529,212.71) | (426,423.83) |
| වසර තුළ බැහැර කිරීම හේතුවෙන් ප්‍රත්‍යාගණන අතිරික්තය පැවරුම | - | (0.06) | - | 0.06 | - |
| වසර සඳහා අලාභය | - | - | - | (71,306.66) | (71,306.66) |
| වෙනත් විස්තීර්ණ ආදායම | - | 4,562.75 | - | (1,262.25) | 3,300.50 |
| මුළු විස්තීර්ණ ආදායම / (අලාභය) | - | 4,562.75 | - | (72,568.91) | (68,006.16) |
| **2023 මාර්තු 31 දිනට ශේෂය** | 96,360.67 | 9,999.16 | 991.74 | (601,781.56) | (494,429.99) |

| සමාගම | ප්‍රකාශිත<br>ප්‍රාග්ධනය<br>රු. මිලියන | ප්‍රත්‍යාගණන<br>සංචිතය<br>රු. මිලියන | ප්‍රාග්ධන<br>සංචිතය<br>රු. මිලියන | සමුච්චිත<br>අලාභ<br>රු. මිලියන | එකතුව<br><br>රු. මිලියන |
|---|---|---|---|---|---|
| **2021 අප්‍රේල් 01 දිනට ශේෂය** | 79,352.43 | 3,115.82 | - | (371,733.52) | (289,265.27) |
| ප්‍රකාශිත ප්‍රාග්ධනයට අත්තිකාරම් (සටහන 13) | (27,734.99) | - | - | - | (27,734.99) |
| කොටස් නිකුතුව (සටහන 13) | 44,743.23 | - | 991.74 | - | 45,734.96 |
| වසර සඳහා අලාභය | - | - | - | (166,369.68) | (166,369.68) |
| වෙනත් විස්තීර්ණ ආදායම | - | - | - | 598.05 | 598.05 |
| මුළු විස්තීර්ණ ආදායම / (අලාභය) | - | - | - | (165,771.63) | (165,771.63) |
| **2022 අප්‍රේල් 01 දිනට ශේෂය** | 96,360.67 | 3,115.82 | 991.74 | (537,505.15) | (437,036.92) |
| වසර තුළ බැහැර කිරීම හේතුවෙන් ප්‍රත්‍යාගණන අතිරික්තය පැවරුම | - | (0.06) | - | 0.06 | - |
| වසර සඳහා අලාභය | - | - | - | (73,621.53) | (73,621.53) |
| වෙනත් විස්තීර්ණ ආදායම | - | 2,733.06 | - | (1,249.49) | 1,483.57 |
| මුළු විස්තීර්ණ ආදායම / (අලාභය) | - | 2,733.06 | - | (74,871.02) | (72,137.96) |
| **2023 මාර්තු 31 දිනට ශේෂය** | 96,360.67 | 5,848.82 | 991.74 | (612,376.11) | (509,174.88) |

පිටු අංක 63 සිට 112 දක්වා ඉදිරිපත් කොට ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවලට අදාළ කොටසකි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| 2023 මාර්තු 31 දිනට ශේෂය | සටහන | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | | 2023 රු. මිලියන | 2022 රු. මිලියන | 2023 රු. මිලියන | 2022 රු. මිලියන |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින්/(භාවිත කළ) මුදල් ප්‍රවාහ** | | | | | |
| ආදායම් බදු වියදමට පෙර අලාභය | | (69,945.70) | (163,157.39) | (73,264.19) | (166,369.68) |
| ගැළපුම් : | | | | | |
| ක්ෂයවීම් / ක්‍රමක්ෂය / හානිකරණය | | 15,153.46 | 14,655.59 | 14,685.12 | 14,188.27 |
| මූල්‍ය පිරිවැය | 23.2 | 51,482.84 | 22,903.90 | 51,394.83 | 22,813.07 |
| දේපළ, පිරියත සහ උපකරණ, අස්පෘශ්‍ය වත්කම් සහ වත්කම පාවිච්චි කිරීමේ හිමිකම බැහැර කිරීමෙන් ලද අලාභය/(ලැබීම්) | | 5.05 | 24.89 | 5.05 | 4.61 |
| මූල්‍ය ආදායම | 23.1 | (1,293.58) | (664.17) | (1,220.87) | (639.25) |
| ලැබිය යුතු දෑ හානිකරණය සඳහා ප්‍රතිපාදනය | 11.3 | 205.94 | 125.63 | 190.13 | 88.38 |
| මන්දගාමීව චලනය වන තොග සඳහා ප්‍රතිපාදනය | 10.1 | 408.17 | 349.35 | 362.11 | 405.29 |
| නඩත්තු සංචිතය හානිකරණය සඳහා ප්‍රතිපාදනය | 6.2 | 10,670.39 | 3,836.65 | 10,670.39 | 3,836.65 |
| බදු සහන | 15.3 | (203.10) | (339.91) | (122.30) | (191.99) |
| උපලබ්ධි නොවන ලද විනිමය අලාභයෙහි බලපෑම | | 38,247.00 | 143,139.73 | 38,141.67 | 145,580.83 |
| අත්තිකාරම්වල විකුණුම් ආපසු ලිවීම | | (768.87) | (2,506.13) | (768.87) | (2,506.13) |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදනය | 16.3 | 1,336.83 | 1,241.51 | 1,200.99 | 1,159.11 |
| **කාර්ය ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය / (අලාභය)** | | 45,298.43 | 19,609.65 | 41,274.06 | 18,369.16 |
| තොගවල පහළයාම / (ඉහළයාම) | | (2,092.14) | 38.03 | (1,718.36) | 62.11 |
| පූර්ව ප්‍රවාහන විකුණුම්වල (පහළයාම)/ ඉහළයාම | | 25,455.48 | 20,013.68 | 25,455.48 | 20,013.68 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ හි (ඉහළයාම) /පහළයාම | | (11,699.33) | (12,666.72) | (7,053.04) | (12,174.95) |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ හි ඉහළයාම / (පහළයාම) | | 49,492.47 | 8,052.86 | 47,261.15 | 8,186.48 |
| නඩත්තු සංචිතවල (ඉහළයාම) / පහළයාම | | (15,660.04) | (4,613.74) | (15,660.04) | (4,613.74) |
| ගුවන්යානා සුරැකුම් තැන්පතුවල පහළයාම / (ඉහළයාම) | | (914.29) | 471.80 | (914.29) | 471.80 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින්/(භාවිත කරන ලද) උත්පාදිත මුදල්** | | 89,880.58 | 30,905.59 | 88,644.96 | 30,314.53 |
| ගෙවන ලද මූල්‍ය පිරිවැය | | (50,800.90) | (15,859.69) | (50,800.90) | (15,768.86) |
| ගෙවන ලද විශ්‍රාම ප්‍රතිලාභ | 16.3 | (1,287.66) | (456.36) | (1,208.26) | (438.69) |
| ගෙවන ලද ආදායම් බදු | | (948.89) | (46.58) | (357.34) | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් ලද/(භාවිත කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහ** | | 36,843.13 | 14,542.96 | 36,278.46 | 14,106.98 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් ලද / (භාවිත කරන ලද) මුදල් ප්‍රවාහ** | | | | | |
| ලද පොලිය | | 52.04 | 419.22 | 23.39 | 396.73 |
| දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම | | (1,227.76) | (490.55) | (1,166.66) | (365.11) |
| (ආයෝජන) / කෙටි කාලීන ආයෝජන තැන්පතු උපලබ්ධි වීම | | (167.61) | (329.13) | (167.61) | (329.13) |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත් කරගැනීම | | (14.86) | (32.15) | (12.44) | (31.68) |
| වත්කම පාවිච්චි කිරීමේ හිමිකම් අත්පත් කරගැනීම | | - | (19.46) | - | (19.46) |
| දේපළ, පිරියත සහ උපකරණ හා අස්පෘශ්‍ය වත්කම් බැහැර කිරීමෙන් ලද මුදල් | | (5.05) | 12.62 | (5.05) | 10.86 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලදී භාවිත කරන ලද ශුද්ධ මුදල්** | | (1,363.24) | (439.45) | (1,328.37) | (337.79) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් ලද / (භාවිත කරන ලද) මුදල් ප්‍රවාහ** | | | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර විකුණුම් වෙතින් උත්පාදන | | - | 17,317.57 | - | 17,317.57 |
| පොලී දරන වගකීම් ආපසු ගෙවීම | | (4,034.96) | (7,475.82) | (4,034.96) | (7,474.82) |
| කල්බදු වගකීම් ආපසු ගෙවීම | 15.3 | (23,951.12) | (18,623.57) | (23,855.88) | (18,678.12) |
| පොලී දරන ණය හා ණය ලබාගැනීම් වෙතින් ලද මුදල් | | - | 200.75 | - | 200.75 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් ලද / (භාවිත කරන ලද) ශුද්ධ මුදල්** | | (27,986.08) | (8,581.07) | (27,890.84) | (8,634.62) |
| **මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ ඉහළ යෑම/(පහළ යෑම)** | | 7,493.81 | 5,522.44 | 7,059.25 | 5,134.57 |
| **වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ** | 12. | (16,146.88) | (21,669.31) | (16,718.75) | (21,853.32) |
| **වසර අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ** | 12. | (8,653.07) | (16,146.88) | (9,659.50) | (16,718.75) |

පිටු අංක 63 සිට 112 දක්වා ඉදිරිපත් කොට ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවලට අදාළ කොටසකි.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 1. සාංගමික තොරතුරු

*1.1 සාමාන්‍ය තොරතුරු*

**සමාගම**
සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් (සමාගම) ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සීමාසහිත වගකීම් සහිත සමාගමකි. සමාගමෙහි ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ශ්‍රී ලංකාවේ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි, ගුවන් සේවා මධ්‍යස්ථානයේ පිහිටා ඇත.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් යනු සමූහයේ සමස්ත පරිපාලක සමාගම වේ.

**පරිපාලිතය - සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම**
ශ්‍රීලංකන් කේටරින් සමාගම (පරිපාලිතය) යනු ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි පූර්ණ පරිපාලිත සමාගමක් වන අතර, එය ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සහ නේවාසික සීමිත වගකීම් සහිත සමාගමකි. සමාග මෙහි ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ශ්‍රී ලංකාවේ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි, ගුවන් සේවා මධ්‍යස්ථානයේ පිහිටා ඇත.

*1.2 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය*

**සමාගම**
සමාගමේ මූලික කාර්යභාරය වනුයේ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහකයා වශයෙන් මගීන් ප්‍රවාහනය කිරීම සඳහා නිශ්චිත සහ නිශ්චිත නොවන කාලසටහනකට අනුව ගුවන් සේවා පවත්වාගෙන යාම සහ, භාණ්ඩ සහ තැපැල් ප්‍රවාහනය කිරීම වේ. එහි අනෙකුත් ප්‍රධාන කටයුතු වනුයේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ (“BIA”) සහ මත්තල රාජපක්ෂ ගුවන්තොටුපළේ (“MRIA”) ගුවන් පර්යන්ත සේවා සැපයීම, ගුවන් යානා තුළ තීරුබදු රහිත භාණ්ඩ විකිණීම, අභ්‍යන්තර සහ බාහිර සංචාරක නිවාඩු පැකේජ අලෙවි කිරීම වේ. සමාග මේ උපකාරී සේවා කටයුතු වනුයේ තෙවන පාර්ශවවලට නඩත්තු සේවා සැපයීම, ගුවන්යානා මෙහෙයුම් සේවා සහ ගුවන් සේවා ආශ්‍රිත පුහුණු වැඩසටහන් මෙහෙයවීම යනාදිය වේ.

**පරිපාලිතය - සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම**
සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගමෙහි (පරිපාලිතය) මූලික කාර්යභාරය වනුයේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සහ මත්තල රාජපක්ෂ ගුවන්තොටුපළ හරහා ක්‍රියාත්මක වනු ලබන ගුවන් සේවා සඳහා ආහාරපාන සේවාවන් සැපයීමයි. අනෙකුත් සහායක කටයුතු සඳහා මහජන සහ අතරමැදි මගී සංක්‍රමණ අවන්හල් පවත්වාගෙන යාම, ලොන්ඩරි සේවා ලබාදීම සහ අතරමැදි මගී සංක්‍රමණ හෝටලය කළමනාකරණය කිරීම ඇතුළත් වේ.

*1.3 මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදුන් දිනය*
2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023 ඔක්තෝම්බර් 23 දින අනුමැතිය ලබාදෙන ලදී.

## 2. පොදු ගිණුම්කරණ ප්‍රමිතීන්

*2.1. පිළියෙල කිරීමේ පදනම*
සාධාරණ අගය මත ගණනය කර ඇති ඉඩම් සහ ගොඩනැගිලි සහ ගුවන්යානයේ මුළුතැන්ගෙයි උපකරණ ඇතුළු සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ, උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇති අතර, එසේ නොමැති නම් අවස්ථා සඳහන් කොට ඇත.

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත්කොට ඇති අතර එසේ නොමැති අවස්ථා සඳහන් කර ඇත.

2.1.1 අඛණ්ඩ පැවැත්ම
සමාලෝචනය කරනු ලබන වර්ෂය තුළදී 2023 මාර්තු 31 දිනට සමූහය විසින් රු. මිලියන 71,306.66 ක අලාභයක් (2022- රු. මිලියන 163,583.08) සහ රු. මිලියන 601,781.56ක සමුච්චිත අලාභයක් (2022- රු. මිලියන 529,212.71) වාර්තා කරන ලදී. එමෙන්ම සමූහයේ ජංගම වගකීම් රු. මිලියන 418,568.67 (2022 - රුපියල් මිලියන 292,420.15) කින් එහි ජංගම වත්කම් ඉක්මවූ අතර, වාර්තා කරන දිනයට අනුව සමූහයේ මුළු හිමිකම් රු. මිලියන 494,429.99 (2022 - රුපියල් මිලියන 426,423.83) ක ඍණාත්මක අගයක් දක්වා සංකෝචනය වී ඇත.

2023 මාර්තු 31 දිනට සමාගම විසින් රු. මිලියන 73,621.53 ක අලාභයක් (2022 - රුපියල් මිලියන 166,369.68) සහ රු. මිලියන 612,376.11 ක සමුච්චිත අලාභයක් (2022 - රුපියල් මිලියන 537,505.15) ක් වාර්තා කරන ලදී. එමෙන්ම සමාගමේ ජංගම වගකීම් රු. මිලියන 431,624.55 (2022 - රු. මිලියන 302,702.50) කින් එහි ජංගම වත්කම් ඉක්මවා ඇති අතර වාර්තා කරනු ලබන දිනට සමාගමේ මුළු වගකීම් රු. මිලියන 509,174.88 (2022- රු. මිලියන 437,036.92) ක ඍණාත්මක අගයක් දක්වා සංකෝචනය විය (2022- ඍණ රු. මිලියන 437,036.92).

සමාගමේ මූලික ව්‍යාපාර කටයුත්ත වන මගී ප්‍රවාහනය, 2020 සහ 2021 වර්ෂයන්හිදී ඇති වූ වසංගත තත්ත්වය සහ ලොව පුරා පැවති සංචාරක සීමා හේතුවෙන් දැඩි බාධාවන්ට මුහුණ පාන ලදී. කෙසේ වෙතත් වසංගත තත්ත්වයේ උච්චතම අවස්ථාව තුළ රටවල් අතර පනවා තිබූ දැඩි දේශසීමා පාලනයන් ලිහිල් කිරීමත් සමඟ 2022 වර්ෂයේ පළමු මාස හතර තුළ මගී ගමනාගමනය ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත් විය. කෙසේ වෙතත්, 2022 වර්ෂය තුළ රටේ ආර්ථිකය දැඩි අහිතකර තත්ත්වයකට මුහුණ දුන් අතර, රජය විසින් 2022 අප්‍රේල් මාසයේදී ජාත්‍යන්තර ණය දෙන්නන්ට ගෙවිය යුතු ස්වෛරී ණය ලබා දීම සඳහා තනි පාර්ශ්වික පමා සහනයක් ප්‍රකාශයට පත් කෙරුණි. සමාලෝචනය කරනු ලබන වසර තුළ මාස දෙකක් පුරා ජෙට් ඉන්ධන සම්පූර්ණයෙන් නොලැබීම ඇතුළුව රට තුළ සමාජයීය නොසන්සුන්තාව සහ ඉන්ධන හිඟය සමාගමේ ආදායම් උත්පාදන හැකියාව කෙරෙහි සැලකිය යුතු ලෙස ඍණාත්මක බලපෑමක් ඇති කළ අතර ගුවන් සේවා මෙහෙයුම් පිරිවැය ඉහළ ගියේය. මෙම කාලය තුළ බොහෝ රටවල් විසින් සංචාරයන් සිදු නොකිරීමට උපදේශන නිකුත් කළ අතර, එය රට තුළට පැමිණෙන ජාත්‍යන්තර සංචාර සඳහා බලපෑම් ඇති කළේය.

රජය විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාකච්ඡා සිදු කළ අතර, එය 2022 සැප්තැම්බර් මාසයේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ කාර්ය මණ්ඩල මට්ටමේ ගිවිසුමකට එළැඹීමත් සමඟ අවසන් විය. එතැන් පටන් ආර්ථික තත්ත්වය ක්‍රමයෙන් දියුණු වූ අතර, වසර අග භාගය වන විට සංචාරයන් සිදු නොකිරීමට ලබා දුන් උපදේශන ක්‍රමානුකූලව ඉවත් කෙරිණ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂයේ අවසාන භාගයේදී මෙරටට ජාත්‍යන්තර

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

ගුවන් ගමන්, වේගයෙන් යථා තත්ත්වයට පත් විය.

සමාගම සඳහා ශ්‍රී ලංකා රජය (GOSL) අඛණ්ඩව සහය දුන් අතර, 2023 මාර්තු 13 වැනි දින පැවති කැබිනට් රැස්වීමේදී සමාගමේ කොටස් ප්‍රතිව්‍යුහගත කිරීමට සහ/හෝ ඉවත් කිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලදී. රජය වෙනුවෙන් ප්‍රතිව්‍යුහගත කිරීමේ/ ඉවත් කිරීමේ කටයුතු සිදු කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති (MoF) අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍ය සතු ව්‍යවසාය ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකය වෙත (SOERU) බලය ලබා දී ඇත. ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ පළමු පියවර ලෙස, රුපියල් බිලියන 102.5 ක ප්‍රාග්ධන වෙන් කිරීමක් 2023 ජුනි 26 දිනැති තීරණය මගින් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ අතර එය සම්පූර්ණයෙන්ම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට (CPC) නොගෙවූ ණය පියවීම වෙනුවෙන් භාවිත කළ යුතුය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට විසින් කලින් අය කරන ලද පොලී අනුපාත මත පදනම්ව වසරකට ඇ.ඩො මිලියන 36 ක පමණ පොලී පිරිවැයක් ඉතිරි වනු ඇතැයි මෙමගින් අපේක්ෂා කෙරේ. කැබිනට් තීරණයට අනුව, මෙම ක්‍රියාවලිය 2023 දෙසැම්බර් 15 වන විට අවසන් කළ යුතු අතර, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් 2023 මැයි මාසයේ සිට හිඟ ණය සඳහා පොලී එකතු කිරීම නවතා ඇත. සමාගමේ සෙසු ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳව SOERU/MoF සමඟ සාකච්ඡා සිදු වෙමින් පවතී. තවද, 2023 ජූලි 10 දිනැති කැබිනට් මණ්ඩලයේ තීරණය මගින්, සමාගමේ කොටස් හිමිකම ඉවත් කිරීම සඳහා රජයේ ගනුදෙනු උපදේශක ලෙස ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (IFC) පත් කිරීමට අනුමැතිය ලබා දී ඇත.

සමාලෝචිත වර්ෂය තුළදී, කෙටි කාලීන ණය පහසුකම් සැපයීමත් සමඟ රාජ්‍ය බැංකු දෙකට වාසිදායක ලෙස, එම කාල සීමාව තුළ කල් ඉකුත් වූ, ඇමරිකානු ඩොලර් මිලියන 359 ක් සහ රුපියල් බිලියන 117 ක් වටිනා සියලු සහනදායී ලිපි සහ භාණ්ඩාගාර ඇපකර, මහා භාණ්ඩාග ාරය හරහා නැවත නිකුත් කිරීමට ශ්‍රී ලංකා රජය විසින් අනුමැතිය ලබා දෙන ලදී.

2022 නොවැම්බර් 28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින්, ගුවන් යානා ප්‍රතිස්ථාපනය හරහා ගුවන් යානා දහයකට නොඅඩු ගුවන් යානා ඇණිය ප්‍රතිස්ථාපනය කිරීම හෝ දැනට පවතින ගුවන් යානා කල්බදු කාලසීමාව දීර්ඝ කිරීම හෝ ඒ දෙකම සිදු කිරීමට ශ්‍රී ලංකා රජය විසින් අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, සමාගම විසින් අවශ්‍ය ගුවන් යානා කල්බදු පදනම මත ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ආරම්භ කර ඇති අතර පටු බඳ සහිත ගුවන් යානා දෙකක් බදු දීම සඳහා සහ දැනටමත් කල්බදු පදනම මත ලබා ගෙන ඇති පටු බඳ සහිත ගුවන් යානා තුනක කල්බදු කාලය දීර්ඝ කිරීම සඳහා කල්බදු විධිවිධාන සකස් කිරීමට මේ වන විට කටයුතු කරමින් සිටී. පුළුල් බඳ සහිත ගුවන් යානා බදු දීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු වෙමින් පවතී.

තවද, 2023 ජුනි 5 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මඟින් සහ 2023 සැප්තැම්බර් 21 දින භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය මඟින් ශ්‍රී ලංකා රජය විසින් සමාගමෙහි යෝජිත ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාවට නැංවීම අවසන් වන තෙක් සිය මෙහෙයුම් කටයුතු අඛණ්ඩ පැවැත්මක් වශයෙන් කරගෙන යාමට අවශ්‍ය මූල්‍ය ආධාර අඛණ්ඩව ලබා දෙන බව තහවුරු කර ඇත.

මෙහෙයුම් පරිසරයේ සැලකිය යුතු දියුණුවක් සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීම ඇතුළුව ඉහත විස්තර කර ඇති ක්‍රියාමාර්ග තුළින් අනාගතයේදී සමාග මේ ද්‍රවශීලතා තත්ත්වය වර්ධනය කරනු ඇතැයි කළමනාකාරිත්වය විශ්වාස කරයි. ඉහත කරුණු මත පදනම්ව, අඛණ්ඩ පදනමක් මත මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම යෝග්‍ය බව අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහසයි.

### 2.1.2. අනුකූලතා ප්‍රකාශය

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයෙන් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS) අනුකූලව සකස් කර ඇත. මූල්‍ය ප්‍රකාශ සැකසීම සහ ඉදිරිපත් කිරීම, 2007 අංක 7 දරන සමාගම් පනතට අනුකූලව සිදු කරනු ලබයි.

### 2.1.3. සංසන්දනාත්මක තොරතුරු

නිසි ඉදිරිපත් කිරීම සහ වර්තමාන වසර සමග සංසන්දනයට අදාළ වූ විටක, පසුගිය වසරේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කර ඇත.

### 2.1.4 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල්

සමූහයේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කරනු ලබන විනිමය වන ශ්‍රී ලංකා රුපියල් (LKR) මගින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලබයි. සියලුම මූල්‍ය තොරතුරු සඳහන් ශ්‍රී ලංකා රුපියල් මිලියන වලින් ඉදිරිපත්කොට ඇති අතර, එසේ නොවන අවස්ථා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් - LKAS 01 හි 'මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම' මගින් අවසරදී ඇති ආකාරයට සඳහන් කොට ඇත.

### 2.2 ඒකාබද්ධකරණයෙහි පදනම

සමාගමේ සහ එහි අනුබද්ධිත සමාග ම්වල 2023 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වසරට මූල්‍ය ප්‍රකාශ වලින් මූල්‍ය ප්‍රකාශ සැකසී ඇත. ස්ථාවර ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කරමින් සමාගමේ පරිපාලිතයෙහි මූල්‍ය ප්‍රකාශ එම වාර්තාකරණ වසර සඳහා සකස් කරනු ලැබේ.

### 2.2.1 ව්‍යාපාර සංයෝජනය

අත්පත් කරගත් ක්‍රියාකාරකම් සහ වත්කම් කාණ්ඩයක් මගින් ව්‍යාපාරයක අර්ථ දැක්වීම සපුරාලන විට සහ පාලනය සමූහය වෙත පවරන විටක, අත්පත් කර ගැනීමේ ක්‍රමය භාවිත කරමින් සමූහය විසින් ව්‍යාපාර සංයෝජනයන් ගිණුම්ගත කරයි. අත්පත් කරගත් කිසියම් ක්‍රියාකාරකමක් හෝ වත්කමක් ව්‍යාපාරයක්ද නැද්ද යන්න හඳුනා ගැනීමේදී, අවම ලෙස එය ආදානයක් සහ ස්වාධීන ක්‍රියාවලියක් මෙන්ම එයට නිපැයුමක් කිරීමේ හැකියාවක් තිබේද යන්න සමූහය තක්සේරු කරනු ලබයි.

අත්පත් කරගත් ක්‍රියාකාරකම් සහ වත්කම් ව්‍යාපාරයක් නොවන්නේද යන්න සරල ලෙස තක්සේරු කිරීමට ඉඩ දෙන 'ඒකාග්‍රතා පරීක්ෂණයක්' කිරීමට සමූහයට විකල්පයක් ඇත. අත්පත් කරගත් දළ වත්කම්වල සාධාරණ අගය සැලකිය යුතු ලෙස හඳුනාගත හැකි වත්කම් හෝ සමානව හඳුනාගත හැකි වත්කම් සමූහයක් තුළ සංකේන්ද්‍රණය වී ඇත්නම් විකල්ප ඒකාග්‍රතා පරීක්ෂණය සපුරාලනු ඇත.

අත්කරගැනීම්වල පවරන ලද වටිනාකම් මෙන්ම හඳුනාගත් ශුද්ධ දළ වත්කම්ද සාමාන්‍යයෙන් සාධාරණ අගය මත මනිනු ලබයි. ඇතිවන්නා වූ ඕනෑම කීර්තිනාමයක්, හානිකරණය සඳහා වාර්ෂිකව පරීක්ෂා කරනු ලබයි. කේවල් කිරීමක ඕනෑම ලාභයක්, ලාභ සහ අලාභවල කඩිනමින් හඳුනා ගනු ලබයි. ණය හෝ අවශිෂ්ට

සුරැකුම්පතකට සම්බන්ධ වීමකදී හැර ගනුදෙනු පිරිවැය දැරූ වියදම් ලෙස සලකනු ලබයි.

පූර්ව පවත්නා සම්බන්ධතා පියවීමේ වටිනාකම් පැවරීම්වල අන්තර්ගත නොවේ. එවැනි අගයන් සාමාන්‍යයෙන් ලාභ සහ අලාභවල හඳුනාගත හැකිය.

ඕනෑම අවිනිශ්චිත වටිනාකමක්, අත්පත් කර ගැනීමේ දිනට එහි සාධාරණ අගයට හඳුනාගනු ලැබේ. අවිනිශ්චිත ගෙවීමට ඇති බැඳීම මූල්‍ය උපකරණයක නිර්වචන සමග සැසඳේ නම් සහ එය හිමිකම් වර්ගීකරණය යටතට වැටේ නම්, එවිට නැවත ගණනය නොකරන අතර ගාස්තු ගෙවීම හිමිකම් සමඟ ගිණුම්ගත කරනු ලබයි. ඒ හැරුණු කොට, අනෙකුත් ප්‍රතිලාභ හඳුනාගැනීම සෑම වාර්තාකරණ දිනකම සාධාරණ අගය මත නැවත ගණනය කරනු ලබන අතර, අවිනිශ්චිත ප්‍රතිලාභ හඳුනාගැනීමේ සාධාරණ අගයන්වල සමාගම් වෙනස්කම් ලාභ හෝ අලාභවල හඳුනා ගැනේ.

### 2.2.2 පරිපාලිතයන්

පරිපාලිතයන් යනු සමූහය විසින් පාලනය කරනු ලබන ආයතන වේ. සමූහය විසින් ආයතනයන් 'පාලනය' කරනු ලබන්නේ, එයට නිරාවරණය වූ විටක හෝ, එහි සම්බන්ධවීම තුළින් පරිපාලිතයේ විචල්‍ය ප්‍රතිලාභ සඳහා අයිතියක් ඇති විටක සහ, සිය බලය යොදවමින්, එවැනි ප්‍රතිලාභ පරිපාලිතයකට බලපෑමක් ඇති කිරීමට හැකි අවස්ථාවකය. පාලනය ආරම්භ කරන දිනයේ සිට අවසන් දිනය තෙක් පරිපාලිතයේ මූල්‍ය ප්‍රකාශ, ඒකාබද්ධ මූල්‍ය වාර්තාවේ අන්තර්ගත වේ.

### 2.2.3 පාලනයට නතු නොවන අයිතීන්

සෑම ව්‍යාපාර සංයෝජනයකදීම සමූහය විසින් අත්කර ගැනීමට අදාළ පාලනය නතු නොවන අයිතීන් ගණනය කරනු ලබන අතර, එය සාධාරණ අගය මත හෝ සමානුපාතික කොටස්වල හඳුනාගත් ශුද්ධ වත්කම්වල අගය මත ගණනය වේ. කෙසේ වෙතත් මෙය සාමාන්‍යයෙන් සාධාරණ අගය මත ගණනය වේ.

පාලනයට නතු නොවන අයිතීන් අත්පත් කර ගැනීම, හිමිකරුවන් සමග හිමිකරුගේ ධාරිතාවය මත සිදුවූ ගනුදෙනුවක් ලෙස සලකා ගණනය කරනු ලබයි. එවැනි ගනුදෙනු නිසාවෙන් කීර්තිනාමයක් හඳුනා ගත නොහැකිය. පාලනයට නතු නොවන අයිතීන්වල වෙනස්කම්, පරිපාලිතයේ ශුද්ධ වත්කම්වල සමානුපාතික අගය මත පදනම්ව ගණනය කරනු ලබයි.

සමූහයට පරිපාලිතයේ තිබෙන අයිතියේ අහිමිවීමක් ගෙන නොදෙන වෙනස්කම්, හිමිකම් ගනුදෙනුවක් ලෙස ගණනය කරනු ලබයි.

### 2.2.4 පාලනය අහිමි වීම

පරිපාලිතයේ පාලනය සමූහයෙන් ගිලිහී යන විටක, එය පරිපාලිතයේ වත්කම් සහ වගකීම් සහ එයට අදාළ NCI හා අනෙකුත් හිමිකම්වල අංග ලෙස හඳුනා නොගනී. ප්‍රතිඵලයක් ලෙස ලාභ හෝ අලාභයක් වෙතොත් එය ලාභ සහ අලාභ යටතේ හඳුනාගනු ලබයි. පෙර පරිපාලිතයේ ඕනෑම රඳවා ගන්නා ලද අයිතියක්, සාධාරණ අගය මත ගණනය කරනු ලබයි.

### 2.2.5 ඒකාබද්ධ කිරීම මත ඉවත් කළ ගනුදෙනු

අන්තර් සමූහ ශේෂයන් හා ගනුදෙනු සහ අන්තර් සමූහ ගනුදෙනු වලින් ඇතිවන උපලබ්ධි නොවූ ආදායම් සහ වියදම් ඉවත් කෙරේ. හිමිකම් ගිණුම්ගත ආයෝජිතයන් සමග ගනුදෙනුවලදී උපලබ්ධි නොවූ ලාභ, ආයෝජිතයාගේ සමූහයේ පොලිය දක්වා එම ආයෝජනවලට එරෙහිව එම හිමිකම් මත ඉවත්කරනු ලැබේ. උපලබ්ධි නොවූ අලාභ, උපලබ්ධි නොවූ ප්‍රතිලාභ ආකාරයටම ඉවත් කළද, එය හානිය පිළිබඳ සාක්ෂියක් නොමැති තෙක් පමණි.

## *2.3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රමිතීන්*

පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රමිති, මෙම මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන සියලුම කාල පරිච්ඡේදයන්ට අදාළව අඛණ්ඩව යොදා ගෙන ඇත.

### 2.3.1 සැලකියයුතු ගිණුම්කරණ ඇස්තමේන්තු, උපකල්පන සහ විනිශ්චයන්

සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් පිළිබඳ වාර්තා වූ ගණන් ප්‍රමාණ කෙරෙහි බලපෑම් කළ හැකි විනිශ්චයන්ට, ඇස්තමේන්තුවලට හා උපකල්පනයන්ට එළඹීමට සහ හෙළිදරව් කිරීම් සිදු කිරීමට සහ අවිනිශ්චිත වගකීම් පිළිබඳ අනාවරණය කිරීමට කළමනාකරණයට සිදුවේ. මෙම උපකල්පන සහ ඇස්තමේන්තු වල අවිනිශ්චිතතාව හේතුවෙන් අනාගතයේ බලපෑම් ඇති කළ හැකි වත්කම් හෝ වගකීම්වල ධාරණ අගය සඳහා ද්‍රව්‍යාත්මක ගැළපීම් සිදු කිරීමට වනු ඇත.

#### (අ) විනිශ්චයන්

**(i) අසම්භාව්‍ය වගකීම් - නඩු කටයුතු**

වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානය වන විට විවිධ පාර්ශ්වකරුවන් සමඟ සමූහය නඩු කටයුතු ගණනාවකට එළඹ ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ නීතිඥයන්ගේ උපදෙස් විමසා බැලීමෙන් අනතුරුව එක් එක් නඩු කටයුතුවල තත්ත්වය ඇගයුමට ලක් කරන අතර, අනාගතයේදී සම්පත් ගලායෑමක් පවතී යයි නිශ්චය කළහොත් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සිදු කරනු ලබයි.

ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන් සහ සේවකයින් විසින් සමූහයට එරෙහිව සිදු කරන නෛතික ක්‍රියාමාර්ග, වෙනත් හිමිකම් ඉල්ලීමක් සහ විය හැකි හිමිකම් ඉල්ලීම් සම්බන්ධයෙන්, සමූහයේ ව්‍යාපාර කටයුතුවලට ඇති වන කිසියම් අවිනිශ්චිත සැලකිය යුතු බලපෑමක් අධ්‍යක්ෂවරුන් අපේක්ෂා නොකරන කාරණා සඳහා, අදාළ මුදල් ප්‍රමාණයන් සටහන 25.2 හි හෙළිදරව් කර ඇත.

**(ii) කල්බදු**

කොන්ත්‍රාත්තුවක් තක්සේරු කරනු ලබන්නේ කොන්ත්‍රාත්තුවක් හෝ කල්බදු ක්‍රමයක් ද යන්න බැලීම සඳහාය. හඳුනාගත් වත්කම් කිසියම් කාල සීමාවකට යම් වටිනාකමක් වෙනුවෙන් භාවිතය සහ පාලනය කිරීමට අයිතියක් ප්‍රකාශ කරන්නේ නම් එය කොන්ත්‍රාත්තුවක් හෝ කල්බදු වේ. කොන්ත්‍රාත්තුවක් හඳුනාගත් වත්කමක් පාලනයට අයිතිය ප්‍රකාශ කරන්නේද යන්න තීරණය කිරීමට සැලකිය යුතු සාධකයන් වන්නේ, කොන්ත්‍රාත් පදනම අනුව හඳුනාගත් වත්කම් භාවිතයට ගැනීමට, භාවිත කාලය පුරාම තක්සේරුව භාවිත කරමින් සියලු ආර්ථික වාසි ලබා ගැනීමට මෙන්ම තක්සේරුවන් ඍජුව භාවිත කිරීමට සමූහයට අයිතියක් ඇත.

#### (ආ) ඇස්තමේන්තු

**(i) දේපළ, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් ක්ෂය වීම/ක්‍රමක්ෂය**

වත්කම්වල අපේක්ෂිත ප්‍රයෝජනය හා ආර්ථික ආයුකාලය පදනම් කර ගනිමින් දේපළ, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වලට, ඒවාට යම් ඵලදායී ජීවකාලයක් හා අවශේෂ වටිනාකමක් කළමනාකරණය විසින් පවරනු ලබයි. දේපළ, පිරියත හා උපකරණ යනාදියට අයත් අවශේෂ අගය සහ ඵලදායී ජීවකාලයද එක් එක් වාර්තා කරන දිනට

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

ඒවායේ ක්ෂයවීම්/ක්‍රමක්ෂය ක්‍රමයද කළමනාකරණය විසින් සමාලෝචනය කරන අතර, මෙම වත්කම් සඳහා පෙර සිදුකළ ඇස්තමේන්තු හා ඒවායේ අයිතමයන් තුළ අඩංගු ආර්ථික ප්‍රතිලාභවල පරිභෝජන රටාව සමග එය අනුගත වන බවටද සහතික කරනු ලබයි. මෙම වත්කම්වල ඵලදායී ජීවකාලය හා අවශේෂ වටිනාකම්වල වෙනස්කම් අනාගත ක්ෂය අයකිරීම්හි සංශෝධනවලට හේතුවිය හැකිය. (2.4.3 (ආ) සහ 2.4.4 ප්‍රතිපත්ති විමසා බලන්න).

**(ii) නිරන්තර පියාසර වැඩසටහන**

ලකුණු ප්‍රදානයන් (Award Credits) ආදායමෙහි වෙනම හඳුනාගැනෙන සංරචකයක් වශයෙන් ගිණුම්ගත කෙරේ. ලකුණු ප්‍රදාන සඳහා වෙන්කළ අදාළ ප්‍රතිෂ්ඨාව ඒවායේ සාධාරණ අගය මත පදනම්ව වෙන්කරනු ලබන අතර, ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වගකීමක් (විලම්බිත ආදායමක්) ලෙස ගිණුම්ගත කෙරේ.

සැතපුම් ලකුණු ප්‍රදානවල (Mile Credits) සාධාරණ අගය නිශ්චය කිරීම සඳහා ඇස්තමේන්තුකරණ ශිල්ප ක්‍රම භාවිත කරන අතර, අංශයක් (Sector) සඳහා ගාස්තුව, ඉහළ පංතියක ආසනයක් ලබාගැනීම සහ හවුල්කාර ප්‍රදාන වැනි සාධක ගණනාවක් සඳහා බර තැබූ සාමාන්‍යයක් නිරූපණය කෙරේ. සාධාරණ අගය ගණනයට අදාළ පදනම වශයෙන් ඓතිහාසික ප්‍රවණතාවන් යොදා ගැනේ.

සාමාජික සාමාජිකාවන් විසින් නිදහස් කරගනු ලැබෙතැයි අපේක්ෂා නොකරන සැතපුම් සඳහා සහ කල් ඉකුත් සැතපුම් සඳහා, සැතපුම්වල සාධාරණ අගය වෙනුවෙන් ගැළපුම් සිදු කෙරේ.

සැතපුම්වල සාධාරණ අගය නිශ්චය කිරීමෙහිලා යොදාගැනෙන යෙදවුම්වල විවිධත්වය හේතුවෙන් කළමනාකරණ විසින් විනිශ්චයන් ක්‍රියාවට නංවනු ලැබේ.

**(iii) නඩත්තු සංචිතය**

නඩත්තු සම්බන්ධයෙන් වූ එකඟත්වයට පත් කොන්දේසි මත පදනම්ව, මෙහෙයුම් කල්බදු යටතේ පවත්නා ගුවන් යානා හා එන්ජින් කීපයක් වෙනුවෙන් අදාළ බදුකරුවන්ට සමාගම විසින් මාසික ගෙවීම් සිදු කරයි. මෙම මාසික ගෙවීම් පදනම් වනුයේ පියාසර කරන ලද පැය ගණන හෝ චක්‍ර ගණන හෝ ගත වූ කාලය අනුවය. ආපසු අයකර හැකි වටිනාකම්වල වඩාත් යෝග්‍ය ඇස්තමේන්තු මත පදනම්ව එකී ගෙවීම්වල ආපසු අයකර ගැනීමේ හැකියාව පිළිබඳව කළමනාකරණය කලින් කල ඇගයීම් සිදු කරයි. කිසියම් වත්කමක ධාරණ අගය එහි ආපසු අයකර ගතහැකි මුදල ඉක්මවන විට, එම වත්කම හානිකරණය වූ වත්කමක් සේ සලකා එය ආපසු අයකර ගත හැකි වටිනාකම දක්වා ලියා හැරේ (සටහන 6 විමසා බලන්න).

**(iv) ගුවන් යානා නඩත්තු සහ අළුත්වැඩියා පිරිවැය සඳහා වෙන්කිරීම**

නඩත්තු කටයුතු සඳහා එකඟත්වයට පත් කල්බදු ගිවිසුම් කොන්දේසිවලට අනුව ගුවන්යානා බඳ, ගුවන්යානා එන්ජින් හා ඒවායේ ගොඩබෑසුම් උපකරණ සම්බන්ධ විශාල නඩත්තු කටයුතු ඉටු කිරීමට සමාගම බැඳී සිටී. පිරික්සුමේ ස්වාභාවය මත භාවිතය සහ කාලය යෙදවීම මත පදනම්ව මූල්‍ය ප්‍රකාශ තුළ විශාල නඩත්තු කටයුතු ආශ්‍රිත පිරිවැය සඳහා වන ප්‍රතිපාදන සිදුකරයි. මෙම ප්‍රතිපාදන තීරණය කිරීමෙහිදී, අදාළ පරීක්ෂා කිරීම සිදු කිරීමේ අවස්ථාවේදී පවත්නා වත්කම්වල ඇස්තමේන්තුගත තත්ත්වය මත, යෙදවිය යුතු අමුද්‍රව්‍ය හා දැරිය යුතු පොදුකාර්ය පිරිවැය මත සහ අදාළ පරීක්ෂා කිරීම් සිදු කළ යුතු වන්නාවූ අවස්ථාව මත සුදුසු උපකල්පනවලට එළඹේ. මෙම උපකල්පනවලට එළඹෙනුයේ අතීත අත්දැකීම් මත වන අතර, ඒවා සත්‍ය මට්ටමට ආසන්න බව තහවුරු කරගැනීම සඳහා නිරන්තර සමාලෝචනයට ලක්කරනු ලැබේ. ප්‍රතිපාදන කෙරෙහි සැලකිය යුතු අයුරින් බලපෑම් ඇතිකරන උපකල්පන හා ඇස්තමේන්තු කිරීම් තුළ සිදුවන යම් සංශෝධන වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශ තුළ ගැළපීම් සිදුකරනු ලැබේ. (සටහන 16.2 විමසා බලන්න).

**(v) ගුවන් යානා ආපසු ලබා දීමේ කොන්දේසි සඳහා විධිවිධාන**

කල්බදු ගිවිසුම්වල නිශ්චිතව දක්වා ඇති යම් කොන්දේසියක් යටතේ කල්බදු ගුවන් යානා නැවත ලබා දීමට සමාගම බැඳී සිටී. ගුවන් යානා ආපසු ලබා දීමේ කොන්දේසිවලට අපේක්ෂිත පිරිවැය, තීව්‍ර කිරීමේ අනුපාත, අපේක්ෂිත වගකීම් කල් පිරීම හා සර්ලන වට්ටම් අනුපාත සම්බන්ධ උපකල්පන ඇතුළත් වේ. ප්‍රතිපාදනය පිළිබඳ තීරණය කිරීමේදී, නැවත භාරදීමේ කාලසීමාව වන විට වත්කමේ ඇස්තමේන්තුගත තත්ත්වය, දැරීමට සිදුවන ද්‍රව්‍ය හා පොදු කාර්ය පිරිවැය සහ නැවත භාරදීම සිදු කරන වේලාව මත උපකල්පන කරනු ලැබේ. මෙම උපකල්පන අතීත අත්දැකීම් මත පදනම්ව පිහිටුවා ඇති අතර ඒවා සත්‍ය තත්ත්වයට ආසන්න බව සහතික කිරීම සඳහා වාර්ෂිකව සමාලෝචනය කෙරේ. ප්‍රතිපාදනයට ද්‍රව්‍යමය බලපෑමක් ඇති කරනු ලබන උපකල්පනවල සහ ඇස්තමේන්තුවල පවතින කිසියම් සංශෝධනයක් වේ නම් එය ඉදිරි මූල්‍ය ප්‍රකාශවල සකස් කරනු ලැබේ.

**(vi) ගුවන් ප්‍රවාහන සේවා ආශ්‍රිත සෘජු මෙහෙයුම් වියදම් සඳහා වෙන්කිරීම**

ගුවන් ප්‍රවාහන සේවා මෙහෙයුම් කටයුතු වලදී ඉන්ධන ගාස්තු, ගොඩබිම් මෙහෙයුම් සේවා සඳහා ගාස්තු, ගොඩබෑම් හා නවතා තැබීමේ ගාස්තු, ගුවන්යානා තුළ ආහාර පාන, ප්‍රවේශපත්‍ර වෙන්කරවා ගැනීමේ පද්ධති ගාස්තු සහ තොරතුරු තාක්ෂණය ආශ්‍රිත ගාස්තු වැනි සෘජු වියදම් සම්බන්ධයෙන් වූ විවිධ ප්‍රතිපාදන වෙන්කිරීම අනිවාර්යයෙන්ම සිදු කළ යුතුය. ඊට අදාළ ඇස්තමේන්තු හා ඒ ආශ්‍රිතව යොදා ගැනෙන උපකල්පන අවස්ථානුකූල පරිදි සාධාරණ වේයැයි විශ්වාස කෙරෙන බොහෝ අනිකුත් සාධක මතද පදනම් වන අතර, ඉන් උද්ගත වන ප්‍රතිඵල වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී වගකීම්වල ධාරණ අගය මත ප්‍රතිපාදන වෙන් කිරීම සිදුවේ.

**(vii) තොග**

සමූහය විසින් භෞතික පරීක්ෂා කිරීම් සහ කල් ඉකුත්වීම් මත පදනම්ව තොගවල පැවැත්ම හා ප්‍රයෝජනවත්භාවය, සමාලෝචනය කරයි. කළමනාකරණය විසින් යල්පැන ගිය තොග නිශ්චය කළ විටක ප්‍රතිපාදන සිදුකරයි.

**(viii) මූල්‍ය වත්කම්වල හානිකරණය**

යම් වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණයට පත්වී ඇති බවට යම් සාක්ෂි තිබේදැයි සොයා බැලීමට එක් එක් වාර්තා කරන දිනට සමූහය විසින් තක්සේරු කිරීම් සිදු කරයි. නොගෙවා ඇති කාල සීමාව, ආරක්ෂාව සහ ඒවා ආපසු අයකර ගැනීමට ඇති හැකියාවේ අවිනිශ්චිතභාවය සම්බන්ධයෙන් පවත්නා කළමනාකරණය දන්නා වෙනත් සාධක මත එම හානිකරණය ඇස්තමේන්තු කිරීමට සිය විනිශ්චය කළමනාකරණය විසින් භාවිත කරනු ලබයි.

**(ඇ) උපකල්පන**

**(i) නිර්වචනිත ප්‍රතිලාභ සැලැස්ම**

ශ්‍රී ලංකාවේ සිට සේවය කරන කාර්ය මණ්ඩලවලට අයත් විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්මෙහි පිරිවැය තීරණය කෙරෙනුයේ

ආයුගණන තක්සේරුවක් ආශ්‍රයෙනි. එම ආයුගණක තක්සේරුව පදනම් වනුයේ පොලී අනුපාතය, වැටුප් වර්ධන අනුපාතය, විශ්‍රාම ගැනීමේ වයස හා සමාගමේ අඛණ්ඩ පැවැත්ම යන කරුණුවලට අදාළ උපකල්පන මතය. සැලසුමෙහි පවත්නා දිගු කාලීන ස්වභාවය හේතුවෙන් එබඳු ඇස්තමේන්තු සැලකිය යුතු මට්ටමේ අවිනිශ්චිතතාවලට යටත් වේ. (2.4.16 (අ) සටහන විමසා බලන්න.)

**(ii) දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය**

ස්වාධීන සුදුසුකම් ලත් තක්සේරුකරුවෙකුගේ සේවය ලබා ගනිමින් ඉඩම් සහ ගොඩනැගිලිවල සහ ගුවන් යානා මුළුතැන්ගෙයි උපකරණ ප්‍රත්‍යාගණන අගය මත මිනුම් ලැබේ. සාධාරණ අගය තීරණය කිරීම පිණිස එකී තක්සේරුකරු විසින් උපකල්පන සහ තක්සේරු ශිල්ප ක්‍රම භාවිත කරනු ලැබේ. අදාළ තක්සේරු කිරීමේ පදනම සටහන 3 හි හෙළිදරව් කර ඇත.

## 2.4 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති ආශ්‍රිත සාරාංශය

### 2.4.1 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය

සමූහයේ ක්‍රියාත්මක වන හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇත. විදේශ ව්‍යවහාර මුදලින් සිදුවන ගනුදෙනු ඒවා සිදුවන දිනයට වලංගු ක්‍රියාත්මක ව්‍යවහාර මුදල් අනුපාතයට අනුව මූලික වශයෙන් වාර්තා කරයි. විදේශ ව්‍යවහාර මුදලින් ඇති මූල්‍ය වත්කම් හා වගකීම් වාර්තා කරන දිනයට වලංගු ක්‍රියාත්මක ව්‍යවහාර මුදල් අනුපාතයට නැවත පරිවර්තනය කරනු ලබයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ලාභ සහ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදලක ඓතිහාසික පිරිවැයට ගණනය කෙරෙන මූල්‍යමය නොවන අයිතම, අදාළ මුල් ගනුදෙනුව සිදුවූ දිනයේ පැවති විනිමය අනුපාත භාවිතයට ගනිමින් පරිවර්තනය කරනු ලැබේ.

### 2.4.2 බදුකරණය

ආදායම් බදුවල ප්‍රවර්තන සහ විලම්බිත බදු අඩංගු වේ. එය ව්‍යාපාර සංයෝජනයකට සම්බන්ධවන ප්‍රමාණයට හෝ හිමිකම් හෝ OCI හි සෘජුවම හඳුනාගත් අයිතමයක් නොවන අවස්ථාවක ලාභ හෝ අලාභයේ හඳුනාගනු ලැබේ. අවිනිශ්චිත බදු පිරියම් ඇතුළුව අදායම් බදුවලට සම්බන්ධ පොලී සහ දඩ මුදල්, ආදායම් බදුවල අර්ථකථනයට නොග ළපෙන බව සමූහය තීරණය කර ඇති හෙයින් එය LKAS 37 ප්‍රතිපාදනයෙහි අවිනිශ්චිත වගකීම් සහ වත්කම් යටතේ ගිණුම්ගත කර ඇත.

**(i) ප්‍රවර්තන ආදායම් බදු**

ප්‍රවර්තන බදු යනු වසර සඳහා බදු ගෙවිය යුතු ආදායම හෝ වියදම මත අපේක්ෂිත බදු ගෙවීම් හෝ ආදායම් බදුවල ලැබිය යුතු සහ පෙර වසරට අනුව ගෙවිය යුතු බදු හෝ ලැබිය යුතු බදු සඳහා ඕනෑම වෙනස් කිරීමක් වේ. ප්‍රවර්තන බදු ගෙවිය යුතු හෝ ලැබිය යුතු ප්‍රමාණයන් යනු ආදායම් බදු සම්බන්ධ අවිනිශ්චිතතාවයක් පවතී නම් පිළිබිඹු කරනු ලබන ගෙවීමට හෝ ලැබීමට අපේක්ෂිත බදු ප්‍රමාණයන්වල සුදුසුතම තක්සේරුවයි. වාර්තාකළ දිනයට පැනවූ බදු අනුපාතික හෝ නිත්‍ය ලෙස පැනවීම් පාදක කරගනිමින් එය මිනුම් ලැබේ. ලාභාංශයෙන් ඇතිවන ඕනෑම බදු ප්‍රමාණයක් ප්‍රවර්තන බදුවල අන්තර්ගතය.

කිසියම් නිර්ණායකයක් තිබේ නම් පමණක්, ප්‍රවර්තන බදු වත්කම් හෝ වගකීම්වලට හිලව් කරගනු ලැබේ.

**සමාගම**

**(අ) දේශීය බදුකරණය**

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත බලාත්මක වීම සමඟ 2018 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සියලුම ව්‍යාපාර කටයුතු සඳහා ආදායම් බදු ගෙවීමේ වගකීමක් සමාගම සතු වේ.

**(ආ) විදේශීය බදුකරණය**

දැනට ද්විත්ව බදු ගිවිසුම් ක්‍රියාත්මක නොවන රටවල් තුළ තම මෙහෙයුම් කටයුතු මත බදු ගෙවීමේ වගකීමට සමාගම යටත් වේ.

**පරිපාලිත සමාගම - ශ්‍රීලංකන් කේටරින් සමාගම**

ගුවන්යානා මුළුතැන්ගෙයි සහ ගුවන් යානාස්ථ ආහාර සැපයුම වෙතින් ලැබෙන ආදායම 2021 මැයි 31 දක්වා ආදායම් බද්දෙන් නිදහස් කොට ඇති අතර, ඉන් පසු ආයෝජන මණ්ඩලය (BOI) සමඟ ඇති කර ගත් ගිවිසුම අනුව 2029 මාර්තු 29 දිනෙන් අවසන් වන වසර අටක කාලයක් සඳහා 15%ක සහනදායී අනුපාතයට බදු ගෙවිය හැකිය. වෙනත් මූලයන් වෙතින් උපයන ආදායම සාමාන්‍ය බදු අනුපාත යටතේ බදු වගකීමට බැඳේ.

**(ii) විලම්බිත ආදායම් බදු**

වත්කම් සහ වගකීම්වල බදු පදනමේ සහ ඒවායේ මූල්‍යමය වාර්තාකරණ කාර්යයන් සඳහා වූ ධාරණ අගයන් අතර වාර්තා කරන දිනට පවත්නා තාවකාලික වෙනස්කම් පිළිබඳ වගකීම් ක්‍රමවේදය භාවිත කරමින් විලම්බිත ආදායම් බදු වෙන්කිරීම් කෙරේ.

විලම්බිත බදු, වාර්තාකරණ දිනයට පනවන ලද හෝ නිත්‍ය ලෙස පනවන ලද නීති මත පදනම්ව, ප්‍රතිවර්තනය කරන අවස්ථාවක තාවකාලිකව වෙනස් කිරීම සඳහා යොදා ගැනීමට අපේක්ෂා කරන බදු අනුපාතික අනුව ගණනය කරනු ලබයි.

භාවිත නොකළ බදු අලාභයන් සහ අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු වත්කම් පිළිගනු ලබන අතර, ඒවා ප්‍රයෝජනට ගත හැකි අනාගත බදු ආදායම් වලට එදිරිව භාවිත කළ හැකිය. විලම්බිත බදු වත්කම් වාර්තා කරන දිනයට විමර්ශනය කරන අතර අදාළ බදු ප්‍රතිලාභයන් තැබිය හැකි, තවදුරටත් සම්භාවි විය නොහැකි වන තෙක් අඩුකරනු ලබයි.

### 2.4.3 දේපළ, පිරියත සහ උපකරණ

**(අ) පිරිවැය සහ තක්සේරු කිරීම**

දේපළ, පිරියත සහ උපකරණ සියලුම අයිතම මූලික වශයෙන් පිරිවැයට වාර්තා කරනු ලබයි. අත්පත්කර ගැනීම් හෝ ඉදිකිරීම සඳහා සෘජුව ආරෝපණය කළ හැකි වියදම් පිරිවැයට ඇතුළත් වේ. ඉඩම් හා ගොඩනැගිලි සහ ගුවන්යානා මුළුතැන්ගෙයි උපකරණ යනාදිය පසුකාලීනව ප්‍රත්‍යාගණනය කරනු ලබන අවස්ථාවේදී, එවැනි දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රත්‍යාගණිත අගයෙන් යම් ක්ෂයවීම් සහ හානිකරණයන් අඩුකර ගෙන යනු ලැබේ. අනෙකුත් සියලු දේපළ, පිරියත සහ උපකරණ ඓතිහාසික පිරිවැයෙන්, ක්ෂයවීම් සහ/හෝ සමුච්චිත හානිකරණ අලාභ ඇතොත් ඒවාද අඩු කිරීමෙන් ලබා ගනී.

සමාන වත්කමකට අයත් මීට පෙර ලාභ අලාභ ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති ප්‍රත්‍යාගණන අඩුවීමක් කරා එය ප්‍රතිවර්තනය වන තෙක් හැරුණුවිට, ඉඩම්, ගොඩනැගිලි සහ ගුවන් යනාස්ථ මුළුතැන්ගෙහි උපකරණ ප්‍රත්‍යාගණන අගයට ගණනය කරන අතර, ඕනෑම ප්‍රත්‍යාගණන අතිරික්තයක් වෙනත් විස්තීරණ ආදායම් තුළ හඳුනා ගන්නා

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

අතර හිමිකම තුළ වූ ප්‍රත්‍යාගණන සංචිතය තුළ සමුච්චිත කරනු ලැබේ. ප්‍රත්‍යාගණන ඌනතාවයක් ලාභ අලාභ ප්‍රකාශය තුළ හඳුනා ගැනෙනුයේ, වත්කම් ප්‍රත්‍යාගණන සංචිත තුළ හඳුනාගෙන ඇති එම වත්කමට අදාළ දැනටමත් පවත්නා අතිරික්තයක් හිලව් කළ පසු ඉතිරියටය.

ප්‍රත්‍යාගණිත වත්කමක සාධාරණ අගය එහි ධාරණ අගයට විශාල වෙනසක් සිදුනොකරනු ලබන බවට සහතිකවනු පිණිස වත්කම් තක්සේරු කටයුතු ප්‍රමාණවත් වාර ගණනක් සිදු කෙරේ. අදාළ අයිතමය ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒ නම් හෝ අදාළ පිරිවැය විශ්වාසදායක අයුරින් ගණනය කල හැකි නම්, පසුව ඇතිවන පිරිවැය අදාළ වත්කමෙහි ධාරණ අගය තුළ අන්තර්ගත කිරීම හෝ වෙනම වත්කමක් ලෙස හඳුනාගැනීම සිදුකෙරේ.

අලුත්වැඩියා සහ නඩත්තු පිරිවැය ඒවා දරන ලද කාලපරිච්ඡේදය තුළ ලාභ අලාභ ප්‍රකාශයට අය කෙරේ.

දේපළ, පිරියත සහ උපකරණ තුළ පහත සඳහන් වෙනත් දෑ ඇතුළත් වේ.

**(i) ගුවන්යානා භ්‍රමණමය අමතර කොටස්**

ස්පෘශ්‍ය වත්කම් ලෙස සැලකෙන ගුවන්යානා භ්‍රමණමය අමතර කොටස් මූලික වශයෙන් පිරිවැය මත වාර්තා කර එහි ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පුරා ක්ෂය කරනු ලබයි. මෙම අයිතමය "ගුවන්යානා ආශ්‍රිත උපකරණ" යටතේ වර්ග කර ඇත.

**(ii) නොනිම් ප්‍රාග්ධනය**

නොනිම් ප්‍රාග්ධනය ඒවා අත්කරගත් දිනයේ සිට වැඩ ස්ථාපිත දිනය දක්වා දරන ලද සියලු වියදම් ඇතුළත් පිරිවැයට වාර්තා කරනු ලබයි. වැඩ ස්ථාපනය කළ විට නොනිම් ප්‍රාග්ධනය දේපළ, පිරියත සහ උපකරණ යටතේ සුදුසු කාණ්ඩය වෙත මාරු කර එහි ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පුරා ක්ෂය කරනු ලබයි.

**ආ) ක්ෂයවීම**

සින්නක්කර ඉඩම් හැරුණු විට, සියලුම දේපළ, පිරියත සහ උපකරණ යනාදියෙහි පිරිවැය හෝ තක්සේරුව මත සරල මාර්ග ක්‍රමවේදය යොදා ගනිමින් පහත දැක්වෙන ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පුරා සමාන වාරිකවලින් කපා හරිමින් ක්ෂයවීම් සඳහා වූ වෙන්කිරීම් ගණනය කෙරේ.

| | |
|---|---|
| ගුවන් යානා ආශ්‍රිත උපකරණ | වසර 08 ක් හෝ කල්බදු කාල සීමාව යන කාල දෙකෙන් අඩු කාල සීමාව පුරා |
| පිරියත සහ උපකරණ | උපකරණයේ වර්ගීකරණය /ස්වභාවය මත පදනම්ව වසර 3-10 දක්වා කාලපරිච්ඡේදය පුරා |
| ගොඩනැගිලි | වසර 15 සිට 50 දක්වා වූ අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ජීවකාලය පුරා |
| මෙහෙයුම් කල්බදු මත වූ ගුවන්යානා වැඩිදියුණු කිරීම් | වසර 10 ක් හෝ කල්බදු කාල සීමාව යන කාල දෙකෙන් අඩු කාල සීමාව තුළ |

අවශේෂ වටිනාකම/සුන්බුන් අගය, ඵලදායී ජීවකාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමය එක් එක් වාර්තාකරණ දිනට සමාලෝචනය කෙරෙන අතර සුදුසු පරිදි අදාළ ගැළපීම් සිදුකෙරේ.

ඉහත සඳහන් ක්ෂයවීමේ අනුපාත ඉදිරිපත් කළ සියලුම කාලපරිච්ඡේදවලට අදාළ වේ.

**(ඇ) හඳුනාගැනීමෙන් බැහැර කිරීම**

කිසියම් දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් බැහැර කිරීමකදී හෝ එහි භාවිතයෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ ඇති නොවන විට හඳුනාගැනීමෙන් බැහැර කරනු ලැබේ. යම් වත්කමක් එසේ බැහැර කිරීමෙන් ඇතිවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් (බැහැර කිරීමෙන් ලද ශුද්ධ මුදල සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කළ) අදාළ වත්කම බැහැර කරනු ලබන වර්ෂයේ ලාභ අලාභ ප්‍රකාශයෙහි ඇතුළත් කෙරේ.

### 2.4.4 අස්පෘශ්‍ය වත්කම්

කිසියම් වත්කමක් නිසා ඇතිවන අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලාඒම සහ එවැනි වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස ගණනය කල හැකි නම් ඒවා අස්පෘශ්‍ය වත්කම් වශයෙන් හඳුනාගනු ලැබේ. ඒ අනුව සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ පිරිවැය මත මෙම වත්කම් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි වාර්තා කෙරේ.

අදාළ දෘඩාංග අයිතමයකින් වෙන් කරගත හැකි පරිගණක මෘදුකාංගයක් අත්පත්කර ගැනීමේ හෝ සැකසීමේ පිරිවැය වෙන් වෙන් වශයෙන් ප්‍රාග්ධනීකරණය කරනු ලබන අතර, එය සරල රේඛීය පදනම මත වසර 05 කට නොවැඩි කාලයක් පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. ක්‍රමක්ෂය කාලච්ඡේදය සහ ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය එක් එක් වාර්තා කරන දිනට විමර්ශනයට ලක් කරනු ලබයි. මෙම වත්කමේ ධාරණ අගය ආපසු අයකර ගත නොහැකි බව යම් අවස්ථානුකූල සිදුවීම් සහ වෙනස්කම් අනුව පෙනී යන්නේ නම් හානිකරණය සඳහා එම වත්කමේ ධාරණ අගය එක් එක් වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කරනු ලැබේ.

### 2.4.5 කල්බදු

කොන්ත්‍රාත්තුවක් ආරම්භ කිරීමේදී, එය කල්බදු වේද නැතහොත් එහි කල්බදු ඇතුළත් වේද යන්න සම්බන්ධයෙන් කොන්ත්‍රාත්තුවක් ඇගයුමට ලක් කෙරේ. කොන්ත්‍රාත්තුව මඟින් හිලව් කිරීමකට හුවමාරු වශයෙන් කිසියම් කාලපරිච්ඡේදයක් සඳහා හඳුනාගත් වත්කමක් භාවිතය පාලනය කිරීමේ හිමිකම පවරනු ලබන්නේ නම්, එම කොන්ත්‍රාත්තුව කල්බදු වේ හෝ එහි කල්බදු ඇතුළත් වේ. කිසියම් කොන්ත්‍රාත්තුවක් මඟින් හඳුනාගත් වත්කමක් භාවිතය පාලනය කිරීමේ හිමිකම පවරනු ලබන්නේද යන්න ඇගයුමට ලක් කිරීමේදී සමූහය මඟින් පහත දැක්වෙන කරුණු සලකා බලනු ලබයි.

- කොන්ත්‍රාත්තුව තුළ භාවිතා වන හඳුනාගත් වත්කමක් පවතීද යන්න - මෙය පැහැදිලිව හෝ වක්‍රව විශේෂ කොට දැක්විය යුතු වන අතර, එහිදී අදාළ වත්කම භෞතිකව අනන්‍ය ස්වභාවයෙන් යුතු වීම හෝ එහි සම්පූර්ණ ධාරිතාව ප්‍රමාණවත් අයුරින් නියෝජනය විය යුතු වීම අවශ්‍ය වේ. සැපයුම්කරුට සැලකිය යුතු ආදේශක අයිතියක් තිබේ නම්, වත්කම හඳුනා ගනු නොලැබේ.
- භාවිත කරනු ලබන කාල පරිච්ඡේදය පුරා අදාළ වත්කම භාවිතයෙන් සියලුම ආර්ථික ප්‍රතිලාභ ප්‍රමාණවත් ආකාරයෙන් ලබාගැනීමේ හිමිකම, සමූහය සතු වේද යන්න සහ;
    - වත්කමෙහි භාවිතය නියම කිරීමේ හිමිකම සමූහය සතු වේද යන්න. අදාළ වත්කම කෙසේ කුමන අරමුණු අරබයා භාවිත කෙරෙන්නේද යන්න පිළිබඳ වෙනස් කිරීමට වඩාත්ම අදාළව තීරණ ගැනීමේ අයිතිය පවතින

විටකදී මෙම හිමිකම සමූහය සතු වේ. වත්කම කෙසේ කුමන අරමුණු අරබයා භාවිත කෙරෙන්නේද යන්න පිළිබඳව තීරණය පූර්ව නිශ්චිත වූ දුර්ලභ අවස්ථාවන්හිදී, පහත සඳහන් තත්ත්ව යටතේ වත්කමෙහි භාවිතය නියම කිරීමේ හිමිකම සමූහය සතු වේ:

- වත්කම මෙහෙයවීමේ හිමිකම සමූහය සතු වේ නම්; හෝ
- සමූහය මඟින් අදාළ වත්කම කෙසේ කුමන අරමුණු අරබයා භාවිත කෙරෙන්නේද යන්න පූර්ව නිශ්චය කළ හැකි ආකාරයෙන් සකසා ඇති නම්

කල්බදු සංරචකයක් සහිත කොන්ත්‍රාත්තුවක ආරම්භයේදී හෝ නැවත තක්සේරුවකදී, සමූහය විසින් එක් එක් කල්බදු සංරචකය සඳහා එහි අදාළ සාපේක්ෂ තනි අගයන්වල පදනම මත කොන්ත්‍රාත්තුවල ප්‍රතිෂ්ඨාව වෙන් කරනු ලැබේ.

කෙසේ වෙතත්, එය බදුකරු වන ඉඩම් සහ ගොඩනැගිලි සම්බන්ධ කල්බදුවලදී, සමූහය මඟින් කල්බදු නොවන සංරචකයන් වෙන් කිරීමට අදහස් නොකරන අතර, කල්බදු සහ කල්බදු නොවන සංරචකයන් තනි කල්බදු සංරචකයක් වශයෙන් ගිණුම්ගත කෙරේ.

*2.4.5.1 භාවිත හිමිකම් වත්කම් (ROU)*

සමූහය මඟින් කල්බදු ඇරඹෙන දිනයේදී භාවිත හිමිකම් වත්කමක් සහ කල්බදු වගකීම හඳුනාගනී. භාවිත හිමිකම් වත්කම මූලිකව පිරිවැයට ගණනය කෙරෙන අතර, ආරම්භක දිනයේදී හෝ එයට පෙර සිදුකරන ලද කවර හෝ කල්බදු ගෙවීම් වෙත ගළපන ලද අනාගත කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකමේ ආරම්භක අගයට, කවර හෝ මූලික සෘජු පිරිවැයක් සහ පවත්නා වත්කමක් කොටස් කිරීමට හෝ ඉවත් කිරීමට හෝ අවශ්‍ය ප්‍රතිලාභ තත්ත්වයට පාදක කර ගත් වත්කම් නැවත පිහිටුවීමට ඇස්තමේන්තු පිරිවැය එකතු කිරීමෙන්, ඕනෑම ලද බදු දිරිගැන්වීම් වලින් අඩු කොට මෙය ගණනය කරනු ලබයි.

**(අ) ගුවන්යානා සහ අමතර එන්ජින් කල්බදු ගැනීම**

සමාගම මඟින් සිය යානා සමූහය සඳහා ගුවන්යානා සහ එන්ජින් කල්බදු ගැනීම සිදුකරයි. ගුවන්යානා සහ එන්ජින් කල්බදු වල කාලසීමාව සාමාන්‍යයෙන් වසර 2 සිට 15 දක්වා වේ.

ගුවන්යානා කල්බදු සඳහා ගුවන්යානාවේ ආපසු ලබාදෙන තත්වය සඳහා වෙන්කිරීමක් ඇතුළත් වේ; එය වගකීම නිර්මාණය කරනු ලබන අවස්ථාවේදී, වත්කම් භාවිතයේ හිමිකම් වෙත කල්බදු ආශ්‍රිත නීතිරීති හා කොන්දේසි මඟින් ඉල්ලා සිටින පරිදි පාදක වන වත්කම යථා තත්වයට ප්‍රතිස්ථාපනය කිරීම සඳහා බදුකරු විසින් දරනු ලබන පිරිවැය පිළිබඳ ඇස්තමේන්තුවකි (සටහන 15.3). සෙසු ගුවන්යානා නඩත්තු සහ අළුත්වැඩියා වියදම් (ගුවන්යානා විශාල නඩත්තු, එන්ජින් අළුත්වැඩියා සහ ගොඩබෑමේ උපාංග අළුත්වැඩියා වියදම් හැර) දරන ලද පදනමක් මත ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හඳුනා ගැනෙන අතර, අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය සටහන අංක 2.4.15. හි දක්වා ඇත.

කල්බදු ඇරඹුමේදී තැන්පතු ගෙවීම සහ සෙසු කල්බදු ගෙවීම් සියල්ල එකම ගනුදෙනුවකින් ආරම්භ වේ. එමනිසා, ප්‍රවර්තන වටිනාකම සහ ආරම්භයේදී ගෙවනු ලබන මූලික මුදල අතර වෙනස බදුකරු විසින් ගෙවිය යුතු අමතර මුදලක් වශයෙන් සැලකේ.

තැන්පතුව SLFRS 9 හි විෂය පථය තුළ පවතින අතර, මූලිකව සාධාරණ අගයට ගිණුම්ගත කළයුතු වන අතර, මූලික මුදල හා තැන්පතුව අතර අතිරික්තය එහි සාධාරණ අගය මත SLFRS 16 - කල්බදු හි විෂය පථයට ඇතුළත් වේ. තැන්පතු සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තිය සටහන 2.4.9. හි දැක්වේ.

මාස 12 ක් ඇතුළත අවසන් වන කල්බදු කාලසීමාවන් සහිත ගුවන්යානාවන්හි කල්බදු සැලකිල්ලට නොගැනුණු අතර, ඒවා කෙටි කාලීන කල්බදු ආකාරයෙන්ම ගිණුම්ගත කොට ලාභ අලාභ ප්‍රකාශයෙහි කල්බදු ගුවන්යානා මත කුලිය යටතේ ඇතුළත් කොට අනාවරණය කර ඇත.

**(ආ) ඉඩම් හා ගොඩනැගිලි ආශ්‍රිත කල්බදු**

සමූහය මඟින් ශ්‍රී ලංකාව තුළ සහ විදේශයන්හි ඉඩම් සහ ගොඩනැගිලි කල්බදු පදනමට ගනු ලැබේ. ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධ ඇතැම් කල්බදුවල, අවලංගු කළ නොහැකි ගිවිසුම් කාලසීමාව අවසන් වීමට පෙරාතුව සමූහයට සිදුකළ හැකි කාලසීමා දිගු කිරීමේ වරණයන් ඇතුළත් වේ. අදාළ අවස්ථාවන්හිදී, සමූහය මඟින් මෙහෙයුම් නම්‍යශීලීත්වය ලබාගැනීමේ අරමුණින් යුතුව නව කල්බදු ගිවිසුම් තුළ කාලසීමා දිගු කිරීමේ වරණයන් ඇතුළත් කිරීම කෙරෙහි අවධානය යොමු කරයි.

සමූහය මඟින් කල්බදු ආරම්භයේදී කාලසීමා දිගු කිරීමේ වරණයන් භාවිත කිරීම සාධාරණ ලෙස ස්ථිරද යන්න පිළිබඳ ඇගයීමක් සිදු කෙරේ. සැලකියයුතු සිදුවීමක් හෝ තත්ත්වවල සැලකිය යුතු වෙනසක් සිය පාලනය තුළ පවතී නම්, අදාළ වරණයන් භාවිත කිරීම සාධාරණ ලෙස ස්ථිරද යන්න පිළිබඳ සමූහය මඟින් ප්‍රති ඇගයුමක් සිදු කරනු ලැබේ.

**(ඇ) රථවාහන ආශ්‍රිත කල්බදු**

සමූහය මඟින් වසර 2 සිට 5 දක්වා කාලසීමා යටතේ රථවාහන කල්බදු පදනමට ලබා ගැනේ.

**වත්කම් භාවිතයේ හිමිකම් ක්ෂයවීම**

වත්කම් භාවිතයේ හිමිකම්, සරල රේඛීය ක්‍රමවේදයට අනුව පසුව ක්ෂය කෙරෙනුයේ ආරම්භක දිනයේ සිට වත්කම් භාවිතයේ හිමිකම් හි ප්‍රයෝජ්‍ය ජීව කාලය අවසන් වීම හෝ කල්බදු කාලසීමාව අවසන් වීම යන දෙකෙන් වඩාත් කලින් එළඹෙන දිනය දක්වාය. වත්කම් භාවිතයේ හිමිකම් හි ඵලදායී ජීව කාලය නිර්ණය කිරීමේදී දේපළ හා උපකරණ සම්බන්ධයෙන් යොදාගත් පදනම භාවිත කෙරේ. ඊට අමතරව, භාවිත හිමිකම් වත්කම් සම්බන්ධ හානිකරණ අලාභයන් වෙතොත් ඒ සඳහා අඩු කෙරෙන අතර, කල්බදු වගකීමෙහි ඇතැම් ප්‍රතිමිනුම්ගත කිරීම් සඳහා ගළපනු ලැබේ.

*2.4.5.2 කල්බදු වගකීම*

කල්බදු වගකීම මූලිකව ආරම්භක දිනයේදී නොගෙවන ලද කල්බදු ගෙවීම්වල ප්‍රවර්තන වටිනාකමට ගණනය කෙරෙන අතර, කල්බදුවල පැහැදිලි පොලී අනුපාතය භාවිත කරමින් හෝ එම අගය නිසි පරිදි නිර්ණය කළ නොහැකි වේ නම්, සමූහයේ වර්ධනීය ණය ලබාගැනීමේ අනුපාතය යොදා ගනිමින් වට්ටම් කෙරේ. සාමාන්‍යයෙන් සමූහය එහි වර්ධක ණය ගැනීම් අනුපාතය, වට්ටම් අනුපාතය ලෙස භාවිත කරනු ලබයි.

කල්බදු වගකීම් ගණනය කිරීමේදී ඇතුළත් කරන ලද කල්බදු ගෙවීම් පහත දැක්වේ.

- ද්‍රව්‍යමය ස්ථාවර ගෙවීම්ද ඇතුළු ස්ථාවර ගෙවීම්;
- ආරම්භක දිනයේදී අදාළ දර්ශකය හෝ අනුපාතය යොදාගනිමින් ගණනය කරන ලද, දර්ශකයක් හෝ

අනුපාතයක් මත පදනම් වූ විචල්‍ය කල්බදු ගෙවීම්;

- අවශේෂ වටිනාකම් ඇපකරයක් යටතේ ගෙවිය යුතු යැයි අපේක්ෂිත මුදල් ප්‍රමාණයන්; සහ
- ක්‍රියාවට නංවන බවට සමූහය සාධාරණ ලෙස ස්ථිර කොටගත් මිල, කාලසීමා දිගු කිරීමේ වරණයක් ක්‍රියාවට නංවන බවට සමූහය සාධාරණ ලෙස ස්ථිර කොට ගත්තේ නම් වෛකල්පිත නැවත අලුත්කිරීමේ කාලසීමාවක කල්බදු ගෙවීම්, සහ කලින් අවසන් කිරීමට සමූහය සාධාරණ ලෙස ස්ථිර කොට නොගත්තේ නැතිනම් කල්බදු ගිවිසුමක් කලින් අවසන් කිරීම සඳහා වන දඩ මුදල්.

කල්බදු වගකීම සඵල පොලී අනුපාත ක්‍රමවේදය යොදාගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කෙරේ. කිසියම් දර්ශකයක හෝ අනුපාතයක වෙනස්වීමක් හේතුවෙන් අනාගත කල්බදු ගෙවීම්වල වෙනසක් උද්ගත වන විටකදී, අවශේෂ වටිනාකම් ඇපකරයක් යටතේ ගෙවියයුතු යැයි අපේක්ෂිත මුදල් ප්‍රමාණය සම්බන්ධ සමූහයේ ඇස්තමේන්තුවේ වෙනසක් පවතින විටකදී, හෝ සමූහය මඟින් මිලදී ගැනීමක්, කාලසීමා දිගු කිරීමක් හෝ අවසන් කිරීමේ වරණයක් තෝරාගන්නේද යන්න පිළිබඳ ස්වකීය ඇගයුම වෙනස් කරන ලද විටකදී එය ප්‍රතිගණනය කෙරේ.

මේ අයුරින් කල්බදු වගකීම ගණනය කල විටකදී, වත්කම් භාවිතයේ හිමිකම් හි ධාරණ අගය වෙත අනුරූපී ගැළපුමක් සිදු කිරීම හෝ, වත්කම් භාවිතයේ හිමිකම් හි ධාරණ අගය ශුන්‍ය දක්වා පහත වැටී ඇත්නම් එය ලාභ අලාභ ප්‍රකාශයෙහි වාර්තා කෙරේ.

### *2.4.5.3 කෙටි කාලීන කල්බදු සහ අඩු වටිනාකම් සහිත වත්කම් ආශ්‍රිත කල්බදු*

මාස 12ට හෝ ඊට අඩු කල්බදු කාලසීමාවන් සහිත කෙටි කාලීන කල්බදු සහ අඩු වටිනාකම් සහිත වත්කම් ආශ්‍රිත කල්බදු සඳහා වත්කම් භාවිතයේ හිමිකම් සහ කල්බදු වගකීම් හඳුනා නොගැනීමට සමූහය තීරණය කරන ලදී. සමූහය මඟින් මෙකී කල්බදු ආශ්‍රිත කල්බදු ගෙවීම් කල්බදු කාලසීමාව පුරා සරල රේඛීය පදනමක් මත වියදමක් වශයෙන් හඳුනාගැනේ.

### *2.4.5.4 කොවිඩ්-19 ට අදාළ බදු කුලී සහන*

කොවිඩ්-19 ට අදාළ බදු කුලී සහන - IFRS 16 සඳහා සංශෝධන සමූහය විසින් යොදා ගන්නා ලදී. කොවිඩ්-19 වසංගතයේ සෘජු ප්‍රතිඵලයන් වන කල්බදු වෙනස් කිරීම්වල සුදුසුකම්ලත් බදු සහන පිළිබඳ තක්සේරු නොකිරීමට ඉඩ සලසන ප්‍රායෝගික ක්‍රියාමාර්ගයන්, සමූහය විසින් යොදා ගනු ලබයි. සමාන අවස්ථාවන්හි සමාන ලක්ෂණ ඇති ගිවිසුම් සඳහා සමූහය ප්‍රායෝගික ක්‍රියාමාර්ග අඛණ්ඩව යොදාගෙන ඇත. ප්‍රායෝගික ක්‍රියාමාර්ගයන් නොයෙදීමට තෝරා ගනු ලබන හෝ ප්‍රායෝගික ක්‍රියාමාර්ගයන් සඳහා සුදුසුකම් නොලබන කල්බදුවල සහනයන්ට කල්බදු නව්‍යකරණයකට යොමු විය හැකි දැයි සමූහය විසින් තක්සේරු කරනු ලබයි.

### 2.4.6 තොග

ගුවන් යානා හා ගුවන් පර්යන්ත සේවා ආශ්‍රිත තොග, අමුද්‍රව්‍ය සහ පාරිභෝජන ද්‍රව්‍ය යනාදියෙන් තොග සමන්විත වේ.

තොග වාර්තා කරනුයේ පිරිවැය (lower of cost) සහ ශුද්ධ උපලබ්ධි කළ හැකි අගයෙන් අවම අගයට වේ. තොගවල පිරිවැය යනු සියලු ගැනුම් පිරිවැය, පරිවර්තන පිරිවැය සහ එම තොග වර්තමාන තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද අනෙකුත් වියදම්ය.

තොගවල පිරිවැය ගණනය කිරීම සඳහා බර තැබූ සාමාන්‍ය පිරිවැය ක්‍රමය යොදා ගැනේ. ඇස්තමේන්තුගත විකුණුම් මිලෙන් සම්පූර්ණ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකුණුමක් සිදුකිරීම සඳහා අවශ්‍ය වන්නා වූ පිරිවැය අඩු කිරීමෙන් ශුද්ධ උපලබ්ධි අගය ලබා ගැනේ.

### 2.4.7 මූල්‍යමය නොවන වත්කම් හානිකරණය

කිසියම් වත්කමක් හානිකරණය වූ බවට පෙන්නුම් කිරීමක් ඇත්දැයි පරීක්ෂා කිරීමට සමූහය විසින් එක් එක් වාර්තා කරන දිනට තක්සේරුවක් සිදුකරයි. එබඳු යම් පෙන්නුම් කිරීමක් වුවහොත් හෝ යම් වත්කමක් සඳහා වාර්ෂික හානිකරණය පරීක්ෂණයක් අවශ්‍ය වන විට සමූහය විසින් වත්කමෙහි ආපසු අයකරගත මුදල පිළිබඳ තක්සේරුවක් සිදු කරනු ලබයි. වත්කමක ධාරණ අගය එහි ආපසු අයකර ගත හැකි අගයෙහි ප්‍රමාණය ඉක්මවන්නේ නම් වත්කම හානිකරණයට පත්ව ඇතැයි සලකන අතර එය ආපසු අයකරගත හැකි අගය දක්වා කපා හැරේ.

### 2.4.8 සාධාරණ අගයට ගණනය කිරීම

සමූහය මඟින් ඉඩම් හා ගොඩනැගිලි, සහ ගුවන්යානා මුළුතැන්ගෙයි උපකරණ සාධාරණ අගය මත ගණනය කරයි. සාධාරණ අගය ආශ්‍රිත අනාවරණය කිරීම සටහන 03 හි සිදුකර ඇත.

සාධාරණ අගය යනු එය ගණනය කරනු ලබන දිනකදී වෙළෙඳපොළේ සහභාගී වන්නන් අතර විධිමත් ගනුදෙනුවක් තුළින් වත්කමක් විකිණීම සඳහා ලැබිය හැකි හෝ වගකීමක් පැවරීම සඳහා ගෙවනු ලබන මිලයි. සාධාරණ අගය මැනීමේ පදනම වනුයේ යම් වත්කමක් විකිණීම හෝ යම් වගකීමක් පැවරීම:

- වත්කම් හෝ වගකීම් සඳහා මූලික වෙළෙඳපොළේ හෝ
- මූලික වෙළෙඳපොළක් නොමැති විට, වත්කම හෝ වගකීම සඳහා වන වඩාත් වාසි සහගතම වෙළෙඳපොළේදී සිදු වේ යන උපකල්පනය මතය.

සමූහයට මූලික වෙළෙඳපොළ හෝ වඩාත් වාසි සහගතම වෙළෙඳපොළ වෙත ප්‍රවේශය සලසා ගත හැකි විය යුතුය.

එබඳු වත්කම්වල සාධාරණ අගය ගණනය කරනුයේ, වෙළෙඳපොළ සහභාගීවන්නන් අදාළ වත්කම හෝ වගකීම මිල කිරීමේදී සිය ප්‍රශස්ත ආර්ථික අපේක්ෂාවන් ඔස්සේ ක්‍රියා කරනු ඇතැයි උපකල්පනය කරමිනි.

මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මැනීම, වත්කම්වල ඉහළ සහ හොඳම භාවිතය හෝ වත්කම එහි ඉහළම හෝ හොඳම භාවිතය සඳහා යොදා ගන්නා වෙනත් වෙළඳපොළ සහභාගීවන්නෙකුට විකිණීමෙන්, ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කිරීමට වෙළඳපොළ සහභාගීවන්නන්ගේ හැකියාව සැලකිල්ලට ගනී.

අදාළ තත්ත්වයට ගැළපෙන සහ සාධාරණ අගය මැනීම සඳහා ප්‍රමාණවත් දත්ත ලබා ගත හැකි, අදාළ නිරීක්ෂණය කළ හැකි යෙදීම් උපරිම කිරීම සහ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් භාවිතය අවම කිරීම සඳහා තක්සේරු කිරීමේ ක්‍රම සමූහය විසින් භාවිත කරනු ලබයි.

සමස්තයක් වශයෙන් සාධාරණ අගය මිනුම්කරණයේදී වැදගත්වන අඩුම මට්ටමේ යෙදවුම් මත පදනම්ව සාධාරණ අගය මනිනු ලබන සියලු වත්කම් සාධාරණ අගය ආශ්‍රිත ධුරාවලිය තුළ පහත විස්තර කර ඇති පරිදි වර්ගීකරණය කෙරේ.

- 01 වන මට්ටම - සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රීය වෙළඳපොළේ ලැයිස්තුගත මිල ගණන් (නොගළපන ලද)
- 02 වන මට්ටම - සෘජුව හෝ වක්‍රව නිරීක්ෂණය කළ හැකි සාධාරණ අගය මැනීම සඳහා වැදගත් වන අඩුම මට්ටමේ යෙදවුම් සඳහා තක්සේරු ක්‍රම
- 03 වන මට්ටම - නිරීක්ෂණය කළ නොහැකි සාධාරණ අගයට මැනීම සඳහා වැදගත් වන අඩුම මට්ටමේ යෙදවුම් සඳහා තක්සේරු ක්‍රම

පුනරාවර්තන පදනමක් මත මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගැනෙන වත්කම් සහ වගකීම් සඳහා එක් එක් වාර්තාකරණ කාලපරිච්ඡේද අවසානයේ වර්ගීකරණය නැවත තක්සේරුවක් (සමස්තයක් වශයෙන් සාධාරණ අගය මැනීම සඳහා වැදගත් වන අඩුම මට්ටමේ යෙදවුම් මත පදනම්ව) මඟින් ධුරාවලියෙහි මට්ටම අතර මාරුවීම් සිදුවී ඇත්ද යන්න සමූහය තීරණය කරනු ලබයි.

දේපළ, පිරියත සහ උපකරණ වැනි සැලකිය යුතු වත්කම් තක්සේරු කිරීම සඳහා බාහිර තක්සේරුකරුවන් සම්බන්ධ වේ. බාහිර තක්සේරුකරුවන් තෝරාග ැනීමේ නිර්ණායක සඳහා වෙළෙඳපොළ දැනුම, කීර්තිනාමය, ස්වාධීනත්වය සහ වෘත්තීය ප්‍රමිතීන්ට අනුව කටයුතු ඉටු කරන්නේද යන දෑ ඇතුළත් වේ. බාහිර තක්සේරුකරුවන් සමග සාකච්ඡා කිරීමෙන් පසුව එක් එක් කාරණය සම්බන්ධයෙන් කුමන ක්‍රමය සහ යෙදවුම භාවිතයට ගන්නේද යන්න පිළිබඳ සමූහය මඟින් තීරණය කරනු ලැබේ.

සාධාරණ අගය අනාවරණය කිරීමේ අරමුණ සඳහා, වත්කමට හෝ වගකීමට අදාළ ස්වභාවය, ගති ලක්‍ෂණ සහ අවදානම් මෙන්ම ඉහත විස්තර කර ඇති පරිදි සාධාරණ අගය පිළිබඳ ධුරාවලියේ මට්ටම යන කරුණු මත පදනම්ව සමූහය විසින් වත්කම් සහ වගකීම්වල කාණ්ඩය තීරණය කරනු ලැබේ.

### 2.4.9 මූල්‍ය උපකරණ

#### 2.4.9.1 මූල්‍ය වත්කම්

**මූලික හඳුනාගැනීම සහ ගණනය කිරීම**
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැය, වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ වටිනාකම (FVOCI) සහ ලාභය හෝ අලාභය ඔස්සේ සාධාරණ වටිනාකම (FVTPL) වශයෙන් වර්ගීකරණය කර ඇත.

මූල්‍ය වත්කම් (ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමකින් නම් කරන ලද වත්කම් ඇතුළුව) මුලින් හඳුනාගනු ලබන්නේ සමූහය උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවල පාර්ශ්වකරුවෙකු සමග වෙළඳාම සිදුවන දිනයේදීය.

මූල්‍ය වත්කම් සාධරණ අගය අනුව මුලින් ගණනය කරනු ලබයි. ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයක් නොමැති අයිතමයක් සඳහා එය අත්පත් කර ගැනීම හෝ නිකුත් කිරීම සඳහා සෘජුවම ආරෝපණය වන ගනුදෙනු පිරිවැය සලකා බලනු ලැබේ.

**පසු ගණනය කිරීම**
මූල්‍ය වත්කම් වර්ගීකරණය සාමාන්‍යයෙන් පදනම් වන්නේ මූල්‍ය වත්කමක් කළමනාකරණය කරනු ලබන ව්‍යාපාර ආකෘතිය සහ එහි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ මතය.

මූල්‍ය වත්කමක් පහත සඳහන් කොන්දේසි දෙකම සපුරාලන්නේ නම් සහ FVTPL වශයෙන් නම් කර නොමැති නම් එය ක්‍රමක්ෂය පිරිවැයකින් ගණනය කරනු ලැබේ:

- වත්කම් ව්‍යාපාර ආකෘතියක් තුළ තබා ඇති අතර, එහි අරමුණ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා වත්කම් තබා ගැනීම; සහ
- මූල්‍ය වත්කම්වල ගිවිසුම් කොන්දේසි නිශ්චිත දිනයන්හිදී මුදල් ගලා ඒමට හේතු වන අතර එය මුල් ගෙවීම සහ හිඟ මුදලෙහි පොලී මත පමණක් සිදු වේ.

වෙළඳාම සඳහා නොපවතින කොටස් ආයෝජනයක් මුලින් පිළිගැනීමෙන් පසු, වෙනත් විස්තීර්ණ ආදායම් හි සාධාරණ වටිනාකමෙහි පසුකාලීන වෙනස්කම් ඉදිරිපත් කිරීම සඳහා සමූහයට ආපසු හැරවිය නොහැකි ලෙස තෝරා ගත හැකිය. උපකරණයක් - උපකරණයක් පාසා මෙම තෝරාගැනීම සිදු කරනු ලබයි.

වෙළඳ සහ වෙනත් අය විය යුතු දෑ, ගුවන් යානා නඩත්තු සංචිතය, ගුවන් යානා සහ අමතර එන්ජින් සඳහා තැන්පතු, කෙටි කාලීන ආයෝජන, මුදල් සහ බැංකු ශේෂ සමූහය මඟින් මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලබන අතර, පසුකාලීනව ක්‍රමක්ෂය පිරිවැය ක්‍රමය මත ගණනය කරනු ලැබේ.

**හඳුනාගැනීමෙන් බැහැර කිරීම**
මූල්‍ය වත්කම්වලින් ලැබෙන මුදල් ප්‍රවාහයන් සඳහා වන ගිවිසුම්ගත අයිතිවාසිකම් කල් ඉකුත් වූ විට සමූහය මූල්‍ය වත්කමක් හඳුනාගැනීමෙන් බැහැර කරයි, නැතහොත් ගනුදෙනුවකදී ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් ලැබීමේ අයිතිය මාරු කරන අතර, එමඟින් සැලකිය යුතු ලෙස මූල්‍ය වත්කම්වල හිමිකාරිත්වයෙහි සියලු අවදානම් සහ ප්‍රතිලාභ පැවරීම හෝ සමූහය විසින් හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කිරීම හෝ රඳවා ගැනීම සිදු නොකරන අතර එය මූල්‍ය වත්කම්වල පාලනයේ රඳවා නොගනී.

මූල්‍ය වත්කමක් හඳුනාගැනීමෙන් බැහැර කිරීමේදී, වත්කමෙහි ධාරණ අගය (හෝ හඳුනාගැනීමෙන් බැහැර කරන ලද වත්කම් කොටසට අදාළ ධාරණ අගය) සහ:

(i) ලද ප්‍රතිශ්ධාව (අත් කරගත් නව වත්කම්වලින් අඩු කළ ඕනෑම උපකල්පිත නව වගකීම් ඇතුළත්ව) සහ
(ii) වෙනත් විස්තීර්ණ ආදායම්වලින් හඳුනාගෙන ඇති කවර හෝ සමුච්චිත ලාභ හෝ අලාභ යන ඒවායේ එකතුව අතර වෙනස ලාභ සහ අලාභවල හඳුනාගෙන ඇත.

**මූල්‍ය වත්කම් හානිකරණය**
ක්‍රමක්ෂය පිරිවැයකින් හෝ වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකමකින් ගණනය කරනු ලබන මූල්‍ය වත්කම්වල අපේක්ෂිත ණය අලාභ සඳහා අලාභ දීමනාවක් සමූහය විසින් හඳුනාගනු ලැබේ.

සියලුම වෙළඳ සහ වෙනත් අය විය යුතු දෑ සඳහා ජීවිත කාලය පුරාම අපේක්ෂිත අලාභ දීමනාවක් භාවිත කරන අපේක්ෂිත ණය පාඩු ගණනය සඳහා සමූහය මඟින් සරල ප්‍රවේශයක් භාවිත කරනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලබන මූල්‍ය වත්කම් සඳහා වන අලාභ දීමනා රැගෙන යන දළ වත්කම් ප්‍රමාණයේ ධාරණ අගයෙන් අඩු කරනු ලැබේ.

මෙම විනිශ්චයන් සහ ආශ්‍රිත උපකල්පනයන්, පවතින තත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කළ හැකි අනාගත සිදුවීම් සම්බන්ධ අපේක්ෂාවන්ද ඇතුළුව, ඓතිහාසික අත්දැකීම් සහ අදාළ යැයි සැලකෙන සෙසු සාධක පිළිබිඹු වේ.

*2.4.9.2 මූල්‍ය වගකීම්*

**මූලික හඳුනාගැනීම සහ ගණනය**
සියලුම මූල්‍ය වගකීම් (ලාභයෙන් හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකමින් නියම කර ඇති වගකීම් ඇතුළුව) පළමුවෙන් හඳුනාගනු ලබන්නේ වෙළඳ දිනයේදී සමූහය, උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානයන්හි පාර්ශ්වකරුවෙකු වන විටය.

වගකීම අත්පත් කර ගත් අරමුණ මත පදනම්ව සමාගම සිය මූල්‍ය වගකීම් පහත කාණ්ඩ දෙකෙන් එකකට වර්ග කරයි; ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ වටිනාකම (FVTPL) හෝ වෙනත් මූල්‍ය වගකීම් එම කාණ්ඩ දෙක වේ.

මූල්‍ය වගකීමක් පළමුව ගණනය කරනු ලබන්නේ සාධාරණ අගය අනුවය. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයක් නොමැති භාණ්ඩයක් සඳහා, එය අත්පත් කර ගැනීමට හෝ නිකුත් කිරීමට සෘජුවම ආරෝපණය වන ගනුදෙනු පිරිවැය සලකා බලනු ලැබේ.

**පසු ගණනය කිරීම**
සමූහයේ මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කරන ලද පොලී දරන ණය සහ ණය ගැනීම්, ගුවන් යානා නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීමේ පිරිවැය, වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ පවතී.

මූලික පිළිගැනීමෙන් අනතුරුව, මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැය ක්‍රමයට මනිනු ලැබේ.

මූල්‍ය වගකීමක ක්‍රමක්ෂය පිරිවැය යනු මූලික හඳුනාගැනීමේදී මූල්‍ය වගකීම ගණනය කරනු ලබන ප්‍රමාණයෙන්, මූලික ආපසු ගෙවීම් අඩු කර හඳුනාගත් ආරම්භක මුදල සහ කල්පිරීමේ මුදල අතර ඇති කිසියම් වෙනසක් සඳහා සඵල පොලී අනුපාතික ක්‍රමයක් භාවිත කරමින් සමුච්චිත ක්‍රමක්ෂය එකතු කර හෝ අඩු කර ඉන් හානිකරණය අඩු කිරීමෙන් ලැබෙන අගයයි.

**හඳුනාගැනීමෙන් බැහැර කිරීම**
වගකීම් යටතේ ඇති බැඳීම නිදහස් කළ විට හෝ අවලංගු කළ විට හෝ කල් ඉකුත් වූ විට මූල්‍ය වගකීමක් හඳුනාගැනීමෙන් බැහැර කෙරේ.

එකම ණය දෙන්නාගෙන් පවත්නා මූල්‍ය වගකීමක් වෙනත් වගකීමක් විසින් සැලකිය යුතු ලෙස වෙනස් කොන්දේසි මත ප්‍රතිස්ථාපනය කරන විට හෝ පවත්නා වගකීමක කොන්දේසි සැලකිය යුතු ලෙස වෙනස් කරන විට, එවැනි හුවමාරුවක් හෝ වෙනස් කිරීමක් මුල් වගකීම හඳුනාගැනීමෙන් බැහැර කිරීමක් ලෙස සහ නව වගකීමක් හඳුනා ගැනීමක් ලෙස සලකනු ලැබේ. අදාළ ධාරණ අගයන්හි වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

*2.4.9.3 මූල්‍ය උපකරණ හිලව්කිරීම*
මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව්කර, ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුනාගනුයේ:

- හඳුනාගත් මුදල් පියවා ගැනීම සඳහා දැනට බලාත්මක කළ හැකි නෛතික හිමිකමක් පවතී නම් සහ
- ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම් උපලබ්ධි කර වගකීම් එකවර පියවා ගැනීමට අභිලාෂයක් පවතී නම් පමණි.

2.4.10 ගුවන්යානා නඩත්තු සංචිතය
මෙහෙයුම් කල්බදු ගිවිසුම් අනුව ගුවන් යානා එන්ජින්, ගුවන්යානා සැකිලි සහ ගුවන්යානා අංගෝපාංග යනාදියෙහි අළුත්වැඩියාවන් සඳහා මාසික පදනමක් මත කල්බදුහිමිකරුවන් වෙත කරනු ලබන ගෙවීම් වලින් ගුවන්යානා නඩත්තු සංචිතය සමන්විත වේ. ගුවන්යානා එන්ජින්, ගුවන්යානා සැකිලි සහ ගුවන්යානා අංගෝපාංග අළුත්වැඩියා සඳහා දරන ලද වියදම (මෙතෙක් සංචිතයට ගෙවූ ප්‍රමාණයන් දක්වා) අදාළ නඩත්තු කටයුතු නිමවීමෙන් පසුව එකී සංචිත හරහා කල්බදුකරුවන් වෙතින් සමාගම ආපසු අය කර ගනී.

එහි ස්වභාවය මත පදනම්ව ගුවන්යානා නඩත්තු සංචිතය, මූල්‍ය වත්කමක් ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇති අතර, මෙම මූල්‍යමය වත්කම් කාණ්ඩය සඳහා අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය ඉහත සටහන 2.4.9.1. හි දැක්වේ.

2.4.11 වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ
තැන්පතු සහ අනෙකුත් ණය ගැතියන් ඇතුළු වෙළඳ ණය ගැතියන් (තැන්පතු යටතේ වර්ගීකරණය කරන ලද මූල්‍ය නොවන වත්කම් සහ පිරිවැයෙන් මනිනු ලබන අනෙකුත් ලැබිය යුතු දේ හැර) ණය සහ ලැබිය යුතු ලෙස වර්ගීකරණය කර ගිණුම්ගත කර ඇත. ස්වභාවය මත පදනම්ව මෙම මූල්‍ය වත්කම් කාණ්ඩය සඳහා අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය ඉහත සටහන 2.4.9.1 හි දක්වා ඇත.

2.4.12 ආයෝජන

**පරිපාලිත සමාගමෙහි ආයෝජන**
සමාගමේ මූල්‍ය ප්‍රකාශ තුළ පරිපාලිත සමාගම ආශ්‍රිතව සිදුකෙරෙන ආයෝජන තාවකාලිකව අගය අවප්‍රමාණ වීම් නොවන හානිකරණයන් ගැළපීමෙන් අනතුරුව ශුද්ධ පිරිවැයට ගිණුම්ගත කරනු ලැබ ඇත.

2.4.13 කෙටි කාලීන ආයෝජන
මාස තුනට වැඩි කල්පිරීමක් සහිත බැංකුවල පවතින ස්ථාවර වත්කම් කෙටි කාලීන ආයෝජන වේ. කෙටි කාලීන ආයෝජන ඒවායේ ක්‍රමක්ෂය පිරිවැය මතගණනය කර ඇත.

2.4.14 මුදල් සහ මුදල්වලට සමාන දෑ
මුදල් සහ මුදල්වලට සමාන දෑ, බැංකුවේ සහ අතේ ඇති මුදල් ලෙස අර්ථ දැක්වෙන අතර, කැඳවීම් තැන්පතු සහ කෙටි කාලීන අධි ද්‍රවශීල ආයෝජන පහසුවෙන් දන්නා මුදල් ප්‍රමාණයට පරිවර්තනය කළ හැකි අතර වටිනාකමේ සුළු වෙනස් වීමේ අවදානමකට යටත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මුදල් සහ මුදල් සමාන දෑ සඳහා බැංකුවේ සහ අතැති මුදල්ද, ශුද්ධ ගෙවීමට ඇති බැංකු අයිරා, කැඳවීම් තැන්පතුද ඇතුළත් වේ. කෙටි කල් පිරීමේ කාලයක් සහිත අයෝජනද (එනම් අත්කර ගැනීමේ දිනයේ සිට තෙමසක කාලයක් හෝ ඊට අඩු) මුදල් සමාන දෑ ලෙස සැලකේ. බැංකු අයිරා අනාවරණය කරනු ලබන්නේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ පොලී දරන වගකීම් යටතේය.

2.4.15 වෙන්කිරීම්

**(i) සාමාන්‍ය තොරතුරු**
වෙන්කිරීම් හඳුනාගැනෙනුයේ, කිසියම් අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමූහය සතුව කිසියම් ප්‍රවර්තන බැඳීමක් (නෛතික හෝ සම්ප්‍රයුක්ත) පවතින අවස්ථාවකදී, එය බේරුම් කිරීම සඳහා

ආර්ථික ප්‍රතිලාභවල අන්තර්ගත යම් සම්පත් ගලායෑමක් අවශ්‍ය වන සහ එකී බැඳීමේ වටිනාකම මත විශ්වාසදායක ඇස්තමේන්තුවක් සිදුකළ හැකි විටය. වෙන්කිරීම් කිහිපයක් හෝ සියල්ලම ප්‍රතිපූර්ණය කළ යුතු යැයි සමූහය අපේක්ෂා කරන්නේ නම්, එකී ප්‍රතිපූර්ණය වෙනම වත්කමක් ලෙස හඳුනා ගැනෙනමුත්, එය එසේ කෙරෙනුයේ අදාළ ප්‍රතිපූර්ණය සැබවින්ම නිශ්චිත වූ විට පමණි. ප්‍රතිපූර්ණයන්ට ශුද්ධව මොනයම් හෝ වෙන්කිරීමක් වෙතොත්, අදාළ වියදම් ලාභ අලාභ ප්‍රකාශය තුළ ඉදිරිපත් කරනු ලැබේ.

**(ii) ගුවන්යානා නඩත්තු සහ අළුත්වැඩියා වියදම්**

ගුවන්යානා නඩත්තු සහ අළුත්වැඩියා වියදම් (ගුවන්යානාවල විශාල නඩත්තු කිරීම්, එන්ජින් සහ ගොඩබැසුම් උපකරණවලට කෙරෙන අළුත්වැඩියා කිරීම් හැර) සමූහය විසින් හඳුනාගැනෙනුයේ ඒ සඳහා වියදම් දැරූ පදනමක් මතය. ගුවන්යානාවල විශාල නඩත්තු කිරීම්, එන්ජින් සහ ගොඩබැසුම් උපකරණවලට කෙරෙන අළුත්වැඩියා කිරීම් සටහන 2.3.1 (ආ) (iv) හි සඳහන් කර ඇති පරිදි ගිණුම්ගත කර ඇත. "පැය ගණනට අනුව කාර්යක්ෂමතාව" තෙවන පාර්ශ්ව නඩත්තු ගිවිසුම් මඟින් ආවරණය කළ එන්ජින් අළුත්වැඩියා පිරිවැය සඳහා අදාළ ගිවිසුම් කාලසීමාව මුළුල්ලේ පැය ගණනට අනුව ගණනය කර එකඟත්වයට පත් ස්ථිර මිල ප්‍රමාණයන් අනුව පිරිවැය ලියා හරියි.

**(iii) ගුවන්යානා ආපසු ලබා දීමේ කොන්දේසි සඳහා ප්‍රතිපාදන**

ගුවන්යානා ආපසු ලබා දීමේ කොන්දේසි සඳහා වන ප්‍රතිපාදන (ප්‍රතිසංස්කරණ වගකීම්) මඟින් නැවත බාරදීමේදී ඇතැම් ගුවන්යානා සහ එන්ජින් සඳහා ගිවිසුම්ගත කල්බදු අවසන් වගකීම සපුරාලීම සඳහා වන පිරිවැයේ ඇස්තමේන්තුව නියෝජනය කරයි. කල්බදු ආරම්භයේදී, පවත්නා ගුවන්යානා සැලැස්ම සහ දිගු කාලීන නඩත්තු කාලසටහන් සැලකිල්ලට ගනිමින්, එක් එක් ප්‍රතිසංස්කරණ වගකීම් සඳහා අපේක්ෂිත පිරිවැයේ වර්තමාන වටිනාකම ප්‍රතිපාදනයක් ලෙස හඳුනාගෙන ඇති අතර, එය වත්කම් භාවිතයේ හිමිකම්වල කොටසක් ලෙස ප්‍රාග්ධනීයකරණය කර, කල්බදු සීමාව තුළ අගය අඩු කර ඇත. ආශ්‍රිත වට්ටම් ඉවත් කිරීම කල්බදු සීමාව තුළ මූල්‍ය පිරිවැයක් ලෙස පිළිගැනේ. එක් එක් ප්‍රතිස්ථාපන වගකීම් සඳහා ඇස්තමේන්තුගත පිරිවැයට පසුව සිදුවන වෙනස්වීම, පවතින්නේ නම්, අදාළ වත්කම් භාවිතයේ හිමිකම් සඳහා අනුරූප බලපෑමක් ඇතිව ගුවන්යානා ආපසු ලබා දීමේ කොන්දේසි සඳහා ප්‍රතිපාදන නැවත මිනුම් කිරීමක් ලෙස ගණනය කරනු ලබන අතර, ඉතිරි කල්බදු කාලය තුළ ක්ෂය කරනු ලැබේ. එසේ නොමැතිනම්, නැවත මිනුම් කිරීම ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි ගිණුම් කරනු ලැබේ. සටහන 2.3.1 (ආ) (v) හි ඇස්තමේන්තු පදනම හි නිරූපණය කර ඇත.

## 2.4.16 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

**(අ) නිර්වචනිත ප්‍රතිලාභ සැලසුම - පාරිතෝෂික**

පාරිතෝෂිකය යනු නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලැස්මකි; 1983 අංක 12 පාරිතෝෂික පනත සහ 2021 අංක 28 දරන සේවකයින්ගේ විශ්‍රාම යන අවම වයස පනත අනුව සමාගම සහ එහි පරිපාලිත ආයතනය ගෙවීමට බැඳී සිටී. සෑම වසරකම ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය උපයෝගී කරගනිමින් ආයුගණක උපදෙස් අනුව, සමූහය විසින් දේශීය සේවකයින්ගේ අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්මේ වර්තමාන වටිනාකම ගණනය කරනු ලබයි.

එතෙර රැකියාවේ නිරත සේවක සේවිකාවන් විශ්‍රාම ප්‍රතිලාභ, අදාළ නීති මත පදනම් ඇස්තමේන්තු කරනු ලබයි.

සමූහය විසින් අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුම මඟින් ඇතිවන ආයුගණක ලාභ/අලාභ වෙනත් විස්තීර්ණ ආදායම තුළ හඳුනාගන්නා අතර, නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුම්වලට අදාළ වියදම් ලාභ අලාභ ප්‍රකාශය තුළ හඳුනාගනු ලබයි.

පාරිතෝෂික වගකීම් සඳහා බාහිරව අරමුදල් සැපයෙන්නේ නැත. මෙම අයිතමය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ "වෙනත් දිගු කාලීන වගකීම්" යටතේ දක්වයි.

එතෙර රැකියාවේ නිරත සේවක සේවිකාවන් ආවරණය වනුයේ ඔවුන් පදිංචි සත්කාරක රටවලට අදාළ නීති/ යෝජනා ක්‍රම යටතේය.

**(ආ) නිර්වචනිත ප්‍රතිලාභ සැලසුම - ඉපැයූ නිවාඩු මත ගෙවීම්**

විශ්‍රාම යාමේදී දේශීය රැකියා මත පදනම්ව වාර්තා කිරීමේ කාල සීමාව අවසානයේ සිට භාවිත නොකළ එකතු වූ නිවාඩු සඳහා සමූහය වගකිව යුතුය. භාවිත නොකළ එකතු වූ නිවාඩු සඳහා සමූහයේ ශුද්ධ බැඳීම, සෑම වසරකම ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය උපයෝගී කරගනිමින් ආයුග ණක උපදෙස් අනුව, දේශීය සේවකයින්ගේ නිර්වචනිත ප්‍රතිලාභ සැලැස්මේ වර්තමාන අගය මත මිනිනු ලැබේ.

ලාභ හෝ අලාභ ප්‍රකාශයේ නිවාඩු මුදල් බවට පත් කිරීමට අදාළ, නිවාඩු මුදල් බවට පත් කිරීම මඟින් ඇතිවන ආයුගණන ලාභය හෝ අලාභ, වෙනත් විස්තීර්ණ ආදයම් සහ වියදම් සමූහය හඳුනාගනු ලබයි.

නිවාඩු මුදල් බවට පත් කිරීමේ වගකීම සඳහා බාහිරව අරමුදල් සැපයෙන්නේ නැත. මෙම කරුණ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ "වෙනත් වගකීම්" යටතේ දක්වයි.

**(ඇ) නිර්වචනය කර ඇති දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිභාර අරමුදල**

ශ්‍රී ලංකාව තුළ සේවයේ නියුතු සේවා නියුක්තිකයන් අදාළ අණපනත් සහ රෙගුලාසි ප්‍රකාරව සේවක අර්ථසාධක සහ සේවා නියුක්තිභාර අරමුදලේ දායකත්වයන්ට සුදුසුකම් ලබා සිටී. සමාගම විසින් සේවක දළ සංවේතන ප්‍රමාණයෙන් 15% ක් සහ 3% ක ප්‍රමාණයක්ද, පරිපාලිත සමාගම විසින් 12% ක් සහ 3% ක් පිළිවෙළින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිභාර අරමුදලටද දායක කරනු ලැබේ.

විදේශයන්හි සිටින සේවකයින් ඔවුන්ගේ සත්කාරක රටවල අදාළ වන නීති/ යෝජනා ක්‍රම යටතේ ආවරණය වේ.

## 2.4.17 Frequent Flyer වැඩසටහන

වැඩසටහනේ සාමාජිකයින්ට සමුච්චිත සැතපුම් ප්‍රමාණය පදනම් කරගනිමින් සංචාරක සම්මාන ප්‍රදානය කරනු ලබන 'FlySmiLes' යන 'frequent flyer' වැඩසටහන සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම 'frequent flyer' වැඩසටහනේ ප්‍රතිලාභවලට අදාළ මගී ආදායමෙන් කොටසක් උපයෝජනයට ගනු ලබන තෙක් විලම්භනය කර තබයි. ආදායම කල් දැමීම තක්සේරු කරනු ලබන්නේ නිදහස් කරගැනීමේ ඓතිහාසික ප්‍රවණතාවයන් මත පදනම්ව වන අතර, පසුව එය එකී ප්‍රතිලාභවලට අදාළ අපේක්ෂිත උපයෝජනය පුරෝකතනය කිරීම පිණිස යොදා ගෙන ඇත. ප්‍රදානය කරනු ලබන බැරවල සාධාරණ වටිනාකම ඇස්තමේන්තු කෙරෙනුයේ ප්‍රදානය කරනු

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

ලබන බැර නිදහස් කරගත හැකි සේවාවල බර තැබූ සාමාන්‍ය අගය සලකමිනි. මෙම ඇස්තමේන්තු එක් එක් වාර්තා කරන දිනට සමාලෝචනය කරනු ලබන අතර අදාළ වගකීම් ඒ අනුව ගළපනු ලැබේ. වැඩසටහන් හවුල්කරුවන්ගේ සේවා භාවිතය හරහා උපචිතවන්නා වූ සහ සහභාගී හවුල්කරුවන් විසින් ගෙවනු ලබන්නා වූ සැතපුම් ප්‍රමාණයන්ද, ඒවා භාවිත කරන තෙක් විලම්බිත ආදායම ලෙස ගණනය කරයි. කල් ඉකුත්වීමට අපේක්ෂිත සැතපුම් ප්‍රමාණ සඳහා වගකීමක් හඳුනා නොගැනේ.

### 2.4.18 ආදායම් හඳුනාගැනීම

ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් ලැබෙන ආදායම, සමූහය විසින් පියවර පහක ආකෘතියක් පදනම් කරගනිමින් හඳුනාගනී.

ආදායම හඳුනාගනු ලබන්නේ, භාණ්ඩ හෝ සේවාවක් පාරිභෝගිකයෙකු වෙත මාරු කිරීම සඳහා යම් ආයතනයක් හිමිකම් ලැබීමට අපේක්ෂා කරන ප්‍රතිශ්ඨාව පිළිබිඹු වන වටිනාකම අනුවය.

**(අ) ගුවන් සේවාවේ ආදායම**

ආදායම ප්‍රධාන වශයෙන් උත්පාදනය වනුයේ මගී ප්‍රවාහනය, ගුවන් බඩු, අතිරික්ත ගමන්මලු සහ තැපැල් ප්‍රවාහන, ගුවන්තොටුපළ පර්යන්ත සේවා, ඉංජිනේරු සේවා, ගුවන්යානා කුලී පදනම මත සැපයීම සහ ආශ්‍රිත සේවා යනාදියෙනි.

(i) ප්‍රවාහනය/පහසුකම් සපයාදෙන අවස්ථාවේදී ජනිත වන මෙහෙයුම් ආදායම මඟින් මගී ප්‍රවාහනය, ගුවන් බඩු, අතිරික්ත ගමන් මලු සහ අනෙක් අදාළ ගාස්තු හඳුනාගනු ලබයි.
(ii) භාවිතයට නොගත් ගුවන් ප්‍රවේශ පත්‍ර සහ ගුවන් මාර්ග බිල්පත්වල අගය, ප්‍රවාහන පූර්ව විකුණුම් ලෙස ජංගම වගකීම්වල ඇතුළත් කෙරේ. භාවිතයට නොගත් ගුවන් ප්‍රවේශ පත්‍ර සහ මාර්ග බිල්පත් එක් වසරකට පසුව කල්ඉකුත් වී සහ භාවිතයට නොගෙන පවතින්නේ නම් ආදායම වශයෙන් හඳුනාගැනේ.
(iii) ගුවන්තොටුපළ පර්යන්ත සේවා මත ආදායම හඳුනාගැනෙනුයේ අදාළ සේවා සැපයීමෙන් පසුවය.
(iv) තෙවන පාර්ශ්ව නඩත්තු සේවා මත ආදායම හඳුනාගැනෙනුයේ එකී කටයුතු නිමවීමෙන් අනතුරුවය.
(v) ගුවන් ගමන් මෙහෙයුම් සේවා මත උපයන ආදායම හඳුනාගැනෙනුයේ අදාළ සේවා සැපයීමෙන් පසුවය.

**(ආ) භාණ්ඩ විකිණීම**

පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවා ගැණුම්කරු වෙත පැවරීමෙන් ආයතනය කාර්යසාධන වගකීම් තෘප්තිමත් කරන පරිදි සහ එසේ කරන විට සමූහය විසින් ආදායම හඳුනාගැනේ. ආදායම සඳහා එකතු කළ අගය මත විකුණුම් බදු ඇතුළත් නොවන අතර, ආදායම වෙළඳ වට්ටම් අඩු කිරීමෙන් පසු අගයට තීරණය වේ. හිඟ මුදල් ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන්, අදාළ වියදම් හෝ සිදුවිය හැකි භාණ්ඩ හැරවුම් සහ භාණ්ඩ පිළිබඳ අඛණ්ඩ කළමනාකරණය සම්බන්ධයෙන් සැලකිය යුතු අවිනිශ්චිතතාවයක් ඇත්නම් ආදායම් කිසිවක් හඳුනා නොගැනේ.

**(ඇ) ලාභාංශ ආදායම**

කොටස් හිමියන්ට අදාළ ගෙවීම් ලැබීමට ඇති අයිතිය තහවුරු කරනු ලැබූ විට ලාභාංශ ආදායම ගිණුම්ගත කෙරේ.

**(ඈ) පොළී ආදායම**

ක්‍රමක්ෂය පිරිවැයට මිනුම් කළ සියලුම මූල්‍ය උපකරණ සඳහා, පොලී ආදායම හෝ වියදම වාර්තා කරනුයේ සඵල පොලී අනුපාතය යටතේය.

**(ඊ) වෙනත් ආදායම්**

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

### 2.4.19 වියදම් හඳුනාගැනීම

දරන ලද පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම ඉපැයුම අතර ඍජු සම්බන්ධය මත පදනම්ව ලාභ අලාභ ප්‍රකාශය යටතේ වියදම් හඳුනා ගැනේ. ව්‍යාපාරය පවත්වාගෙන යාම සහ දේපළ, පිරියත සහ උපකරණ පවත්වාගෙන යාම සහ කාර්යක්ෂම මට්ටමකින් පවත්වාගෙන යාම සඳහා වත්කම් භාවිතයේ හිමිකම් සඳහා දරන ලද සියලු වියදම්, ලාභ අලාභ ප්‍රකාශයේ දක්වා ඇත. ලාභ අලාභ ප්‍රකාශය ඉදිරිපත් කිරීමට, "වියදම්වල ස්වභාවය" නැමැති ක්‍රමය අනුගමනය කර ඇති අතර, සමූහයේ කාර්යසාධනය සම්බන්ධව අංග සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමේ පදනම මත එය අනුගමනය කර ඇත.

### 2.4.20 ණය ගැනුම් පිරිවැය

අපේක්ෂිත භාවිතයට හෝ විකිණීම සඳහා සැලකිය යුතු කාලසීමාවක් වැයවන, කිසියම් වත්කමක් අත්කර ගැනීමක්, ඉදිකිරීමක් හෝ නිපදවීමක් සඳහා ඍජුවම වෙන්කළ හැකි ණය ලබාගැනීමේ පිරිවැය සහ වත්කමේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කරනු ලබන ඒවා හැර, අනෙක් ණය ගැනුම් පිරිවැය ඒවා දරනු ලබන කාලසීමාව තුළ වියදමක් ලෙස හඳුනාගැනේ.

### 2.4.21 ඛණ්ඩ වාර්තාකරණය

ඛණ්ඩයක් යනු, සමූහය සම්බන්ධයෙන් හඳුනාගනු ලැබිය හැකි එක්තරා අංශයක් වන අතර, අනෙකුත් ඛණ්ඩ වඩා වෙනස් ස්වරූපයක් ගත් අවදානම් සහ ප්‍රතිලාභවලට යටත් විශේෂිත ආර්ථික පරිසරයක් තුළ සේවා සැපයීමේ නිරත වේ.

සමූහයේ අවදානම සහ ප්‍රතිලාභ අනුපාතය කෙරෙහි විවිධ රටවල් තුළ ස්වකීය ක්‍රියාකාරකම් ඉටුකිරීම යන සාධකය ප්‍රධාන ලෙස බලපෑම් ඇතිකරන බැවින් මෙහෙයුම් කටයුතුවල භූගෝලීය පැතිරයාම මත පදනම්ව අදාළ මූලික ඛණ්ඩ තීරණය කරනු ලැබේ. විකුණුම් මඟින් සැකසෙන පිරිවැටුමෙහි විශ්ලේෂණය ලබා ගැනෙනුයේ, විකුණුම් සිදුකළ කලාපය වෙත ආදායම වෙන්කිරීම මඟිනි. නිශ්චිත ඛණ්ඩයකට ඍජුවම හඳුනාගත නොහැකි වියදම් වෙන් කොට හෙළිදරවු නොකෙරේ.

භූගෝලීය බෙදීම වෙත වත්කම් සහ අදාළ වගකීම් වෙන්කිරීම සඳහා කිසිදු සුදුසු පදනමක් නොපවතින බවට කළමනාකරණය අදහස් කරයි. ඒ අනුව ඛණ්ඩ වත්කම්, ඛණ්ඩ වගකීම් සහ භූගෝලීය බෙදීම ආශ්‍රිත තොරතුරු යනාදිය සම්බන්ධයෙන් අනාවරණය කරනු නොලබයි.

ව්‍යාපාර ඛණ්ඩය අනුව දෙවන වාර්තාකරණය, සමූහය විසින් සපයන ලද සේවාව මත රඳා පවතී. ගුවන් ප්‍රවාහන කටයුතුවල සහ සිය පරිපාලිත සමාගම ඔස්සේ ගුවන්යානාස්ථ ආහාරපාන සේවා සැපයීමේ කටයුතු ලෙස සමූහයේ ප්‍රධාන ව්‍යාපාර ඛණ්ඩ දෙකක් යටතේ සිදුවෙයි.

### *2.5 නව ගිණුම්කරණ ප්‍රමිති නිකුත් කළ නමුත් මේ දක්වා ක්‍රියාත්මක නොවන ගිණුම්කරණ ප්‍රමිති*

සමූහයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කරන දිනය දක්වා නිකුත් කරනු ලබන නමුත් වත්මන් වාර්ෂික වාර්තාකරණ කාල සීමාව සඳහා ක්‍රියාත්මක නොවන නව සහ සංශෝධිත ප්‍රමිතීන් සහ අර්ථකථන පහතින් අනාවරණය කර ඇත. මෙම නව සහ සංශෝධිත ප්‍රමිතීන් සහ අර්ථකථන අදාළ වන්නේ නම්, ඒවා ක්‍රියාත්මක වන විට ඒවා අනුගමනය කිරීමට සමූහය විසින් අදහස් කරනු ලබයි.

### 2.5.1 ගිණුම්කරණ ඇස්තමේන්තු පිළිබඳ අර්ථ දැක්වීම - LKAS 8 වෙත සංශෝධන

සංශෝධන මගින් ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම් සහ දෝෂ නිවැරදි කිරීම අතර වෙනස පැහැදිලි කරයි. එමෙන්ම ගිණුම්කරණ ඇස්තමේන්තු සංවර්ධනය කිරීම සඳහා ආයතන මිනුම් ශිල්පීය ක්‍රම සහ යෙදවුම් භාවිත කරන ආකාරය එතුළින් පැහැදිලි කරයි. ආදානයක වෙනසක් හෝ මිනුම් තාක්ෂණයක වෙනසක් පිළිබඳ ගිණුම්කරණ ඇස්තමේන්තුවකට ඇති වන බලපෑම්, පූර්ව කාලපරිච්ඡේද දෝෂ නිවැරදි කිරීමෙහි ප්‍රතිඵලයක් නොවන්නේ නම් එය ගිණුම් ඇස්තමේන්තුවල වෙනස්කමක් යැයි සංශෝධිත ප්‍රමිතිය මඟින් දක්වනු ලබයි.

මෙම සංශෝධන 2023 ජනවාරි 1 හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේද සඳහා බලාත්මක වේ. ඉන් පෙර වාර්තාකරණයන් සඳහාද අවශ්‍ය නම් යොදා ගත හැකිය.

### 2.5.2 තනි ගණුදෙනුවකින් ඇතිවන වත්කම් සහ බැරකම් සම්බන්ධ විලම්බිත බද්ද - LKAS 12 වෙත සංශෝධන

වගකීමක් පියවන ගෙවීම් බදු අරමුණු සඳහා අඩු කළ හැකි විට, එවැනි අඩු කිරීම් මූල්‍ය ප්‍රකාශනවල (සහ පොලී වියදම්) හඳුනාගෙන ඇති වගකීම්වලට හෝ අදාළ වත්කම් සංරචකයට (සහ පොලී වියදම) බදු අරමුණු වෙනුවෙන් ආරෝපණය කළ හැකිද යන්න තීරණය කිරීමේ කාරණයක් වේ යන්න (අදාළ කළ හැකි බදු නීති පිළිබඳ සලකා බැලීමෙන්) සංශෝධන මඟින් විස්තර කරයි. වත්කම් සහ වගකීම් මූලික වශයෙන් හඳුනා ගැනීමේදී යම් තාවකාලික වෙනස්කම් තිබේද යන්න තීරණය කිරීමේදී මෙම විනිශ්චය වැදගත් වේ.

එසේම, සංශෝධන යටතේ, මූලික හඳුනාගැනීමේදී සමාන බදු සහ අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් ඇති කරන ගනුදෙනු සඳහා මූලික හඳුනාග ැනීමේ ව්‍යතිරේකය අදාළ නොවේ. කල්බදු වත්කමක් සහ කල්බදු වගකීමක් හඳුනා ගැනීම (හෝ ඉවත් කිරීමේ වගකීම සහ ඉවත් කිරීමේ වත්කම් සංරචකය) සමාන නොවන බදු සහ අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් ඇති කරන්නේ නම් මෙය අදාළ වේ.

මෙම සංශෝධන 2023 ජනවාරි 1 හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයන් සඳහා බලාත්මක වේ.

### 2.5.3 ගිණුම්කරණ ප්‍රමිති අනාවරණය - LKAS 1 සහ IFRS පරිචය සටහන් 2 සඳහා සංශෝධන

LKAS 1 සහ IFRS පරිචය සටහන 2 ප්‍රමාණාත්මක තීරණ ගැනීම සඳහා සංශෝධන මඟින් ගිණුම්කරණ ප්‍රතිපත්ති අනාවරණයන් සිදු කිරීමට ප්‍රමාණාත්මක තීරණ අදාළ කර ගැනීමට ආයතනවලට උපකාර කිරීම සඳහා මාර්ගෝපදේශ සහ උදාහරණ සපයනු ලබයි. සංශෝධන මගින් පහත දැට වඩාත් ප්‍රයෝජනවත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම් සැපයීමට ආයතනවලට උපකාර කිරීම අරමුණු කරයි:

- ආයතන සඳහා ඔවුන්ගේ 'සැලකිය යුතු' ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළි කිරීමේ අවශ්‍යතාවය ඔවුන්ගේ 'ප්‍රමාණාත්මක' ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළි කිරීමේ අවශ්‍යතාවයක් සමඟ ප්‍රතිස්ථාපනය කිරීම.
- ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම් පිළිබඳ තීරණ ගැනීමේදී ආයතන මඟින් ප්‍රමාණාත්මක සංකල්පය අදාළ කරගන්නා ආකාරය පිළිබඳ මාර්ගෙ ෝපදේශ එක් කිරීම.

මෙම සංශෝධන 2023 ජනවාරි 1 හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේද සඳහා බලාත්මක වේ.

### 2.5.4 ජංගම සහ ජංගම නොවන ලෙස වගකීම් වර්ගීකරණය - LKAS 1 වෙත සංශෝධන

LKAS 1 වෙත සංශෝධන හි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම මඟින් වගකීම්, ජංගම හෝ ජංගම නොවන ලෙස වර්ගීකරණය කිරීමේ අවශ්‍යතා දක්වනු ලබයි. සංශෝධන මඟින් පැහැදිලි කරනුයේ -

- බේරුම්කරණය කල් දැමීමේ අයිතිය යන්නෙන් අදහස් දේ
- වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ කල් දැමීමට අයිතියක් ඇති
- එම වර්ගීකරණය සඳහා ආයතනයක් විසින් එහි කල් දැමීමේ අයිතිය ක්‍රියාත්මක කිරීමේ සම්භාවිතාවයෙන් බලපානු නොලැබේ.
- පරිවර්තනය කළ හැකි වගකීමක නිහිත ව්‍යුත්පන්නයක්, හිමිකම් සාධන පත්‍රයක් වන්නේ නම් පමණක් වගකීමක නියමයන් එහි වර්ගීකරණයට බලපාන්නේ නැත.
- හෙළිදරව් කිරීම්

මෙම සංශෝධන 2023 ජනවාරි 1 හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයන් සඳහා බලාත්මක වේ.

### 2.5.5 SLFRS 17 රක්ෂණ ගිවිසුම්

මෙම ප්‍රමිති සමූහය සඳහා අදාළ නොවන බැවින් ඉන් බලපෑමක් නොපවතී.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

**3. දේපළ, පිරියත සහ උපකරණ**

*3.1 සමූහය*

| | ඉඩම් සහ ගොඩනැගිලි රු. මිලියන | පිරියත සහ උපකරණ රු. මිලියන | කල්බදු මත ගුවන්යානා වැඩිදියුණු කිරීම් රු. මිලියන | ගුවන්යානා ආශ්‍රිත උපකරණ රු. මිලියන | අත්තිකාරම්/ ප්‍රාග්ධන නොනිමි වැඩ රු. මිලියන | එකතුව 2023 රු. මිලියන | එකතුව 2022 රු. මිලියන |
|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය/ප්‍රත්‍යාගණනය** | | | | | | | |
| අප්‍රේල් 01 දිනට ශේෂය | 4,615.16 | 10,076.38 | 1,951.78 | 9,840.24 | 4.57 | 26,488.13 | 26,075.66 |
| අත්පත් කරගැනීම්/ නවීකරණයන්/ වැඩිදියුණු කිරීම් | 13.31 | 361.80 | - | 934.22 | - | 1,309.33 | 474.22 |
| ප්‍රතිවර්ගීකරණ | (13.79) | 13.79 | - | - | - | - | - |
| බැහැර කිරීම්/විශ්‍රාම ගැනීම් | (0.24) | (23.17) | - | (60.01) | (4.57) | (87.99) | (61.75) |
| වසර තුළ ප්‍රත්‍යාගණනය | 3,182.58 | 2,164.31 | - | - | - | 5,346.90 | - |
| ප්‍රත්‍යාගණනය මත ගැළපීම | (1,419.51) | (1,207.22) | - | - | - | (2,626.73) | - |
| **මාර්තු 31 දිනට ශේෂය** | 6,377.51 | 11,385.89 | 1,951.78 | 10,714.45 | - | 30,429.64 | 26,488.13 |
| **සමුච්චිත ක්ෂයවීම** | | | | | | | |
| අප්‍රේල් 01 දිනට ශේෂය | 1,224.53 | 8,456.37 | 1,850.65 | 8,705.84 | - | 20,237.39 | 18,847.15 |
| වසර සඳහා අයකිරීම | 290.72 | 710.80 | 55.89 | 383.47 | - | 1,440.88 | 1,448.84 |
| ප්‍රතිවර්ගීකරණ | (1.51) | 1.51 | - | - | - | - | - |
| බැහැර කිරීම්/විශ්‍රාම ගැනීම් | (0.24) | (23.17) | - | (58.22) | - | (81.63) | (58.60) |
| ප්‍රත්‍යාගණනය මත ගැළපීම | (1,419.51) | (1,207.22) | - | - | - | (2,626.73) | - |
| **මාර්තු 31 දිනට ශේෂය** | 93.99 | 7,938.29 | 1,906.54 | 9,031.09 | - | 18,969.91 | 20,237.39 |
| **මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය** | 6,283.52 | 3,447.60 | 45.24 | 1,683.36 | - | 11,459.71 | 6,250.74 |

**3. දේපළ, පිරියත සහ උපකරණ (සබැඳේ)**

**3.2** *(අ)* සමාගමෙහි ඉඩම් සහ ගොඩනැගිලිවල සාධාරණ අගය තීරණය කරන ලද්දේ, 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර තුළදී රන්ජන් ජේ. සමරකෝන් මහතා (ඒ.අයි.වී. ශ්‍රී ලංකා - ආයතනික තක්සේරුකරු) විසින් සිදු කරන ලද ප්‍රත්‍යාගණනයක් ඔස්සේ වන අතර, 2023 මාර්තු 31 දිනට ඉඩම් සහ ගොඩනැගිලි හා පරිපාලිතයෙහි මුළුතැන්ගෙයි උපකරණවල සාධාරණ අගය තීරණය කරන ලද්දේ, ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනයෙහි සංස්ථාපිත තක්සේරුකරු ඒ. ආර්. අජිත් ප්‍රනාන්දු මහතා විසිනි.

තක්සේරුකරණයේදී ප්‍රකාශිත සමූහයේ ඉඩම්, ගොඩනැගිලි සහ වෙනත් පිරියත හා උපකරණ පිළිබඳ විස්තර පහත දැක්වේ;

| වත්කම | තක්සේරු ක්‍රමවේදය | තක්සේරුකරණයේ බලාත්මක දිනය | සැලකිය යුතු නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් | ප්‍රත්‍යාගණනයන් වල වටිනාකම රු. මිලියන | නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් වෙත සාධාරණ අගයෙහි සංවේදීතාව | සාධාරණ අගයෙහි ධුරාවලි මට්ටම |
|---|---|---|---|---|---|---|
| ඉඩම - කොළඹ | **විවෘත වෙළඳපොළ අගය** නැවත අගය කළ දේපළවල සාධාරණ අගය තීරණය කිරීමේදී සාධාරණීය මෑත කාල සීමාව තුළ සමාන දේපළවල විකුණුම් මිල ගණන් මෙම ක්‍රමය මඟින් සලකා බලනු ලබයි. මෙය දේපළවල ප්‍රමාණයේ, ස්වභාවයේ සහ පිහිටීමේ වෙනස අනුව අවශ්‍ය වෙනස්කම් කරමින් වත්මන් සක්‍රීය වෙළඳපොළෙහි සමාන වත්කම් ඇගයීම පාදක කරගනී. | 23 මාර්තු 31 | පර්චස් 1 ක ඇස්තමේන්තුගත මිල රු. මිලියන 20 | 715.00 | ධනාත්මක ලෙස සහසම්බන්ධිත සංවේදීතාවය | මට්ටම 3 |
| ගොඩනැගිලි - කොළඹ / කටුනායක | **ක්ෂයවීම් ප්‍රතිස්ථාපන පිරිවැය** වත්කමක් එහි වර්තමානයේ වත්කමකට ආදේශනයෙන් සමාන වත්මන් පිරිවැය භෞතික ක්ෂයවීම් සඳහා අවම අඩුකිරීමකින් සහ අදාළ සියලු අවභාවිතයන් සහ ප්‍රශස්තකරණ ස්වරූප මෙම ක්‍රමය මඟින් සලකනු ලබයි.<br><br>තවද, බදු පදනම මත ඇති ගොඩනැගිලි සම්බන්ධයෙන්, අදාළ සාධාරණ අගයන් තක්සේරු කිරීමේදී පාදක කරගත් දේපළ "සින්නක්කර පදනම" ලෙස සලකනු ලැබේ. මෙම උපකල්පනය පදනම් වී ඇත්තේ පාදක කරගත් මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා උපායමාර්ගික වැදගත්කමක් සහිත අදාළ කල්බදු අඛණ්ඩව පවත්වාගෙන යනු ඇති බවට කළමනාකාරිත්වය විසින් සිදු කරන තක්සේරුව මතය. | 23 මාර්තු 31 | වර්ග අඩියක ඇස්තමේන්තුගත මිල රු. 850 - රු. 15,000 අදාළ ඉඩම් බදු අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිබඳ කළමනාකාරිත්වයේ තක්සේරුව | 3,804.48 | ධනාත්මක ලෙස සහසම්බන්ධිත සංවේදීතාවය | මට්ටම 3 |

## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

| වත්කම | තක්සේරු ක්‍රමවේදය | තක්සේරුකරණයේ බලාත්මක දිනය | සැලකිය යුතු නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් | ප්‍රත්‍යාගණනයන් වල වටිනාකම රු. මිලියන | නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් වෙත සාධාරණ අගයෙහි සංවේදීතාව | සාධාරණ අගයෙහි ධුරාවලි මට්ටම |
|---|---|---|---|---|---|---|
| **පරිපාලිතය** | | | | | | |
| ගොඩනැගිලි - කටුනායක | **ක්ෂයවීම් ප්‍රතිස්ථාපන පිරිවැය** වත්කමක් එහි වර්තමානයේ වත්කමකට ආදේශනයෙන් සමාන වත්මන් පිරිවැය භෞතික ක්ෂයවීම් සඳහා අවම අඩුකිරීමකින් සහ අදාළ සියලු අවභාවිතයන් සහ ප්‍රශස්තකරණ ස්වරූප මෙම ක්‍රමය මඟින් සලකනු ලබයි.<br><br>තවද, බදු පදනම මත ඇති ගොඩනැගිලි සම්බන්ධයෙන්, අදාළ සාධාරණ අගයන් තක්සේරු කිරීමේදී පාදක කරගත් දේපළ "සින්නක්කර පදනම" ලෙස සලකනු ලැබේ. මෙම උපකල්පනය පදනම් වී ඇත්තේ පාදක කරගත් මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා උපායමාර්ගික වැදගත්කමක් සහිත අදාළ කල්බදු අඛණ්ඩව පවත්වාගෙන යනු ඇති බවට කළමනාකාරිත්වය විසින් සිදු කරන තක්සේරුව මතය. | 23 මාර්තු 31 | වර්ග අඩියක ඇස්තමේන්තුගත මිල රු. 4,000 - රු. 12,000 අදාළ ඉඩම් බදු අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිබඳ කළමනාකාරිත්වයේ තක්සේරුව | 1,762.70 | ධනාත්මක ලෙස සහසම්බන්ධිත සංවේදීතාවය | මට්ටම 3 |
| පිරියත සහ උපකරණ යටතේ ඇතුළත් කළ ගුවන් සේවා මුළුතැන්ගෙයි උපකරණ - කටුනායක | **ක්ෂයවීම් ප්‍රතිස්ථාපන පිරිවැය** වත්කමක් එහි වර්තමානයේ වත්කමකට ආදේශනයෙන් සමාන වත්මන් පිරිවැය භෞතික ක්ෂයවීම් සඳහා අවම අඩුකිරීමකින් සහ අදාළ සියලු අවභාවිතයන් සහ ප්‍රශස්තකරණ ස්වරූප මෙම ක්‍රමය මඟින් සලකනු ලබයි. | 23 මාර්තු 31 | එක් එක් උපකරණය සඳහා ශුද්ධ ප්‍රතිස්ථාපන පිරිවැය ක්‍රමවේදය (NRC) යොදා ගනිමින් සාධාරණ අගය ගණනය කෙරිණි. | 2,532.03 | ධනාත්මක ලෙස සහසම්බන්ධිත සංවේදීතාවය | මට්ටම 3 |

ක්ෂයවීම් අඩු කරන ලද පිරිවැය යටතේ වත්කම් ධාරණය කළේ නම්, මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුළත් කළ හැකිව තිබූ ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම්වල ධාරණ අගය පහත දැක්වෙන පරිදි වේ:

| වත්කම් කාණ්ඩය | පිරිවැය<br>රු. මිලියන | වත්කම පිරිවැය අනුව ධාරණය කරනු ලැබුවේ නම් සමුච්චිත ක්ෂය<br>රු. මිලියන | ශුද්ධ ධාරණ වටිනාකම 2023<br>රු. මිලියන | ශුද්ධ ධාරණ වටිනාකම 2022<br>රු. මිලියන |
|---|---|---|---|---|
| ඉඩම් සහ ගොඩනැගිලි | 3,077.72 | 2,378.46 | 699.26 | 803.78 |
| පිරියත සහ උපකරණ | 2,548.13 | 2,322.52 | 225.60 | 286.19 |

(ආ)වසර තුළ, සමූහය විසින් රුපියල් මිලියන 1,309.33 ක (2022 රුපියල් මිලියන 474.22) සමස්ත වටිනාකමකින් යුතු දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනිණි. වසර තුළ, දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම සඳහා රුපියල් මිලියන 1227.76 ක (2022 රුපියල් මිලියන 490.55) වටිනාකමකින් යුතු මුදල් ගෙවීම් සිදු කරන ලදී.

(ඇ)සමූහයේ සහ සමාගමේ දේපළ, පිරියත සහ උපකරණ අතරට රුපියල් මිලියන 15,346.53 ක ශුද්ධ ධාරණ වටිනාකමකින් යුතු (2022 රුපියල් මිලියන 13,230.51) පූර්ණ වශයෙන් ක්ෂය වූ වත්කම්ද ඇතුළත් වේ.:

(ඈ)බැංකු පහසුකම් සඳහා උකස් කරන ලද දේපළ, පිරියත සහ උපකරණ කිසිවක් නොමැත.

*3.3 සමාගම*

| | ඉඩම් සහ ගොඩනැගිලි<br>රු. මිලියන | පිරියත සහ උපකරණ<br>රු. මිලියන | කල්බදු මත ගුවන්යානා වැඩිදියුණු කිරීම්<br>රු. මිලියන | ගුවන්යානා ආශ්‍රිත උපකරණ<br>රු. මිලියන | අත්තිකාරම්/ ප්‍රාග්ධන නොනිමි වැඩ<br>රු. මිලියන | එකතුව 2023<br>රු. මිලියන | එකතුව 2022<br>රු. මිලියන |
|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය/ප්‍රත්‍යාගණනය** | | | | | | | |
| අප්‍රේල් 01 දිනට ශේෂය | 2,986.55 | 8,521.01 | 1,951.78 | 9,840.24 | 4.57 | 23,304.15 | 23,010.01 |
| අත්පත් කරගැනීම්/ නවීකරණයන්/වැඩිදියුණු කිරීම් | 7.60 | 306.41 | - | 934.22 | - | 1,248.23 | 348.78 |
| ප්‍රතිවර්ගීකරණ | (13.79) | 13.79 | - | - | - | - | - |
| බැහැර කිරීම්/විශ්‍රාම ගැනීම් | (0.24) | (23.17) | - | (60.01) | (4.57) | (87.99) | (54.64) |
| වසර තුළ ප්‍රත්‍යාගණනය | 2,733.06 | - | - | - | - | 2,733.06 | - |
| ප්‍රත්‍යාගණනය මත ගැළපීම | (1,098.45) | - | - | - | - | (1,098.45) | - |
| **මාර්තු 31 දිනට ශේෂය** | 4,614.74 | 8,818.04 | 1,951.78 | 10,714.45 | - | 26,099.00 | 23,304.15 |
| සමුච්චිත ක්ෂයවීම | | | | | | | |
| අප්‍රේල් 01 දිනට ශේෂය | 969.51 | 7,571.87 | 1,850.65 | 8,705.84 | - | 19,097.87 | 18,106.81 |
| වසර සඳහා අයකිරීම | 224.70 | 352.26 | 55.89 | 383.47 | - | 1,016.32 | 1,045.70 |
| ප්‍රතිවර්ගීකරණ | (1.51) | 1.51 | - | - | - | - | - |
| බැහැර කිරීම්/විශ්‍රාම ගැනීම් | (0.24) | (23.17) | - | (58.22) | - | (81.63) | (54.64) |
| ප්‍රත්‍යාගණනය මත ගැළපීම | (1,098.45) | - | - | - | - | (1,098.45) | - |
| **මාර්තු 31 දිනට ශේෂය** | 94.01 | 7,902.47 | 1,906.54 | 9,031.09 | - | 18,934.11 | 19,097.87 |
| **මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය** | 4,520.73 | 915.57 | 45.25 | 1,683.36 | - | 7,164.89 | 4,206.28 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

**3. දේපළ, පිරියත සහ උපකරණ (සබැඳේ)**

*3.4 (අ)* සමාගමෙහි ඉඩම් සහ ගොඩනැගිලිවල සාධාරණ අගය තීරණය කරන ලද්දේ, 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී ස්වාධීන තක්සේරුකරුවෙකු වන රන්ජන් ජේ. සමරකෝන් මහතා (ඒ.අයි.වී. ශ්‍රී ලංකා - ආයතනික තක්සේරුකරු) විසින් සිදු කරන ලද ප්‍රත්‍යාගණනයක් ඔස්සේය. 2023 මාර්තු 31 දින සිට බලපැවැත්වෙන පරිදි මූල්‍ය ප්‍රකාශයන්හි එම ප්‍රත්‍යාගණනයන්වල ප්‍රතිඵලයන් අන්තර්ගත කර ඇත.

තක්සේරුකරණයේ සඳහන් කරන ලද සමාගමේ ඉඩම් සහ ගොඩනැගිලිවල තොරතුරු පහත දැක්වේ.

| වත්කම | තක්සේරු ක්‍රමවේදය | තක්සේරුකරණයේ බලාත්මක දිනය | සැලකිය යුතු නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් | ප්‍රත්‍යාගණනයන්වල වටිනාකම රු. මිලියන | නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් වෙත සාධාරණ අගයෙහි සංවේදීතාව | සාධාරණ අගයෙහි ධුරාවලි මට්ටම |
|---|---|---|---|---|---|---|
| ඉඩම - කොළඹ | **විවෘත වෙළඳපොළ අගය** නැවත අගය කළ දේපළවල සාධාරණ අගය තීරණය කිරීමේදී සාධාරණීය මෑත කාල සීමාව තුළ සමාන දේපළවල විකුණුම් මිල ගණන් මෙම ක්‍රමය මඟින් සලකා බලනු ලබයි. මෙය දේපළවල ප්‍රමාණයේ, ස්වභාවයේ සහ පිහිටීමේ වෙනස අනුව අවශ්‍ය වෙනස්කම් කරමින් වත්මන් සක්‍රිය වෙළඳපොළෙහි සමාන වත්කම් ඇගයීම පාදක කරගනී. | 2023 මාර්තු 31 | පර්චස් 1 ක ඇස්තමේන්තුගත මිල රු. මිලියන 20 | 715.00 | ධනාත්මක ලෙස සහසම්බන්ධිත සංවේදීතාවය | මට්ටම 3 |
| පිරියත සහ උපකරණ යටතේ ඇතුළත් කළ ගුවන් සේවා මුළුතැන්ගේ උපකරණ - කටුනායක | **ක්ෂයවීම් ප්‍රතිස්ථාපන පිරිවැය** වත්කමක් එහි වර්තමානයේ වත්කමකට ආදේශනයෙන් සමාන වත්මන් පිරිවැය භෞතික ක්ෂයවීම් සඳහා අවම අඩුකිරීමකින් සහ අදාළ සියලු අවභාවිතයන් සහ ප්‍රශස්තකරණ ස්වරූප මෙම ක්‍රමය මඟින් සලකනු ලබයි.<br><br>තවද, බදු පදනම මත ඇති ගොඩනැගිලි සම්බන්ධයෙන්, අදාළ සාධාරණ අගයන් තක්සේරු කිරීමේදී පාදක කරගත් දේපළ "සින්නක්කර පදනම" ලෙස සලකනු ලැබේ. මෙම උපකල්පනය පදනම් වී ඇත්තේ පාදක කරගත් මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා උපායමාර්ගික වැදගත්කමක් සහිත අදාළ කල්බදු අඛණ්ඩව පවත්වාගෙන යනු ඇති බවට කළමනාකාරිත්වය විසින් සිදු කරන තක්සේරුව මතය. | 2023 මාර්තු 31 | වර්ග අඩියක ඇස්තමේන්තුගත මිල රු. 850 - රු. 15,000 අදාළ ඉඩම් බදු අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිබඳ කළමනාකාරිත්වයේ තක්සේරුව | 3,804.48 | ධනාත්මක ලෙස සහසම්බන්ධිත සංවේදීතාවය | මට්ටම 3 |

ක්ෂයවීම් අඩු කරන ලද පිරිවැය යටතේ වත්කම් ධාරණය කළේ නම්, මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුළත් කළ හැකිව තිබූ ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම්වල ධාරණ අගය පහත දැක්වෙන පරිදි වේ:

| වත්කම් කාණ්ඩය | පිරිවැය රු. මිලියන | වත්කම පිරිවැය අනුව ධාරණය කරනු ලැබුනේ නම් සමුච්චිත ක්ෂය රු. මිලියන | ශුද්ධ ධාරණ වටිනාකම 2023 රු. මිලියන | ශුද්ධ ධාරණ වටිනාකම 2022 රු. මිලියන |
|---|---|---|---|---|
| ඉඩම් සහ ගොඩනැගිලි | 1,246.74 | 984.47 | 262.27 | 281.11 |

ආ) වසර තුළ, සමූහය විසින් රුපියල් මිලියන 1,248.23 ක (2022 රුපියල් මිලියන 348.78) සමස්ත වටිනාකමකින් යුතු දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනිණි. වසර තුළ, දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම සඳහා රුපියල් මිලියන 1,166.66 ක (2022 රුපියල් මිලියන 365.10) වටිනාකමකින් යුතු මුදල් ගෙවීම සිදු කරන ලදී.

ඇ) සමාගමේ දේපළ, පිරියත සහ උපකරණ අතරට රුපියල් මිලියන 15,346.53 ක ශුද්ධ ධාරණ වටිනාකමකින් යුතු (2022 රුපියල් මිලියන 13,230.51) පූර්ණ වශයෙන් ක්ෂය වූ වත්කම්ද ඇතුළත් වේ.

ඈ) බැංකු පහසුකම් සඳහා උකස් කරන ලද දේපළ, පිරියත සහ උපකරණ කිසිවක් නොමැත.

## 4. වත්කම් භාවිතයේ හිමිකම්

*4.1 වත්කම් භාවිතයේ හිමිකම්හි සංචලනය*

| සමූහය | ගුවන්යානා අමතර එන්ජින් රු. මිලියන | ඉඩම් සහ ගොඩනැගිලි රු. මිලියන | රථවාහන රු. මිලියන | ගුවන්යානා සමාකෘතිය රු. මිලියන | එකතුව 2023 රු. මිලියන | එකතුව 2022 රු. මිලියන |
|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | | |
| අප්‍රේල් 01 දිනට ශේෂය | 125,154.77 | 2,010.79 | 76.50 | 3,510.95 | 130,753.01 | 127,254.54 |
| එකතු කිරීම් | 855.25 | 185.24 | 12.17 | - | 1,052.66 | 2,660.46 |
| බැහැර කිරීම් | - | (20.44) | - | - | (20.44) | (105.64) |
| ගැළපීම් | 379.51 | (54.12) | - | - | 325.39 | 943.65 |
| **මාර්තු 31 දිනට ශේෂය** | 126,389.53 | 2,121.47 | 88.67 | 3,510.95 | 132,110.62 | 130,753.01 |
| **ක්ෂයවීම** | | | | | | |
| අප්‍රේල් 01 දිනට ශේෂය | 44,560.94 | 966.22 | 66.92 | 2,350.57 | 47,944.65 | 34,798.66 |
| ක්ෂයවීම | 13,153.34 | 293.74 | 8.47 | 230.63 | 13,686.18 | 13,169.37 |
| බැහැර කිරීම් | - | (17.08) | - | - | (17.08) | (43.91) |
| ගැළපීම් | - | - | - | - | - | 20.53 |
| **මාර්තු 31 දිනට ශේෂය** | 57,714.28 | 1,242.88 | 75.39 | 2,581.20 | 61,613.75 | 47,944.65 |
| **මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය** | 68,675.25 | 878.59 | 13.28 | 929.75 | 70,496.87 | 82,808.36 |

## 4. වත්කම් භාවිතයේ හිමිකම්

*4.1 වත්කම් භාවිතයේ හිමිකම්හි සංචලනය*

| සමාගම | ගුවන්යානා අමතර එන්ජින් රු. මිලියන | ඉඩම් සහ ගොඩනැගිලි රු. මිලියන | රථවාහන රු. මිලියන | ගුවන්යානා සමාකෘතිය රු. මිලියන | එකතුව 2023 රු. මිලියන | එකතුව 2022 රු. මිලියන |
|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | | |
| අප්‍රේල් 01 දිනට ශේෂය | 125,154.77 | 1,334.98 | 76.50 | 3,510.95 | 130,077.20 | 126,636.79 |
| එකතු කිරීම් | 855.25 | 185.24 | 12.17 | - | 1,052.66 | 2,647.22 |
| බැහැර කිරීම් | - | (20.44) | - | - | (20.44) | (105.64) |
| ගැළපීම් | 379.51 | (0.53) | - | - | 378.98 | 898.83 |
| **මාර්තු 31 දිනට ශේෂය** | 126,389.53 | 1,499.25 | 88.67 | 3,510.95 | 131,488.40 | 130,077.20 |
| **ක්ෂයවීම** | | | | | | |
| අප්‍රේල් 01 දිනට ශේෂය | 44,560.94 | 559.47 | 66.92 | 2,350.57 | 47,537.90 | 34,465.72 |
| ක්ෂයවීම | 13,153.34 | 254.46 | 8.47 | 230.63 | 13,646.89 | 13,116.09 |
| බැහැර කිරීම් | - | (17.08) | - | - | (17.08) | (43.91) |
| **මාර්තු 31 දිනට ශේෂය** | 57,714.28 | 796.85 | 75.39 | 2,581.20 | 61,167.71 | 47,537.90 |
| **මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය** | 68,675.25 | 702.40 | 13.28 | 929.75 | 70,320.69 | 82,539.30 |

*කෙටි කාලීන කල්බදු*

සමූහය මගින් මාස 12 ක් හෝ එයට අඩු කල්බදු කාලසීමාවන් සහිත ගුවන් යානා, ඉඩම් හා ගොඩනැගිලි සහ රථවාහන සම්බන්ධ කෙටි කාලීන කල්බදු සඳහා වත්කම් භාවිතයේ හිමිකම් හා කල්බදු වගකීම් හඳුනානොගැනීමට තීරණය කෙරිණි. සමූහය මගින් මෙම කල්බදු ආශ්‍රිත කල්බදු ගෙවීම් කල්බදු කාලසීමාව පුරා සරල රේඛීය පදනමක් මත වියදමක් වශයෙන් හඳුනාගැනේ.

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | 2023 රු. මිලියන | 2022 රු. මිලියන | 2023 රු. මිලියන | 2022 රු. මිලියන |
| කල්බදු ගුවන්යානා මත කුලී ගෙවීම් / අමතර එනජින් | 504.44 | 43.66 | 504.44 | 43.66 |
| ඉඩම් හා ගොඩනැගිලි මත කුලී ගෙවීම් | 411.26 | 206.48 | 411.26 | 206.48 |
| රථවාහන මත කුලී ගෙවීම් | 104.35 | 60.67 | 104.35 | 60.67 |

*අඩු වටිනාකමකින් යුතු වත්කම්*

සමූහය මගින් අඩු වටිනාකමකින් යුතු වත්කම් සඳහා වත්කම් භාවිතයේ හිමිකම් හා කල්බදු වගකීම් හඳුනා නොගැනීමට තීරණය කෙරිණි. සමූහය මගින් මෙම කල්බදු ආශ්‍රිත කල්බදු ගෙවීම්, කල්බදු කාලසීමාව පුරා සරල රේඛීය පදනමක් මත වියදමක් වශයෙන් හඳුනාගැනේ.

## 5. ගුවන්යානා පූර්ව ගෙවීම්

2023 මාර්තු 31 දිනට ගුවන්යානා ලබාගැනීම සඳහා වන පූර්ව ගෙවීම් (PDPs) සමන්විත වන්නේ එයාර්බස් A350 900 ගුවන් යානා හතරක් සඳහා සිදු කරන ලද රුපියල් මිලියන 6,288.68 (ඇ.ඩො. මිලියන 19.21) ක පූර්ව ගෙවීම්වලින් වන අතර එම ගුවන්යානා 2020 සහ 2021 දී ලබා දීමට නියමිතව තිබිණි.

**25. බැඳීම් සහ අසම්භාව්‍යයන් (සබැඳේ)**

*25.2 අසම්භාව්‍යයන්*

*සමාගම*

අසම්භාව්‍ය වගකීම්, 2023 මාර්තු 31 දිනට සිදුකරන ලද රුපියල් මිලියන 16,322.03 (2022 රුපියල් මිලියන 6,259.66) ක හිමිකම්පෑම මත පදනම් වේ. අසම්භාව්‍ය වගකීම් සඳහා ගුවන්යානා කල්බදු ගිවිසුම් අවලංගු වීම හේතුවෙන් ගුවන්යානා කොටස් හා එන්ජින් සැපයුම්කරුවන් කිහිපදෙනෙකු විසින් සිදුකරන ලද රුපියල් මිලියන 11,412.09 (ඇ.ඩො. මිලියන 34.84) ක හිමිකම්පෑම, ගුවන්තොටුපළ බදු ගෙවීම් හා ලබාගත් කොන්ත්‍රාත් වලට අදාළව විදේශ බදු අධිකාරියක විසින් නියම කරන ලද රුපියල් මිලියන 480.28 ක දඩ මුදල, විදේශ බදු අධිකාරියක් සමඟ සේවා බදු අර්බුදයක් හේතුවෙන් නියම කරන ලද රුපියල් මිලියන 2,443.67 ක්, සහ රුපියල් මිලියන 1,985.99 ක සේවකයින් ආශ්‍රිත හිමිකම්පෑම්වලින් සමන්විත වේ.

සමාගමෙහි ව්‍යාපාරික කටයුතු සිදු කෙරෙන අතරතුර ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන් හෝ සේවකයින් විසින් සමාගම වෙත කෙරෙන නෛතික ක්‍රියාමාර්ග, වෙනත් හිමිකම්පෑම් හෝ අනාගත හිමිකම්පෑම් හේතුවෙන් කවර හෝ අසම්භාව්‍ය වගකීම්ක් ආශ්‍රිත කිසිදු සැලකිය යුතු වගකීමක් උද්ගත වේ යැයි අධ්‍යක්ෂවරුන් විසින් අපේක්ෂා නොකෙරෙන බැවින්, මෙම මූල්‍ය ප්‍රකාශයන්හි කිසිදු ප්‍රතිපාදනයක් සිදුකොට නොමැත.

*පරිපාලිතය*

සමාගමෙහි නීතිඥවරුන්ගේ මතය අනුව, සමාගමෙහි අනාගත මෙහෙයුම්වල වාර්තා කරන ලද ප්‍රතිඵලයන් කෙරෙහි බලපෑමක් ඇති කරන්නා වූ කම්කරු උසාවි නඩු කටයුතු කිහිපයක් හැර සමාගමට එරෙහිව කිසිදු අසම්පූර්ණ නඩු කටයුත්තක් නොමැත. මෙම නඩු සඳහා රුපියල් මිලියන 3.74 ක් තැන්පත් කරනු ලැබ ඇත.

**26. ඇපයට තබන ලද වත්කම්**

*සමූහය/සමාගම*

ලබාගත් පහසුකම්වලට, ඇපයට තබන ලද වත්කම් පිළිබඳ විස්තර සඳහා සටහන 15.2 බලන්න.

**27. වාර්තාකරණ දිනයෙන් පසු සිදුවූ සිදුවීම්**

*සමූහය/සමාගම*

(අ) සටහන 15.2 හි අනාවරණය කර ඇති පරිදි, මෙම මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමට අනුමැතිය ලැබීමට පෙර ගෙවිය යුතු රුපියල් මිලියන 29,273.60 ක් වන කෙටි කාලීන පහසුකම් ආපසු ගෙවීම් දිනයන්, අදාළ භාණ්ඩාගාර ඇපකර සහ ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද සහනදායි ලිපිය සමගින් වාර්තා කරන දිනයට පසුව දීර්ඝ කොට ඇත.

(ආ)2023 ජූනි මාසයේදී ගෙවීමට නියමිතව තිබූ ජාත්‍යන්තර බැඳුම්කරයේ කූපන් පොලී ගෙවීම සමාගම විසින් සිදු නොකළේය. රජයේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ මූලපිරීම්වලට අනුකූලව ඉදිරියේදී අනුගමනය කළ හැකි සමබර හා සාධාරණ විසඳුමක් සෙවීම සඳහා බැඳුම්කර හිමියන් සමඟ සම්බන්ධ වීමට සමාගම සැලසුම් කරයි. මේ සඳහා සටහන 15.1 බලන්න.

(ඇ)සමාගම විසින් පටු බඳ සහිත ගුවන් යානා 3 ක් සඳහා කල්බදු කොන්දේසි දීර්ඝ කිරීමට අනුමැතිය ලබාගෙන ඇති අතර තවත් ගුවන් යානා 2 ක් සඳහා නව කල්බදු ගිවිසුම් වලට එළඹීමක් ද සිදුකර ඇත. ගිවිසුම් 2 ක් දැනටමත් අත්සන් කර ඇති අතර ඉතිරිය අවසාන අදියරෙහි පවතී.

## 28. සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම්

*28.1 සමූහය සහ සමාගම*

28.1.1 ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින් සමඟ සිදු කරන ගනුදෙනු (KMP)

සම්බන්ධිත පාර්ශ්වයන් අතරට සමාගමෙහි සහ එහි පරිපාලිතයෙහි ක්‍රියාකාරකම් සැලසුම්කරණය, නියම කිරීම සහ මෙහෙයවීමේ අධිකාරීත්වය හා වගකීම සහිත පුද්ගලයින් වශයෙන් නිර්වචනය කෙරෙන ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින් ඇතුළත් වේ. එවැනි ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින් අතරට සමූහයේ අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන විධායක නිලධාරී සහ ඉහත දක්වන ලද ක්‍රියාපටිපාටිය සපුරාලනු ලබන අනෙකුත් ජ්‍යේෂ්ඨ කළමනාකරණ විධායක නිලධාරීන් ඇතුළත් වේ.

සමූහය සහ සම්බන්ධිත පාර්ශ්වයක් අතර කවර හෝ ගනුදෙනුවක් සිදු කළ යුතු බවට නියම කර ඇති සමූහය/ සමාගම් ප්‍රතිපත්තියට අනුකූලව (සමාගමෙහි සම්බන්ධිතයන්, අධ්‍යක්ෂවරුන්, සේවකයින් හෝ ඔවුන්ගේ සමීපතම පවුලේ සාමාජිකයින්ට උනන්දුවක් ඇති විට) අනාවරණය කරන අතර ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයන් විසින් සිදුකරන ලද අදාළ ප්‍රකාශන සලකා බලා ඇත.

(අ) වාර්තාකරණ කාලපරිච්ඡේදය තුළදී ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයන් විසින් ව්‍යාපාරයෙහි සාමාන්‍ය ක්‍රියාකාරකම්වලදී සිදුකරන ලද කැපී පෙනෙන ගනුදෙනු පහත දැක්වේ;

| | 2023<br>රු. මිලියන | 2022<br>රු. මිලියන |
|---|---|---|
| කෙටි කාලීන ප්‍රතිලාභ | 306.07 | 208.62 |
| පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ | 45.41 | 35.66 |
| සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ | - | 4.96 |

වසර තුළදී අධ්‍යක්ෂවරුන්ට වරප්‍රසාද සහ අනෙකුත් ස්ථිර ගුවන් ටිකට්පත් ලබාදී නොමැත. ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයෝ සහ ඔවුන්ගේ කාලත්‍රයෝ සහ ඔවුන් මත යැපෙන දරුවෝද පවතින ආසන අනුව නොමිලේ ගුවන් ටිකට්පත් ලබාගැනීමේ සුදුසුකම් ලබති.

(ආ)සමූහයේ ප්‍රමුඛ කළමනාකාරණ වෘත්තිකයින් වසර තුළදී සමූහය සමඟ වෙළඳ ගනුදෙනු සිදුකරන ලද වෙනත් සමාගම්වල ධූරයන් දරන අතර ඒවා පහත දැක්වෙන පරිදි හඳුනාගැනේ;

- සමූහයෙහි සභාපති අසෝක පතිරගේ මහතා පිළිවෙළින් සොෆ්ට්ලොජික් හෝල්ඩින්ග්ස් පීඑල්සී සහ එහි පරිපාලිතයන්හි, ආසිරි හොස්පිට්ල් හෝල්ඩින්ග්ස් පීඑල්සී සහ එහි පරිපාලිතයන්හි, සහ ඔඩෙල් පීඑල්සී සහ එහි පරිපාලිතයන්හි සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ/අධ්‍යක්ෂවරයකු වශයෙන් කටයුතු කරයි. වසර තුළදී සමූහය විසින් ආසිරි හොස්පිට්ල් හෝල්ඩින්ග්ස් පීඑල්සී සමඟ රුපියල් මිලියන 27.62 ක වටිනාකමින් යුතු ගනුදෙනු සිදු කළ අතර, 2023 මාර්තු 31 දිනට හිඟ ශේෂය රුපියල් මිලියන 0.01 කි. සොෆ්ට්ලොජික් හෝල්ඩින්ග්ස් පීඑල්සී සමඟ රුපියල් මිලියන 0.03 ක වටිනාකමින් යුතු ගනුදෙනු සිදු කළ අතර, 2023 මාර්තු 31 දිනට හිඟ ශේෂය රුපියල් මිලියන 0.38 කි. (2022 - සමූහය පරිපාලිත සමාගම් සමඟ රුපියල් මිලියන 32.5 ක වටිනාකමින් යුතු ගනුදෙනු සිදුකරනු ලැබ ඇත).
- සමාගමෙහි අධ්‍යක්ෂවරයෙකු වන ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා, ඩයලොග් ආසිආටා පීඑල්සී සමාගම් සමූහයේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් සේවය කරනු ලබයි. වසර තුළදී සමූහය ඩයලොග් ආසිආටා පීඑල්සී සමඟ රුපියල් මිලියන 3.72 ක වටිනාකමින් යුතු ගනුදෙනු සිදුකරනු ලැබ ඇත. 2023 මාර්තු 31 දිනට අයවිය යුතු ශේෂය රුපියල් මිලියන 1.24 කි (2022 - සමූහය පරිපාලිත සමාගම් සමඟ රුපියල් මිලියන 4.56 ක වටිනාකමින් යුතු ගනුදෙනු සිදුකරනු ලැබ ඇත).
- සමාගමෙහි අධ්‍යක්ෂවරයෙකු වන ජයන්ත් පෙරේරා මහතා, මැක්ලරන්ස් සමාගම් සමූහයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කරනු ලබයි. වසර තුළදී සමූහය මැක්ලරන්ස් සමාගම් සමූහය සමඟ රුපියල් මිලියන 3.46 ක වටිනාකමින් යුතු ගනුදෙනු සිදු කරනු ලැබ ඇති අතර 2023 මාර්තු 31 දිනට හිඟ ශේෂය රුපියල් මිලියන 0.08 කි. (2022 - සමූහය පරිපාලිත සමාගම් සමඟ රුපියල් මිලියන 0.87 ක වටිනාකමින් යුතු ගනුදෙනු සිදු කරනු ලැබ ඇත).

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

**28. සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් (සබැඳේ)**

*28.1 සමූහය සහ සමාගම (සබැඳේ)*

*28.2 සමූහය*

සමාගමේ ප්‍රධාන කොටස්කරුවෙකු ලෙස ශ්‍රී ලංකා රජය (GOSL) වෙත සමූහයේ පාලන කටයුතු සඳහා බලය පවතී.

සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී ශ්‍රී ලංකා රජය (GOSL) විසින් පාලනය කරනු ලබන ආයතන සමඟ පහත දැක්වෙන අන්දමේ සැලකිය යුතු ගනුදෙනුවල නිරත වී ඇත.

| සමාගමේ නම | සම්බන්ධතාවය | ගනුදෙනුවල ස්වභාවය | ගනුදෙනුවේ වටිනාකම | | ලැබිය යුතු / (ගෙවිය යුතු) ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | | | 2023 රු. මිලියන | 2022 රු. මිලියන | 2023 රු. මිලියන | 2022 රු. මිලියන |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | රජයට අයත් | ඉන්ධන | (59,578.74) | (23,338.20) | (101,414.20) | (87,050.40) |
| | | ප්‍රමාද වූ ගෙවීම් සඳහා වන මූල්‍ය පිරිවැය | (11,739.36) | (3,523.04) | | |
| සීමාසහිත ගුවන්තොටුපොළ සහ ගුවන්සේවා සමාගම | රජයට අයත් | ගොඩබෑම්, ගුවන් පාලම්, මගී විවේකාගාර, කුලියට දීම, බලයලත් නියෝජිත ගාස්තු සහ කසළ නාශක ගාස්තු ආදිය | (6,453.84) | (2,971.90) | (2,093.81) | (2,231.21) |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | රජයේ පාලනයට අයත් | බලපත්‍ර, අවසර පත්‍ර සහ බදු | (25,186.50) | (4,657.97) | (5,444.54) | (1,607.33) |
| මිහින් ලංකා (පුද්) සමාගම | රජයට අයත් | ගබඩාව කුලියට දීම | 0.58 | 0.58 | 1,167.36 | 1,102.36 |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | රජයට අයත් | රක්ෂණ සේවා | (1,363.83) | (706.57) | - | - |
| ලංකා බැංකුව | රජයට අයත් | ණය | - | 200.75 | (47,265.00) | (45,077.51) |
| | | කෙටි කාලීන තැන්පතු | - | - | 2,073.56 | 2,443.58 |
| | | බැංකු අයිරා | - | - | (18,408.22) | (17,129.68) |
| | | පොලිය | (9,594.47) | (3,490.51) | - | - |
| මහජන බැංකුව | රජයට අයත් | ණය | - | - | (50,579.60) | (47,479.28) |
| | | කෙටි කාලීන තැන්පතු | - | - | 3.49 | 4.08 |
| | | බැංකු අයිරා | | | (1,244.90) | (4,394.01) |
| | | පොලිය | (9,418.42) | (2,871.61) | - | - |

වාර්තාකරණ දිනය වන විට, සමාගම ලංකා බැංකුවෙන් රුපියල් මිලියන 3,007.46 ක (2022 - රුපියල් මිලියන 2,952.47) බැංකු ඇපකර පහසුකම් භාවිත කරනු ලැබ ඇත.

සමාගම වෙනුවෙන් සපයන ලද රජයේ ඇපකර සහ සහනදායී ලිපි පිළිබඳ විස්තර සඳහා සටහන 15.2 බලන්න.

ශ්‍රී ලංකා රජය මඟින් පාලනය කරනු ලබන ආයතන වෙතින්/වෙත වන ශේෂයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වෙළඳ සහ වෙනත් ලැබිය යුතු/ගෙවිය යුතු දෑ සහ පොලී දරන වගකීම් යටතේ දක්වා ඇත.

වාර්තාකරණ දිනය වන විට, අදාළ පාර්ශ්වවලට අදාළ හානිකරණ සඳහා ප්‍රතිපාදන සමූහය සහ සමාගම සඳහා පිළිවෙළින් රුපියල් මිලියන 1,284.43 ක් සහ රුපියල් මිලියන 1,183.97 ක් විය. (2022- සමූහය සඳහා රුපියල් මිලියන 1,230.35 සහ සමාගම සඳහා රුපියල් මිලියන 1,129.89).

සියලුම රජය මඟින් පාලනය කෙරෙන/අදාළ ආයතනයන් සමඟ සිදුකරන ලද සියලු ගනුදෙනු සඳහා 'LKAS 24 - සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම්' හි පවතින නිදහස් කිරීම් යොදා ගනිමින් සීමිත හෙළිදරව් කිරීම් ප්‍රමාණයක් සිදු කර ඇත.

## 28. සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් (සබැඳේ)

*28.3 සමාගම*

සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී ශ්‍රී ලංකා රජය (GOSL) විසින් පාලනය කරනු ලබන පරිපාලිතය සහ ආයතන සමඟ පහත දැක්වෙන කරුණු ඇතුළුව සැලකිය යුතු ගනුදෙනු සිදු කර ඇත.

| සමාගමේ නම | සම්බන්ධතාවය | ගනුදෙනුවල ස්වභාවය | ගනුදෙනුවේ වටිනාකම | | ලැබිය යුතු / (ගෙවිය යුතු) ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | | | 2023<br>රු. මිලියන | 2022<br>රු. මිලියන | 2023<br>රු. මිලියන | 2022<br>රු. මිලියන |
| සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම | පරිපාලිතය | භාණ්ඩ ප්‍රවාහන සේවා | 277.19 | 94.09 | (9,843.31) | (9,334.39) |
| | | යානාස්ථ ආහාරපාන සැපයීම සහ වෙනත් සේවා | (13,138.86) | (2,439.73) | | |
| | | ලාභාංශ | 2,382.30 | - | | |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | රජයට අයත් | ඉන්ධන | (59,200.78) | (23,266.45) | (101,414.20) | (87,050.40) |
| | | ප්‍රමාද වූ ගෙවීම් සඳහා වන මූල්‍ය පිරිවැය | (11,739.36) | (3,523.04) | | |
| සීමාසහිත ගුවන්තොටුපොළ සහ ගුවන්සේවා සමාගම | රජයට අයත් | ගොඩබෑම්, ගුවන් පාලම්, මගී විවේකාගාර, කුලියට දීම, බලයලත් නියෝජිත ගාස්තු සහ කසළ නාශක ගාස්තු ආදිය | (5,527.85) | (2,793.54) | (2,237.53) | (2,231.21) |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | රජයේ පාලනයට අයත් | බලපත්‍ර, අවසර පත්‍ර සහ බදු | (25,186.50) | (4,657.97) | (5,444.54) | (1,607.33) |
| මිහින් ලංකා (පුද්) සමාගම | රජයට අයත් | ගබඩාව කුලියට දීම | 0.58 | 0.58 | 1,055.53 | 1,001.90 |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | රජයට අයත් | රක්ෂණ සේවා | (1,363.83) | (706.57) | - | - |
| මහජන බැංකුව | රජයට අයත් | ණය | - | 200.75 | (47,265.00) | (45,077.51) |
| | | කෙටි කාලීන තැන්පතු | - | - | 2,073.56 | 2,443.58 |
| | | පොලිය | (9,594.47) | (3,490.51) | - | - |
| | | බැංකු අයිරා | | | (18,408.22) | (17,129.68) |
| මහජන බැංකුව | රජයට අයත් | ණය | - | - | (50,579.60) | (47,479.28) |
| | | කෙටි කාලීන තැන්පතු | - | - | 3.49 | 4.08 |
| | | පොලිය | (9,418.42) | (2,871.61) | - | - |
| | | බැංකු අයිරා | - | - | (1,244.90) | (4,394.01) |

වාර්තාකරණ දිනය වන විට, සමාගම ලංකා බැංකුවෙන් රුපියල් මිලියන 2,987.92 ක (2022 - රුපියල් මිලියන 2,952.47) බැංකු ඇපකර පහසුකම් භාවිත කරනු ලැබ ඇත.

සමාගම වෙනුවෙන් සපයන ලද රජයේ ඇපකර සහ සහනදායී ලිපි පිළිබඳ විස්තර සඳහා සටහන 15.2 බලන්න.

ශ්‍රී ලංකා රජය මඟින් පාලනය කරනු ලබන ආයතන වෙතින්/වෙත වන ශේෂයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වෙළඳ සහ වෙනත් ලැබිය යුතු/ගෙවිය යුතු දෑ සහ පොලී දරන වගකීම් යටතේ දක්වා ඇත.

වාර්තාකරණ දින වන විට, සම්බන්ධිත පාර්ශ්වයන් ආශ්‍රිත හානිකරණය සඳහා වෙන්කිරීම රුපියල් මිලියන 1,183.97 ක් (2022 - රුපියල් මිලියන 1,129.89) විය.

සියලුම රජය මඟින් පාලනය කෙරෙන/අදාළ ආයතනයන් සමග සිදුකරන ලද සියලු ගනුදෙනු සඳහා 'LKAS 24 - සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම්' හි පවතින නිදහස් කිරීම් යොදා ගනිමින් සීමිත හෙළිදරව් කිරීම් ප්‍රමාණයක් සිදු කර ඇත.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

**29. මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති**

සමූහයේ ප්‍රධාන මූල්‍ය වගකීම් සමන්විත වනුයේ ණය සහ ණය ගැනීම්, වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ සහ වෙනත් මූල්‍ය වගකීම්වලිනි. මෙම මූල්‍ය වගකීම්වල ප්‍රධාන අරමුණ වන්නේ සමූහයේ මෙහෙයුම් සඳහා මූල්‍ය සම්පාදනයයි. සමූහයේ මූල්‍ය වත්කම් සමන්විත වන්නේ වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ සහ එහි මෙහෙයුම්වලින් ඍජුව ලබාගත් මුදල් සහ කෙටි කාලීන තැන්පතුවලිනි.

ආයතනික කළමනාකාරිත්වය විසින් වරින් වර, පුළුල් අවදානම් කළමනාකරණ අනුකෘතිය විමර්ශනය කර යාවත්කාලීන කරන අතර, සැලකිය යුතු බලපෑමක් ඇති පහත සඳහන් මූල්‍ය අවදානම් හඳුනාගෙන ඇත.

(i) වෙළඳපොළ අවදානම
- පොලී අනුපාත අවදානම
- විනිමය අවදානම

(ii) ද්‍රවශීලතා අවදානම

(iii) ණය අවදානම

වෙළඳපොළ වෙනස්වීම් සහ අනෙකුත් මූල්‍යමය අවදානම් සහිත ක්‍රියාකාරකම්වල වෙනස්කම් පිළිබිඹු වන පරිදි සමූහය සිය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලබන අතර, මේවා නියම කරන ලද ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටිවලට අනුකූලව අවදානම් හඳුනාගෙන මැනීම සහ කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා යෝග්‍ය ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි මඟින් පාලනය වේ.

*(i) වෙළඳපොළ අවදානම*

**පොලී අනුපාත අවදානම**

පොලී අනුපාත අවදානම යනු වෙළඳපළ පොලී අනුපාතවල වෙනස්වීම් හේතුවෙන් මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහවල සාධාරණ වටිනාකම උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපළ පොලී අනුපාතවල වෙනස් වීමේ අවදානමට සමූහය නිරාවරණය වීම මූලික වශයෙන් පාවෙන පොලී අනුපාත සමඟ සමූහයේ දිගු කාලීන ණය බැඳීම් හා සම්බන්ධ වේ.

පොලී අනුපාත උච්චාවචනයන්හි බලපෑම අවම කිරීම සඳහා ගුවන් යානා කල්බදු ඇතුළු ස්ථාවර හා විචල්‍ය අනුපාත ණය ගැනීම් අතර ප්‍රශස්ත සමබරතාවයක් පවත්වා ගැනීම සමූහයේ ප්‍රතිපත්තියයි.

ණය සහ ණය ගැනීම් සඳහා පොලී අනුපාතවල සාධාරණ ලෙස වෙනස් විය හැකි සංවේදීතාව පහත වගුව මඟින් ඉදිරිපත් කෙරේ. අනෙකුත් සියලුම විචල්‍යයන් නියතව පැවතුනහොත්, පහත සඳහන් පරිදි පාවෙන අනුපාත ණය ගැනීම් සඳහා වන බලපෑම මඟින් බදුවලට පෙර සමූහයේ / සමාගමේ අලාභයට බලපානු ඇත.

| | බදුවලට පෙර අලාභය මත බලපෑම | | | |
|---|---|---|---|---|
| | 2023 | | 2022 | |
| | සමූහය රු. මිලියන | සමාගම රු. මිලියන | සමූහය රු. මිලියන | සමාගම රු. මිලියන |
| පොලී අනුපාත ඉහළයාම/(පහළයාම) | | | | |
| +5% | 5,455.20 | 5,455.20 | 4,759.61 | 4,759.61 |
| -5% | (5,455.20) | (5,455.20) | (4,759.61) | (4,759.61) |

*පොලී අනුපාත ඉහළයාම, අලාභ ඉහළ යාම කෙරෙහි හේතු වේ.

**විදේශ විනිමය අවදානම**

විදේශ විනිමය අවදානම යනු විදේශ විනිමය අනුපාතවල වෙනස්වීම් හේතුවෙන් මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහවල සාධාරණ වටිනාකම උච්චාවචනය වීමේ අවදානමයි. සමූහය විසින් එහි විදේශ මුදල් ඒකක මඟින් ආදායම, වියදම්, ණය ගැනීම් සහ වෙනත් මූල්‍ය උපකරණ නියම කර ඇති බැවින් විදේශ විනිමය අනුපාතයේ උච්චාවචනයන්හි බලපෑමට නිරාවරණය වී ඇත.

සමූහය සිය විදේශ විනිමය නිරාවරණය කළමනාකරණය කරනුයේ රිසිට්පත් තැබීම සහ ගෙවීම හැකිතාක් දුරට අදාළ මුදල් ඒකකවලින්ම ගැළපීමේ ප්‍රතිපත්තියක් මඟිනි.

පහත දැක්වෙන වගුව මඟින් සමූහයේ/ සමාගමේ බදුවලට පෙර අලාභයේ (වාර්තා කරන දිනය වන විට මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කිරීමේදී වාර්තා වී ඇති හිඟ මුදල් වත්කම් සහ වගකීම්වල සාධාරණ අගයෙහි වෙනස්වීම් හේතුවෙන්) එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ රුපියල වෙනස් විය හැකි සංවේදීතාව පෙන්නුම් කරන අතර, සෙසු සියලුම විචල්‍යයන් නියතව පවතී. අනෙකුත් සියලුම මුදල් සඳහා සමූහය විදේශ මුදල් වෙනස්වීම්වලට නිරාවරණය වීම, ප්‍රමාණාත්මක බලපෑමක් ඇති නොකරයි.

## 29. මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති (සබැඳේ)

| | බදුවලට පෙර අලාභය මත බලපෑම | | | |
|---|---|---|---|---|
| | 2023 | | 2022 | |
| | සමූහය<br>රු. මිලියන | සමාගම<br>රු. මිලියන | සමූහය<br>රු. මිලියන | සමාගම<br>රු. මිලියන |
| පොලී අනුපාත ඉහළයාම/(පහළයාම) | | | | |
| +10% | 52,641.01 | 52,120.25 | 50,118.25 | 50,103.77 |
| -10% | (52,641.01) | (52,120.25) | (50,118.25) | (50,103.77) |

*පොලී අනුපාත ඉහළයාම, අලාභ ඉහළ යාම කෙරෙහි හේතු වේ.

ඇමරිකන් ඩොලරයෙන් දක්වා ඇති වත්කම් සහ වගකීම් 2023 මාර්තු 31 දිනට වන ශ්‍රී ලංකා රුපියල් 327.2857 (2022 - රුපියල් 294) වූ විනිමය අනුපාතයට පරිවර්තනය කරන ලදී.

*(ii) ද්‍රවශීලතා අවදානම*

ද්‍රවශීලතා අවදානම යනු සමූහයට එහි වර්තමාන සහ අනාගත මුදල් බැඳීම් නියමිත පරිදි සපුරාලීමට නොහැකි වීමේ අවදානමයි. සමූහය විසින් දෛනික/සතිපතා/මාසික සහ වාර්ෂික මුදල් කළමනාකරණ සහ අයවැයකරණ ක්‍රියාවලියක් භාවිත කරමින් අරමුදල් හිඟවීමේ අවදානම පිළිබඳ අධීක්ෂණය කරයි. අවදානම අවම කිරීම සඳහා දිගු කාලීන සහ කෙටි කාලීන ණය, බැංකු අයිරා පහසුකම්, සැපයුම්කරු මූල්‍යකරණය, කල්බදු ඇතුළු මූල්‍ය ආයතනවලින් අරමුදල් ලබා ගැනීම සඳහා සමූහය විසින් කටයුතු කරනු ලැබේ.

පහත වගුව මගින් ගිවිසුම්ගත වට්ටම් නොකළ ගෙවීම් මත පදනම්ව සමූහයේ/සමාගමේ මූල්‍ය වගකීම්වල කල්පිරීම් පිළිබඳ විස්තර සාරාංශ කොට දැක්වේ.

| 2023 | වට්ටම් නොකළ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ | | | | | | ධාරණ අගය |
|---|---|---|---|---|---|---|---|
| | ඉල්ලීම මත<br>රු. මිලියන | මාස 3 ට අඩු<br>රු. මිලියන | මාස 3 සිට මාස 12 දක්වා<br>රු. මිලියන | වසර 2 සිට 5 දක්වා<br>රු. මිලියන | වසර 5 ට වැඩි<br>රු. මිලියන | එකතුව<br>රු. මිලියන | රු. මිලියන |
| **සමූහය** | | | | | | | |
| පොලී දරන වගකීම් | 19,653.12 | 29,273.93 | 125,777.64 | - | - | 174,704.69 | 174,704.69 |
| කල්බදු වගකීම | 30,462.69 | 10,383.28 | 29,052.54 | 157,224.66 | 22,759.62 | 249,882.79 | 214,032.53 |
| ගුවන් යානා නඩත්තු කිරීමේ සහ අලුත්වැඩියා පිරිවැය | - | - | 27,131.51 | 43,799.39 | - | 70,930.90 | 70,930.90 |
| ප්‍රතිලාභ පිරිවැය වගකීම | - | - | 4,128.83 | 5,748.03 | - | 9,876.86 | 9,876.86 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | - | 164,549.80 | - | - | - | 164,549.80 | 164,549.80 |
| | 50,115.81 | 204,207.01 | 186,090.52 | 206,772.08 | 22,759.62 | 669,945.04 | 634,094.78 |
| **සමාගම** | | | | | | | |
| පොලී දරන වගකීම් | 19,653.12 | 29,273.93 | 125,777.64 | - | - | 174,704.69 | 174,704.69 |
| කල්බදු වගකීම | 30,462.69 | 10,383.28 | 28,880.24 | 156,495.46 | 22,759.62 | 248,981.29 | 213,131.03 |
| ගුවන් යානා නඩත්තු කිරීමේ සහ අලුත්වැඩියා පිරිවැය | 16,603.69 | 3,092.27 | 6,668.53 | 35,099.77 | 9,466.64 | 70,930.90 | 70,930.90 |
| ප්‍රතිලාභ පිරිවැය වගකීම | 1,949.35 | 1,949.35 | 1,949.35 | 1,949.35 | 1,949.35 | 9,746.74 | 9,876.86 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | - | 170,848.07 | - | - | - | 170,848.07 | 170,848.07 |
| | 68,668.85 | 215,546.90 | 163,275.76 | 193,544.58 | 34,175.61 | 675,211.69 | 639,491.55 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

**29. මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති (සබැඳේ)**

*(ii) ද්‍රවශීලතා අවදානම (සබැඳේ)*

| 2022 | වට්ටම් නොකළ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ | | | | | | ධාරණ අගය |
|---|---|---|---|---|---|---|---|
| | ඉල්ලීම මත | මාස 3 ට අඩු | මාස 3 සිට මාස 12 දක්වා | වසර 2 සිට 5 දක්වා | වසර 5 ට වැඩි | එකතුව | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **සමූහය** | | | | | | | |
| පොලී දරන වගකීම් | 21,523.70 | 33,038.27 | 65,847.47 | 56,852.25 | - | 177,261.69 | 168,134.95 |
| කල්බදු වගකීම | 0.17 | 10,768.36 | 32,305.09 | 155,528.06 | 40,776.09 | 239,377.77 | 211,727.51 |
| ගුවන් යානා නඩත්තු කිරීමේ සහ අලුත්වැඩියා පිරිවැය | 5,424.85 | 4,039.89 | 12,046.30 | 25,758.16 | 3,783.27 | 51,052.47 | 51,052.45 |
| ප්‍රතිලාභ පිරිවැය වගකීම | 355.76 | - | 1,795.08 | 2,405.84 | 4,303.62 | 8,860.30 | 8,860.30 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | - | 127,379.17 | - | - | - | 127,379.17 | 127,379.17 |
| | 27,304.48 | 175,225.69 | 111,993.94 | 240,544.31 | 48,862.98 | 603,931.40 | 567,154.38 |
| **සමාගම** | | | | | | | |
| පොලී දරන වගකීම් | 21,523.70 | 33,038.27 | 65,847.47 | 56,852.25 | - | 177,261.69 | 168,134.95 |
| කල්බදු වගකීම | 0.17 | 10,725.38 | 32,176.14 | 154,977.44 | 40,440.83 | 238,319.96 | 210,669.68 |
| ගුවන් යානා නඩත්තු කිරීමේ සහ අලුත්වැඩියා පිරිවැය | 5,424.85 | 4,039.89 | 12,046.30 | 25,758.16 | 3,783.27 | 51,052.47 | 51,052.45 |
| ප්‍රතිලාභ පිරිවැය වගකීම | 355.76 | 0.00 | 1,795.08 | 2,405.84 | 4,303.62 | 8,860.30 | 8,860.30 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | - | 136,407.84 | - | - | - | 136,407.84 | 136,407.84 |
| | 27,304.48 | 184,211.38 | 111,864.99 | 239,993.69 | 48,527.72 | 611,902.26 | 575,125.22 |

***(iii) ණය අවදානම***

ණය අවදානම යනු මූල්‍ය අලාභයකට තුඩු දෙන මූල්‍ය උපකරණයක් හෝ පාරිභෝගික ගිවිසුමක් යටතේ ප්‍රති පාර්ශ්වයක් විසින් තම වගකීම් ඉටු නොකිරීම නිසා ඇති වන අවදානමයි. සමූහය ප්‍රධාන වශයෙන් ණය අවදානමට නිරාවරණය වන්නේ එහි මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් (මූලික වශයෙන් වෙළඳ ලැබිය යුතු දෑ) හේතුවෙනි.

මගී සහ භාණ්ඩ ප්‍රවාහනය විකිණීම මූලික වශයෙන් IATA ප්‍රතීතනය ලත් විකුණුම් නියෝජිතයින් හරහා සිදු වේ. පුළුල් විවිධාංගීකරණයක් හේතුවෙන් එවැනි විකුණුම්වල ණය අවදානම සාපේක්ෂව කුඩා වේ. IATA විසින් මෙම නියෝජිතයින් විසින් සිදු කරන ලද පියවීම් ඔවුන්ගේ මගී සහ භාණ්ඩ පියවීම් යෝජනා ක්‍රම හරහා එකතු කරනු ලැබේ. එකතු කරන ලද අරමුදල් IATA විසින් සෘජුවම ගුවන් සමාගම වෙත පියවනු ලබන අතර එමඟින් එවැනි නියෝජිතයින්ගේ ණය සුදුසුකම් පිළිබඳ තවදුරටත් සහතික වීමක් සිදු වේ.

ප්‍රධාන ගුවන් සමාගම් අතර ලැබිය යුතු සහ ගෙවිය යුතු මුදල් ප්‍රධාන වශයෙන් IATA නිෂ්කාශන ආයතනය හරහා පියවනු ලැබේ. ලැබිය යුතු සහ ගෙවිය යුතු දෑ සාමාන්‍යයෙන් ශුද්ධ වටිනාකමක් බවට පත්කොට සතිපතා කාල පරතරයන් මත පියවනු ලබන අතර, එය පැහැර හැරීමේ අවදානම පැහැදිලි ලෙස අඩු කිරීමට හේතු වේ. වෙනත් සේවා සම්බන්ධතා සඳහා, සපයනු ලබන සේවාවන්හි ස්වභාවය සහ විෂය පථය මත ඇපකරයක් අවශ්‍ය වේ. ණය ගැතියන්ගෙන් ලැබෙන එවැනි ඇපකරයන්ට බැංකු ඇපකර, ආරක්ෂක තැන්පතු සහ වෙනත් යාන්ත්‍රණ ඇතුළත් වේ.

අවදානම් හඳුනාගත් සෑම අවස්ථාවකම ලැබිය යුතු සැක සහිත ගිණුම් සඳහා හානිකරණය සිදු කෙරේ.

*ප්‍රාග්ධන කළමනාකරණය*

මෙම මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 2.1.1 හි වඩාත් සම්පූර්ණයෙන් විස්තර කර ඇති සාධක මත පදනම්ව, යෝජිත ප්‍රාග්ධන මුදල් සම්භාරය සහ ණය ප්‍රතිව්‍යුහගතකරණය සමඟ ණය මූල්‍යකරණය සඳහා ස්වෛරී ඇපකර/සහනශීලී ලිපි ලබා දීමෙන් සමූහයට ශ්‍රී ලංකා රජය සිය දායකත්වය ලබා දී ඇත.

# පාරිභාෂික ශබ්ද මාලාව

**ලබාගත හැකි ආසන කිලෝමීටර් ප්‍රමාණය (ASK)**
අලෙවිය සඳහා පවතින ආසන ප්‍රමාණය සහ ඒවා ප්‍රවාහනය කරන දුර ප්‍රමාණයේ ගුණිත වේ.

**ලබාගත හැකි ටොන් කිලෝමීටර් ප්‍රමාණය (ATK)**
මෙය ප්‍රවාහන නිෂ්පාදනයෙහි මිණුම වේ.

ගුවන් යානාවක් විසින් නිපදවන ලබාගත හැකි ටොන් කිලෝමීටර ප්‍රමාණය වනුයේ, පියාසර කළ දුර ප්‍රමාණය, ටොන් ප්‍රමාණයෙන් ගුණ වීමෙන් ගණනය වන ගුවන් යානාවේ බර සඳහා ධාරිතාවයි.

**ආදායම් මගී කිලෝමීටර් ප්‍රමාණය (RPK)**
ප්‍රවාහනය කළ මගීන් සහ ඔවුන් ප්‍රවාහනය කළ දුර ප්‍රමාණයේ ගුණිතය වේ.

**ආදායම් ටොන් කිලෝමීටර ප්‍රමාණ (RTK)**
ටොන් වලින් ප්‍රවාහනය කළ මගී සහ භාණ්ඩ නිෂ්පාදනය සහ ඒවා ප්‍රවාහනය කෙරෙන දුර ප්‍රමාණය.

**පැටවුම් සාධකය**
සැපයන ලද ධාරිතාවයට පැටවුමේ සබඳතාවය අනුව ප්‍රතිශතය.

මගී පැටවුම් සාධකය කෙරෙහි ASK සහ RPK අදාළ වන අතර සමස්ත පැටවුම් සාධකය කෙරෙහි RTK සහ ATK අදාළ වේ.

**ආදායම් මගී කිලෝමීටර් RPK**
ප්‍රමාණයට ආදායම ආදායම සහ ආදායම් මගී කිලෝමීටර් ප්‍රමාණය අතර සබඳතාවය වේ.

**ඒකක පිරිවැය**
ලබාගත හැකි ටොන් කිලෝමීටර් ප්‍රමාණයට (ATK) මූල්‍ය පිරිවැය අඩුකළ පසු ගුවන්සේවා මෙහෙයුම් වල මුළු මෙහෙයුම් පිරිවැය ගැළපීමෙන් ඒකක පිරිවැය ගණනය කෙරේ.

**සමස්ත ඵලදාව**
ආදායම් ටොන් කිලෝමීටර් ප්‍රමාණයට (RTK) ශුද්ධ ප්‍රවාහන ආදායම ගැළපීමෙන් සමස්ත ඵලදාව ගණනය කෙරේ.

ශුද්ධ ප්‍රවාහන ආදායම යනු මගී, අතිරේක ගුවන් මළු, ගුවන් බඩු හා තැපැල් යන ඒවායේ, වැඩසටහන්ගත හා වැඩසටහන්ගත නොකළ සේවාවන් වල එකතුවයි.

# දස අවුරුදු සමාලෝචනය

| | | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රකාශය** | | | | | |
| ආදායම | රු.මිලියන | 121,585.83 | 131,922.13 | 129,480.41 | 135,491.19 |
| මෙහෙයුම් පිරිවැය | රු.මිලියන | 150,389.46 | 145,983.35 | 137,311.44 | 146,760.80 |
| ශුද්ධ ලාභ/(අලාභ) | රු.මිලියන | (32,408.34) | (16,494.66) | (12,621.69) | (28,929.99) |
| **ශේෂ පත්‍රය** | | | | | |
| කොටස් ප්‍රාග්ධනය/ප්‍රකාශිත ප්‍රාග්ධනය | රු.මිලියන | 51,617.44 | 51,617.44 | 51,617.44 | 51,617.44 |
| ජංගම නොවන වත්කම් | රු.මිලියන | 25,212.47 | 22,836.77 | 23,548.01 | 24,660.56 |
| ජංගම වත්කම් | රු.මිලියන | 37,154.23 | 49,721.49 | 26,901.02 | 26,973.07 |
| මුළු වත්කම් | රු.මිලියන | 62,366.70 | 72,558.26 | 50,449.03 | 51,633.63 |
| ජංගම වගකීම් | රු.මිලියන | 88,609.07 | 103,414.31 | 100,334.44 | 126,302.55 |
| **ප්‍රතිලාභය /ඒකක පිරිවැය** | | | | | |
| සමස්ත ප්‍රතිලාභ | රු. tkm | 77.26 | 80.32 | 79.06 | 80.08 |
| ඒකක පිරිවැය (මූල්‍ය පිරිවැය හැර) | රු. tkm | 65.00 | 62.00 | 58.72 | 61.61 |
| මගී කි.මී. 1 ක ආදායම | රු. ./RPK | 7.8 | 8.2 | 8.2 | 8.4 |
| **නිෂ්පාදනය** | | | | | |
| මගී ධාරිතාවය | ASK මිලියන | 15,780.54 | 16,180.27 | 15,790.28 | 15,608.10 |
| සමස්ත ධාරිතාවය | ATK මිලියන | 2,187.18 | 2,224.87 | 2,165.21 | 2,167.92 |
| **ප්‍රවාහනය** | | | | | |
| ප්‍රවාහනය කළ මගීන් | සංඛ්‍යාව දහස් | 4,175 | 4,348 | 4,328 | 4,446 |
| ප්‍රවාහනය කළ මගීන් | RPK මිලියන | 12,810.95 | 12,963.71 | 12,727.66 | 12,455.05 |
| මගී පැටවුම් සාධකය | % | 81.18 | 80.12 | 80.60 | 79.80 |
| | | | | | |
| ප්‍රවාහනය කළ භාණ්ඩ | ටොන් | 94,410 | 101,878 | 102,082 | 116,221 |
| ප්‍රවාහනය කරන ලද භාණ්ඩ පැටවුම් | RTK මිලියන | 355.59 | 373.32 | 356.76 | 374.46 |
| | | | | | |
| ප්‍රවාහනය කරන ලද සමස්ත භාණ්ඩ පැටවුම් | RTK මිලියන | 1,466.74 | 1,519.93 | 1,484.77 | 1,475.29 |
| සමස්ත භාණ්ඩ පැටවුම් සාධකය | % | 67.06 | 68.32 | 68.57 | 68.05 |
| **කාර්ය මණ්ඩලය** | | | | | |
| පිරිස් බලයේ සාමාන්‍යය | සංඛ්‍යාව | 6,578 | 6,987 | 6,959 | 7,021 |
| සේවකයෙකුගේ ආදායම | රු. | 18,483,708 | 18,881,084 | 18,606,181 | 19,297,991 |
| සේවකයෙකුගේ ධාරිතාව | ටොන් කි.මී. | 332,499 | 318,430 | 311,139 | 308,776 |
| සේවකයෙකු ප්‍රවාහනය කළ පැටවුම් | ටොන් කි.මී. | 222,976 | 217,537 | 213,359 | 210,126 |
| **සමස්ත ප්‍රවාහන යානා** | | | | | |
| පටු බඳ සහිත | සංඛ්‍යාව | 8 | 8 | 8 | 11 |
| පුළුල් බඳ සහිත | සංඛ්‍යාව | 13 | 13 | 13 | 13 |
| වසර අවසානය වන විට සේවයේ නියුතු ගුවන් යානා | සංඛ්‍යාව | 21 | 21 | 21 | 24 |
| ගුවන් යානා භාවිතය | දිනකට පියාසර පැය | 12.76 | 12.90 | 12.02 | 12.44 |

| 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|
| 161,433.87 | 180,340.32 | 180,151.02 | 50,693.85 | 132,936.23 | 365,171.77 |
| 175,883.85 | 206,344.66 | 190,321.69 | 81,405.99 | 170,209.86 | 330,568.53 |
| (17,213.57) | (44,022.67) | (47,197.86) | (45,231.46) | (166,369.68) | (73,621.53) |
| 51,617.44 | 51,617.44 | 51,617.44 | 79,352.43 | 96,360.67 | 96,360.67 |
| 37,476.46 | 36,596.59 | 150,013.50 | 122,471.42 | 122,685.53 | 132,772.81 |
| 30,090.50 | 40,742.41 | 31,176.10 | 31,909.99 | 55,458.64 | 66,681.95 |
| 67,566.96 | 77,338.99 | 181,189.60 | 154,381.41 | 178,144.17 | 199,454.76 |
| 130,358.61 | 227,081.67 | 242,821.23 | 253,218.98 | 358,161.14 | 498,306.50 |
| 84.24 | 91.32 | 99.03 | 146.86 | 147.06 | 253.97 |
| 65.74 | 74.31 | 74.22 | 105.23 | 89.02 | 163.87 |
| 8.6 | 9.4 | 10.2 | 21.8 | 15.0 | 24.4 |
| 18,487.54 | 18,925.40 | 18,041.41 | 3,816.40 | 10,144.12 | 15,188.00 |
| 2,549.88 | 2,577.53 | 2,454.30 | 794.52 | 1,531.28 | 2,044.45 |
| 5,839 | 5,663 | 5,256 | 167 | 1,468 | 3,484 |
| 15,280.78 | 15,689.19 | 14,547.97 | 748.13 | 4,968.59 | 11,793.72 |
| 82.65 | 82.90 | 80.64 | 19.60 | 48.98 | 77.65 |
| 132,958 | 125,753 | 113,971 | 56,406 | 97,695 | 80,827 |
| 401.66 | 408.71 | 363.31 | 244.93 | 400.16 | 294.56 |
| 1,749.14 | 1,806.58 | 1,664.49 | 312.26 | 847.33 | 1,355.99 |
| 68.60 | 70.09 | 67.82 | 39.30 | 55.33 | 66.33 |
| 7,019 | 6,794 | 6,693 | 5,965 | 5,833 | 5,440 |
| 22,999,555 | 26,544,057 | 26,916,333 | 8,498,550 | 22,790,370 | 67,127,164 |
| 363,283 | 379,383 | 366,697 | 133,196 | 262,520 | 375,819 |
| 249,201 | 265,908 | 248,691 | 52,349 | 145,265 | 249,263 |
| 13 | 13 | 13 | 12 | 12 | 12 |
| 13 | 14 | 12 | 12 | 12 | 11 |
| 26 | 27 | 25 | 24 | 24 | 23 |
| 13.25 | 12.60 | 12.18 | 2.98 | 7.21 | 10.14 |

# ගුවන් මාර්ග සිතියම

දැනට ශ්‍රීලංකන් ගුවන් සමාගම යුරෝපය, මැද පෙරදිග, දකුණු ආසියාව, අග්නිදිග ආසියාව, ඈත පෙරදිග, ඕස්ට්‍රේලියාව සහ උතුරු ඇමෙරිකාව වැනි කලාප වල රටවල් 56 ක් පුරා ගමනාන්ත 111 ක් සඳහා සේවා සපයයි.



# Destinations in 56 Countries

SriLankan Airlines brings more of the world to you



# විශේෂ කඩඉම්

## 2011/2012

කල්බදු ගිවිසුමක් යටතේ සමාගම එයාර් බස් A320 ගුවන් යානා හතරක්, එයාර් බස් A330 පුළුල් බඳ ගුවන් යානා දෙකක් සහ එයාර් බස් A340 පුළුල් බඳ ගුවන් යානාවක් භාර ගත්තේය.

ගුවන් සේවය ප්‍රතිප්‍රාග්ධනීකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ඇමරිකානු ඩොලර් මිලියන 500 ක කොටස් ආයෝජනයක් සඳහා කැබිනට් අනුමැතිය හිමි විය.

## 2012/2013

එයාර් බස් A320 නියමුවන් පුහුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පළමු A320 පියාසැරි සිමියුලේටරය දියත් කිරීම.

මෙහෙයුම් කල්බදු ගිවිසුමක් යටතේ සමාගම එක් එයාර් බස් A320 ගුවන් යානයක් භාර ගත්තේය. මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපළෙන් ජාත්‍යන්තර ගුවන් ගමන් ආරම්භ කළේය.

2012 මැයි මාසයේ දී සමාගම ඇමරිකානු ඩොලර් මිලියන 175 ක මූල්‍යකරණයක් ලබා ගැනීම සඳහා විදේශීය බැංකු සමූහයක් සමග මූල්‍යකරණ ගිවිසුමකට එළඹුණි.

## 2013/2014

එයාර් බස් A330 නියමුවන් පුහුණු කිරීම සඳහා පියාසැරි සිමියුලේටරය දියත් කිරීම. 2013 දෙසැම්බරයේ දී සමාගම මඟී සේවා පද්ධතිය ඇමඩියස් ඇල්ටියා (Amadeus Altea) වෙතට මාරු කරන ලදී.

2014 මාර්තු මාසයේදී සමාගම මධ්‍ය කාලීන මූල්‍යකරණය සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 150 ක් ලබා ගැනීමට බැංකු සමූහයක් සමග මූල්‍යකරණ ගිවිසුමකට එළැඹිණි.

## 2014/2015

සමාගම 2014 මැයි මාසයේ දී වන්වර්ල්ඩ් එකමුතුව සමග ගිවිසුම්වලට එළඹුණි. 2014 ජුනි මාසයේ දී සමාගම පළමු වරට පස් අවුරුදු ජාත්‍යන්තර බැඳුම්කරයක් නිකුත් කළේය.

පුළුල් බඳ ගුවන් යානා නැවත ධාවනය කිරීමේ වැඩසටහනක කොටසක් ලෙස සමාගම විසින් පිළිවෙලින් 2014 ඔක්තෝබර් සහ 2015 මාර්තු මාසවලදී නවතම A330 - 300 ගුවන් යානා තුනක් ලබා ගැනුණි.

## 2015/2016

ගුවන් සේවාව කීර්තිමත් ගෞරව නාම හතරක් සඳහා ලැයිස්තුගත කරන ලදී: එනම් ආසියානු සහ ඔස්ට්‍රේලියා හි කලාපීය හොඳම ගුවන් සේවය, හොඳම ගුවන් යානස්ථ ප්‍රකාශනය, 'හොඳම ගුවන් යානාස්ථ (Inflight) වීඩියෝව සහ ඇපෙක්ස් මඟී තේරීම් සම්මාන 2015 හි හොඳම ගොඩබිම අත්දැකීම යනුවෙනි. ගුවන් සේවය කාණ්ඩ හතරක් සඳහා නම් කරන ලද පළමු අවස්ථාව මෙයයි. ආසියාවේ සහ ඔස්ට්‍රලේෂියාවේ හි මඟී අත්දැකීම් සඳහා විශිෂ්ට ජයග්‍රහණ සම්මානය දිනා ගත්තේය. - 2015 සැප්තැම්බර් ඇපෙක්ස් පෝට්ලන්ඩ් ඔරේගන් සහ හොඳම පූර්ණ සේවා ගුවන් සේවා ත්‍යාගය, මධ්‍යම හා දකුණු ආසියාව - ආසියාවේ අනාගත සංචාරක අත්දැකීම් සම්මාන 2015-සිංගප්පූරුව.

පුළුල් බඳ ගුවන් යානා නැවත ධාවනය කිරීමේ වැඩසටහනේ කොටසක් ලෙස සමාගම විසින් අගෝස්තු සහ නොවැම්බර් මාසවලදී අති නවීන A330-300 ගුවන් යානා හතරක් සහ 2015 දෙසැම්බර් මාසයේදී ගුවන් යානා දෙකක් ලබාගන්නා ලදී.

## 2016/2017

2017 පෙබරවාරි සහ 2017 මාර්තු මාසවලදී A320 නව ගුවන් යානා දෙකක් හඳුන්වා දීම - පළමු A320/ A321 පවුලේ නව එන්ජින් විකල්ප ගුවන් යානා දෙක සමූහයට එක්විය.

ලාහෝර්, ජකර්තා, ඩකා, කල්කටා, මදුරෙයි, වරනාසි, බුද්ධගයා, මස්කට්, බහරේන්, සීෂෙල්ස් සහ ගැන් දූපත් යන ආකර්ෂණීය නව ගමනාන්ත එකොළහකට ශ්‍රීලංකන් මගින් සේවා අරඹන ලදී.

සමාගමට "දකුණු ආසියාවේ හොඳම ගුවන් සමාගම", ෆියුචර් ට්‍රැවල් එක්ස්පීරියන්ස් ඒෂියා 2016 හි අඛණ්ඩව දෙවන වරටත් "මධ්‍යම හා දකුණු ආසියාවේ හොඳම පූර්ණ සේවා ගුවන් සේවය" යන ඉහළම සංචාරක සම්මාන පිරිනමන ලදී. 7 වන ආසියා සේවායෝජක සන්නාම සම්මාන උළෙලේදී "පුහුණු විශිෂ්ටතා සම්මානය" සහ ව්‍යාපාරයට අනුකූලව හොඳම මානව සම්පත් ක්‍රමෝපාය සඳහා සම්මානයද ගුවන් සමාගම විසින් හිමිකර ගන්නා ලදී.

## 2017/2018

සමාගම විසින් ගුවන් යානා සමූහයේ කොටසක් ලෙස 2017 ජුනි, ඔක්තෝබර් සහ දෙසැම්බර් මාසවලදී නවතම එයාර්බස් A321 -200 neo නව ගුවන් යානා තුනක් ලබා ගන්නා ලදී.

ශ්‍රීලංකන් මගින් මෙල්බර්න්, හයිද්‍රාබාද්, කොයිම්බතූර් සහ විශාකාපට්නම් යන නව ගමනාන්ත හතරකට සේවා අරඹන ලදී.

ගුවන්සේවා මඟී අත්දැකීම් සංගමයෙන් (ඇපෙක්ස්) තරු හතරේ විශිෂ්ටතා ශ්‍රේණිගත කිරීමක් ලබාගත් අතර, 2017 සිංගප්පූරුවේ අනාගත සංචාරක අත්දැකීම් සම්මාන උළෙලේදී ගුවන් සේවය නොකඩවා තෙවන වරටත් විශිෂ්ට සේවා සඳහා සම්මානය ලබා ගත්තේය. සිංගප්පූරුවේ පැවති 2017 ආසියා පැසිෆික් සම්මාන උළෙලේදී "වාණිජ ගුවන් සේවා මැදිරිවල නවෝත්පාදන" සම්මානයද සමාගම දිනා ගත්තේය.

## 2018/2019

සමාගම විසින් 2018 ජුලි මාසයේදී තවත් නවතම එයාබස් A321 neo ගුවන් යානයක් ලබා ගන්නා ලද අතර එමගින් නියෝ යානා සමූහයේ නිල ආරම්භය පූර්ණ විය.

පියාසැරි දත්ත විශ්ලේෂණ සමාගමක් වන ෆ්ලයිට්ස්ටැට්ස්.කොම් (Flightstats.com.) විසින් ශ්‍රේණිගත කරන ලද 'ගෝලීය ගුවන් සේවා' සහ 'ප්‍රධාන ගුවන් සේවා' යන ප්‍රධාන කාණ්ඩ යටතේ ශ්‍රීලංකන් ගුවන් සේවය 2018 සැප්තැම්බර් මාසයේ දී ලොව වඩාත් කාර්යක්ෂම ගුවන් සේවය බවට පත්විය.

ශ්‍රීලංකන් ගුවන් සේවය විසින් ගුවන් මගී අත්දැකීම් සංගමයේ (ඇපෙක්ස්) අඛණ්ඩව දෙවන වරටත් ප්‍රධාන ගුවන් සේවා කාණ්ඩයේ තරු හතරේ ශ්‍රේණිගත කිරීමක් පවත්වා ගෙන ගිය අතර, ජාත්‍යන්තර සම්මාන කිහිපයක් ද හිමි කර ගත්තේය. මේ අතරට අඛණ්ඩව තෙවැනි වරටත් ඉන්දියානු සාගරයේ ලොව ප්‍රමුඛ ගුවන් සේවය සම්මානය දිනා ගැනීම සහ අයි.ටී.බී බර්ලිනයේ ගෝල්ඩන් සිටි ගේට් සම්මාන තුනක් ඇතුළත් වේ.

## 2019/2020

ශ්‍රීලංකන් ගුවන් සේවය 2019 වර්ෂයේ සැප්තැම්බර් මස සිය 40 වැනි සංවත්සරය සැමරීය. ජාතික ගුවන් සේවය වෙත ගුවන් මගී අත්දැකීම් සංගමය (APEX) මගින් ''විශිෂ්ටතම අලෙවිකරණ නව හඳුන්වාදීම'' සම්මානය පිරිනැමිනි. ශ්‍රීලංකන් ගුවන් සේවය විසින් අඛණ්ඩව තෙවන වරටත් ප්‍රධාන ගුවන් සේවා කාණ්ඩයේ තරු හතරේ ශ්‍රේණිගත කිරීමක් ලබා ගන්නා ලදී.

2019 දී ශ්‍රීලංකන් ගුවන් සේවය විසින් 'Two Cities, One Spirit' ප්‍රචාරණ ව්‍යාපෘතිය වෙනුවෙන් PATA ස්වර්ණ සම්මානය දිනා ගන්නා ලද අතර, 2019 බර්ලින් ITB ගෝල්ඩ් සිටි ගේට් සම්මාන උළෙලේදී සම්මාන ත්‍රිත්වයක් දිනා ගැනුණි.

2020 බර්ලින් ITB ගෝල්ඩ් සිටි ගේට් සම්මාන උළෙලේදී සමාගම ප්‍රථම වරට කාණ්ඩ තුනකින් ("Airline International", "Music International" සහ "Campaign") තරු පහේ සම්මානයට පාත්‍ර විය.

ශ්‍රීලංකන් ගුවන් සේවය වර්ල්ඩ් ට්‍රැවල් අවෝර්ඩ්ස් ඒෂියා ඇන්ඩ් ඕෂනියා (ලෝක චාරිකා සම්මාන- ආසියාව හා ඕෂනියාව) හිදී අග්‍රගන්‍ය 'ලොව විශිෂ්ටතම ගුවන් සේවය' සහ 'ඉන්දියන් සාගරය ආශ්‍රිත ආසියාවේ ප්‍රමුඛතම ගුවන් සේවය' යන සම්මානයන්ගෙන් පිදුම් ලැබීය.

## 2020/21

පශ්චාත් කෝවිඩ් ගුවන් ගමන් වලදී මගීන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම තහවුරු කිරීම හේතුවෙන් APEX Health Safety විසින් ප්ලැටිනම් ප්‍රමිති තත්වය පිරිනමන ලදී.

"Future Travel Experience (FTE) Virtual Expo" සම්මාන උළෙලේදී ගුවන් මගී අත්දැකීම් සංගමය (APEX) විසින් 2021 වසර සඳහා "ප්‍රධාන නිල ගුවන් සේවය සඳහා තරු හතරක් ශ්‍රේණිගත කිරීම" පිරිනමන ලදී.

ගෝලීය වසංගත තත්වය තුළ ශ්‍රී ලාංකේය අපනයනකරුවන් හට සහය දැක්වීම සඳහා සහ අඩුවන මගී සංචාර හමුවේ විකල්ප ආදායම් මාර්ග සොයා ගැනීමේ අරමුණින් ප්‍රථම වරට ගුවන් භාණ්ඩ යානා, ගමනාගමන කාලසටහනට ඇතුළත් කරන ලදී.

වසංගතය තත්වය හමුවේ දේශසීමා වසා දැමීම හේතුවෙන් විදේශයන්හි අතරමංව සිටින ශ්‍රී ලාංකිකයින් ආපසු ගෙන්වා ගැනීම සඳහා විශේෂ මගී ගුවන් ගමන් ක්‍රියාත්මක කළ අතර, අත්‍යවශ්‍ය වෛද්‍ය සැපයුම් ප්‍රවාහනය සඳහා විශේෂ භාණ්ඩ ප්‍රවාහන ගුවන් ගමන් ක්‍රියාත්මක කරන ලදී.

## 2021/22

පශ්චාත් කොවිඩ් සමයේ ගුවන් සංචාරයේදී මගී ආරක්ෂාව සහ යහපැවැත්ම සඳහා Simplyflying මගින් අනුග්‍රහය දක්වන ලද දියමන්ති සම්මානය - ඇපෙක්ස් සෞඛ්‍ය සහ ආරක්ෂාව සහ "සේවා ස්ථානයේ සෞඛ්‍ය කළමනාකරණයේ විශිෂ්ටතමයා" ආසියාතික නායකත්ව සම්මානය 2021 වර්ෂයේදී ලබා ගන්නා ලදී.

දකුණු ආසියාතික කලාපයේ පැවැත්ම තහවුරු කළ හෙයින් 2021 ලෝක සංචාරක සම්මාන උළෙලේදී, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් ඉන්දියන් සාගරය ආශ්‍රිත ලොව ප්‍රමුඛතම ගුවන් සේවය සහ ඉන්දියන් සාගරය ආශ්‍රිත ආසියාවේ ප්‍රමුඛතම ගුවන් සේවය ලෙස කීර්තියක් හිමි කර ගැනුණි. එමෙන්ම 'සේ බොන්ජු ටු පැරිස් (Say Bonjour to Paris)ප්‍රචාරණ ව්‍යාපාරය සඳහා අලෙවිකරණ වාහකයා - PATA රන් සම්මානය 2021 වර්ෂයේදී දිනා ගන්නා ලදී.

## 2022/23

2023 වසරේ සිංගප්පූරුවේ දී, APEX Asia EXPO හි මධ්‍යම/දකුණු ආසියාවේ හොඳම ආහාර සහ පාන සහ හොඳම ආසන පහසුව සඳහා APEX මගී තේරීම් සම්මානය පිරිනමන ලදී.

2022 වසරේ ශෙයික් මොහම්මඩ් බින් රශීඩ් අල් මක්ටූම් (SMBR) ගෝලීය ගුවන් සේවා සම්මාන උළෙලේදී හොඳම ගුවන් සේවා තිරසාර වැඩසටහන් සම්මානය දිනා ගන්නා ලදී.

2022 වසරේ පැසිෆික් ආසියා සංචාරක සංගමයේ (PATA) රන් සම්මාන උළෙලේදී "අලෙවිකරණ - වාහකයා" කාණ්ඩය යටතේ රන් සම්මානය හිමිකර ගන්නා ලදී.

2022 වසරේ දකුණු ආසියානු සංචාරක සම්මාන උළෙලේදී (SATA) සංචාරක තේරීම අනුව වසරේ ගුවන් සේවය ලෙස පිළිගන්නා ලදී.

2022 ලෝක සංචාරක සම්මාන උළෙලේදී ඉන්දියන් සාගරයට ඇති ලොව ප්‍රමුඛතම ගුවන් සේවය ලෙස සම්මානයට පාත්‍ර විය.

# සාංගමික තොරතුරු

**සමාගමේ නම**
සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම

**සමාගමේ ලියාපදිංචි අංකය**
පී බී 67

**නෛතිකභාවය**
සීමාසහිත පොදු සමාගමකි

**අධ්‍යක්ෂ මණ්ඩලය**
අසෝක පතිරගේ මහතා (සභාපති)
මලික් ජේ. ප්‍රනාන්දු මහතා
ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා
ජෝසප් මයිකල් ජයන්ත් පෙරේරා මහතා
ආනන්ද විජේතිලක අතුකෝරල මහතා
ඒ. කේ. ඩී. ඩී. ඩී. අරන්දර මහතා/ භාණ්ඩාගාර නියෝජිත
ඒ. එම්. ඒ. ඒ. ලක්මාල් රත්නායක මහතා
ඩී.ඩී. ශිරාන් චමින්ද දම්මගේ මහතා
සංජය මොහොට්ටාල මහතා (2022 අප්‍රේල් 29 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් විය.)
මනෝහර රත්නවිභූෂණ ද සිල්වා මහතා (2022 අගෝස්තු 18 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් විය.)
සමන්ත රත්වත්ත මහතා (2022 අගෝස්තු 18 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් විය.)
වීරසිංහ ආච්චිගේ සරත් කුමාර මහතා (2022 අගෝස්තු 18 දින සිට බලපැවැත්වෙන පරිදි තේරී පත් විය/2023 පෙබරවාරි 3 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස් විය.)

**විගණන කමිටුව**
ඩී.ඩී. ශිරාන් චමින්ද දම්මගේ මහතා (සභාපති)
ජෝසප් මයිකල් ජයන්ත් පෙරේරා මහතා
මලික් ජේ. ප්‍රනාන්දු මහතා
ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා
ඒ. කේ. ඩී. ඩී. ඩී. අරන්දර මහතා

**අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව**
මලික් ජේ. ප්‍රනාන්දු මහතා (සභාපති)
ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා
ජෝසප් මයිකල් ජයන්ත් පෙරේරා මහතා
ඒ.එම්.ඒ.ඒ. ලක්මාල් රත්නායක මහතා
ඒ. කේ. ඩී. ඩී. ඩී. අරන්දර මහතා

**අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කමිටුව**
ජෝසප් මයිකල් ජයන්ත් පෙරේරා මහතා (සභාපති)
මලික් ජේ. ප්‍රනාන්දු මහතා
ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා
ආනන්ද විජේතිලක අතුකෝරල මහතා (නිරීක්ෂක)
ඒ. කේ. ඩී. ඩී. ඩී. අරන්දර මහතා
ඩී.ඩී. ශිරාන් චමින්ද දම්මගේ මහතා

**සමාගම් ලේකම්/ සාංගමික ලේකම් සේවා ප්‍රධානී**
ඩැල්රීන් තිරුකුමාර් මහත්මිය (ACG)

**බැංකුකරුවන්**
ලංකා බැංකුව
මහජන බැංකුව
ස්ටෑන්ඩර්ඩ් චාටර්ඩ් බැංකුව
සිටි බැංකුව
සම්පත් බැංකුව
නේෂන්ස් ට්‍රස්ට් බැංකුව
හැටන් නැෂනල් බැංකුව
කොමර්ෂල් බැංකුව
කාගිල්ස් බැංකුව

**විගණක**
විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
306/72
පොල්දුව පාර
බත්තරමුල්ල

**ලියාපදිංචි කාර්යාලය**
සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම
ගුවන් සේවා මධ්‍යස්ථානය
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ
කටුනායක
ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය**
www.srilankan.com

optima Designing Your Year! | Designed & Produced by Optima Designs (Pvt) Ltd. | A full service design and print company. www.optimadesigns.lk

# මහා සභා රැස්වීම් නිවේදනය

පහත දැක්වෙන අරමුණු පාදක කර ගනිමින්, සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ හතළිස් පස්වන වාර්ෂික මහා සභා රැස්වීම 2023 නොවැම්බර් 30 බ්‍රහස්පතින්දා ප.ව. 3.00 ට කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ පිහිටි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ (BMICH) 'සිනමා ආලින්දය' පරිශ්‍රයේ පැවැත්වෙන බව මෙයින් දන්වා සිටියි.

1. 2023 මාර්තු 31 දිනට අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ සමඟ ඒ පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව භාරගනු ලැබ සලකා බැලීම.

2. අවුරුදු හැත්තෑව ඉක්මවූ ඒ. ඩබ්ලිව්. අතුකෝරල මහතා නැවත සමාගමේ අධ්‍යක්ෂවරයකු වශයෙන් තෝරා පත්කර ගැනීම සලකා බැලීමට සහ පහත යෝජනාව සම්මත කිරීමට සුදුසු යැයි හැඟේ නම්;

   "2007 අංක 07 දරන සමාගම් පනතේ 210 වගන්තියේ දක්වා ඇති වයස් සීමාව හැත්තෑ හතරවන වියේ පසුවන ඒ. ඩබ්ලිව්. අතුකෝරල මහතාට අදාළ නොවන බවටත් අතුකෝරල මහතා වාර්ෂික මහා සභා රැස්වීම අවසන් වීමෙන් පසු තවත් වසරක කාලයක් සඳහා සමාගමේ අධ්‍යක්ෂවරයකු ලෙස නැවත පත් කරන බවටත් මෙයින් තීරණය වේ."

3. අවුරුදු හැත්තෑව ඉක්මවූ ජේ. එම්. ජයන්ත් පෙරේරා මහතා නැවත සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස තෝරා පත්කර ගැනීම සලකා බැලීමට සහ පහත යෝජනාව සම්මත කිරීමට සුදුසු යැයි හැඟේ නම්;

   "2007 අංක 07 දරන සමාගම් පනතේ 210 වගන්තියේ දක්වා ඇති වයස් සීමාව හැත්තෑවන වියේ පසුවන ජේ. එම්. ජයන්ත් පෙරේරා මහතාට අදාළ නොවන බවටත් පෙරේරා මහතා වාර්ෂික මහා සභා රැස්වීම අවසන් වීමෙන් පසු තවත් වසරක කාලයක් සඳහා සමාග මේ අධ්‍යක්ෂවරයකු ලෙස නැවත පත් කරන බවටත් මෙයින් තීරණය වේ."

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වන වගන්තිය ප්‍රකාරව, විගණකාධිපතිවරයා විසින් සමාගම විගණනය කරනු ලබයි.

2022/23 සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි වාර්ෂික වාර්තාව,
(i) ආයතනික වෙබ් අඩවිය – https://www.srilankan.com/en_uk/corporate/annual-reports
(ii) කොටස් හිමියන්ගේ ප්‍රජා අඩවිය - www.srilankan.com/shareholdercommunitysite න් ලබා ගත හැකිය.

පහත QR කේතය ස්කෑන් කිරීමෙන් සාමාජිකයින්ට ඔවුන්ගේ ජංගම දුරකථන හරහාද වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ වෙත ප්‍රවේශ විය හැක.

සියලුම රජය සතු ව්‍යවසායන්ට විද්‍යුත් සන්නිවේදන මාධ්‍යයට මාරු වී කඩදාසි භාවිතය හැකිතාක් අඩු කරන ලෙස ඉල්ලා සිටිමින් නිකුත් කර ඇති, 2022 අගෝස්තු 8 දිනැති 04/2022 පොදු ව්‍යවසාය චක්‍රලේඛය ප්‍රකාරව, මෙම වාර්තාව ලබා ගත හැක්කේ PDF ස්වරූපයෙන් පමණකි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස්

**ඩැල්රීන් තිරුකුමාර් මහත්මිය**
*සාංගමික ලේකම් සේවා ප්‍රධානී / සමාගම් ලේකම්*

2023 ඔක්තෝබර් 23
කටුනායක

**සටහන්:**
1. සාමාජිකයෙකුට ඔහු/ඇය වෙනුවට සහභාගි වීමට සහ ඡන්දය දීමට පෙරකලාසිකරුවෙකු පත් කිරීමට හිමිකම් ඇත.
2. පෙරකලාසිකරු සමාගමේ සාමාජිකයෙකු විය යුතු නැත.
3. ඔවුන් වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු පත් කිරීම හරහා පෙරකලාසිකරුවෙකු මඟින් ඡන්දය ප්‍රකාශ කිරීමට සහ රැස්වීමේදී ඉදිරිපත් කිරීමට නියමිත යෝජනා පිළිබඳව ඔවුන්ගේ ඡන්ද මනාපයන් පෙරකලාසි පත්‍රයේ ඇතුළත් කිරීමට සාමාජිකයන් දිරිමත් කරනු ලැබේ.
4. වලංගු වීමට නම්, සම්පූර්ණ කරන ලද පෙරකලාසි පත්‍රය රැස්වීමට පැය 48 කට පෙර සමාගමේ ලියාපදිංචි කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය.
5. සංස්ථාපිත ආයතනයක් නියෝජනය කරන පුද්ගලයෙකු එම සංස්ථාවේ නියෝජිතයා ලෙස කටයුතු කිරීමට ඔහුට/ඇයට බලය පවරමින් එහි අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවේ සහතික කළ පිටපතක් රැගෙන යා යුතුය.
6. ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද කිසියම් සන්නිවේදනයක්, මාර්ගෝපදේශනයක්, විධානයක් හෝ නියෝගයක් හේතුවෙන් වාර්ෂික මහා සභා රැස්වීමට අදාළව යම් ක්‍රියාමාර්ගයක් ගැනීමට සමාගමට අවශ්‍ය නම්, එම ක්‍රියාමාර්ගය පිළිබඳ නිවේදනය සමාගමේ වෙබ් අඩවිය - www.srilankan.com/AGM, කොටස් හිමියන්ගේ ප්‍රජා වෙබ් අඩවිය www.srilankan.com/shareholdercommunitysite සහ ජාතික පුවත්පත් හි ප්‍රකාශනයක් ආකාරයෙන් ලබාදිය යුතු වන්නේය.

# සටහන්

# පෙරකලාසි පත්‍රය

සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස්
සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමෙහි සාමාජිකයෙකු/ සාමාජිකයින් වන,...............................................................................හි

..........................................................................................................................................................................

වන මම / අපි .................................................................. හි ............................................................................................

හෝ ඔහු/ඇය අපොහොසත් වන්නේ නම් පහත සඳහන් අධ්‍යක්ෂවරුන්ගෙන් එක් අයෙක්;

අසෝක පතිරගේ මහතා
මලික් ජේ. ප්‍රනාන්දු මහතා
ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා
ජෝසප් ජයන්ත් මයිකල් පෙරේරා මහතා
ආනන්ද විජේතිලක අතුකෝරල මහතා
ඒ. කේ. ඩී. ඩී. ඩී. අරන්දර මහතා/ භාණ්ඩාගාර නියෝජිත
ඒ. එම්. ඒ. ඒ. ලක්මාල් රත්නායක මහතා
ඩී.ඩී. ශිරාන් චමින්ද දම්මගේ මහතා

මගේ/අපගේ පෙරකලාසිකරු වශයෙන් සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමෙහි 2023 නොවැම්බර් 30 බ්‍රහස්පතින්දා ප.ව. 3.00 ට කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ පිහිටි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ (BMICH) 'සිනමා ආලින්දය' පරිශ්‍රයේ පැවැත්වීමට නියමිත හතළිස් පස්වන වාර්ෂික මහා සභා රැස්වීමේදී හෝ එහි කිසියම් කල්තැබීමකදී මම/අපි වෙනුවෙන් ඡන්දය ලබා දීමට සහ මම/අපි නියෝජනයට මෙහිලා පත්කරනු ලබයි.

| | පක්ෂව | විපක්ෂව |
|---|---|---|
| 1. 2023 මාර්තු 31 න් අවසන් මූල්‍ය වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ සමඟ, ඒ පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව භාරගනු ලැබ සලකා බැලීම. | ☐ | ☐ |
| 2. 2007 අංක 7 දරණ සමාගම් පනතේ 210 වගන්තිය අනුව, විශ්‍රාමික අවුරුදු හැත්තෑව ඉක්මවූ ඒ. ඩබ්ලිව්. අතුකෝරල මහතා නැවත සමාගමේ අධ්‍යක්ෂවරයකු වශයෙන් තෝරා පත්කර ගැනීම. | ☐ | ☐ |
| 3. 2007 අංක 7 දරණ සමාගම් පනතේ 210 වගන්තිය අනුව, විශ්‍රාමික අවුරුදු හැත්තෑව ඉක්මවූ ජේ. එම්. ජයන්ත් පෙරේරා මහතා නැවත සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස තෝරා පත්කර ගැනීම. | ☐ | ☐ |

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වන වගන්තිය ප්‍රකාරව, විගණකාධිපතිවරයා විසින් සමාගම විගණනය කරනු ලබයි.

දෙදහස් විසි තුනේ ..................................... මස.................................දින මෙය අත්සන් කරන ලදී.

........................................................ අත්සන/අත්සන්

**සටහන:**
*(අ) * අනවශ්‍ය වචනය කපා හරින්න.*
වචන කිසිවක් ඉවත් කර නොමැති නම් හෝ පෙරකලාසිකරු ඡන්දය භාවිත කළ යුතු ආකාරය පිළිබඳ (පෙරකලාසි පත්‍රය සම්පූර්ණ කිරීමේදී උපදෙස් ඇතුළත් කර ඇති ආකාරය සම්බන්ධව) පෙරකලාසිකරු හට සැකයක් පවතී නම්, පෙරකලාසිකරු යෝග්‍ය යැයි සිතන පරිදි ඡන්දය භාවිත කරනු ඇත.

**පෙරකලාසි පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්:**
1. ඔබගේ සම්පූර්ණ නම සහ ලිපිනය පැහැදිලිව සටහන් කිරීමෙන් පසු සපයා ඇති ඉඩෙහි අත්සන් කර, අත්සන් කරන දිනයද සටහන් කර නිවැරදිව පෙරකලාසි පත්‍රය සම්පූර්ණ කරන්න.
2. සම්පූර්ණ කරන ලද පෙරකලාසි පත්‍රය, ලියාපදිංචි කාර්යාලය, සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම, 'ගුවන් සේවා මධ්‍යස්ථානය', බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ, කටුනායක යන ලිපිනයට රැස්වීම පැවැත්වීමට පැය 48 කට පෙර එනම් 2023 නොවැම්බර් 28 වන දින ප.ව. 3.00 ට පෙර එවිය යුතුය.
3. නේවාසික/ අනේවාසික කොටස් හිමියන් සම්බන්ධයෙන්, සම්පූර්ණ කරන ලද පෙරකලාසි පත්‍රය සමාගම වෙත ආපසු ලබා දීමෙන් පසු මුද්‍රා තැබීම සිදු කරනු ලැබේ.

SriLankan Airlines

oneworld

www.srilankan.com
ගුවන් සේවා මධ්‍යස්ථානය,බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ,
කටුනායක, ශ්‍රී ලංකාව.